61 වන කාණ්ඩය
5 වන කලාපය

සඳුදා
1965 අගෝස්තු 23

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

## නිල වාර්තාව

### අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තී. 1009]

විසර්ජන කෙටුම්පත් පනත, 1965-66 [හතරවන වෙන්කළ දිනය] [තී. 1033] :

දෙවන වර කියවීම—විවාදය ඉදිරියට ගෙන යන ලදී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 61
இல. 5

திங்கட்கிழமை
23, ஒகஸ்ட் 1965

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

அதிகாரபூர்வமான அறிக்கை

பிரதான உள்ளடக்கம்

விஞக்களுக்கு வாய்மூல விடைகள் [ப. 1009]

ஒதுக்கீட்டு மசோதா, 1965–66 [ஒதுக்கப்பட்ட நான்காம் நாள்] [ப. 1033] :
இரண்டாம் மதிப்பு—விவாதம் ஒத்திவைக்கப்பட்டது.

---

Volume 61
No. 5

Monday,
23rd August 1965

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS

**ORAL ANSWERS TO QUESTIONS** [Col. 1009]

**APPROPRIATION BILL, 1965-66** [*Fourth Allotted Day*] [**Col. 1033**] :
**Second Reading—Debate adjourned.**

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

பிரதிநிதிகள் சபை

House of Representatives

1965 අගෝස්තු 23 වන සඳුදා

திங்கட்கிழமை 23, ஆகஸ்ட், 1965

Monday, 23rd August 1965

---

පූ. භා. 10ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය. කථානායකතුමා [ශ්‍රීමත් ඇල්බට් එෆ්. පීරිස්, කේ. බී. ඊ.] මූලාසනාරූඪ විය.

சபை, மு.ப. 10 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [கௌரவ ஸ்ரீமான் அல்பட் எப். பீரிஸ், கே.பி.ஈ.] தலைமை தாங்கினார்கள்.

The House met at 10 A.M., MR. SPEAKER [THE HON. SIR ALBERT F. PERIES, K.B.E.] in the Chair.

---

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු

விஞக்களுக்கு வாய்மூல விடைகள்

## ORAL ANSWERS TO QUESTIONS

### රාජකාරි නිවාස ටෙලිෆෝන්

உத்தியோக வங்களாத் தொலைபேசிகள்

OFFICIAL BUNGALOW TELEPHONES

3. සී. එන්. මැතිව් මයා. (කොළොන්න)
(திரு. சீ. என். மதியூ—கொலன்ன)
(Mr. C. N. Mathew—Kolonna)

රජයේ වැඩ, තැපැල් හා විදුලි සංදේශ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ටෙලිෆෝන් ලබා ගැනීම සඳහා පොරොත්තු වූවන්ගේ ලේඛනයේ සිටින ඉල්ලුම්කරුවන්ගේ ගණන කොපමණද? (ආ) කොළඹ තිබෙන මුලු රාජකාරි නිවාස ටෙලිෆෝන් සංඛ්‍යාව කොපමණද? (ඉ) ටෙලිෆෝන් දී තිබෙන සියලුම නිලධාරීන්ට ඇත්ත වශයෙන්ම ඒවා රාජකාරි කටයුතු සඳහා අවශ්‍ය වේද යන්න නිසැකව දැන ගැනීමටත් නිසි සැළකීමක් නොමැතිව තත්ත්ව ලාංඡන වශයෙන් දී ඇති ටෙලිෆෝන් ආපසු ලබා ගෙන පොරොත්තු වූවන්ගේ ලේඛනයේ සිටින අයට දීමටත් එතුමා ක්‍රියා කරනවාද? (ඊ) පී. ඕ. ප්‍රනාන්දු කාරක සභා වාර්තාවේ 472 හා 473 යන ඡේදවල නිර්දේශ කර ඇති පරිදි රාජකාරි ටෙලිෆෝනයකින් නොමිළයේ කළ හැකි ඇමතීම් ගණන මසකට විසිපහ දක්වා සීමා කිරීමටත් එම වාර්තාවේ සඳහන් පරිදි නොමිළයේ කරන්නා වූ ඇමතීම් පහසුකම් අයථා පරිදි පාවිච්චි කරන නිසා අනික් සියලුම ඇමතීම්වලට මුදල් අය කිරීමටත් එතුමා ක්‍රියා කරනවාද?

அரசாங்கக் கட்டிவேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா: (அ) தொலைபேசிகளுக்கு விண்ணப்பித்து எதிர்பார்த்திருக்கும் விண்ணப்பதாரர்கள் எத்தனை பேர்? (ஆ) கொழும்பில் உத்தியோக தோரணையில் வழங்கப்பட்டுள்ள தொலைபேசிகளின் மொத்த எண்ணிக்கை எவ்வளவு? (இ) உத்தியோகத்தோரணையில் தொலைபேசிகள் வழங்கப்பட்ட உத்தியோகத்தர்களுக்கு உண்மையில் உத்தியோக விடயங்களுக்கு அவை தேவைப்படுகின்றனவா என்பதைக் கண்டறிவதற்கும், தொலைபேசிக்கு விண்ணப்பித்துக் காத்திருப்பவர்களுக்கு வழங்கக்கூடிய முறையில் முன்யோசனை எதுவுமின்றி உத்தியோக அந்தஸ்தைக்கருதி வழங்கப்பட்ட தொலைபேசிகளை மீண்டும் எடுத்துக்கொள்வதற்கும் அவர் நடவடிக்கை எடுப்பாரா? (ஈ) பி. ஓ. பெர்ணாண்டோ குழுவினது அறிக்கையின் 472—473 ஆம் பந்திகளில் சிபார்சுசெய்யப்பட்டுள்ளபடி உத்தியோகபூர்வமான தொலைபேசிகள் மூலம் செய்யப்படும் இலவச அழைப்புக்களை ஒரு மாதத்திற்கு 25 ஆக கட்டுப்படுத்துதற்கும் அறிக்கையில் குறிப்பிடப்பட்டுள்ள பிரகாரம் இலவச தொலைபேசி அழைப்பு வாய்ப்புக்களை துர்ப்பிரயோகம் செய்வதனை முன்னிட்டு இக்கட்டுப்பாட்டு எண்ணிக்கைக்கு மேலதிகமாய்ச் செய்யப்படும் அழைப்புக்கள் அனைத்திற்கும் கட்டணங்கள் அறவிடுவதற்கும் அவர் நடவடிக்கை எடுப்பாரா?

asked the Minister of Public Works, Posts and Telecommunications: (a) What is the number of applicants on the waiting list for telephones? (b) What is the total number of official bungalow telephones in Colombo?



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මැතිව් මයා.]

(c) Will he take action to ascertain whether all the officials who have been issued telephones actually require them for official purposes and recover those issued without due consideration as status symbols with a view to having them issued to applicants on the waiting list? (d) Will he also take action as recommended in paragraphs 472-473 of the P. O. Fernando Committee Report to limit free calls on official telephones to 25 per month and to charge for all other calls in view of the abuse of free call facilities as mentioned in this report?

කථානායකතුමා

(சபாநாயகர் அவர்கள்)

(Mr. Speaker)

I shall be very grateful if Hon. Ministers are here in time.

**ගරු ජේ. ආර්. ජයවර්ධන (රාජ්‍ය ඇමති සහ අග්‍රාමාත්‍යතුමාගේත් රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේත් පාර්ලිමේන්තු ලේකම්—රජයේ වැඩ තැපැල් හා විදුලි සන්දේශ ඇමති වෙනුවට)**

*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன—இராஜாங்க அமைச்சரும் பிரதம அமைச்சரதும் பாதுகாப்பு வெளிவிவகார அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசியும்—அரசாங்கக் கட்டுவேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சர் சார்பாக)*

(The Hon. J. R. Jayewardene—Minister of State and Parliamentary Secretary to the Prime Minister and Minister of Defence and External Affairs—on behalf of the Minister of Public Works, Posts and Telecommunications)

(a) The total number of applicants on the waiting list for the Island is 9,777. (b) 773. (c) Applications for official telephones are in the first instance closely scrutinized by the heads of departments who make recommendations through their respective Permanent Secretaries. The authority who sanctions the new telephones is the Permanent Secretary concerned. (d) The matter is being examined.



## තැපැල් භාණ්ඩ නැතිවීම්

*தபால்மூலம் அனுப்பப்படுகின்ற பொருட்கள் காணமற் போகுதல் முதலியன*

LOSSES, ETC. OF POSTAL ARTICLES

4. මැතිව් මයා.

*(திரு. மதியூ)*

(Mr. Mathew)

රජයේ වැඩ, තැපැල් හා විදුලි සංදේශ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) (i) ලියුම්, පාර්සල් සහ ලියාපදිංචි කළ භාණ්ඩ ඇතුළු තැපැල් භාණ්ඩ නැතිවීම් හා ඒවා කැඩීම පිළිබඳ සිද්ධීන් ඉතා බහුල වුවත් දැනට පවත්නා වැඩ පිළිවෙල යටතේ කිසිම වග කීමක් පැවරිය නොහැකි බවත්; (ii) සමහර සේවකයින්, විශේෂයෙන්ම ලියාපදිංචි කිරීමේ ශාඛාවේ, නැතිවීම් බොහොමයකට සම්බන්ධ වී ඇතත් කිසිම වෙනසක් නොමැතිව එම අංශවලම කටයුතු කිරීමට ඉඩ දී ඇති බවත්; (iii) කලින් කල නිලධාරීන් මහ තැපැල් කාර්යාලයයේ විවිධ ශාඛා තුළ ස්ථාන මාරු කිරීමට අමාත්‍යාංශය තීරණය කළ නමුත් ප්‍රධාන තැපැල් ස්ථානාධිපති විසින් මෙය ක්‍රියාත්මක කර නැති බවත් එතුමා දන්නවාද? (ආ) එම නිසා, නැතිවීම් ආදිය නැවැත්වීමේ මූලික පියවරක් වශයෙන් අවුරුදු පහකට වරක් වත් සියලුම නිලධාරීන් මහ තැපැල් කාර්යාලය තුළම ස්ථාන මාරු කිරීමට එතුමා වහාම ක්‍රියා කරනවාද?

*அரசாங்கக் கட்டுவேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா: (அ) (i) கடிதங்கள், பார்சல்கள், பதிவுசெய்யப்பட்ட பார்சல்கள் உட்படத் தபால் மூலம் அனுப்பப்படுகின்ற பொருட்கள் காணமல் போதல், மாறுதல் செய்யப்படுதல் ஆகியன மிக அதிக அளவில் நடைபெறுகையிலுங்கூட, அவற்றுக்கான பொறுப்பைத் தற்போதைய ஒழுங்குகளின் பிரகாரம் எவர் மேலும் சுமத்த முடியாமலிருக்கின்றதென்பதையும், (ii) சில ஊழியர்கள், குறிப்பாகப் பதிவுக் கிளையில் கடமையாற்றுபவர்கள் இக்களவுகளில் சம்பந்தப்பட்டிருக்கையிலுங்கூட, அதே கிளைகளில் அவர்கள் அமைதியாகத் தொடர்ந்தும் வேலை செய்வதற்கு அனுமதிக்கப்பட்டுள்ளார்களென்பதையும், (iii) தலைமைத் தபால் கந்தோரில் கடமையாற்றும் உத்தியோகத்தர்களை அக் கந்தோரின் வெவ்வேறு கிளைகளுக்கும் காலத்*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

*திற்குக் காலம் இடமாற்றம் செய்வதென அமைச்சுத் தீர்மானித்துங்கூட, பிரதம தபால் அதிபரினால் இது செயற்படுத்தப்படவில்லை யென்பதையும் அவர் அறிவாரா? (ஆ) ஆகவே இக்களவுகள் முதலியனவற்றை இல்லாமற் செய்வதற்கான முதல் நடவடிக்கையாக குறைந்தது ஐந்து வருடங்களுக்கொருமுறை யாவது உத்தியோகத்தர்களனைவரையும் உள்ள கத்துள் மாற்றங்கள் செய்வதற்கான திட்டத் தினை உடனடியாகச் செயற்படுத்துவதற்கு அவர் வகைசெய்வாரா?*

asked the Minister of Public Works, Posts and Telecommunications: (*a*) Is he aware that: (i) although the incidence of losses and tampering with postal articles including letters, parcels and registered articles is very high no responsibility could be fixed under the present arrangements? (ii) though some employees especially in the Registration Branch have been involved in many losses, they have been allowed to work in the same sections undisturbed? (iii) though it was decided at Ministry level to shift officers periodically within different branches in the G. P. O. this has not been implemented by the Chief Postmaster? (*b*) Will he therefore, cause the immediate implementation of internal transfers of all officers once in five years at least, as a first step towards the arresting of losses, etc.

**ගරු ජේ. ආර්. ජයවර්ධන (රජයේ වැඩ, තැපැල් හා විදුලි සන්දේශ ඇමති වෙනුවට)**

*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன—அரசாங்கக் கட்டுவேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சர் சார்பாக)*

(The Hon. J. R. Jayewardene—on behalf of the Minister of Public Works, Posts and Telecommunications)

(*a*) (i) The incidence of losses and tampering with postal articles, etc., is not as high as is popularly believed to be the case when one considers the total amount of mail handled by the department. It is correct that there are deficiencies in regard to procedure in the Registration Branch and these are being rectified. In regard to ordinary mail, I am satisfied that satisfactory arrangements exist for the handling of about 78 million items of mail dealt within an year. Further improvements will be effected when the new Mail Sorting Office is built. (ii) No. If the employee is found to be guilty of misconduct, he is dealt with under the Public Service Commission rules and transferred after necessary inquiries have been completed. (iii) Yes. The implementation of the decision was suspended owing to the impending general elections and its implementation will be considered afresh. (*b*) Certain technical considerations prevent the immediate implementation of a regular scheme of internal transfers in the case of certain grades of officers. The matter will, however, be re-examined.

## තැපැල් කටයුතු සඳහා ගත් ගොඩනැගිලි වලට ගෙවන කුලිය

*தபாற் சேவைக் கட்டடங்களுக்கான வாடகை*

RENTS OF POSTAL BUILDINGS

5. **මැතිව් මයා.**
*(திரு. மதியூ)*
(Mr. Mathew)

රජයේ වැඩ, තැපැල් හා විදුලි සංදේශ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) තැපැල් කටයුතු සඳහා ගන්නා ලද ගොඩනැගිලි වලට අවුරුදු පතා ගෙවූ කුලිය වශයෙන් වැය වූ මුළු මුදල කොපමණද? (ආ) මෙම ගොඩනැගිලිවලින් කීයක් දෙපාර්තමේන්තු කායයීයන් සඳහා ප්‍රමාණවත් නොවන බව හෝ නුසුදුසු බව පෙනී ගොස් තිබේද? (ඉ) මේ ප්‍රශ්නය විසඳීම සඳහා කුමන ක්‍රියා මාර්ගයක් ගෙන තිබේද?

*அரசாங்கக் கட்டுவேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா: (அ) தபாற்சேவைகள் சம்பந்தமாய் உபயோகிக்கப்படும் கட்டடங்களுக்கு வருடாந்தம் வாடகையாக எவ்வளவு தொகை செலவிடப்பட்டது? (ஆ) இக்கட்டடங்களுள் எத்தனை திணைக்களத் தேவைகளுக்கு போதாதனவாய் அல்லது தகுதியற்றவையாய் காணப்பட்டன? (இ) இந்நிலையை தவிர்ப்பதற்கு என்ன நடவடிக்கை எடுக்கப்படுகிறது?*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මැතිව් මයා.]

asked the Minister of Public Works, Posts and Telecommunications: (a) What is the total amount incurred as rent paid annually on buildings taken for postal work? (b) How many of these buildings have been found inadequate or unsuitable for departmental purposes? (c) What action is being taken to solve the problem?

ගරු ජේ. ආර්. ජයවර්ධන (රජයේ වැඩ, තැපැල් හා විදුලි සන්දේශ ඇමති වෙනුවට)

(கௌரவ ஜே. ஆர். ஜயவர்தன—அரசாங்கக் கட்டுவேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சர் சார்பாக)

(The Hon. J. R. Jayewardene—on behalf of the Minister of Public Works Posts and Telecommunications)

(a) In 1963-64, Rs. 756,205. (b) About 75 buildings. (c) In the current financial year provision exists for the construction of 12 post offices. Provision has been made also in the next financial year for 13 post office buildings. Further action will be taken to solve this problem.

## "අරලියගහ මන්දිරය" රැකවල් කිරීම සඳහා යන වියදම

"அலரி மாளிகை": பாதுகாப்புச் செலவுகள்

"TEMPLE TREES": SECURITY EXPENSES

7. ඇලික් අලුවිහාරේ මයා. (මාතලේ)
(திரு. அலிக் அலுவிஹார—மாத்தளை)
(Mr. Alick Aluwihare—Matale)

අග්‍රාමාත්‍ය සහ රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති හා ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) 1960 අගෝස්තු මාසයේ සිට 1965 මාර්තු මාසය දක්වා වූ වකවානුව තුළ (i) යුද හමුදාව, (ii) පොලීසිය (iii) පොලිස් සුනඛයින් විසින් "අරලියගහ මන්දිරය" රැකවල් කිරීම සඳහා මසකට වැය වූ සාමාන්‍ය මුදල කොපමණද? (ආ) එම වකවානුව තුළ එවකට සිටි අගමැතිනියගේ වෙනයම් නිවසක් රැකවල් කිරීම සඳහා රැකවලුන් යොදවන ලද්දේද? එසේ නම්, මසක සාමාන්‍ය වියදම කොපමණද? (ඉ) 1965 සිට මේ දක්වා, "අරලියගහ මන්දිරය" සහ දැනට සිටින අගමැතිගේ නිවාසය වන "වුඩ්ලන්ඩ්ස්" මන්දිරය රැකවල් කිරීම සඳහා මසකට වැය වූ සාමාන්‍ය මුදල කොපමණද?

பிரதம அமைச்சரையும் பாதுகாப்பு வெளிவிவகார அமைச்சரையும், திட்டமிடல், பொருளாதார விவகார அமைச்சரையும் கேட்ட வினா: (அ) 1960 ஆம் ஆண்டு ஆகஸ்ட் மாதம் தொடக்கம் 1965 மார்ச் வரைக்கும் (i) இராணுவத்தினர், (ii) பொலிஸ், (iii) பொலிஸ் நாய்கள் ஆகியோர்கள் அலரி மாளிகையை காவல்புரிந்தமை சம்பந்தமாக மாதாந்தம் ஏற்பட்ட சராசரிச் செலவு எவ்வளவு? (ஆ) இக்கால எல்லையில் முன்னாள் பிரதம அமைச்சரினது வேறெந்த வதிவிடத்தையாவது காவலாளர்கள் காவல் புரிந்தார்களா? அவ்வாறாயின் மாதாந்தம் ஏற்பட்ட சராசரி செலவு எவ்வளவு? (இ) 1965 ஆம் ஆண்டிலிருந்து, "அலரி மாளிகையையும்" தற்போதைய பிரதம அமைச்சரது வதிவிடமான "வூட்லண்ட்ஸ்" சையும் காவல் புரிவதற்கு ஏற்பட்ட மாதாந்த சராசரிச் செலவு எவ்வளவு?

asked the Prime Minister and Minister of Defence and External Affairs, and Minister of Planning and Economic Affairs: (a) What was the average cost per month, for the period August, 1960, to March, 1965, incurred in respect of guarding "Temple Trees" by (i) The Army; (ii) The Police; (iii) Police Dogs? (b) Were guards posted at any other residence of the then Prime Minister during the same period and, if so, what was the average cost per month? (c) What was the average monthly cost of guarding "Temple Trees" and also "Woodlands" the residence of the present Prime Minister since 1965?

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

(a) During the period in question, i.e. from 24th November 1960 to 24th March 1965, "Temple Trees" was guarded by the Army and the Police (including police dogs), but it is difficult to work out the average cost of these services per month. The provision of security is deemed to be a

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

normal function of these services. The Army detachment was composed of personnel who were on the authorized cadre of the Army. They were employed on patrol duty, sentry duty and the operation of mobile tanks inside the premises. In respect of the Police, the personnel were C. I. D. officers who were on security duty with the Prime Minister. The then Prime Minister, Mrs. Sirima Bandaranaike, came into residence at "Temple Trees" not in August 1960, but on the 24th of November, 1960. (b) Yes. During the period August to 24th November 1960. Army and Police guards were on duty at the then Prime Minister's residence, No. 65, Rosmead Place; from December 1960 to March 1965, there was a Police guard at Horagolla Walauwa. These personnel were regular officers of the Army and Police and they were paid for from Departmental Estimates. (c) Security duty in respect of the Prime Minister, either at "Temple Trees" or "Woodlands"—the residence of the Prime Minister—is at present done by the Police. These personnel are on the authorized cadre and provide these services as part of their duties.

## ග්‍රාම සංවර්ධන සහ සුළු කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ප්‍රධාන පේෂකර්ම සැලසුම්කරු තනතුර

## கிராம அபிவிருத்தி, சிறுகைத்தொழில் திணைக்களம் : பிரதம துணி வடிவ அமைப்பாளர் பதவி

## RURAL DEVELOPMENT AND SMALL INDUSTRIES DEPARTMENT : POST OF CHIEF DESIGNER, TEXTILES

8. ආර්. පී. විජේසිරි මයා. (කුන්ඩසාලෙ)
(திரு. ஆர். பீ. விஜேசிறி—குண்டசாலே)
(Mr. R. P. Wijesiri—Kundasale)

ස්වදේශ කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) ග්‍රාම සංවර්ධන සහ සුළු කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ප්‍රධාන පේෂකර්ම සැලසුම්කරු තනතුර ඇති කරන ලද්දේ කවදාද ? මෙම තනතුර ඇති කරන ලද්දේ මන්ද ? (ආ) එම තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවන ලද්දේ කවදාද ? (ඉ) සම්මුඛ පරීක්ෂණය පවත්වන ලද්දේ කවදාද ? (ඊ) පත්වීම දෙන ලද්දේ කවදාද ? (උ) ඉල්ලා සිටි අධ්‍යාපනික, ප්‍රවීණතා හා කාර්මික සුදුසුකම් මොනවාද ? (ඌ) කී දෙනෙක් මෙම තනතුර සඳහා ඉල්ලුම් කළෝද ? (එ) ඒ එක් එක් අයගේ සුදුසුකම් මොනවාද ? (ඒ) එම තනතුර පුරවා තිබේද ? (ඔ) එසේ නම්, තෝරාගනු ලැබූ ඉල්ලුම්කරුගේ නම කුමක්ද ? (ඕ) එය V වැනි ශ්‍රේණියේ II වැනි පංතියේ තනතුරක්ද ?

உள்நாட்டு அமைச்சரைக் கேட்ட வினா : (அ) கிராம அபிவிருத்தி, சிறு கைத்தொழில்கள் திணைக்களத்தில் பிரதம துணிவடிவ அமைப்பாளர் பதவி எப்பொழுது ஏற்படுத்தப் பட்டது? எதற்காக இப்பதவி ஏற்படுத்தப் பட்டது? (ஆ) இப்பதவிக்கான விண்ணப்பங் கள் எப்பொழுது கோரப்பட்டன? (இ) நேர் முகப் பரீட்சை எப்பொழுது நடாத்தப் பட்டது? (ஈ) நியமனம் எப்பொழுது வழங்கப் பட்டது? (உ) கோரப்பட்ட கல்வி, தேர்ச்சி, தொழில் நுட்பத் தகைமைகள் என்ன? (ஊ) இப்பதவிக்கு விண்ணப்பித்தோர் எத்தனை பேர்? (எ) அவர்கள் ஒவ்வொருவரினதும் தகைமைகள் யாவை? (ஏ) இப்பதவி நிரப்பப் பட்டுள்ளதா? (ஐ) அவ்வாறாயின் தெரிவு செய்யப்பட்ட விண்ணப்பதாரரின் பெயர் என்ன? (ஒ) இப்பதவி V ம் தர, II ஆம் வகுப்புப் பதவியா?

asked the Minister of Home Affairs: (a) When was the post of Chief Designer, Textiles created in the Rural Development and Small Industries Department, and why was this post created? (b) When were applications for the post called? (c) When was the interview held? (d) When was the appointment given? (e) What are the educational, proficiency and technical qualifications called for? (f) How many applied for this post? (g) What are their qualifications individually? (h) Has the post been filled? (i) If so, what is the name of the successful applicant? (j) Is it a Grade V, Class II, post?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ආචාර්ය ඩබ්ලිව්. දහනායක (ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති)

*(கௌரவ கலாநிதி டபிள்யூ. தகநாயக்க— உள்நாட்டு விவகார அமைச்சர்)*

(The Hon. Dr. W. Dahanayake—Minister of Home Affairs)

(*a*) On 1.10.63. This post was created to expand the Designs Section further and co-ordinate the work of the designers. (*b*) Applications were not invited. According to the scheme of recruitment approved by the P.S.C. the post could be filled by promoting the designers of the department. The five designers of the department were therefore requested to be present at an interview on 25.2.1965. This request was made on 11.2.65. Four of the five designers attended the interview. (*c*) On 25.2.1965. (*d*) From 1.3.1965. (*e*) Educational and other qualifications : (1) Applicants should have passed at least the Senior School Certificate Examination. This requirement is not necessary for promotion of designers in the department. (2) Those who are to be promoted must have a wide knowledge of, and at least ten years' experience in, the preparation of designs for various types of handicrafts. (*f*) Vide (*b*) above. (*g*) Qualifications of the four (Designers) who came for the interview in accordance with (*b*) above are as follows :

| *Name :* | *Qualifications :* |
|---|---|
| 1. Mr. K. T. Selvadurai (Textile Designer) | Passed Std. VII at the Hindu College, Jaffna; followed a special two-year course in Textile production and Traditional Designs in India; served as Textile Designer of the Department from 1st August, 1947. |
| 2. Mr. W. S. Lankatilake (Artist Designer) | Teachers' Final Examination (Sinhala); has wide experience as an Artist; served as Artist in several Departments; served as Chief Demonstrator in this Department from 1.11.1941; as Artist from 1.10.1948 and as Artist Designer from 1.10.1951. |
| 3. Mr. W. B. Dassanayake (Textile Designer) | Senior School Certificate both in Sinhala and in English; Textile Teacher's Certificate; the three-year course Certificate in Textile Weaving of the Department of Commerce and Industries; six month's training in Textile Designing in Japan under a Colombo Plan Scholarship; served in the Department as Demonstrator from 15.10.1952; as Junior Supervisor from 1.12.1956 and as a Textile Designer from 1.4.1960. |
| 4. Mr. T. P. Kulatunga (Designer) | G.C.E. (English Medium Ord. Level) pass in 4 subjects; English Teacher's Drawing Certificate; Diploma in Drawing, Painting and Sculpture, College of Fine Arts, Ceylon; Certificate of Product Design, Industrial Arts Institute of Japan; and Research Certificate in theatrical Arts of Tokyo University of Arts, Japan. Appointed Designer on 1.7.1963. |

(*h*) Yes. (*i*) Mr. K. T. Selvadurai, Class II of C.A.S. (*j*) This is not a post in Grade V,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## විශ්ව විද්‍යාල කොමිසමේ වාර්තාව සහ ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ උප කුලපති

## பல்கலைக்கழக ஆணைக்குழுவினது அறிக்கையும் இலங்கைப் பல்கலைக்கழக துணைவேந்தரும்

## UNIVERSITIES COMMISSION REPORT AND VICE-CHANCELLOR, UNIVERSITY OF CEYLON

9. එස්. එස්. අබේසුන්දර මයා. (යටිනුවර)

(திரு. எஸ். எஸ். அபேசுந்தர—யட்டிநுவர)

(Mr. S. S. Abeysundera—Yatinuwara)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) විශ්ව විද්‍යාල කොමිෂමේ වාර්තාව ප්‍රසිද්ධ කරන ලද්දේ කවදාද? (ආ) එම වාර්තාවේ මනා සේ දක්වා ඇති විශ්ව විද්‍යාලවල පවත්නා වූ බරපතල දෙස් නිදොස් කිරීමට පසුගිය රජය කිසිදු ක්‍රියා මාර්ගයක් නොගත් බව එතුමා දන්නවාද? (ඉ) ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය පිරිහීම ගැන කොමසාරිස්වරු වැඩියෙන්ම දෝෂාරෝපණය පවරා ඇත්තේ උප කුලපති මතද? (ඊ) මෑතකදී දිස්ත්‍රික්ක උසාවියේ අසන ලද නඩු දෙකකදී උප කුලපතිගේ පාලනය ගැන ප්‍රශ්න කරන ලද බව එතුමා දන්නවාද? (උ) මෙම වාර්තාවේ උප කුලපතිට නිර්දය ලෙස දෝෂාරෝපණය කර තිබියදීත් තුන් වැනි වරටත් ඔහු උප කුලපති තනතුරට තෝරා පත්කර ගෙන තිබෙන බව එතුමා දන්නවාද? (ඌ) මෙම විශ්ව විද්‍යාලය තවදුරටත් පිරිහීම නැවැත්වීමට එතුමා වහාම ක්‍රියා කරනවාද? (එ) විශ්ව විද්‍යාලය මේ රටේ උසස් අධ්‍යාපනය කෙරෙහි ප්‍රයෝජනවත් කාර්යයක් ඉටු කරන බව සහතික කිරීමට එතුමා කුමන ක්‍රියා මාර්ගයක් ගැනීමට අදහස් කරන්නේද?

கல்வி, கலாச்சார விவகார அமைச்சரைக் கேட்ட வினு: (அ) பல்கலைக்கழகங்கள் பற்றிய ஆணைக்குழுவினது அறிக்கை எப்பொழுது வெளிவிடப்பட்டது? (ஆ) அவ்வறிக்கையில் சுட்டிக்காட்டப்பட்ட பல்கலைக்கழகங்களிலுள்ள பிரத்தியட்சமான குறைபாடுகளை நிவிர்த்தி செய்வதற்கு முன்னுள் அரசாங்கத்திஞல் நடவடிக்கையெதுவும் மேற்கொள்ளப்படவில்லையென்பதை அவர் அறிவாரா? (இ) இலங்கைப் பல்கலைக்கழகம் மிக மோசமான நிலைமையை அடைந்தமைக்கு துணை வேந்தரே கூடிய பொறுப்பாளியாவரென ஆணையாளர்கள் தெரிவித்தனரா? (ஈ) மாவட்ட நீதிமன்றத்தில் அண்மையில் நடைபெற்ற இரு வழக்குகளில் துணைவேந்தரது நடத்தை சம்பந்தமாகப் பிரஸ்தாபிக்கப்பட்டதென்பதை அவர் அறிவாரா? (உ) துணை வேந்தர் அறிக்கையில் மோசமான வகையில் தாக்கப்பட்டிருந்துங்கூட அவர் மூன்ருவது தவணைக்கும் துணை வேந்தர் பதவிக்குத் தெரிவு செய்யப்பட்டுள்ளார் என்பதை அவர் அறிவாரா? (ஊ) இலங்கைப் பல்கலைக்கழகம் மேலும் மோசமான நிலையை அடையாமல் தடுப்பதற்கு அவர் உடனடியாக நடவடிக்கைகள் எடுப்பாரா? (எ) இந்நாட்டின் உயர்தர கல்விக்கு பல்கலைக்கழகம் மிகப்பயனளிக்கக்கூடிய ஒரு பங்கை எடுத்துக்கொள்வதை உறுதிப்படுத்துமுகமாக அவர் மேற்கொள்ள உத்தேசித்துள்ள நடவடிக்கைகள் யாவை?

asked the Minister of Education and Cultural Affairs: (*a*) When was the Report of the Universities Commission published? (*b*) Is he aware that no action was taken by the previous Government to rectify the glaring defects in the Universities pin-pointed in that Report? (*c*) Did the Commissioners lay most of the blame for the deterioration of the University of Ceylon on the Vice-Chancellor? (*d*) Is he aware that the Vice-Chancellor's conduct has been questioned recently in two cases in the District Court? (*e*) Is he aware that despite the scathing attacks on the Vice-Chancellor in the Report, he has been elected for a third term of office as Vice-Chancellor? (*f*) Will he take immediate steps to arrest the further deterioration of this University? (*g*) What steps does he propose to take to ensure that the University will play a useful role in higher education in this country.

ගාමිණී ජයසූරිය මයා. (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)

(திரு. காமினி ஜயசூரிய—கல்வி, கலாச்சார விவகார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)

(Mr. Gamani Jayasuriya—Parliamentary Secretary to the Minister of Education and Cultural Affairs)

(*a*) On 16.10.63. (*b*) Yes. (*c*) Yes. (*d*) Yes. (*e*) Yes. (*f*) Yes. (*g*) A scheme regarding university

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගාමිණි ජයසූරිය මයා.]

education will also be included in the educational reorganization proposals which will be presented in the near future.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Question No. 13.

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

We want more time.

**ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.**

வினவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்க ஆணையிடப்பட்டது.

*Question ordered to stand down.*

## පූනකරි හා පල්ලයි ආදායම් නිලධාරි කොට්ඨාශයන්හි නීතිවිරෝධි ආගාමිකයින්

*பூநகரி, பலாலி காரியாதிகாரி பகுதிகளிலுள்ள கள்ளக் குடியேற்றக்காரர்*

ILLICIT IMMIGRANTS IN PUNAKARY AND PALLAI D. R. O. DIVISIONS

14. **කා. පො. ඉරත්තිනම් මයා.** (කිලිනොච්චි)
*(திரு. கா. பொ. இரத்தினம்—கிளிநொச்சி)*
(Mr. K. P. Ratnam—Kilinochchi)

අග්‍රාමාත්‍ය සහ රාජ්‍යාරක්ෂක සහ විදේශ කටයුතු ඇමති සහ ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) නීතිවිරෝධි ආගාමිකයින් වැළැක්වීමට හා නීතිවිරෝධි ආගාමිකයින් සිර භාරයට ගැනීම සඳහා දැනට පූනකරි හා පල්ලයි ආදායම් නිලධාරි කොට්ඨාශයන්හි දැනට නවත්වා ඇති යුද්ධ සේනාංක එම ස්ථානවලට යවන ලද්දේ කවදාද? (ආ) එවක් පටන් පූනකරි හා පල්ලයි ආදායම් නිලධාරි කොට්ඨාශයන් තුළ නීතිවිරෝධි ආගාමිකයින් වශයෙන් සළකා කී දෙනෙකු සිරභාරයට ගෙන තිබේද? (ඉ) මෙසේ සිරභාරයට ගන්නා ලද අයගෙන් කී දෙනෙකු නිදහස් කර තිබේද? (ඊ) කී දෙනෙකු නීති විරෝධි ආගාමිකයින් වශයෙන් සලකා ආපසු යවා තිබේද?

*பிரதம அமைச்சரையும் பாதுகாப்பு வெளிவிவகார அமைச்சரையும், திட்டமிடல், பொருளாதார விவகார அமைச்சரையும் கேட்ட வினா: (அ) பூநகரிக் காரியாதிகாரி பகுதியிலும், பளைக் காரியாதிகாரி பகுதியிலும் உள்ள படைவீரர் எப்பொழுது அங்கு சட்டவிரோதக் குடிவரவினரைத் தடுப்பதற்கும், கைது செய்வதற்கும் அனுப்பப்பட்டனர்? (ஆ) அவர்கள் அன்று தொட்டு இன்று வரை அவ்வப்பகுதிகளில் உள்ள ஒவ்வொரு கிராம சேவகர் பிரிவிலும் கைதுசெய்தவர்களின் தொகை யாது? (இ) இவ்வாறு கைது செய்யப்பட்டவர்களில் விடுதலையடைந்தவர்களின் தொகை யாது? (ஈ) சட்டவிரோதக் குடியேற்றக்காரர் என நாடு கடத்தப்பட்டவர் தொகை யாது?*

asked the Prime Minister and Minister of Defence and External Affairs, and Minister of Planning and Economic Affairs : (*a*) When were units of the Army that are stationed presently at the D.R.Os divisions of Punakary and Pallai, sent to those places to check illicit immigration and to arrest illicit immigrants ? (*b*) How many persons were arrested as illicit immigrants in each of the Grama Sevaka divisions in the D. R. Os divisions of Punakary and Pallai since then ? (c) Of those arrested, how many persons were released ? (*d*) How many persons were repatriated as illicit immigrants ?

**ගරු ඩඩ්ලි සේනානායක (අග්‍රාමාත්‍ය සහ ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති සහ ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු පිළිබඳ ඇමති)**
*(கௌரவ டட்லி சேனநாயக்க—பிரதம அமைச்சரும் பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரும் திட்ட அமைப்பு, பொருளாதார விவகார அமைச்சரும்)*
(The Hon. Dudley Senanayake—Prime Minister, Minister of Defence and External Affairs, and Minister of Planning & Economic Affairs)

(*a*) Punakari Division : The navy had been in occupation of the camp from 15 September 1963 to 2 December 1964, and from 3 December 1964, up to date army units are in occupation.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Pallai Division : Units of the army have been in occupation of the camp from 29 October 1963 up to date. (b) Punkari D. R. O's Division : 1 in the Grama-Sevaka's division of Kollakurichchi ; 1 in the Grama-Sevaka's division of Ponnaveli.

Pallai D. R. O's Division : 1 in the Grama-Sevaka's division of Chempianpattu ; 10 in the Grama-Sevaka's division of Pullopallai ; and 2 in the Grama-Sevaka's division of Ittavil. (c) 9 ; 3 unconditionally and 6 pending completion of investigations. (d) 3.

## තහනම් මාර්ගවල දැව දඬු ප්‍රවාහණය කරන වාහන රාජසන්තක කිරීම

## தடைசெய்யப்பட்ட பாதைகள் ஊடாக மரமேற்றிச் செல்லும் வாகனங்களைப் பறிமுதல் செய்தல்

## TRANSPORT OF TIMBER ON PROHIBITED ROUTES : CONFISCATION OF VEHICLES

1. ආචාර්ය එන්. එම්. පෙරේරා (යටියන්තොට—ඩී. පී. ආර්. වීරසේකර මයා. දෙහිඕවිට—වෙනුවට)

*(கலாநிதி என். எம். பெரேரா—யட்டியாந்தோட்டை—திரு. டீ. பீ. ஆர். வீரசேக்கர—தெஹியோவிற்ற சார்பாக)*

(Dr. N. M. Perera—Yatiyantota—on behalf of Mr. D. P. R. Weerasekara—Dehiowita)

ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : නීති විරෝධී ලෙස මත්පැන් ප්‍රවාහණය කිරීම සඳහා යොදවන වාහන, රාජසන්තක කිරීමට නීතියෙන් ඉඩ සලස්වා ඇති හෙයින් තහනම් මාර්ගවල හා වෙනත් ස්ථානවල දැව දඬු ප්‍රවාහණය කිරීමේ යොදවන වාහන රාජසන්තක කිරීම පිණිස නීතියට අවශ්‍ය සංශෝධන කිරීමට එතුමා කටයුතු කරනවාද ?

*காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா : சட்டவிரோதமாய் மதுபானம் ஏற்றிச்செல்வதற்கு அமர்த்தப்படுகின்ற வாகனங்களைப் பறிமுதல் செய்வதற்கு சட்டம் ஏற்பாடு செய்கின்றமையினால், தடைசெய்யப்பட்ட பாதைகளிலும் மற்றைய இடங்களிலும் மரங்கள் ஏற்றிச்செல்வதற்கு அமர்த்தப்படுகின்ற வாகனங்களை பறிமுதல் செய்வதற்கேதுவாக சட்டத்தில் தேவையான திருத்தங்களைச் செய்வதற்கு அவர் நடவடிக்கை எடுப்பாரா?*

asked the Minister of Land, Irrigation and Power : In view of the fact that the law makes provision to confiscate vehicles engaged in illicit transport of liquor, will he take action to effect necessary amendments to the law to confiscate vehicles engaged in transporting timber on prohibited routes and other places ?

සී. පී. ජේ. සෙනෙවිරත්න මයා. (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)

*(திரு. சி. பீ. ஜே. செனெவிரத்ன—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. C. P. J. Seneviratne—Parliamentary Secretary to the Minister of Land, Irrigation and Power)

1. කැලෑ නීති කඩ කිරීමකදී පාවිච්චි කරණු ලැබූ ඕනෑම මෝටර් වාහනයක් රාජසන්තක කිරීමට නියෝග කිරීම සඳහා බලතල, වන ආඥා පණතේ 40 වන වගන්තිය යටතේ දැනටමත් ඇති හෙයින් මෙම ප්‍රශ්නය පැන නොනඟී.

## පොත්දෙනිකන්ද බෙහෙත් ශාලාව, දෙහිඕවිට

## பொத்தெனிக்கந்த மருந்தகம், தெஹியோவிற்ற

## POTHDENIKANDA DISPENSARY, DEHIOWITA

2. ආචාර්ය එන්. එම්. පෙරේරා (ඩී. පී. ආර්. වීරසේකර මයා. වෙනුවට)

*(கலாநிதி என். எம். பெரேரா—திரு. டீ. பீ. ஆர். வீரசேக்கர சார்பாக)*

(Dr. N. M. Perera—on behalf of Mr. D. P. R. Weerasekara)

සෞඛ්‍ය ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) දෙහිඕවිට ඡන්දදායක කොට්ඨාශයේ පොත්දෙනිකන්ද ගමේ ඉදිකර ගෙන යනු ලබන බෙහෙත් ශාලාවේ වැඩ කටයුතු නිම කරන්නේ කවදාද ? (ආ) මෙම කාර්යය සඳහා කොපමණ මුදලක් වෙන් කර තිබේද ? (ඉ) මෙතෙක් කොපමණ මුදලක් වැය කර තිබේද ? (ඊ) මෙම බෙහෙත් ශාලාව විවෘත කරන්නේ කවදාද ? (උ) මෙම බෙහෙත් ශාලාවෙන් කිනම් ගම්වලට සේවයක් සිදු වේද ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය එන්. එම්. පෙරේරා]

சுகாதார அமைச்சரைக் கேட்ட வினா: (அ) தெஹியோவிற்ற தேர்தல் தொகுதியிலுள்ள பொத்தெனிகந்தவிலுள்ள மருந்தகக்கட்டட வேலை எப்பொழுது நிறைவேற்றப்படும்? (ஆ) இத்தேவைக்கென எவ்வளவு தொகை ஒதுக்கப்பட்டுள்ளது? (இ) இற்றைவரை எவ்வளவு பணம் செலவிடப்பட்டது? (ஈ) இம்மருந்தகம் எப்பொழுது திறக்கப்படும்? (உ) இம்மருந்தகம் எவ்வெக் கிராமங்களுக்குச் சேவையாற்றும்?

asked the Minister of Health: (*a*) When will the construction work of the Dispensary at Pothdenikanda in the Dehiowita electorate be completed? (*b*) How much money has been allocated for this purpose? (*c*) How much has been spent so far? (*d*) When will this dispensary be opened? (*e*) What villages will be served by this dispensary?

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන (සෞඛ්‍ය ඇමති)**

*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன—சுகாதார அமைச்சர்)*

(The Hon. M. D. H. Jayawardena—Minister of Health)

(අ) නිමකර ඇත. (ආ) රු. 4,250. (ඇ) රු. 5,000. (ඈ) ග්‍රාම සංවර්ධන සමිතිය විසින් ගොඩනැගිලි භාරදුන් විට. (ඉ) මෙම ශාඛා බෙහෙත්හලින් පහත සඳහන් ගම්වලට සේවය සැලසේ :

1. මාලිබොඩ
2. නක්කාවිට
3. උඩ මාලිබොඩ
4. දික්එලිකන්ද
5. වරකාව
6. පිල්ලවත්ත
7. ඉමේවත්ත
8. පේරුපල්ල
9. මහයාය
10. එල්ලපිට
11. කදව
12. පිලිවෙල
13. හාරදහ
14. පන්දහ
15. ගිඹුරන
16. වේරුව
17. රන්වල
18. උරපනාව
19. මාගල
20. අඳලුව
21. යටිවල
22. නවාන
23. කඳවත
24. ගලපල්ලෙවත්ත
25. පනාවල්කන්ද
26. වත්තේගොඩ
27. පල්ලෙපන්තිය
28. කනුහේන්කන්ද.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**

*(கலாநிதி என். எம். பெரேரா)*

(Dr. N. M. Perera)

When is this to be opened?

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**

*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*

(The Hon. M. D. H. Jayawardena)

First September, as soon as the rural development society hands over the building.

## අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ සභාපති

அனுராதபுரப் பாதுகாப்புச் சபை: தலைவர்

ANURADHAPURA PRESERVATION BOARD: CHAIRMAN

6. **ආචාර්ය එන්. එම්. පෙරේරා**

*(கலாநிதி என். எம். பெரேரா)*

(Dr. N. M. Perera)

අග්‍රාමාත්‍ය සහ රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති හා ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ සභාපතිගේ නම කුමක්ද? (ආ) සංරක්ෂණ මණ්ඩලයේ පරිපාලන හා විධායක කටයුතු කරන පූර්ණ කාලීන, ප්‍රධානියා ඔහුද? (ඉ) ඒ හා සමගම ඔහු ඔහුගේ නීතිඥ වෘත්තියේ කටයුතුත් කරන්නේද? (ඊ) එසේ නම්, නීතිඥයෙකු වශයෙන් වෘත්තියෙහි යෙදෙන අතරම ඔහුට අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ පූර්ණ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කාලීන පරිපාලන හා විධායක ප්‍රධානියෙකු ගේ කටයුතු ප්‍රමාණවත් ලෙස ඉටු කිරීමට හැක්කේ ද ?

*பிரதம அமைச்சரையும் பாதுகாப்பு வெளிவிவகார அமைச்சரையும், திட்டமிடல், பொருளாதார விவகார அமைச்சரையும் கேட்ட வினா : (அ) அநுராதபுரப் பாதுகாப்புச் சபையின் தலைவரது பெயர் என்ன ? (ஆ) சபையின் நிருவாக, நிறைவேற்று வேலைகளைக் கவனிக்கும் முழு நேரத் தலைவராக அவர் கடமையாற்றுகிறாரா ? (இ) அதே நேரத்தில் தொழில் நடாத்தும் ஒரு வழக்கறிஞராகவும் அவர் கடமையாற்றுகின்றாரா ? (ஈ) அவ்வாறாயின் வழக்கறிஞராகத் தொழில் நடாத்துகின்ற அதே சமயத்தில் அநுராதபுரப் பாதுகாப்புச்சபையில் நிருவாக நிறைவேற்று வேலைகளைக் கவனிக்கும் ஒரு முழுநேரத் தலைவராக அவர் ஒழுங்காகக் கடமையாற்ற முடியுமா ?*

asked the Prime Minister and Minister of Defence and External Affairs and Minister of Planning and Economic Affairs: (*a*) What is the name of the Chairman of the Anuradhapura Preservation Board? (*b*) Is he the full time Head of the Board, doing both administrative and executive work? (*c*) Does he simultaneously carry on his work as a practising lawyer? (*d*) If so, can he adequately fulfil, while, practising as a lawyer, the task of a full time administrative and executive Head of the Anuradhapura Preservation Board?

**ගරු ඩඩ්ලි සේනානායක**

*(கௌரவ டட்லி சேனநாயக்க)*

(The Hon. Dudley Senanayake)

(*a*) Mr. K. D. M. C. Bandara. (*b*) No. He works part time only. The General Manager has been delegated all the executive and administrative functions. (*c*) Yes. (*d*) It does not arise in view of (*b*).

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

Question No. 10.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

**ගරු යූ. බී. වන්නිනායක (මුදල් ඇමති)**

*(கௌரவ யூ. பி. வன்னிநாயக்க—நிதி அமைச்சர்)*

(The Hon. U. B. Wanninayake—Minister of Finance)

We want more time.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

*வினாவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்க ஆணையிடப்பட்டது.*

*Question ordered to stand down.*

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

Question No. 11.

**ආර්. ප්‍රේමදාස මයා. (පළාත් පාලන ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. ஆர். பிரேமதாச—உள்ளூராட்சி அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. R. Premadasa—Parliamentary Secretary to the Minister of Local Government)

We require more time.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

*வினாவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்க ஆணையிடப்பட்டது.*

*Question ordered to stand down.*

## ජාතික පේෂකර්ම සංස්ථාව : කපු නූල් මිල දී ගැනීම

தேசிய புடவைக் கூட்டுத்தாபனம் : பருத்தி நூல் கொள்வனவு

NATIONAL TEXTILE CORPORATION : PURCHASE OF COTTON YARN

12. **ආචාර්ය එන්. එම්. පෙරේරා**

*(கலாநிதி என். எம். பெரேரா)*

(Dr. N. M. Perera)

කර්මාන්ත හා ධීවර කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ හෝ පුවත්පත්වල දැන්වීමක් පළ නොකර රුපියල් හැත්තෑ පන් ලක්ෂයක් වටිනා කපු නූල් තොගයක් මිල දී ගැනීමට ජාතික පේෂකර්ම සංස්ථාව තීරණය කළ බව එතුමා දන්නවාද ? (ආ) එතරම් විශාල කපු නූල් තොගයක් මිල දී ගැනීම සඳහා සාමාන්‍ය ටෙන්ඩර් කාර්ය පරිපාටිය අනුගමනය නොකරන ලද්දේ මන්ද ? (ඉ) මෙම කපු නූල් සපයන්නා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය එන්. එම්. පෙරේරා]
කවරෙක්ද? (ඊ) මෙම පිරිනැමුම පිළිගන්නා ලද්දේ කෙසේද?

கைத்தொழில், கடற்றொழில் அமைச்சரைக் கேட்ட வினு: (அ) பத்திரிகை மூலமோ, வர்த்தமானி மூலமே விளம்பரஞ் செய்யாமல் 7½ கோடி ரூபா பெறுமதியான பருத்திநூலை வாங்குவதற்கெனத் தேசிய புடவைக் கூட்டுத்தாபனம் தீர்மானித்ததென்பதை அவர் அறிவாரா? (ஆ) அத்தகைய பெருந்தொகையான பருத்திநூலை இக்கூட்டுத்தாபனம் வாங்குகையில் வழக்கமான கேள்விப்பத்திர நடைமுறை கடைப்பிடிக்கப்படாததேன்? (இ) இப்பருத்திநூலை வழங்குபவர் யார்? (ஈ) இக்கொடை ஏற்றுக்கொள்ளப்பட்டதெவ்வாறு?

asked the Minister of Industries and Fisheries: (a) Is he aware that the National Textile Corporation decided to purchase Rs. 7½ million worth of cotton yarn without an advertisement in the Gazette or in the press? (b) Why was the normal tender procedure not adopted by this Corporation for the purchase of such a large volume of cotton yarn? (c) Who is the supplier of this cotton yarn? (d) How was this offer accepted?

ඩී. ෂෙල්ටන් ජයසිංහ මයා. (කර්මාන්ත හා ධීවර ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)
(திரு. டீ. செல்ற்றன் ஜயசிங்க—கைத்தொழில், கடற்றொழில் அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)
(Mr. D. Shelton Jayasinghe—Parliamentary Secretary to the Minister of Industries and Fisheries)

(a) Yes. (b) This was the first consignment of yarn that was being imported by the corporation in terms of a Government decision that the corporation should be the sole importer of cotton yarn. A substantial portion of yarn imports in the past had been done by the Department of Rural Development and Small Industries which had over the years built up a special panel of 53 suppliers. This panel had been selected by the department after checking the credentials of a large number of suppliers, and as they had proved satisfactory, the department had adopted the practice of calling for quotations only from these suppliers. As the corporation was entering the field of yarn imports for the first time and in order to be assured of reliable suppliers and avoid unnecessary delays, the board decided that the quotations for the first consignment should be confined to the D.R.D's approval panel of suppliers especially as this consignment was only for about two months' supply. But for this variation, all the usual safeguards of normal tender procedure have been adopted. The question of calling for world-wide tenders for the rest of the supply is receiving the attention of the board. (c) A total quantity of 1,378,000 lbs. of different counts of cotton yarn valued at Ceylon rupees 5,308,196.56 has been ordered from six suppliers as follows:

| | | | | |
|---|---|---|---|---|
| (1) Messrs. Indo Burma Trading Corporation, Bombay .. | 1,026,000 lbs. | —value (Ind.) | | Rs. 4,165,161.00 |
| (2) Messrs. Keshavlal Talakchand (Pvt.) Ltd. Madras .. | 229,800 lbs. | —value (Ind.) | | Rs. 670,494.00 |
| (3) Messrs. M. M. Mohamed & Co., Madras .. .. | 22,000 lbs. | —value (Ind.) | | Rs. 53,900.00 |
| (4) Messrs. Mittersain Rupchand, Bombay .. .. | 84,600 lbs. | —value (Ind.) | | Rs. 354,086.00 |
| | 1,362,400 lbs. | — | Indian<br>Ceylon | Rs. 5,243,641.00<br>Rs. 5,240,494.82 |
| (5) Messrs. Crescent Textile Mills Ltd., Pakistan .. | 10,800 lbs. | —value (Ceylon | £ 1440-0-0d. Rs. 19,266.90) | |
| (6) Messrs. C. Itoh & Co., Japan.. | 4,800 lbs. | —value (Ceylon | £ 3620-0-0d. Rs. 48,434.84) | |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(*d*) Those offers not complying with the conditions laid down in the quotation forms were rejected and from among the others the lowest offers conforming to specifications were accepted.

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

Can you tell me whether any of these suppliers of yarns are local agents ?

ෂෙල්ටන් ජයසිංහ මයා.
*(திரு. ஷெல்றன் ஜயசிங்ஹ)*
(Mr. Shelton Jayasinghe)

According to my information I am unaware whether they are local agents or not. If the hon. Member wishes to I could verify that and give him a reply at a later date.

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

I would like you to find out. The next point is this : is the value of the various types of yarn per yard really determined according to the various counts and so on, or is there any other basis of determination ? For instance, the Madras quotation is higher than the other quotations.

ෂෙල්ටන් ජයසිංහ මයා.
*(திரு. ஷெல்றன் ஜயசிங்ஹ)*
(Mr. Shelton Jayasinghe)

It is fixed purely on the qualities of the counts.

## විසර්ජන කෙටුම්පත් පනත 1965-66

### *ஒதுக்கீட்டு மசோதா, 1965-66*

### APPROPRIATION BILL, 1965-66

කල් තබන ලද විවාදය තව දුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී. ඊට අදාල ප්‍රශ්නය [අගෝස්තු 9.]

"කෙටුම්පත් පණත දැන් දෙවනවර කියවිය යුතුය"—[ගරු වන්නිනායක.]

ප්‍රශ්නය සළින් සභාභිමුඛ කරන ලදී.

விஞ மீதான ஒத்திவைக்கப் பெற்ற விவாதம் மீள ஆரம்பிப்பதற்கான கட்டளை வாசிக்கப்பட்டது.—[9, ஓகஸ்ட்]

"மசோதா இப்பொழுது இரண்டாம் முறை மதிக்கப் படுமாக".— [கௌரவ வன்னிநாயக்க.]

விஞ மீண்டும் எடுத்தியம்பப் பெற்றது.

*Order read for resuming Adjourned Debate on Question.—[9th August].*

"That the Bill be now read a Second time".—[*Hon. Wanninayake.*]

*Question again proposed.*

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

I should like to give hon. Members an indication of the time already consumed. Out of the time allotted to the Government 10 hours and 28 minutes have been already consumed leaving 14 hours while the Opposition has already taken 14 hours and 52 minutes leaving 21 hours.

පූ. භා. 10.20

ලෙස්ලි ගුණවර්ධන මයා. (පානදුර)
*(திரு. லெஸ்லி குணவர்தன—பாணந்துறை)*
(Mr. Leslie Goonewardene—Panadura)

ගරු කථානායකතුමනි, අය වැය ලේඛනය පිළිබඳ දෙවන වර කියවීමේ විවාදය ආරම්භ වී දැන් මැදක් තරමට වාගේ පැමිණ තිබෙනව. ඒ කියන්නෙ, තුන් වන වෙන් කළ දිනයේ සාකච්ඡාවත් අවසන් වී තිබෙනව. එම නිසා මේ වන තෙක් මෙම විවාදය කුමන ආකාරයකට පවත්වා ගෙන ගොස් තිබෙනවාද කියන එක ගැන මොහොතකට සිත් යොමු කර බැලිය යුතුව තිබෙනව.

ප්‍රථමකොටම මෙම විවාදය පිළිබඳව යමක් ප්‍රකාශ කළ යුතුව තිබෙනව. එනම්, මට පෙනී යන හැටියට මෙතෙක් දුර මෙම විවාදයට සහභාගි වූ ගරු මන්ත්‍රීවරුන් මෙය එක්තරා උසස් මට්ටමකින් පවත්වා ගෙන ගොස් තිබෙනවාය කියන එකයි. ඒ මට්ටම පහළට වැටෙන්න ඉඩ නොතබා කෙළෙවර දක්වාම ඒ තත්ත්වයෙන් මෙම විවාදය ගෙන යනවා ඇත කියා අප

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

කවුරුත් විශ්වාස කරනව. විරුද්ධ පාර්ශ්ව යෙන් මෙම විවාදයෙදි ඉදිරිපත් කළ විවේචනවලින් මූලික විවේචනය හැටියට සැලකිය හැක්කෙ මෙයයි : මෙම අයවැය ලේඛනය මීට පෙර ඉදිරිපත් කරන ලද අයවැය ලේඛන වාගෙ නොවෙයි. මෙය, පෞද්ගලික ධනපතියන්ට, සහ ධනපති කොම්පැනිවලට, කෙටියෙන් කියනව නම් ධනපති පන්තියට අයබදු අතින් විශාල සහනයක් ලබා දී තිබෙන අයවැය ලේඛන යක් හැටියට සලකන්න පුළුවනි. ඒ වාගේ ම මෙම අයවැය ලේඛනයෙන් දක්වෙන අපේ රටේ සංවර්ධනය පිළිබඳ දර්ශනය කුමක්ද ? එය සම්පූර්ණයෙන්ම වාගෙ පෞද්ගලික ප්‍රාග්ධනය මාර්ගයෙන් නැති නම් ධනපති මාර්ගවලින් ඇති කිරීමට සකස් කර තිබෙන දර්ශනයක්ය කියන විවේචනයත් විරුද්ධ පාර්ශ්වයෙ මූලික විවේචන අතර තිබෙන බව මට පේනව. එහෙත් මේ අවස්ථාවේදී මා ඒ සම්බන්ධව කථා කරනවා වෙනුවට තරමක් දුරට මේ දක්වා මෙම විවාදයේදී වැදගත් කාරණයක් හැටියට ඉදිරිපත් නොවූ තවත් පැත්තක් ඉදිරිපත් කිරීමට කල්පනා කරනව. ඒ පැත්ත සමහරවිට මා පෙර කී ඒ මූලික විවේචනයත් වගේම වැදගත් පැත්තක් වන්ට පුළුවනි. කෙසේ වෙතත් මා ඉදිරිපත් කරන්ට අදහස් කරන විවේචනය පෙර කී විවේචනවලට වඩා මූලික විවේචනයක් යයි මා විශ්වාස කරනව. පෙර කරන ලද විවේචනවලින් පැන නගින ප්‍රශ්නවලට වඩා මූලික ප්‍රශ්න මා ඉදිරිපත් කරන්ට යන විවේචනයෙන් පැන නගිනවාද යන්න විනිශ්චය කිරීම මා මේ ගරු සභාවට පවරනවා.

මේ අළුත් පැත්ත කුමක්ද ? කථානායක තුමනි, මේ අයවැය ලේඛනය දෙස බලන විටත්, රටේ තත්ත්වය දෙස බලන විටත් අද රටේ පැන නැගී තිබෙන මූලික ප්‍රධාන ප්‍රශ්නය—අර්බුදයක් වශයෙන් පැන නැගී තිබෙන ප්‍රශ්නය—රටේ අභ්‍යන්තර මුදල් ප්‍රශ්නයක් නොව විදේශ විනිමය ප්‍රශ්න යක් බව අප කාටත් පෙනී යනවා ඇතැයි මා හිතනව. කෙසේ වෙතත් ශ්‍රී ලංකා මහ බැංකුව 1964 වර්ෂය පිළිබඳව ඉදිරිපත් කරන ලද වාර්තාවෙන් නම් එය සිළි ගන්හ බව පෙනී යනව. එහෙත් අද අපේ රටේ විශාලම ප්‍රශ්නය හැටියට තිබෙන්නේ විදේශ විනිමය ප්‍රශ්නයය, අනිකුත් ප්‍රශ්න වලට ප්‍රධාන හේතුව හැටියට ඉදිරිපත් වී තිබෙන්නේ විදේශ විනිමය ප්‍රශ්නයය කියන එක මුදල් ඇමතිතුමාගේ අයවැය කථාවෙන් පෙනී යන්නෙ නැහැ. මූලික ප්‍රශ්නය හැටියට එතුමාගේ කථාවෙන් එතුමා ඉදිරිපත් කරන්නේ වෙනත් කාරණයක්. 1965 අගෝස්තු 9 වැනිදා හැන්සාඩ් වාර්තාවේ 49 වෙනි තීරුවේ එතුමාගේ කථාවේ ඉංග්‍රීසියෙන් මෙසේ කියනව :

"The economy was in the grip of inflationary pressures created by large-scale deficit financing and unrestricted commercial bank credit expansion."—[OFFICIAL REPORT, 9th August 1965; Vol. 61, c. 49.]

එතුමා අපට සපයා තිබෙන අය වැය කථාවේ සිංහල අනුවාදයේ 1 වැනි පිටුවේ ඒ කොටස මෙසේ දක්වා තිබෙනවා :

" විශාල හිඟ සහිත වූ රජයේ අය-වැය ලේඛනය නිසාත්, වෙළඳ බැංකු ණය අධික වීම නිසාත්, ඇති වූ උද්ධමන පීඩනයන්ගෙන් ආර්ථිකත්වය පෙළෙන්නට වුණා."

නමුත් කථානායකතුමනි, අපේ මුදල් ඇමතිතුමාම හුඟක් දුරට විශ්වාසය තබන ශ්‍රී ලංකා මහ බැංකුවේ 1964 වර්ෂය පිළිබඳ වාර්තාව දෙස බලන විට ඊට වඩා වෙනස් තත්ත්වයක් තමයි, දක්නට ලැබෙන්නෙ. ඒ වාර්තාවේ 3 වෙනි පිටුවේ මෙසේ කියා තිබෙනව :

"Successive reports of the Central Bank have drawn attention to the fiscal and monetary expansion that has been taking place in recent years. This expansion had its repercussions successively on the country's external reserves and its domestic price level—repercussions which were intensified by persistent unfavourable movements in Ceylon's terms of trade.

මේකෙ වැදගත් වාක්‍යය ඒකයි.

Nevertheless Ceylon's present difficulties are not of a kind that can be overcome by a slowing down of the monetary-fiscal expansion alone. The depletion of external reserves has helped bring to the surface problems of a more basic character . . . ."

මා ඒ කියවූයේ 1965 වර්ෂයේදී පිටවූ 1964 වර්ෂය පිළිබඳ ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්තාවෙන්. මුදල් ඇමතිතුමා ඒ වාර්තාව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අනුව තමයි, හුඟක් දුරට අයවැය ලේඛනය සකස් කර තිබෙන්නේ. එසේ නම් ඇයි, මුදල් ඇමතිතුමා විදේශ විනිමය පිළිබඳ ප්‍රශ්නය ප්‍රධාන කාරණය හැටියට ඉදිරිපත් නොකළේ? මේකෙ පැහැදිලිව ප්‍රකාශ වන්නේ මූලික කාරණාව හැටියට වෙන හේතු තිබෙනවාය කියායි. ඇත්ත වශයෙන්ම ඒ වෙන හේතු මොනවාද? මුදල් ඇමතිතුමා පාවිච්චි කරන සිංහල වචන වලින් කියනවා නම් "විදේශ වෙළඳ අනුපාතය" අපේ අවාසියට හැරී තිබෙන වාය කියනවා. මා ඒකට කියන්නට සතුටුයි, පසුගිය වර්ෂ ගණනක කාලය තුළදී අපේ විදේශ වෙළඳ හුවමාරු මිනුම අපේ අවාසියට හැරී තිබෙනවාය කියා. ඒ කියන්නේ අපේ අපනයන භාණ්ඩවල වටිනාකම පහළ බැස තිබෙනවා. ආනයන භාණ්ඩවල, මේ රටට ගෙන්වන භාණ්ඩ වල වටිනාකම වැඩිවී තිබෙනවා. ඒ නිසා විදේශ විනිමය හිඟයක් ඇතිවී තිබෙනවා. මේක තමයි මූලික ප්‍රශ්නය. ඇත්ත වශයෙන්ම මේ ප්‍රශ්නය මූලික වැදගත් ප්‍රශ්නයක් බව අපේ ගරු මුදල් ඇමතිතුමා සවකීය අයවැය කථාවෙන් පිළිගන්නවා. එතුමා එසේ පිළිගත්තේවී නමුත් ඒ අතරම මට පිළිගන්නට බැරි කාරණයකුත් තිබෙනවා. එනම් මේ ප්‍රශ්නය, අපේ විදේශ විනිමය හිඟවීමේ ප්‍රශ්නය ප්‍රධාන ප්‍රශ්නය නොවෙයි, එය එක් ප්‍රශ්නයක් පමණයි කියා මුදල් ඇමතිතුමා කියනවා. හැන්සාඩ් වාර්තාවේ 58 වන පිටුවේ එතුමා මෙහෙමයි කියන්නෙ:

"This deterioration in the terms of trade was a contributory factor to the balance of payments difficulties in 1964."—[OFFICIAL REPORT, 9th August 1965; Vol. 61, c. 58.]

අයවැය කථාවේ සිංහල අනුවාදයේ 9 වන පිටුවේ සඳහන් වන්නේ මෙහෙමයි:

"............විදේශ වෙළඳ අනුපාතයෙහි ඇතිවුණු මේ පිරිහීම 1964 හිදී ගෙවීම් ශේෂයෙහි ඇතිවුණු දුෂ්කරතාවන්ට හේතුවුණු එක් කාරණයක්."

මේ අනුව මුදල් ඇමතිතුමා කියන්නේ ඒ ප්‍රශ්නය එක් කාරණයක් පමණක්ය කියායි. නමුත් ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්තාව දෙස බලනවා නම් අපට පෙනී යන්නේ ඊට වඩා හාත්පසින්ම වෙනස් පැත්තකුයි. ඒ ගැන මහ බැංකුවේ වාර්තාවේ 5 වන පිටුවේ සඳහන්වී තිබෙන්නේ මෙහෙමයි:

"The monetary-fiscal expansion which commenced during the late fifties, in the background of a liberal policy of import licensing, contributed towards a relatively precipitate decline in external reserves."

මුදල් ඇමතිතුමා කියන්නේ විදේශ වෙළඳ අනුපාතය ප්‍රධාන කාරණයක් නොවේය, එය එක් කාරණයක් පමණක්ය කියායි. නමුත් මහ බැංකුවේ වාර්තාවේ තිබෙන්නේ එය ප්‍රධාන කාරණයක් හැටියටයි. ඊළඟට ඒ වාර්තාව අනුව වැඩිපුර කාරණා හැටියට ඉදිරිපත් කරන්නට පුළුවන් වන්නේ, පසුගිය වර්ෂවලදී ආණ්ඩු හිඟ අයවැය ලේඛන ඉදිරිපත් කිරීම, බැංකු විසින් වුවමනාවට වඩා ණය මුදල් දීම, ආදීයයි. නමුත් ඒවා ප්‍රධාන කාරණා හැටියට ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්තාවෙන් නම් පෙන්වන්නෙ නැහැ. ඒ නිසා මුදල් ඇමතිතුමා තමාගේ අයවැය ලේඛනයේ එකට දමන්නට තිබුණු එක දෙකට දමා තිබෙන්නේ මක්නිසාද කියා මා අසන්නට සතුටුයි. එතුමා එකට දමන්නට තිබුණු එක දෙකට දමා තිබෙනවා. ඒ මක්නිසාද? මෙසේ කරන්නට හේතු කීපයක් තිබෙන බව අප දන්නවා. අප එතුමාට දොස් කියන්නෙ නැහැ. ඒ හේතු අපට තේරුම් ගන්නට ඉතාමත් ලෙහෙසියි. එකක් නම් මුදල් ඇමතිතුමා එයින් විරුද්ධ පාර්ශවයට දේශපාලන පහරක් ගසන්නට කල්පනා කිරීමයි. ඒ නිසා මෙසේ එකට දමන්නට තිබුණු එක දෙකට දමා තිබෙන්නේ මක්නිසාද යන්න අපට ඉතාමත් පැහැදිලියි. එය අපේ රටේ සම්පූර්ණයෙන්ම දේශපාලන සිරිතක් වී තිබෙන නිසා එයට අප දොස් කියන්නෙ නැ; නමුත් ඊට වඩා භයානක කරුණක් පෙන්වා දිය යුතුව තියෙනවා. මා මතක් කරන්නට අදහස් කරන්නේ ඒකයි. අංක 1 ට දැමිය යුතුව තිබුණු කරුණ අංක 2 ට දැමීමෙන්, අංක 1 දරණ කරුණෙන් පැන නැඟින වැදගත් ප්‍රශ්නවලට මුහුණ දී ක්‍රියා නොකිරීමට ඉඩ ප්‍රස්තාවක් ගරු මුදල් ඇමති තුමා විසින් ඇති කර තිබෙනවා. අංක 1 දරණ කරුණ වන්නේ අපගේ විදේශ විනිමය ප්‍රමාණයේ මූලික හේතුව වන විදේශ වෙළඳ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

අනුපාතයයි. ඊට අප මුහුණ දී එය විසඳන්නට නැත් කොළොත් සමහර විට අධිරාජ්‍යවාදීන්ට ඔලුව උස්සන්නට බැරි වන විධියේ වැඩ පිළිවෙලක් ඇති කරන්නට සිදු වෙනවා. තමන් අනුගමනය කරන, අවවාද උපදෙස් ගන්න, ශ්‍රී ලංකා මහ බැංකුවේ තීන්දුවටත් පටහැනි වන වෙනස් විධියේ කථාවක් ගරු මුදල් ඇමති තුමා විසින් මෙහි කර තිබෙන්නේ ඒ නිසාද කියා මම ප්‍රශ්න කරනවා. ඇත්ත වශයෙන්ම විදේශ වෙළෙඳ අනුපාතයේ ප්‍රමාණය අපේ රටේ ඉතාමත් බැරෑරුම් ප්‍රශ්නයක් වී තිබෙනවා. මේ සම්බන්ධයෙන් වෙන කාගේවත් කථා ඉදිරිපත් කරන්නට වුවමනාවක් නෑ. ගරු මුදල් ඇමති තුමා විසින්ම මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් මෙසේ කියා තිබෙනවා. 1965 අගෝස්තු මස 9 වැනිදා හැන්සාඩ් වාර්තාවේ 56 වැනි පිටුවෙහි එය මේ විධියට සඳහන් වී තිබෙනවා :

"The increase in the value of imports was also caused by the increase in import prices. Average import prices which rose by 10 per cent in 1963 rose by a further 2 per cent in 1964 to the highest level since 1957."—[OFFICIAL REPORT, 9th August 1965 ; Vol. 61, c. 56]

ඒ එක්කම තව ටිකක් එහායින් මුදල් ඇමති තුමා මෙසේත් කියා තිබෙනවා :

"Ceylon's terms of trade suffered a deterioration of 9 per cent in 1963 as a result of the sharp increase in import prices in that year. The year 1964 saw a further deterioration in the terms of trade of 3 per cent."—[OFFICIAL REPORT, 9th August, 1965 ; Vol. 61, c. 57.]

ඒ සමගම, පිටරටින් මෙරට ගෙන්වන භාණ්ඩවල මිළ වැඩි වී තිබෙන බවත් ගරු මුදල් ඇමති තුමා විසින් 58 වැනි පිටුවෙහි දක්වා තිබෙනවා. ඒකත් බොහොම වැදගත් කරුණක්. තේ ගැන සඳහන් කරන එතුමා, විදේශ විනිමය ලබා ගන්නා වැදගත් නිෂ්පාදනයක් වන තේ පසුගිය අවුරුදු 10 ඇතුළදී—1954 සිට 1964 දක්වා නිෂ්පාදන ප්‍රමාණයෙනුත් අපනයන ප්‍රමාණයෙනුත් සියයට 26 කින් වැඩි වී තිබෙන බව සඳහන් කරනවා. නමුත් තේවල මිළ සියයට 19 කින් අඩු වී තිබෙනවා. ඒ වගේම මේ අවුරුදු 10 ඇතුළතදී පිටරට යවන රබර් ප්‍රමාණය සියයට 20 කින් වැඩි වුණ බව කියා තිබෙනවා. නමුත් රබර් මිළ සියයට 17 කින් අඩු වී තිබෙනවා. පිටරට යවන පොල් ප්‍රමාණය සියයට 41 කින් වැඩි වී තිබෙන නමුත් පොල්වල මිළ සියයට 7 කින් අඩු වී තිබෙනවා.

මේ කරුණු අනුව බලන විට ඇත්ත වශයෙන්ම අපේ රටේ ආර්ථික තත්ත්වය ගරු මුදල් ඇමති තුමා කියා තිබෙනවාටත් වඩා නරක බව පෙනී යනවා. පසුගිය අවුරුද්දේ අප විසින් පාවිච්චි කරන්නට යෙදුණු භාණ්ඩවලින් සියයට 50 කට කිට්ටු වන ප්‍රමාණයක් පිටරටවලින් ගෙන්වා තිබෙනවා. ඒ නිසා ජාත්‍යන්තර වෙළෙඳාමෙන් රජේ රට රැකෙනවායයි කියන්නට පුලුවනි. එපමණකුත් නොවෙයි, පිටරට යවන භාණ්ඩවල වටිනාකමෙන් සියයට 67 ක්—තුනෙන් දෙකකටත් වැඩිය ලැබෙන්නේ තේවලින්. ඒ නිසා තේ පිළිබඳව පමණක් වුවත් බැලීමෙන් මේ ප්‍රශ්නය කොතරම් බැරෑරුම් තත්ත්වයකට පැමිණ තිබෙනවද යන්න අපට වැටහෙන්න ඕනෑ. ගරු මුදල් ඇමතිතුමා විසින් තෝරා ගන්නා ලද පරිදි 1954 සහ 1964 යන වර්ෂ දෙක මාත් තෝරා ගන්නව. මා මේ සංඛ්‍යා ලේඛන ආදිය ලබා ගත්තෙ ශ්‍රී ලංකා මහා බැංකු වාර්තාවෙනුත්, තේ කොමසාරිස්වරයගෙ පාලන වාර්තාවෙනුත් බව සඳහන් කරන්න කැමතියි. ඒ වාර්තාවලට අනුව අප විසින් 1964 අවුරුද්දෙදි, දළ වශයෙන් බලනවා නම්, තේ රාත්තල් "මිලියන්ස්" හෙවත් දශ ලක්ෂ 450 ක් පිටරට යවා තිබෙනව. ඒ කියන්නෙ ඒ අවුරුද්දෙ අප යැවූ තේ රාත්තල් ගණන කෝටි 45 යි. අප යැවූ තේ රාත්තල් කෝටි 45 සඳහා රුපියල් "මිලියන්ස්" හෙවත් දශලක්ෂ 1142 ක් අපට ලැබී තිබෙනව. ඒ කියන්නෙ රුපියල් කෝටි 114 යි.

අවුරුදු 10කට පෙර, ඒ කියන්නෙ 1954 අවුරුද්දෙදි අප පිටරට යැවූ තේ ප්‍රමාණය ගැන බලමු. 1954දී තේ රාත්තල් "මිලියන්ස්" හෙවත් ලක්ෂ 350ක් පමණයි පිටරට යවා තිබෙන්නෙ. ඒ කියන්නෙ රාත්තල් කෝටි 35යි. 1964 දී පිටරට යැවූ ප්‍රමාණයට වඩා තේ රාත්තල් කෝටි 10ක් අඩුවෙනයි 1954දී පිටරට යවා තිබෙන්නෙ. ඒ කොයි හැටි වෙතත් ලැබුණු ආදායම කොපමණද ? තේ රාත්තල් කෝටි 35ට ලැබුණු රුපියල් කෝටි 123.8ක් හෙවත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

"මිලියන්ස්" 1238ක්. වෙනත් ක්‍රමයකට කියතොත්, 1964 අවුරුද්දෙදි කෝටි 45කට රුපියල් කෝටි 114ක් ලැබූ අපට 1954 අවුරුද්දෙදි කෝටි 35කට රුපියල් කෝටි 123ක් ලබා ගන්න පුළුවන් වුණා. රාත්තල් ගණන කෝටි 10කින් අඩු වුවත් මුදලින් කෝටි දහයක් පමණ වැඩිපුර ලැබී තිබෙනව. එනකොට 1964, 1954 අවුරුද්දත් සමග එකට ගෙන සංසන්දනය කර බලන විට 1964 දි කෝටි දහයක් වැඩිපුර යැවූ නමුත් 1954ට වඩා කෝටි දහයක් අඩුවෙන් ලැබී ඇති බව පෙනී යනව. ඉතින් මේක පුදුම තත්ත්වයක්. ඇත්ත වශයෙන්ම ඒක එහෙම නම් මුදල් කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා වෙන හේතුවක් සොයා යන්න වුවමනා නැහැ. බැංකුවලින් වැඩියෙන් ණය දී තිබෙනවය කියාවත්, හිඟය හුඟක් තිබුණු අයවැය ලෙබන තිබුණාය කියාවත් කියන්න වුවමනාවක් නැහැ. මුදල් අර්බුදයට හේතුවක් වශයෙන් මෙය පමණක් ගෙනාවත්, හොඳටම ප්‍රමාණවත්ය කියා කල්පනා කරන්න පුළුවනි.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

පසුගිය අවුරුදු දහයෙදි මොකක්ද කළේ ?

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

මම ඒක කියන්නම්. වෙන කාරණයක් නිසා නොවෙයි මේ විදේශීය විනිමය පිළිබඳ ප්‍රශ්නය ඇති වෙලා තියෙන්නෙ, විදේශීය වෙළඳ අනුපාතය අපට අවාසි අතට හැරී තිබුණු නිසයි. එය අපට පමණක් සීමා වූ දෙයක් නොවෙයි. හැම රටකටම සාධාරණ වූ දෙයක්. විශේෂයෙන්ම පසුගිය මහා යුද්ධයෙන් පස්සෙ එවැනි තත්ත්වයක් හැම රටකටම වාගේ ඇති වී තිබෙනව. යටත් විජිතයක් වශයෙන් තිබී දේශපාලන වශයෙන් නිදහස ලබා ගත්—එහෙත් ආර්ථික වශයෙන් නම් තවමත් බැමිවලට යටත් වෙලා ඉන්න—අප රට වැනි රටවල් සූරා කෑම සඳහා ඇති කර තිබෙන ප්‍රධාන මාර්ගය කුමක්දැයි අප තෝරා ගන්න ඕනෑ. අප රට වැනි රටවල් සූරා කෑවේ ප්‍රධාන වශයෙන් මුදල් තැන්පත් කරලයි. මුදල් තැන්පත් කර එයින් ලැබෙන ලාභය සූරාගෙන කෑමෙන් තමයි යුද්ධයට පෙර යුගයෙදි මෙවැනි රටවල් සූරා කෑම කරගෙන ගියෙ. එහෙත් දේශපාලනය නිදහස ලැබුණට පස්සෙ අප සූරා කෑමේ ප්‍රධාන මාර්ගය හැටියට දැන් පාවිච්චි කරන්නෙ වෙළඳාමේදී ඇති වන මේ "ටර්මස් ඔෆ් ට්‍රේඩ්" එහෙම නැත්නම් ගරු මුදල් ඇමතිතුමා විසින් පාවිච්චි කරනු ලබන වචනවලින්ම කියනවා නම් "විදේශීය වෙළඳ අනුපාතය"යි. කාර්මික භාණ්ඩවල මිළ නඟිනවා, මූලික ද්‍රව්‍යවල මිළ බහිනවා. ගරු මුදල් ඇමතුමා පාවිච්චි කර තිබෙන්නෙ, ප්‍රාථමික භාණ්ඩ මිළ බහිනවා යන්නයි.

මුදල් ඇමතිතුමාත් මෙය පිළිගන්නවා. එතුමාගේ කථාවේ මෙන්න මේ විදියට කියා තිබෙනවා :

"There is no evidence to believe that there will be an improvement in the prices of our principal exports in 1965. On the contrary, the available evidence indicates that there would be a fall in tea and rubber prices."—[OFFICIAL REPORT, 9th August 1965 ; Vol. 61, c. 55.]

එතුමා කියන්නේ නැහැ, මෙය තාවකාලිකව සිද්ධ වූ දෙයක්ය කියා. ඉදිරියටත් මෙය බලපාන්න පුළුවන්යයි එතුමා කියනවා මෙන්න එතුමාගේ වචන :

"The present indications are, therefore, that there will be a further weakening in export prices which would cause either a fall in the export earnings or an increase in export earnings much more modest than in 1964."—[OFFICIAL REPORT, 9th August 1965 ; Vol. 61, c. 56.]

අපේ අපනයන භාණ්ඩවල මිළ තවත් බහින්න පුළුවන්යයි එතුමා කියනවා. ඒ අතර කාර්මික භාණ්ඩවල මිළ නඟින්න පුළුවන්යයි කියනවා. 57 වන තීරුවේ මේ විදියට කියා තිබෙනවා :

"The prices of manufactured goods in world trade which is determined mainly by the principal industrial countries has shown a gradual upward trend over the recent years."

එනකොට මේ ප්‍රශ්නය පැහැදිලියි. මා කලින් කිව්වාක් මෙන් මේ තත්ත්වය පවතින්නේ අපේ රටේ පමණක් නොවෙයි. අනික් නොදියුණු රටවලිත් තත්ත්වය ඒකයි. GATT සංවිධානය මගින් ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

සකස් කරන ලද ලේඛනයකින් කොටසක් මම දැන් කියවන්නම්. මෙය ප්‍රංශ භාෂාවෙන් තුබුණු ලේඛනයකින් සකස් කර ගත්තේ. මේ ගණන් ඇත්තේ ඩොලර්ස් "මිලියාඩ්ස්" වලින්; in milliards of dollars.

Import capacity of under-developed countries, that is, export values less export of profits:

| | |
|---|---|
| 1953 | 11.3 |
| 1954 | 11.6 |
| 1955 | 12.4 |
| 1956 | 12.1 |
| 1957 | 11.3 |
| 1958 | 11.8 |

Imports from U.S.A. and Western countries:

| | |
|---|---|
| 1953 | 12.4 |
| 1954 | 13.6 |
| 1955 | 14.8 |
| 1956 | 16.0 |
| 1957 | 18.7 |
| 1958 | 18.0 |

Capital imports less long term private capital:

| | |
|---|---|
| 1953 | 1.6 |
| 1954 | 2.0 |
| 1955 | 2.5 |
| 1956 | 2.9 |
| 1957 | 5.2 |
| 1958 | 5.2 |

මේ සංඛ්‍යා ලේඛන දෙස බලන විට නොදියුණු රටවලට මේ වෙළඳාමෙන් අවාසියක් ඇති බව පෙනෙනවා. ඒ වෙළඳ අවාසිය යම්තම් පියවෙන්න තමයි, ආධාර ලැබී ඇත්තේ. ඒ නිසා බටහිර රටවල් 1953 සිට 1958 දක්වා යම් කිසි මුදලක් ආධාර වශයෙන් දුන්නා නම් අර වෙළඳ අවාසිය නිසා එය අහෝසි වී යනවා. අපෙන් කොල්ලාකාගත්, වෙළඳාමෙන් අයුතු විදියට සූරාගත්, මුදල් ආපසු දීමක් පමණයි, මේ ආධාර දීමයයි කියන්නේ.

පසු ගිය මහා යුද්ධයෙන් පස්සෙ ජාත්‍යන්තර සම්මේලන කීපයක්ම පැවැත් වූ අතර ඒ සෑම සම්මේලනයකදීම මේ ගැන සාකච්ඡා වුණා. ඒ සෑම සම්මේලනයකටම අපේ රට වැනි රටවලින් ගිහින් කියනවා, "අනේ අපේ බඩුවලට හරි මිලක් දෙන්නෙ නැත්නම් අපට කිසිවක් කරන්න බැරිය, ඒ නිසා මේ සඳහා මොන විධියේ හෝ වැඩ පිළිවෙළක් කරන්න"ය කියා. සාකච්ඡා කරනවා පමණයි, ඒ ගැන කිසිම තීරණයකට එළඹෙන්නෙ නැහැ. මේ පවතින ක්‍රමය අනුව කවදාවත් තීරණයකට එළඹෙන්න පුළුවන්කමකුත් නැහැ. ඊට හේතුව මොකක්ද? මම තමුන්නාන්සේලාට කලිනුත් කිව්වා, අපේ රටවල් සූරා කෑමට අධිරාජ්‍යවාදීන් විසින් යොදාගෙන තිබෙන අමුතු වැඩ පිළිවෙළ අත හරින්නෙ නැති බව. දැන් ඉස්සර වගේ රටවල් සූරා කන්න බැරි නිසා ඒ සඳහා අලුත් පිළිවෙළක් සොයාගෙන තිබෙනවා. මේ අර්බුදයෙන් බේරෙන්න නම් අප විසින් කළ යුතුව ඇත්තේ අපේ ආර්ථික ක්‍රමයේ සවභාව වෙනස් කිරීමයි. තේ, රබර්, පොල් යන ප්‍රාථමික ද්‍රව්‍ය තුන කෙරෙහි අපේ තිබෙන ගැතිකම අත් හැර, ඒ තත්ත්වය වෙනස් කර, අපේ ආර්ථික ක්‍රමයට වෙන අංශවලින් වැදගත් ස්ථානයක් දෙන්නට පුළුවන් වන පරිදි අපි තත්ත්වය වෙනස් කරන්න ඕනෑ. ඉංග්‍රීසියෙන් විස්තර කරනවා, Diversification of the economy කියා. ඒ කියන්නේ අපේ ආර්ථික ක්‍රමය විවිධ අංශවලට යොමු කරන්න ඕනෑ. එසේ කටයුතු කරන්න යනවා නම් කාර්මික අංශයට බර වී කටයුතු කිරීමට අපට සිද්ධ වෙනව. එසේ නොකළොත් කවදාවත් මේ ප්‍රපාතයෙන් ගොඩ එන්නට අපට පුළුවන්කමක් නැහැ. මේ රටේ සඳහටම නිෂ්පාදනය කරන්නට යන්නෙ කෘෂිකාර්මික ද්‍රව්‍ය නම් සෑමදාම මේ ප්‍රශ්නයට මුහුණ පාන්නට අපට සිද්ධ වෙනවා. ඒ නිසා අපේ නිෂ්පාදනය කෘෂිකාර්මික ද්‍රව්‍යවලට පමණක් සීමා නොකර කාර්මික භාණ්ඩ නිෂ්පාදනය කිරීමටත් අප විශෙෂ උත්සාහයක් සහ ප්‍රයත්නයක් දැරිය යුතුයි.

මෙම ප්‍රශ්නය විසඳීම සම්බන්ධයෙන් කිසිම විධියකින් අධිරාජ්‍යවාදීන්ගෙන් කිසිම සහායක් බලාපොරොත්තු වෙන්න බැහැ. ඔවුන් අපට කිසි දිනක සහායක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දක්වලත් නැහැ. අපේ රටේ මෑත ඉතිහාසය දෙස බලන විට අපේ රට කාර්මික වීමේ ප්‍රශ්නය ගැන ඇති වී තිබෙන තත්ත්වය අපට හොඳට පැහැදිලි වෙනව. අධිරාජ්‍යවාදීන් නොහොත් ධනපති රටවල් අපේ රට කාර්මික කිරීමේ කාර්යවලට විරුද්ධ වී ඇති බව මිස, ඊට අතුල් හෙලූ බව මිස, කිසිම විධියකින් ආධාරයක් දුන්නෙ නැති බව අපේ රටේ ඉතිහාසයෙන් පෙනී යනවා.

1936-37 කාලෙදි, යටියන්තොට ගරු මන්ත්‍රීතුමාත්, දැනට ආණ්ඩු පක්ෂයේ සිටින අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමාත් රාජ්‍ය මන්ත්‍රණ සභාවෙ සිටින කාලයේදි, ඒ මන්ත්‍රීවරු දෙපළ වාණිජ කාරක සභාවෙ සාමාජිකයන් වශයෙන් කටයුතු කළා. ඒ කාලයෙදි මේ රටේ ටයර් නිෂ්පාදනය කරන්න පුළුවන්ද බැරිද කියන ප්‍රශ්නය ගැන ඉංග්‍රීසි ටයර් කොම්පැනියක විශෙෂඥයන්ගෙන් ඒ කාරක සභාවට වාර්තාවක් ලැබුණා. ඒ වාර්තාවෙන් කියා තිබුණේ ටයර් නම් ලංකාවෙ නිෂ්පාදනය කරන්න බැරි බව යි. එතකොට කථානායකතුමනි, එයින් අදහස් කෙළේ ලංකාව හොඳ රබර් වවන්න පමණක් බවයි. ටයර් සෑදුවොත් ඉන් පාඩු වන බවත්, ටයර් සෑදීම පිණිස හුඟක් දුරට පාවිච්චි වන්නේ රබර් නොව ඉන්දියාවෙන් ගෙන්වන "ජූට්" බවත්, ඒ අනුව ටයර් සෑදීම සඳහා වියදම් වන මුදලේ හැටියට එයින් ප්‍රයෝජනයක් නොලැබෙන බවත් කියා ඒ අදහස ප්‍රතික්ෂේප කර තිබුණා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
ඒ යූ. එන්. පී. කාලෙදි.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)
යූ.එන්.පී. මුතුන් මිත්තන්ගෙ කාලෙදි. මා ඒ සඳහන් කෙළේ කථානායකතුමනි, යුද්ධයට පෙර තත්ත්වයයි. යුද්ධයට පස්සෙ තත්ත්වය මොකක්ද ? අපට 1948 දි නිදහස ලැබුණ ය කියනව. නිදහස ලැබුණාට පස්සෙ අධිරාජ්‍යවාදීන්ගේ ඒ ක්‍රියා මාර්ගය වෙනස් කළාද ? 1952 දී— ඒ කියන්නෙ නිදහස ලබා අවුරුදු 4 ක් ගත වුණාට පස්සෙ—අපේ රටේ කාර්මික නිෂ්පාදන ගැන ලෝක බැංකුවෙ විශෙෂඥයෙක් පැමිණ කරුණු සොයා බලා වාර්තාවක් ඉදිරිපත් කළා. ඒ පිළිබඳ කරුණු 1952 ලෝක බැංකු වාර්තාවෙ සඳහන් වෙනවා. මේ රටේ කර්මාන්ත ඇති කිරීම සම්බන්ධයෙන් ඒ වාර්තාවේ සඳහන් වී ඇති වැදගත් කොටස් කීපයක් මේ ගරු සභාව ඉදිරිපිට තබන්නට මා බලාපොරොත්තු වෙනව.

"The Government fertilizer project should be postponed."

අපේ රට කෘෂිකාර්මික රටක් නිසා කෘෂිකර්මය දියුණු කළ යුතු අතර කර්මාන්ත ඇති කිරීම කල් දමන ලෙස ලෝක බැංකුවේ විශේෂඥයන් කියනවා.

අපේ ධීවර කර්මාන්තය දියුණු කිරීම සඳහා මේ වරවත් යමක් කෙරේ යයි හිතෙනවා. නමුත් ඒ ගැනත් කියන්න හම් බැහැ. මෙන්න ඒ ගැන එදා කී දේ :

"Purchase of additional trawlers should be deferred until there are at least skilled local seamen and fishermen to man the present trawlers without outside help."

ධීවර කාර්මිකයන්ට පුහුණුවක් නැත් නම් ඒ පුහුණුව ලබා ගත යුතු බව නොකියා ධීවර කාර්මිකයන්ට පුහුණුව ලැබෙන තුරු "trawlers" නො ගත යුතු යයි කියනවා. මෙන්න තවත් එකක් :

"Production of steel should be deferred as costly and entirely premature in relation to power and other developments."

දැන් මේ කාරණය සම්බන්ධයෙන් හෙමින් හෙමින් වුවත් කිසියම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා. ඊළඟ කාරණය මේ රටේ රෙදි විවීම ගැනයි.

"Ceylonese textile workers have not performed up to Indian standards."

අපේ කම්කරුවන් හොඳ නැතිලු. නමුත් අපේ කම්කරුවන්ට වැල්ලවත්තේ රෙදි මොලේ අවුරුදු තිහ හතලිහක පුරුද්දක් දැන් තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

"Textile specialists hold the view that increased Ceylonese textile manufacturing can be sound economically if the island can grow more of its own cotton."

කවුරුනුත් විරුද්ධ නැහැ කපු වැවීමට. නමුත් කපු වවන්නේ නැතිව රෙදි කර්මාන්තය කරගෙන යන්නට බැරි බව අද කවුරුන්වත් පිළිගන්නේ නැහැ, කපු නොවවා වුවත් රෙදි කර්මාන්තය කරගෙන යන්නට පුළුවනි.

"Development of industries should be encouraged as an important productive activity but secondary to agriculture for the present."

ඒ කාලයේදී වුවත් කර්මාන්ත දියුණු කරන්නට එපා යයි මේ විශේෂඥයන් කෙළින් කීවේ නැහැ. ඔවුන්ට එසේ කියන්නට බැරි වුණා. ඒක නොකියා එය දියුණු කළ යුතු බව කියන ගමන්ම ඊට වඩා සැලකිල්ල යොමු කළ යුත්තේ කෘෂිකර්මයට යයි කියනවා. අපේ ගරු මුදල් ඇමතිවරයාගේ කථාව කියවන විටත් ලෝක බැංකුවේ විශේෂඥයන්ගේ පුස්කෑ මොලවල අදහස් ඒ කථාවේද තිබෙන බව පෙනී යනවා. කර්මාන්ත ඇති නොකළ යුතුයයි අපේ මුදල් ඇමතිවරයාත් කෙළින්ම කියන්නේ නැහැ. නමුත් පළමු කොට කෘෂිකර්මය දියුණු කළ යුතු යයි ඔහු කියනවා. මෙය එක්සත් ජාතික පක්ෂයේ අලුත් ප්‍රතිපත්තියක් නොවෙයි. 1947 සිට 1956 දක්වා ඔවුන් බලයේ සිටියදී දියුණු කළ කර්මාන්තයක් මේ රටේ නැහැ. කර්මාන්තයක් දියුණු වුණා නම් එසේ වූයේ 1956න් පසුවයි. විශේෂයෙන්ම 1960න් පසුවයි. අපේ රාජ්‍ය ඇමතිතුමාත් ඒ බව කියනවා. විදේශීන්ගෙන් පහර වැදුණු නිසා කර්මාන්ත ඇති වූ බව එතුමා කියනවා. සමහර විට එය එසේ වන්නට පුළුවනි; එසේ නොවන්නටත් පුළුවනි. කෙසේ වුවත් පසුගිය ආණ්ඩුව ප්‍රථම වරට මේ රටේ කර්මාන්ත දියුණුවක් ඇති කිරීම සඳහා වැඩ පිළිවෙළක් ඇරඹූ බව ඇත්තයි. නමුත් ඒකෙන්වත් පාඩමක් ඉගෙන නොගෙන, එක්සත් ජාතික පක්ෂය සවභාව වෙනස් කර තිබෙනවාය කියා වෙස් පමණක් මාරු කර තිබෙන පිළිවෙළට ක්‍රියා කිරීම ගැන අපි කනගාටු වෙනව. ඒ මක්නිසාද, ඒ ප්‍රශ්නය ගැන නම් එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්ති මේ ආණ්ඩුව වෙනස් කර තියෙන බවට ලකුණක් අපට පෙනෙන්න නැහැ. ඇත්ත වශයෙන් මේ ආණ්ඩුව ඉදිරිපත් කර තිබෙන්නේ කෘෂිකර්මය දියුණු කිරීමේ දර්ශනයක්. මුදල් ඇමතිතුමා කියා තිබෙන්නේ ගොවියා අතිරේක ආහාර ද්‍රව්‍ය වගා කිරීමට අසමත් වී තිබෙනවාය කියායි. එතුමා වගේම ආහාර ඇමතිතුමත්, සතියකට පමණ පෙර සී. අයි. එස්. අයි. ආර්. හෙවත් විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතනය ඉදිරිපිට කථාවක් කරමින් ඒ විධියේ ප්‍රකාශයක් කරල තියෙනව. ඇත්ත වශයෙන්ම මේක පුදුමයක්. අපේ රටේ කෘෂිකර්මය දියුණු කරන්න ඕනෑය, විශේෂයෙන් ආහාර නිෂ්පාදනය වැඩි කරන්න ඕනෑය කියා මීට පෙරත් ඔය විධියේ හඬක් තිබුන. ඒ හඬ තිබුනේ 1919 දීයි. නමුත් ඒ 1919 යේ හඬ ඇති වුණේ ඔයිට වඩා ටිකක් වෙනස් විධියකටයි. ධනපතියන් ආහාර වගා කරන්නෙ නැත කියායි, ඒ කාලයේ අඳෝනාව ඇති වුනේ. ඒ කාලයේදී, නැසීගිය ඩී. එස්. සේනානායක මහතා රාජ්‍ය මන්ත්‍රණ සභාවේදී කළ කථාවකින් කොටසක් මම කියවන්නම්.

"In 1919 when there was a food shortage when these capitalists did not go into food production it was found necessary to encourage the peasants to go in for food cultivation."

මේ ප්‍රකාශය කරල දැන් අවුරුදු 50 කට කිට්ටු කාලයක් ගත වෙලා තියෙනවා. දැන් අපේ ආණ්ඩුවට කල්පනා වෙලා තියෙන්නෙ එහි අනික් පැත්තයි. ආහාර වැඩිපුර වගා කරන්න ඒ කාලයෙදී කල්පනා වුනේ එකක්. දැන් එහි අනික් පැත්ත කල්පනා වෙලා තියෙනවා. ගොවීන්ට මේ වැඩය බැරිය කියා දැන් ධනපතීන්ට භාර දෙන්න යනව.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(Hon. Wanninayake)

දෙගොල්ලන්ටම වැඩේ භාර දෙනව.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

මුදල් ඇමතිතුමා කියා තිබෙන්නෙ ගොවියා මේ වැඩේ කරන්නෙ නැත කියලයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

Have you forgotten your own speech ?

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

අතීතයේ කියාපු දේ පමණක් නොවෙයි, කරපු දේත් තමුන්නාන්සෙට අමතක වෙලා තියෙනව. 1935 දී තමයි, "ලෑන්ඩ් ඩෙවලප්මන්ට් ඕඩිනන්ස්" හෙවත් ඉඩම් සංවර්ධන ආඥ පනත ඇති කළේ. ඩී. එස්. සේනානායක මහතා එවකට තිබූ රාජ්‍ය මන්ත්‍රණ සභාව ඉදිරිපිටට එය ගෙනාවෙ 1933 දියි. එය ධනපතියන්ට ඉඩම් දීම වැළැක්වීමට ගෙන ආ පනතක්. ඒ කාලයේ ඉඩම් වෙන්දේසි තියෙනව. වෙන්දේසියෙන් තමයි, ධනපතියන් ඉඩම් ගත්තෙ. සුද්දොත් ඉඩම් ගත්තෙ ඒ විධියටයි. දුප්පත් මිනිහට අක්කර තුන් හාර දාහ වෙන්දේසි කරන ඒ වෙන්දේසිවලට ගිහින් ඉඩම් ගන්න පුළුවන්කමක් තිබුනෙ නැහැ. ඒ තත්ත්වය වැළැක්වීමටයි ඒ පණත ගෙනාවෙ. ඒ අනුව වුවමනා නම් ලාංකික සුළු ධනපතියන්ට අක්කර 50 ක් ගන්න පුළුවන්කම තිබුන. ඒ පනත නිසා අපේ රටේ ගොවියා බේරුනා. ඊට පසු ගම් පළල් කිරීමේ ක්‍රමය හා වෙන වෙන ක්‍රම මගින් ගොවියාට ඉඩම් දීමේ වැඩපිළිවෙළක් තමයි අපේ රටේ ඇති වුනේ. මට පෙනෙන හැටියට දැන් මෙය වෙනස් කරන්න යනව. මේ ඉදිරිපත් කර තිබෙන යෝජනාව එසේ වෙනස් කිරීමේ ප්‍රාථමික පියවරක් කියායි, මා කියන්නෙ. ගොවියාට ඉඩම් දෙන්නෙ නැත කියල නැහැ. ගොවියටත් දෙනව. නමුත් 1935 ප්‍රතිපත්තිය වෙනස් කරල නැවතත් ලොකු ධනපතින්ට ඉඩම් දෙන්න යනව.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

සුළු කාලයකට.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

අවුරුදු 25 ක් සුළු කාලයක් වන්න පුළුවනි. එයින් පස්සෙ නැවතත් දෙනවද නැද්ද කියා තීන්දු කරනුව. තව අවුරුදු 25 ක් 30 ක් ගියාට පසුවත්, මේ මුදල් ඇමතිතුමාම ඉන්නවද ? ඒ කෙසේ වුවත් පළමු පියවර වශයෙන් අවුරුදු 25 කට දෙනව.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

සම්පූර්ණ වගාවකට නොවෙයි.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

වගා කළාට පසු දැනගන්න ලැබේවි මොනවද වගා කළේ කියා. අපේ හොඳ ඇවදඹු නැති වුණාට පසු වගාව නැතිව මොනවාද කරන්න යන්නෙ ? මේවා දෙන්නේ "ලෝකල් ප්‍රයිවේට් කොම්පැනි" වලටය කියා තිබෙනව. එහෙත් ලෝකල් ප්‍රයිවේට් කොම්පැනි කියන්නේ විදේශික කොම්පැනිවලටයි. ඕනෑම කොම්පැනියකට ගන්න පුළුවන්. එය "රෙසිඩන්ට්" නොවෙයි, "ලෝකල්". විදේශික කොම්පැනියක් වුණත් දෙන්න පුළුවන්.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

කොමර්ෂල් කොම්පැනියට දෙන්නෙ නැද්ද ?

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

මෙහි තවත් ප්‍රශ්නයක් තිබෙනව. අපේ ගොවියා අතිරේක ආහාර වගාකිරීමට මැළිකමක් දක්වනවද කියා මා අහනව. එහෙම කියා තිබෙන එකේ ඇත්තක් තිබෙනවද කියා මා තර්ක කරන්න ඕනෑ. මට දැනගන්නට ලැබී තිබෙන හැටියට නම් එහෙම මැළිකමක් නැහැ. වගා කරන ද්‍රව්‍ය මිළයට ගන්න ආණ්ඩුව කැමැත්තක් දක්වන්නේ නැහැ. ඒ සම්බන්ධව මේ ආණ්ඩුව පමණක් නොවෙයි, මීට කලින් තිබුණු ආණ්ඩුත් විවේචනය කරන්න සිදු වී තිබෙනව. වුවමනා කරන ආහාර ද්‍රව්‍ය මිළයට ගැනීමට ආණ්ඩුව උත්සාහයක් දරන්නේ නැහැ. මේ අතිරේක ආහාර ද්‍රව්‍ය මොනරාගල පළාතේ වැවෙනවා. මා හිතනවා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

මොනරාගල මන්ත්‍රීතුමා (රාජා වෙලේගම මයා.) මීට සාක්ෂි දරනවා ඇති. නමුත් ඒ ආහාර ද්‍රව්‍ය විකුණා ගන්න බැහැ. "ඇග්‍රේරියන් සර්විසස්" දෙපාර්තමේන්තුවට ගෙනෙනවා, නමුත් ගන්නේ නැහැ. එක්කෝ සල්ලි නෑ කියනවා, නැත්නම් වෙන මොකක් හරි කියනව. ඒ නිසා ඒවා වගා කළ නැනැත්තාට කරන්න දෙයක් නැතිව අඩු මුදලට වෙළෙන්දන්ට විකුණනවා. මා දන්නව සමහර තැන්වල කියනව කිරන්න උපකරණ නැති නිසා ගන්න බැරිය කියා. මෙහි තිබෙන ප්‍රශ්නය මේකයි. වී නම් ගන්නට ලැහැස්තියි. මොකද හේතුව? පොඩි පගාවක් ගහන්නට, කට් එකක් ගන්නට ඉඩ තිබෙනව. අනික් අතිරේක ආහාර ද්‍රව්‍ය ගත්තාම ඒ කට් එක ලැබෙන්නෙ නැහැ. ඒ නිසා ඇග්‍රේරියන් සර්වියස් දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය නිලධාරීන් ඒවා ගන්නට වුවමනාවක් දක්වන්නෙ නැහැ. කරුණු තිබෙන්නේ මේ පිළිවෙළට නිසා ආහාර ද්‍රව්‍ය වගා කිරීමට ගොවියා සූදානම් නැහැ කියන්න හොඳ නැහැ.

ඒ කෙසේ වුවත් අපේ මුදල් ඇමතිතුමාගේ ප්‍රතිපත්තිය කෘෂිකර්මය දියුණු කරන එකයි. එය හැන්සාඩ් වාර්තාවේ 94 වැනි පිටුවෙන් හොඳට පැහැදිලි වෙනවා. මෙන්න මෙහෙමයි කියා තිබෙන්නෙ:

"It is the Government's view that the most effective way of relieving our foreign exchange difficulties is by a vigorous programme of import substi-tution in the field of domestic agricul-ture......our plans and programmes will be substantially oriented towards this end." [OFFICIAL REPORT, 9th August 1965; Vol. 61, c. 94.]

මෙයින් සිදු වෙන්නෙ කුමක්ද? එතුමා කියනවා ඇති අපි පළමුව කෘෂිකර්මය දියුණු කර පසුව කර්මාන්ත දියුණු කරනවාය කියා. නමුත් ඒ අවුරුදු 25 කට පසු වයි. ඇත්ත වශයෙන්ම මේ ආණ්ඩුව ගන්නා මේ නව පියවර අපේ රට කර්මාන්තමය කිරීම සදහටම කල් තැබීමක්ය කියා මා දෝෂාරෝපනය කරනව. මේ යන මාර්ගයෙන් ප්‍රශ්න විසඳෙන්නේ නැහැ. මේ කාරණය මා පමණක් නොවෙයි අපේ ගරු මුදල් ඇමතිතුමාත් කියා තිබෙනවා. මා එය පෙන්වන්නම්. එතුමාගේ අයවැය කථාවේ 58 වැනි පිටුවේ මෙන්න මෙහෙම කියල තිබෙනව:

"Unless international action is taken to prevent the fall in prices of exports of under-developed countries, as well as to prevent the increase in prices of their imports, whatever action under-developed countries themselves might take to put their house in order will not provide a permanent and lasting solution."—[OFFICIAL REPORT, 9th August, 1965; Vol. 61, c. 58.]

මට පෙනෙන්නෙ නැහැ, අධිරාජ්‍ය වාදී රටවලින් ආනයන කරන බඩු අඩු කරන්න, අධිරාජ්‍යවාදී රටවලට අපනයන කරන බඩු වැඩි කරන්න වැඩ පිළිවෙළක් තිබෙනවාය කියා. එසේ ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වනවාය කියාවත් අපට හිතන්න බැහැ. මේ යන මාර්ගයෙන් නම් මේ ප්‍රශ්නයට නියම විසඳුමක් ඇති වෙන්නෙ නැති බව මුදල් ඇමතිතුමාම කියනව. අද ඉදිරිපත් කර ඇති අයවැය ලේඛනයෙන් අනුගමනය කිරීමට බලාපොරොත්තු වන වැඩ පිළිවෙළ සියයට සියයකින්ම සාර්ථක වුණත් ප්‍රශ්නය විසඳෙන්නෙ නැති බව මුදල් ඇමතිතුමාගේ මුඛයෙන්ම පිට වී තිබෙනව. ප්‍රශ්නය විසඳෙන්නෙ නැතුවා පමණක් නොවෙයි, ප්‍රශ්නය විසඳන්නට හැකිවන ආර්ථික දර්ශනයකුත් නැහැ. හැබැයි එක දර්ශනයක් තිබෙනව. වරින්වර පිටරටවලින් ණය ඉල්ලීමේ, මුදල් හිඟාකෑමේ දර්ශනයක් නම් තිබෙනව. කාටවත් මේක නැතැයි කියන්න බැහැ. අපේ මුදල් ඇමතිවරයාම ඒ බව කියනව. එතුමාගේ අයවැය කථාවේ 88 පිටුවේ මෙසේ සඳහන් කර තිබෙනව:

"......throughout the entire post-war period, little progress has been made to-wards the initiation of schemes to stabilize and improve the prices of primary com-modities. ...... But, in the interim, Ceylon will have, together with other developing countries, to pursue the possi-bility of securing external assistance in order to meet the inevitable gap between essential imports needed for growth and possible export earnings".—[OFFICIAL REPORT, 9th August, 1965; Vol. 61, c. 88].

කොටින් කියනවා නම්, නොවැළැක්විය හැකි අන්දමට ඇති වන ඒ හිඟය, අපේ ආනයන හා අපනයන අනුව ඇතිවන විදේශ විනිමය හිඟය පියවන්නට අපට ඒ රටවලින් වරින් වර ණය ගන්නට සිදුවන බවයි එතුමා කියා තිබෙන්නෙ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ (අකුරැස්ස)**
*(டொக்டர் எஸ். ஏ. விக்கிரமசிங்ஹ—அக்குறஸ்ஸ)*
(Dr. S. A. Wickremasinghe—Akuressa)
පාවා දීමේ පාර කැපෙනව.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)
අප මේ සැරේ ණය මුදල් ගත්තත් එයින් බේරෙන්නෙ නැහැ. නැවත නැවතත් ණය මුදල් ගන්න සිද්ධ වෙනව, මේ යන මාවත නිසා. එතකොට මේ ආණ්ඩුවේ දර්ශනය ඒකයි. අප වැටී තිබෙන වළෙන් ගොඩ ඇවිත් අප නිදහස් වී තනියම ඉස්සරහට යන මාවතක් නොවෙයි කැපෙන්නෙ. එය නොවෙයි දර්ශනය. සඳහටම ඒ අධිරාජ්‍යවාදී රටවලට යටවන ආකාරයට බඩගාගෙන ගොස් ඔවුන්ගෙන් ණය මුදල් ඉල්ලා ගන්නා ආකාරයට පිළියෙල කළ දර්ශනයකුයි රට ඉදිරියේ තබා තිබෙන්නෙ. මෙවැනි අන්දමක දර්ශනයකුයි අප ඉදිරියෙ තිබෙන්නෙ. ඇයි කෙනෙකුගෙන් පිහිටක් ඉල්ලන්න ඉඩ තියෙන්නෙ?

ගරු කථානායකතුමනි, කෙසේ හෝ වේවා අප වැටී තිබෙන මේ අමාරුවෙන් බේරීමට මේ රට දියුණු කිරීමට, නොයෙකුත් කර්මාන්ත ඇති කිරීමට උත්සාහයක් නොදරන්නෙ මොන කාරණයක් නිසාද කියා සොයා බැලීම වැදගත්. එයට තමයි අපට පිළිතුරු සොයන්නට වුවමනා කරන්නෙ. ඇත්ත වශයෙන්ම මෙයට පිළිතුරු සොයන්නට නම් එක්සත් ජාතික පක්ෂයත් ෆෙඩරල් පක්ෂයත් නියෝජනය කරන පංක්තිය කුමක්ද කියා පළමුව සොයා බලන්න ඕනෑ. ඇත්ත වශයෙන්ම මේ පක්ෂ දෙක නියෝජනය කරන පංක්තිය මේ රටේ ධනපති පංක්තියය කියා අපට කියන්න පුළුවනි.

නමුත් ඉන්දියාවේ ධනපති පංක්තිය හා සංසන්දනය කර බලන විට ලංකාවේ ධනපති පංක්තියෙහි වෙනසක් තිබෙනව. අඩු ගණනෙ ඉන්දියානු ධනපති පංක්තිය කාර්මික ධනපති පංක්තියක්. අධිරාජ්‍යවාදීන් සමග හැප්පුන ධනපති පංක්තියක්. තමන්ගේ ජාතික නිදහස ලබාගැනීම සඳහා අධිරාජ්‍යවාදීන් සමග හැප්පී තිබෙන පංක්තියක්. නමුත් ලංකාවේ සිටින්නේ කාර්මික ධනපති පංක්තියක් නොවෙයි. චතුකරයෙන් සල්ලි හම්බ කළ පංක්තියක්. වෙළඳාමෙන්, අධිරාජ්‍යවාදීන්ගේ බඩු විකුණා කොමිස් මුදල් ලබාගැනීමෙන් වෙළඳුන් හැටියට දියුණු වුණු ධනපති පංක්තියක්. කොටින් කියනවා නම් අධිරාජ්‍යවාදීන්ගේ ඒජන්තවරුන් හැටියට ක්‍රියා කරන පංක්තියකුයි මේ රටේ සිටින්නෙ. ඒ පංක්තියට වුවමනාවක් නැහැ, අධිරාජ්‍යවාදීන් සමග හැප්පෙන්න. අතීතය දෙස බලනවා නම් ඒ අය අධිරාජ්‍යවාදීන් සමග හැප්පී නැහැ. එක්සත් ජාතික පක්ෂයේ මුතුන් මිත්තන් ක්‍රියා කර ඇති ආකාරය ගැන අපි දන්නව. යුද්ධ කාලයේදී අධිරාජ්‍යවාදීන්ට විරුද්ධව වචනයක්වත් ප්‍රකාශ නොකළ, පිටකොන්ද කෙළින් කර ඔළුව උස්සල අඩියක්වත් ඉස්සරහට ගමන් නොකළ පක්ෂයක් තමයි එක්සත් ජාතික පක්ෂයත්, ඔවුන්ගේ මුතුන් මිත්තනුත්. යුද්ධ කාලයේ දී ඒ අධිරාජ්‍යවාදීන් කළ හැම දෙයක්ම අනුමත කරමින් සිටි උදවිය—

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)
නිදහස ලබාගත්තෙ අපයි.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)
නිදහස ලබාගත් හැටි කියන්න ඕනෑ කරනවද? එකම ආත්ම පරිත්‍යාගයක් වත් කරලාද නිදහස ලබාගත්තෙ? අනුන් විසින් කරන ලද පරිත්‍යාග නිසා නොවේද අපට නිදහස ලැබුණේ, කියා මා මෙම සභා ගර්භය තුළ දී අහනව. ඉන්දියාවෙ ජනතාව වැගුරූ ලේ වලින්, බුරුමයෙ ජනතාව වැගුරූ ලේවලින් එහෙම තමයි, අපට අපේ නිදහස ලබා ගන්න හැකි වුණේ. මහ ලොකුවට කියනව, ලේ බිඳක් හෙළීමක් නැතුව නිදහස ලැබුණාය කියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

ඔව්, අපි නම් ලේ වැගුරුවෙ නැහැ. නමුත් අප වෙනුවෙන්, මේ රටේ නිදහස වෙනුවෙන් ලේ වැගුරූ ජනතාව අප අවට අග්නිදිග ආසියානු රටවල සිටිනවා. ඒ ලේ කරණකොටගෙන තමයි, අපට අපේ නිදහස ලැබුණේ. ඒ රටවලට අප ණය ගැතියි. නිදහස උදෙසා සිය ජීවිත පිදූ අනිකුත් සිය, දහස්, ලක්ෂ ගණන් අග්නිදිග ආසියානු යටත් විජිත රටවල ජනතාවට අප ණයගැතියි. ඒ ණය ගෙවන්න තියෙනවා. මේ දක්වා ඒ ණය ගෙවන්න එක්සත් ජාතික පක්ෂය ක්‍රියා කර තිබෙන්නේ කොහොමද? මීට පෙර—1956 න් පෙර—පැවති එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව, ඉන්දු චීනයේ ජනතාව නිදහස උදෙසා සටන් කරන විට උදව් කළේ කොහොමද? ඉන්දු චීනයෙ වීර වික්‍රමාන්විත ජනතාව නිදහස උදෙසා සටන් කරන විට ඒ ජනතාවට වෙඩි තබා මරා දමන්න ප්‍රංශ අධිරාජ්‍යවාදී හේවායන් අහස් යානාවලින් ගෙන යද්දී ඉන්දියාව සහ අග්නිදිග ආසියාවේ එකම රටක්වත් එවැනි අහස් යානාවලට තමන්ගේ ගුවන් තොටුපළවලට ගොඩ බහින්න ඉඩකඩ දුන්නේ නැහැ. ඉන්දු චීනයෙ නිදහස් කාමීන්ට වෙඩි තබන්න ගෙන යන ප්‍රංශ හේවායන් සිටි අහස් යාත්‍රා ගොඩ බා පෙට්‍රල් දමන්න ඉඩ දුන්න එකම රට ලංකාවය කියා මම ප්‍රකාශ කරනවා. නමුත් නාන්සෙලගෙ පක්ෂයේ නායක සර් ජෝන් කොතලාවල මහතා ඒ නින්දිත ක්‍රියාව කළා. ඒ විධියටයි, අග්නිදිග ආසියාවෙ අපි වෙනුවෙන් දිවි පිදූ නිදහස් කාමීන්ට අපේ ණය ගෙව්වෙ. ප්‍රංශයෙන් ඒ නිසා පදක්කමකුත් ලැබුණා, "Legion of Honour" නමින්. අධිරාජ්‍යය විෂයයෙහි නැතිනම් විදේශික විෂයයෙහි මේ විධියට ක්‍රියා කරනවාත් සමගම අභ්‍යන්තර විෂයයෙහිත් ක්‍රියා කරන්නෙ මේ අන්දමටයි.

මේ ආණ්ඩුව ධනපති පන්තියෙ පැත්ත අරගෙන ජනතාවට විරුද්ධකම් කරන ආණ්ඩුවක්ය කියා මීට පෙර කථා කළ විරුද්ධ පාර්ශ්වයේ අය කීවා. සමහරවිට ඊටත් වඩා වැදගත් අදහසක් මම මෙතන දී ප්‍රකාශ කරනවා. මේ ආණ්ඩුව ජනතාවට විරුද්ධ ආණ්ඩුවක් පමණක් නොවෙයි, ධනපති පන්තියට පක්ෂ ආණ්ඩුවක් පමණක් නොවෙයි, රට ජාතියට විරුද්ධ, දේශ ද්‍රෝහී, අධිරාජ්‍යවාදීන්ට පක්ෂපාතීත්වය දක්වන ආණ්ඩුවක්ය යනුවෙන් මම චෝදනා කරනවා. මෙවැනි ප්‍රතිපත්ති උඩ අප කොයිබට ද ගමන් කරන්නෙ කියන ප්‍රශ්නය, රටවැසියන් කවුරුන් විසිනුත් ඇසියයුතු ප්‍රශ්නයක්. අධිරාජ්‍යවාදීන්ගෙන් වරින් වර ණය මුදල් ලබා ගන්න යනවා. ඔවුන් ඒවා අපට නිකම් දෙනවාද? ඔවුන් අපට ඒවා දෙන්නෙ, කොන්දේසි ඇතිව නේද? ඒ කොන්දේසිවලට අප යට වන්නෙ නැතෙයි කියා ප්‍රකාශ කරන්න පුළුවන්ද? නැතෙයි කියල කිව්වට, දැනටමත් එක අඩියක් බැහැල නේද? කොච්චර පිරිසිදු චේතනාවක් හිත තුළ තිබුණත් දැනටමත් එක අඩියක් පහළට බැස තිබෙනවා නේද? මේ මූල්‍ය අරමුදල පිළිබඳ ආයතනයට පොරොන්දු දෙකක් දීල නේද ණය ලබා ගන්න සිදු වෙලා තියෙන්නෙ?

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

ඒක අපේ සමාගමක්; අපිත් එහි සාමාජිකයො.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

නමුත් කාගෙ ආයතනයක්ද? අමෙරිකන් අධිරාජ්‍යවාදීන් පාලනය කරන ආයතනයක් නේද?

සෙනෙවිරත්න මයා.
(திரு. செனெவிரத்ன)
(Mr. Seneviratne)

රුසියාවෙන් ගන්නකොට—

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

කාගෙන් ගත්තත්, මම අහන්නෙ මේ යයි: කමන විධියෙ කොන්දේසි දීලද ණය ගන්නෙ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
තමුසෙලගෙ අගමැති කියා තිබෙනව, රුසියාවෙනුත් ගන්නට කියා.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)
තරහද ඒකට ?

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
කවුද කිව්වෙ, තරහයි කියල? [බාධා කිරීමක්]

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)
මේ ගැන සැක කර දොම්පේ ගරු මන්ත්‍රීතුමා (එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) දැනට මාසයකට විතර පෙර 1965 ජූලි 6 වැනිදා මන්ත්‍රී මණ්ඩලයේදී ප්‍රශ්නයක් ඇසුවා, ලංකාවේ සිටි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පිරිසට, සෞඛ්‍ය අධ්‍යාපනය ආහාර හා සමාජ සේවාවන් පිළිබඳව රජය මහජනයාට දීමට අදහස් කරන ආධාර ප්‍රමාණය සම්බන්ධයෙන් පොරොන්දුවක් දුන්නාද, කියා. ඒ අවස්ථාවේදී ඊට උත්තරයක් ලැබුණා, "ඊට උත්තරයක් දෙන්ට බැරිය" කියා. දුන්න උත්තරය මේකයි :

"The subject-matter of this Question will be dealt with in the Budget speech of the Hon. Minister. It is not in the public interest at the moment to disclose the information asked for."

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)
ඊට පස්සෙ එදාම මා උත්තර දුන්න.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)
"බජට්" එකේදි දෙනව කිව්ව.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)
එදාම ඊට පස්සෙ උත්තර දුන්නා.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)
ඊට පස්සෙ කවුරුවත් උත්තරයක් දුන්නෙ නැහැ. [බාධා කිරීමක්] මෙතැන තිබෙන්නෙ අයවැය ලේඛනය ඉදිරිපත් කිරීමේදී උත්තරයක් දෙනව කියායි. එහෙත් ඒ අවස්ථාවෙදිවත් ඊට උත්තරයක් දීල නැහැ. මේ ප්‍රශ්නය මට දකුණෙන් සිටින යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) ඉදිරිපත් නොකළා නම් ඒ කාරණය එළි වෙන්නෙත් නැහැ. ඇමරිකන් පාලනය යටතේ පවතින ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට මේ විධියේ පොරොන්දු දී තිබෙන නිසාය ණය මුදල් ලැබී තිබෙන්නේ, කියා යටියන්තොට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. ආණ්ඩුව ඊට නැතැයි නොකීමෙන් තමයි, අපට ඒ කාරණය සත්‍යයය කියා පිළිගන්ට පුළුවන් වුණේ. ඇත්ත වශයෙන්ම එක්සත් ජාතික-ෆේඩරල් ආණ්ඩුව අර්බුද වලින් තාවකාලිකව ගොඩ ඒමේ අදහසින් වරින් වර ණය ගැනීමේ ප්‍රතිපත්තියේ ප්‍රතිඵලය කුමක්ද? පළමුවැනි එක, මේ රට කර්මාන්තමය කිරීම අත්හැර දැමීම. දෙවැන්න, මේ රට තව යුගයකට කෘෂිකර්ම කර්මාන්තයට පමණක් වැඩි සැලකිල්ලක් දක්වා ක්‍රියා කරන රටක් හැටියට තබාගෙන සිටීම. ඒ නිසාම මේ ජාත්‍යන්තර වෙළඳ තත්ත්වය මත අධිරාජ්‍යවාදීන් විසින් අපව සූරා කෑම මේ කාලය තුල එහෙමම කරගෙන යනව. ජාත්‍යන්තර සංවිධාන වලට ඒ විධියේ පොරොන්දු දෙන්ට ඔවුන්ට සිදුවන නිසා අපේ රටේ ජනතාවගේ කර පිට නුවුවමනා බර තබන්ටත් සිද්ධ වෙනව. මේ අන්දමට පොරොන්දු දී ණය ලබාගෙන නැවතත් ණය වුවමනා වී ඔවුන් වෙත යන විට අහයි, "පොරොන්දු වුණු විධියට කෝ හාල් කැපුවද?" කියා. හාල් කැපුවෙ නැති නිසා ණය දෙන්ට බැරිය කියයි. මම අහනව. ඒ අවස්ථාවෙදි එක්සත් ජාතික පෙඩරල් ආණ්ඩුව දෙන්ට යන උත්තරය මොකක්ද කියා: ණය මුදල් අවශ්‍යයි; හාල් කපන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

ටත් බැහැ. කැපුවොත් මොනව වෙයිද කියා දන්නෙ නැහැ. 1953 අත්දැකීම් මත කයි.

ගරු කථානායකතුමනි, මගේ හිතේ ලොකු භයක් තිබෙනව. මගේ භය හාල් කපයි කියා නොවෙයි; හාල් නොකපා ඊට වඩා භයානක දෙයක් කරයිද කියන එකයි.

**ගරු වන්නිනායක**
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

මොකද ඔච්චර බය?

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

භයමොකද? මේ කර තිබෙන ඒව අපට පෙනෙන නිසයි. ආධාර ලබාගන්න ගියාම හාල් නොකපා තව ණය දෙන්න බැරිය කියන කොට—තමුන්නාන්සේලා පොරොන්දු වී තිබෙනව, හාල් කපනව කියා—තමුන්නාන්සෙල මොනව කරන්නද? මේ මුදල් ඇමතිතුමාත්, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධ්‍යක්ෂතුමාත් හාල් කපන බවට පොරොන්දු වී අත්සන් කර තිබෙනව. එහෙම නැත්නම් "නැහැ" කියන්න. මේ සභා ගර්භයේ මීට කලින් ඒ කාරණය ප්‍රකාශ වුණා. කවුරුවත් "නැහැ" කිව්වේ නැහැ.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

I read that letter.

**ගරු වන්නිනායක**
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

What is that letter? There is nothing in that letter.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

Nothing?

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

"නතිං" කියන ලියමන ඈරියා කියා පිළිගන්නවා. ඒක "නතිං" වෙන්න පුළුවන්. ඊළඟට ණය මුදල් ගන්ට ගිය විට "කෝ පොරොන්දු වුණු විධියට හාල් කැපුවෙ නැහැ නේද?" කියා අහවි. එතකොට අපේ එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව කියාවි, "ඇත්ත තමයි, සර්, අපට හාල් සේරුව කපන්න බැරිවුණා; නමුත් හාල් සේරුව කැපීම නම් බොහොම අමාරුයි; ඒ වැඩේ කළොත් අපේ රටේ හර්තාල් ඇති වෙන්නට පුළුවනි; ඒ නිසා කියන වෙන ඕනෑම දෙයක් කරන්නම්" ය කියා. ඊළඟට ඇමරිකන්කාරයො කියන්නට පුළුවනි, "හොඳයි, ගොයියො, එහෙම නම් හාල් කපන්නට වුවමනා නැහැ, අපට ලංකාවෙ යුද්ධ කඳවුරක් පිහිටුවා ගන්න ඉඩ දීපන්"ය කියල. එහෙම වුනොත් ඒක හාල් කැපීමටත් වඩා භයානක දෙයක් වෙනව. අන්න ඒ ගැනයි අපේ භය තිබෙන්නෙ.

එවැනි අවස්ථාවක් ආවොත් එක්සත් ජාතික පක්ෂය ලංකාවේ ඇමරිකන් යුද්ධ කඳවුරක් පිහිටුවීමට එකඟවේවිය කියායි අප තුළ තිබෙන භය. එක්සත් ජාතික පක්ෂය ඒ විධියේ පොරොන්දුවක් ඇමරිකන්කාරයින්ට දුන්නොත් අපේ රටේ අනාගතය කුමක් වේද යන්න ගැන මා තුළ විශාල භයක් තිබෙනව. අද වියට්නාමයේ ඇමරිකන් අධිරාජ්‍යවාදීන් පරදිනව. ඇත්ත වශයෙන්ම ඇමරිකන් අධිරාජ්‍යවාදීන් වියට්නාම් සටන පැරදී අවසානයි. වියට්නාම ජාතිකයින් යොදවල නම් අද එහෙ සටන් කරන්න බැහැ. ඒ නිසා ඇමරිකන් හමුදා පිටින්ම ගෙනැවිත් සටන් කරනව. නමුත් එහෙම කරලත් ඇමරිකන් හමුදා පල්ලම් බැහැගෙනයි යන්නෙ. ළඟ දීම ඇමරිකන් හමුදා වියට්නාමය අත්හැර යන්නට ඉඩ තිබෙනව. එතකොට තමන්ගේ යුද්ධ කඳවුරු ලංකාවේ තබා ගන්නට අවසර ඉල්ලාවි. සමහර විට තමුන්නාන්සේලා එවැනි ඉල්ලීමකට එකඟ වන්නට ඉඩ තිබෙනව. හාල් කපන්නට බැරි නිසා තමුන්නාන්සේලා ඇමරිකන්කාරයින්ගේ එවැනි ඉල්ලීමකට ඉඩ දෙන්නට පුළුවන්. ඒ ගැනයි අප තුළ තිබෙන ලොකුම භය.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එහෙම වුණොත් ඇමරිකන් පරමානු බෝම්බ ලංකාවේ ගබඩා කරන්න පුළුවනි. ඒවාගේම පරමානු බෝම්බ තරමටම අපට ඇමරිකන් සල්ලිත් ලැබෙන්නට පුළුවනි. නමුත් සිද්ධ වෙන්නෙ මොකක්ද? යුද්ධයක් ඇතිවුණු අවස්ථාවක රුසියන් කාරයෝ—ලංකාවෙ මහජනතාවගෙන් ඔවුන්ට වන කරදරයක් නිසා නොවෙයි, යුද්ධය දිනන්නට වුවමනා නිසා—ඔවුන්ගේ පරමාණු බෝම්බ, ඇමරිකාවට නොවෙයි, අපේ රටටයි පළමුවෙන් එවන්නෙ. රුසියානු පරමාණු බෝම්බ ඇවිත් ලංකාවෙ ගබඩා කරල තිබෙන ඇමරිකානු පරමාණු බෝම්බ සමග පිපිරුණාම ශ්‍රී ලංකාද්වීපය ඉන්දියානු සාගරයෙන් මකබෑවී යනවාට කිසිම අනුමානයක් නැහැ. [බාධා කිරීමක්] ගරු ඇමතිවරු හිනහ වෙනව. නමුත් එහෙම දෙයක් වෙන්න ඉස්සෙල්ල ගරු ඇමතිවරුන්ට නම් අහස් යාත්‍රාවලින් ඇමරිකාවට යන්න පුළුවන්. මැරෙන්න සිද්ධ වෙන්නෙ මේ රටේ ජනතාවටයි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayawardene)
නමුන්නාන්සෙත් එන්න.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

ඒ නිසා මේ එක්සත් ජාතික පක්ෂය ණය මුදල් ලබා ගැනීමනේ අපේ රට ආර්ථික වශයෙන් ස්වාධීනත්වය කරා ගමන් කරවන්නට පුළුවන් මාර්ගයේ නොවෙයි ගමන් කරන්නෙ. සදහටම අධිරාජ්‍යවාදීන්ට ගැතිකම් කරන්නට සිද්ධ වන ආකාරයටම, වරින් වර අධිරාජ්‍යවාදීන්ගෙන් ණය මුදල් ලබා ගැනීමේ අදහස උඩ මේ රට ගමන කරවීමෙන් භයානක අනතුරුවලට මේ රටට මුහුණපාන්නට සිද්ධ වන බව මා ප්‍රකාශ කරනවා. අවසාන වශයෙන් වැඩිපුර මිනිත්තු 5 ක් කථා කරන්නට ඉඩ දීම ගැන ඔබතුමාට ස්තුති කරමින් මගේ කථාව මෙයින් සමාප්ත කරනවා.

පූ. භා. 11.25

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

Mr. Speaker,

"The lunatic, the lover and the poet
Are of imagination all compact.
One sees more devils than vast hell
can hold; . . ."

ගරු කථානායකතුමනි, පළමුවෙන්ම මා මස්කෙළියේ ගරු මන්ත්‍රීතුමාට ස්තුති වන්ත වෙනව, එතුමාගේ කාලය මා සමග මාරු කිරීමට එතුමා කැමතිවීම ගැන. ඊළඟට උඩරට නොදියුණු ප්‍රදේශයක් නියෝජනය කරන මන්ත්‍රීවරයකු හැටියට, මේ අන්දමින් දුප්පත් ගොවි ජනතාවගේ හිස පිට බදු බරක් නොදමා, සහනදායක වැදගත් අයවැය ලේඛනයක් ඉදිරිපත් කළ අපේ ජාතික ආණ්ඩුවේ මුදල් ඇමතිතුමාවූ මේ වන්නියේ නායකතුමා වැනි තික්ෂණ නුවණක් ඇති, අවස්ථානුකූලව හා කාර්යශීලීව වැදගත් ක්‍රියා මාර්ගයක් ගැනීමට පුළුවන් මුදල් ඇමතිවරයකු මේ ආණ්ඩුවට තෝරා පත් කිරීම ගැන ජාතික ආණ්ඩුවේ අගමැතිතුමාට මහියංගන ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් මගේ අවංක ස්තුතිය මේ අවස්ථාවේදී පුද කරනව.

ගරු කථානායකතුමනි, මට මතක හැටියට පසුගිය කාලයේදී වර්ෂයක් පාසාම මේ ගරු සභාවට ඉදිරිපත් වුණු සෑම විසර්ජන කෙටුම්පත් පණතකම වාගේ මූලික ලක්ෂණය වුයේ වර්ෂයක් පාසාම පුරුද්දක් වශයෙන් මහ ජනතාවගේ හිස පිට බදු බර පැටවීමයි. දුප්පත් ගොවි කම්කරු ජනතාවට වේවා, මධ්‍යම පන්තිකයාට වේවා, ධනපතියන්ට වේවා, බදු බර පැටවීමයි අවුරුද්දක් ගානේම කෙරුණේ. රටක් පාලනය කිරීමේදී මහ ජනතාවගේ හිස පිට බදු බර පටවා එම බදු මුදල් රජය විසින් අය කර ගෙන ඒවා පොදු ජනතාවගේ දියුණුවටත් රටේ සංවර්ධනයටත් යොදනොත් මහ ජනයා මත බදු පැවරීමේ වරදක් වෙන්නෙ නෑ. නමුත්, පසුගිය අවුරුදු නවය තුළ මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නට යෙදුණු විසර්ජන කෙටුම්පත් පණත්වල ඇතුළත් වුණු බදු යෝජනා ගැන කල්පනා කර බලන විට, කිසිම අවස්ථාවක මහජනයාගෙන් ලබා ගත් බදු මුදල්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සෙනෙවිරත්න මයා.]

රටේ සංවර්ධනයට යොදා නැති බව අපට ඔප්පු වෙනවා. දැන් ඔප්පු වී තිබෙනවා, එය මුළු රටම පිළිගන්නවා. මහජනයා ගෙන් ලබාගත් ඒ මුදල් කාබාසිනියා වුණා විනා රටේ දියුණුවට එයින් කිසිම දෙයක් කෙරුණේ නැහැ.

ගරු කථානායකතුමනි, දැන් අපේ ගරු මුදල් ඇමතිතුමා විසින් ඉදිරිපත් කර තිබෙන විසර්ජන කෙටුම්පත් පණ තින් පොදු ජනතාවට කිසිම බදු බරක් පටවා නොතිබීම මෙහි නවාංගයක් බව කියන්නට පුලුවනි. පොදු ජනතාවට බදු බර නොපැවරීම නිසා අපට මේ විසර්ජන කෙටුම්පත් පණතින් අද සැහීමකට පත් වන්නට පුළුවන් වී තිබෙනවා. දේශපා ලන පක්ෂපාතීත්වයෙන් තොර අවංක මහජන නියෝජිතයකු වශයෙන් හෝ වේවා, ලාංකික පුරවැසියකු වශයෙන් හෝ වේවා, අවංක ලෙස කල්පනා කරන සෑම කෙනකුටම කියන්නට පුලුවන් වන්නට ඕනෑ, අලුත් විසර්ජන කෙටුම් පත් පණතින් මහ ජනතාවට කිසිම බදු බරක් පටවා නැති බව. තිබෙන බදුන් රාශියක් මහජනතාවගේ හිසින් අස් වී තිබෙනවා මිස කිසිම බද්දක් වැඩි වී නැහැ. දුප්පත් පාරිභෝගිකයාගේ ජීවන වියදම පසුගිය වර්ෂ 9 ය තිස්සේම වර් ෂයක් පාසා වැඩි වෙමින් තිබුණු අවස් ථාවකදී එය යම්කිසි සීමා සහිත තත්ත් වයකවත් තබා ගැනීමට අවස්ථාවක් මේ අයවැය ලේඛනයෙන් ලැබීම ගැන අප සන්තෝෂ විය යුතුයි.

මේ අය වැය විවාදය ආරම්භ කළ හිටපු මුදල් ඇමතිවරයකු වන යටියන් තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා මයා.) එතුමාගේ කථාව කරගෙන ගියේ, තම ශිෂ්‍යයකුට යම්කිසි පාඩමක් බාර දී එය හරිහැටි ඉෂ්ට නො කළ ඒ ළමයා ගැන තරහෙන් කථා කරන ස්කෝල මහත්මයකු වගේ බව අප කවුරුත් දැක්කා. ඒ ගරු මන්ත්‍රී තුමා විවාදය ආරම්භ කළේ බොහොම තරහෙන්. "මොකක්ද මේ කර තිබෙන් නෙ? විසර්ජන කෙටුම්පත් පණත් ඉදිරි පත් කරන්නෙ මෙහෙමද? මා නතර කළ තැන සිට කරගෙන යන්නට තිබුණේ නැද්ද? එහෙම නැත්නම් එංගලන්තයේ කම්කරු ආණ්ඩුව කළ විදියට කරන්නට තිබුණේ නැද්ද?" ආදී වශයෙන් ප්‍රශ්න කරමින් එතුමා බොහොම තරහෙන් කථා කළා. කියන්නත් කනගාටුයි, යටියන් තොට ගරු මන්ත්‍රීතුමා මුදල් ඇමතිවරයා වශයෙන් සිටිද්දී එතුමා ඉදිරිපත් කළ එම විසර්ජන කෙටුම්පත් පණතෙන් එතුමත් එතුමගෙ සභාග ආණ්ඩුවත් කපෝති වුණා, එහෙම නැත්නම් නැති වුණා. එවැනි කනගාටුදායක තත්ත්වයකට මුහුණ පෑවා මදිවටදෝ අපේ ජාතික ආණ්ඩුවේ මුදල් ඇමතිවරයාටත් තමන් ක්‍රියාවේ යොදන්න නැත් කර අමාරුවේ වැටුණු අන්දමේ විසර්ජන පනත් කෙටුම් පතක් ඉදිරිපත් නොකිරීම ගැන දොස් කියන්නෙ. එවැන්නක් ක්‍රියාවේ යොදන් නැයි කීම මහා විහිලුවක් නොවෙයිද? ප්‍රජාතන්ත්‍රවාදී පදනමක් මත ඉදගෙන කොමියුනිස්ට්වාදී ප්‍රතිපත්ති අනුව විසර් ජන පනත් කෙටුම්පතක් ඉදිරිපත් කර නවා නම් එය ඉදිරිපත් කරන්නෙ, මේ අන්දමටයි. තිබෙන තත්ත්වයටත් වඩා උග්‍ර ආර්ථික ප්‍රපාතයකට රට එහෙම පිටින්ම හෙලා, ඒ මාර්ගයෙන් රට බංකොලොත් තත්ත්වයකට පත් කර දෙවනුව ඇවිත් කියනවා, "ඔන්න ප්‍රජා තන්ත්‍රවාදී ප්‍රතිපත්ති තුළින් වැඩ කරන් න ගියාම මතු වන තත්ත්වය; මේ විධි යට රටවල් ගෙන යන්න බැහැ; ඒ නිසා අපේ වාමාංශික පිළිවෙත තමයි ඕකට එකම බෙහෙත් ක්‍රමය" කියා.

වාමාංශික ප්‍රතිපත්තිය අනුගමනය කිරී ම තමයි එකම බෙහෙත යන්න ඔප්පු කරන්නයි වාමාංශිකයන් ප්‍රජාතන්ත්‍රවාදී පදනමක් තුළ වැඩ කරමින් උත්සාහ කරන්නෙ. එවැනි ක්‍රියා මාර්ගයක් ගෙන යන්න ගත් උත්සාහයෙදි තමයි එදා යටි යන්තොට ගරු මන්ත්‍රීතුමාට වැඩේ වැර දුනේ. එවැනි තත්ත්වයකට මුහුණ පෑ එතුමා දැන් තරහින්, කේන්තියෙන්, එහෙම නැත්නම් කෝපයෙන් හෝ බියෙන් හෝ මෙවැනි කථා කිරීම ගැන අප කනගාටු වෙනව. උන්නැහෙට තිබෙ න ඒ බිය, කෝපය, තරහ සාධාරණ දෙයක්. මා එසේ කල්පනා කරන්නෙ මෙවැනි විසර්ජන පනතකින් වර්තමාන යේ පවතින ආර්ථික පරිහානිය සතුටුදා යක තත්ත්වයකට පත් කර ගනු ලැබ

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

වොත් තමන්ගෙ විප්ලවකාරි වැඩ පිළිවෙළ අසාර්ථක විය හැකි බව උන්නැහෙට තේරුම් යන නිසයි. ඒ නිසා උන්නැහෙගෙ බිය සාධාරණ බියක් බව අප පිළිගන්නව. ඒ අතරම ඒ ගැන අප කනගාටු වෙනව; හැබැයි, ඒ ගැන අපට කරන්න දෙයක් නැහැ. ජාතික ආණ්ඩුවේ මුදල් කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා ඉදිරිපත් කර තිබෙන්නෙ ප්‍රජාතන්ත්‍රවාදි පදනමක් මත සිට රට නියත වශයෙන්ම බංකොලොත් කිරීමේ විසර්ජන පනත් කෙටුම්පතක් නොවෙයි; රට දියුණු කිරීමේ කෙටුම්පතක්. එය වාමාංශික කෙටුම්පතක් නොවෙයි. ඒ නිසා ඒ ගැන අප සතුටු වෙනවා. ඒ හැර අපට කරන්න වෙන දෙයක් නැහැ. අපේ මුදල් ඇමතිතුමා ඉදිරිපත් කළේ ප්‍රජාතන්ත්‍රවාදි වැඩ පිළිවෙළක් අනුව සකස් කළ විසර්ජන කෙටුම්පතක් බව කියන්න මා කැමතියි.

අප පුදුමයට පත් කරවන කාරණය නම් පසුගිය අවුරුදු නවය තිස්සේ දුප්පතාගේ එදිනෙදා පාවිච්චියට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය, ඇඳුම් පැළඳුම් සඳහා අවශ්‍ය බඩු බාහිරාදිය, සීනි, පිටි, අල, මිරිස් වැනි ද්‍රව්‍ය, රැවුල බාන්න ගන්න බ්ලේඩ් තලය වැනි ද්‍රව්‍ය, ගොඩනැගිලි සෑදීමට ගන්න සිමෙන්ති, යකඩ ඇණ ආදි ද්‍රව්‍ය යනාදියේ මිළ සත යෙන් සතය ක්‍රම ක්‍රමයෙන් වැඩි වුණා මිස අඩු වුණේ නැති එක ගැන විරුද්ධ පාර්ශ්වයේ කිසිම කෙනෙකුට අමතක වීමයි. පසුගිය කාලයේ හිටපු හැම මුදල් ඇමතිකෙනෙකුම පාගේ මේ ගරු සභාවට ඇවිත් කිව්වෙ සමාජවාදයේ නාමයෙන් පටි තද කරගන්නෙයි කියන එකමයි. මතුවට සහන දෙන්න බලාපොරොත්තු වූ බව කිව්වා විනා ඒ අවස්ථාවල දුන්නෙ පරිත්‍යාග කරන ලෙස ඉල්ලීම පමණයි. ඔය විධියට පටි තද කරගෙන ගිහිල්ලා අන්තිමේදී 1965 වන විට පටිය පිට කොන්දෙ ගෑවෙන තරමට තද වෙලා ගියා. වාසනාවකට මෙන් අවසාන වරට ඉදිරිපත් කරන ලද, රට කාබාසිනියා කරන විසර්ජන පණතක් ඊට වගකිවයුතු සභාග ආණ්ඩුවත් නැති වෙලා ගියා.

මා මුලින්ම කිව්වාත් මෙන් කොයි තරම් බදු වැඩි කළත් කමක් නැහැ, බදු වැඩි කිරීමෙන් එකතු කර ගන්න මුදල් සම්භාරය රටේ සංවර්ධනය සඳහා නිසි ලෙස යෙදේ නම්. විරුද්ධ පාර්ශ්වය බොහොම තදින් උදන් අනල තියෙනව 1956න් හෝ 1960 න් පස්සෙ මේ රටේ කර්මාන්ත අතින් යම්කිසි දියුණුවක් ඇති වුණාය යන්න ගැන. අපි පිළිගන්නවා, යම් කිසි දියුණුවක් ඇති වුනාය කියා: නැත කියන්නේ නැහැ. නමුත් ඒ දියුණුව ඇති වූයේ මොන කාරණයක් නිසාද කියා බලමු. ඔවුන්ට කරගන්න වෙන දෙයක් තිබුනේ නැහැ. අවශ්‍ය විදේශීය විනිමය තිබුනේ නැහැ. ඒ නිසා පිටරටින් ගෙනෙන ද්‍රව්‍ය නවත්වා ඒවා මෙහි නිෂ්පාදනය කිරීමට සිඬ වුණා. එසේ නැතිව ඔවුන්ගේ ප්‍රතිපත්ති අනුව පසු ගිය අවුරුදු 9 තුළ මේ රටේ කර්මාන්ත දියුණුවක් ඇති වූයේයයි කම්මුලේ දිව තබාගෙන නොකියා, අවංකවම කියන්න පුළුවන්දැයි මම විරුඬ පාර්ශ්වයෙන් අහන්න කැමතියි. එවැනි දියුණුවක් ඇති වුණේ නැහැ. පැන නැගි තත්ත්වයෙන් බේරීම සඳහා, අවසථානුකූලව ගත් පියවරක ප්‍රතිඵලයක් වශයෙනුයි, කර්මාන්ත මේ රටේ ඇති වුයේ. ඒ කර්මාන්ත සඳහා අවශ්‍ය අමු ද්‍රව්‍ය වලින් සියයට 75ක්ම වාගේ පිටරටින්මයි. ගෙන්වා ගැනීමට සිඬ වූයේ. ඒ අමු ද්‍රව්‍ය ගෙන්වා ගැනීමටවත් අවශ්‍ය විදේශීය මුදල් තිබුනේ නැහැ. බාගයකටත් වඩා කර්මාන්ත ඉතා අමාරුවෙනුයි, කරගෙන ගියේ. 1965 මාර්තු වන විට අපේ රටේ විදේශීය විනිමය තත්ත්වය තිබුනේ ඒ අයුරුයි.

ජාත්‍යන්තර දේශපාලනය ප්‍රචාරය කිරීම පිළිගන්නවායයි කියන වාමාංශික පක්ෂ නායකයෙක් වන දකුණු කොළඹ මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) ඔවුන්ගේ හදවත් අස්සේ තිබෙන්නේ කුමන විදියේ අදහස්දැයි දැන් ඔප්පු කර තිබෙනවා. මොකක්ද, ඔවුන් එක්සත් ජාතික පක්ෂයට එල්ල කළ චෝදනාව? අද ෆේඩරල් පක්ෂයත් සමග එක්සත් ජාතික පක්ෂය එකතු වෙලා තිබෙන්නේ එදා ෆේඩරල් පක්ෂයට විරුද්ධව ගත් පියවර එක්සත් ජාතික පක්ෂයට අමතක වෙලාදැයි එතුමා ඇහුවා. මම ඔවුන්ගෙන් අහන්න කැමතියි, ඔවුන්ගේ ප්‍රජාතන්ත්‍රවාදි ප්‍රතිපත්ති අවුරුදු 40 ක් 50 ක් තිස්සේ පුස්කාපු පොත්වල ප්‍රතිපත්ති අනුව ගෙන යන දේශපාලන ප්‍රතිපත්ති නොවේද කියා. දවසින් දවස, පැයෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සෙනෙවිරත්න මයා.]

පැය, විනාඩියෙන් විනාඩිය වෙනස් වන මේ වර්තමාන සමාජයට අනුව තම අදහස්, තම ප්‍රතිපත්ති, තම ක්‍රියා පටිපාටිය, වෙනස් කිරීමට ප්‍රජාතන්ත්‍රවාදය ඇතුලේ නිදහස තිබෙනවා. ඒ නිදහසට අනුවයි, එක්සත් ජාතික පක්ෂයත් ෆෙඩරල් පක්ෂයත් මේ රට දියුණු කිරීම සඳහා, සමගි ජාතියක් ඇති කිරීම සඳහා, මේ වැද ගත් පියවර ගෙන තිබෙන්නේ. දකුණු කොළඹ මන්ත්‍රීතුමා වැනි මන්ත්‍රීවරුන්ට මම ඒ කාරණය මතක් කරන්න කැමතියි.

පාරිභෝගිකයාට එදිනෙදා ජීවිතයට අවශ්‍ය රතුලූණු, අර්තාපල්, වියලි මිරිස් වැනි දේවල මිළ අඩු කිරීම ගැන විරුද්ධ පාර්ශවයේ මන්ත්‍රීවරු මොනවද කිව්වේ? අර්තාපල් හොණ්ඩරයකට රු. 1.25 ක තීරු බද්දක් අඩු කර තිබෙනවාය, රතුලූණු හොණ්ඩරයකට රු. 1.50 ක් අඩු කර තිබෙනවාය, වියලි මිරිස් හොණ්ඩරයකට රු. 1.00 ක් අඩු කර තිබෙනවාය කිව්වා. ඒවායේ තීරු බද්ද නොවේද, ඒ අඩු කර තිබෙන්නේ? තීරු බද්ද අඩු කරන්නේ නැතිව, ඒවා නිපදවන රටවලින් ගෙනෙන මිළ අඩු කරන්න අපට පුළුවන්කමක් නැහැ. අවුරුදු 9 ක් තිස්සේ ඔවුන් අවුරුදු පතා ඒවායේ තීරු බද්ද ශතයකින් දෙක කින්වත් වැඩි කළා. අපි ඒ තීරු බද්ද සම්පූර්ණයෙන් නැති කළා. දුප්පත් මහ ජනයාට එදිනෙදා ජීවිතයට අවශ්‍ය බඩු මේ රටට ගෙන්වීමේ තීරු බද්ද සම්පූර්ණයෙන් අඩු කිරීම ඉතාමත් ප්‍රශංසනීය කාරණයක් නොවේද? ඇයි තමුන්නාස්සෙලාට අවුරුදු 9ක් තිස්සේ එය කරන්න බැරි වුණේ? ඒ අවුරුදු නවය තිස්සෙ තමුන්නාන්සෙලා කෙළේ මොකක්ද? අවුරුද්දෙන් අවුරුද්දට ක්‍රම ක්‍රමයෙන් තීරු බද්ද වැඩි කිරීමයි. ප්‍රථමයෙන් සියයට 2 ක් වැඩි කරනවා; ඊළඟට සියයට තුනක් වැඩි කරනවා; ඔය විධියට ගොස් උදලු ආදී යකඩ බඩු වලට සියයට 35 දක්වා වැඩි කළා. ශත තුනහ මාරට තිබුණ ගිනිපෙට්ටිය ශතයකින් වැඩි කළා; තුට්ටුවකින් වැඩි කළා; තුට්ටු දෙක කින් වැඩි කළා. ඒ අවුරුදු 9 තිස්සේම තමුන්නාන්සෙලා කෙළේ පාරිභෝගික ද්‍රව්‍යවල මිල වැඩි කිරීමයි. තමුන්නාන් සේලා අවංක මහජන නියෝජිතයන් වශයෙන් කල්පනා කරනවා නම් එදිනෙදා ජීවත් වීමට අවශ්‍ය, දුප්පත් මිනිසාට වුවමනා කරන ආහාර ද්‍රව්‍යවල තීරු බද්ද අඩු කිරීමෙන් සහනයක් දීම ගැන තමුන් නාන්සේලා අකමැති ඇයි? නරක ඇයි? තමුන්නාන්සේලා අවංක මහජන නියෝජිතයන් නම් තමුන්නාන්සේලාට යුතු කමක් තිබෙනවා, මේ පියවර ගැන වචනය කින්වත් ප්‍රශංශා කරන්න.

රාජා වෙලේගම මයා. (මොණරාගල)
(திரு. ராஜா வெலேகம—மொனராகல)
(Mr. Raja Welegama—Moneragala)

අඩු කිරීමෙන් ශතයක්වත් අඩු වෙලා නැහැ.

සෙනෙවිරත්න මයා.
(திரு. செனெவிரத்ன)
(Mr. Seneviratne)

කථානායකතුමනි, පණ්ඩිතයන් දහ දෙනෙක් එක්ක කථා කරල දිනුවත් එක මෝඩයෙක් එක්ක කථා කර දිනන්න බැහැ. හොණ්ඩරයකට තීරු බද්ද වශයෙන් අඩු වුණේ රුපියල නම් රාත්තලකට ශත යක් වත් අඩු වන්නේ නැති බව අපි පිළිගන්නවා. නමුත් අපි අඩු කෙළේ දැනට තිබෙන තීරු බද්දයි.

රාජා වෙලේගම මයා.
(திரு. ராஜா வெலேகம)
(Mr. Raja Welegama)

පාරිභෝගිකයාට ප්‍රයෝජනයක් නැහැ.

සෙනෙවිරත්න මයා.
(திரு. செனெவிரத்ன)
(Mr. Seneviratne)

පාරිභෝගිකයාට ප්‍රයෝජනයක් තිබෙනවා. හෙට අනිද්දා බඩු එන්නට පටන් ගත් විට පාරිභෝගිකයාට නව නවත් ප්‍රයෝජන ලැබේවි. ඒකට ඇති බය නිසයි ඔය කෑ ගහන්නෙ. තමුන්නාන්සේලා අවුරුදු 9ක් තිස්සේ කළුකඩකාරයන් බිහි කළා. මාස 5ක් ඇතුළත අපට ඒක හරි ගස්සන්න බැරි වූ එක පුදුමයක් නොවෙයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එල්. සී. ද සිල්වා මයා.** (බලපිටිය)
*(திரு. எல். சீ. டி சில்வா—பலப்பிட்டிய)*
(Mr. L. C. de Silva—Balapitiya)

තමුන්නාන්සේලාව බලයට පත් කළේ ඒගොල්ලො.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

අපව බලයට පත් කළේ කළුකඩ කාරයන් නොවෙයි. දුප්පත් ජනතාව විසිනුයි. කළුකඩකාරයන් ඡන්දය දුන්නෙ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටයි. මේ අයවැය ලේඛන විවාදයේදී ඒ කාරණා ගැන විස්තර කියන්න වුවමනාවක් නැහැ. නමුත් පසුගිය අවුරුදු 9 තිස්සෙ අනුගමනය කළ ක්‍රියා මාර්ගය උඩ බිහි වුණ කළුකඩකාරයො හෙට අනිද්දා මේ රටට බඩු ගලාගෙන එන්න පටන්ගත් විට නිකම් ප්‍රපාතයට වැටේවි.

අපි බදු අඩු කර ඇත්තේ වැඩි වශයෙන් දුප්පත් සාමාන්‍ය මිනිසාගේ අවශ්‍යතාවන්ට අනුවයි. රෙදිවල තොග වටිනාකම අනුව තීරු බද්ද අඩු කර තිබෙනවා. නැවෙන් බාන මිල අනුවයි ඒ බද්ද අඩු වන්නෙ. එවිට සමහර විට රෙදි මිල රුපියලකට ශත 25කින් පමණ අඩු වෙන්න පුළුවන්. ඩීසල් බද්ද නැති කර දැම්මා. ඩීසල් බද්ද අනුව ඩීසල් වාහනයක් තිබෙන කෙනෙක් ඒ වාහනය වැඩ කළත් නැතත් බද්ද වශයෙන් ආණ්ඩුවට රුපියල් 5ක් ගෙවිය යුතුව තිබුණා. දැන් ඒ බද්ද නැති කර දමා තිබෙනවා.

**එල්. සී. ද සිල්වා මයා.**
*(திரு. எல். சீ. டி சில்வா)*
(Mr. L. C. de Silva)

ඩීසල්වල මිල වැඩි කර තිබෙනවා.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

ඒකට කමක් නැහැ. ඒක ඒ තරම් බල පාන එකක් නොවෙයි. ලොරියක් වැඩ නොකර තිබුණොත් දැන් ඒ සඳහා ගෙවීමක් නැහැ. ඒ නිසා ඩීසල් මිල වැඩි වීම ගැන ව්‍යාපාරිකයා අකැමැත්තක් නැහැ. නමුත් එදා ව්‍යාපාරිකයාට වැඩි කළ බදුවලින් සියයට සියයක්ම ගෙව්වෙ පාරිභෝගිකයායි. ඩීසල් බද්ද ඇති කිරීම නිසා මොකක්ද සිදු වුණේ ? රුපියලකින් පටවාගෙන ගිය බඩුවට රුපියල් දෙකක් අය කිරීමයි. එසේ වැඩි වුණ මිල ගෙව්වෙ පාරිභෝගිකයා විසිනුයි. තමුන්නාන්සේලාට ඒවා පෙනුණෙ නැහැ. නමුත් අද මුදල් ඇමතිතුමා අනුගමනය කර තිබෙන මේ වැදගත් ක්‍රියා මාර්ගය අනුව අපේ රටේ දුප්පත් ගොවියා නිෂ්පාදනය කරන එළවලු ආදි ද්‍රව්‍ය එහා මෙහා පටවාගෙන යාමේදී විශාල සහනයක් ලැබෙනවාට කිසිම අනුමානයක් නැහැ.

ගරු කථානායකතුමනි, මේ රටේ රක්ෂා නැති තරුණයන්ට රක්ෂා සැපයීමේ ප්‍රශ්නය ගැන මේ අයවැය ලේඛනයෙහි සඳහන් කර තිබෙනවා. අවුරුදු 15ටත් 25ටත් අතර රක්ෂා නොමැති තරුණයන් දෙලක්ෂයක් පමණ සිටින බව අප පිළි ගන්නවා. මාස 5කින් හෝ අවුරුද්දකින් අප ඒ සියලු දෙනාටම රක්ෂා දෙන බවට පොරොන්දු වන්නේ නැහැ. පසුගිය සභාග ආණ්ඩුවත්, ඊට පෙර තිබුණ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවත් මේ ප්‍රශ්නය උග්‍ර වීම සම්බන්ධයෙන් වගකිව යුතුයි. වර්ෂයක් පාසා වැඩි වන පිරිසට රක්ෂා සැපයීම පිණිස ඒ ආණ්ඩු කිසිම ක්‍රියා මාර්ගයක් නොගත් නිසයි, අද මේ ප්‍රශ්නය මේ තරම් උග්‍ර වී තිබෙන්නේ. නමුත් මේ ප්‍රථම වර්ෂයේදී තරුණයන් 10,000කට පමණ කෘෂිකර්මය සඳහා ඉඩම් දී පදිංචි කරවීමට අපේ ගරු මුදල් ඇමතිතුමා යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. මේ අත්හදා බැලීමේදී අපට සුළු සුළු අඩුපාඩුකම්වලට මුහුණ පාන්නට සිදු විය හැකියි ; කරදරවලට මුහුණ පාන්නට සිදුවිය හැකියි. එහෙත් පිටිසර බද ගොවි පවුල්වල ලක්ෂ සංඛ්‍යාත ගොවි තරුණයන් මෙම අලුත් ජනපදවලට ඇතුළු වී ගොවීන් වීමේ ආශාවෙන් සිටින බව අපට නිසැකවම කියන්නට පුළුවනි. මෙතෙක් කල් රජයේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සෙනෙවිරත්න මයා.]

ඉඩම් ලැබීමේ වරප්‍රසාදය ලැබුවේ දරුවන් තුන් හතර දෙනකු සිටින විවාහක උදවියයි. නමුත් විවාහ නොවූ අයටත් ඉඩම් ලැබීමේ වරප්‍රසාදය මින් පසු හිමි වෙනවා.

**එල්. සී. ද සිල්වා මයා.**
*(திரு. எல். சி. டி சில்வா)*
(Mr. L. C. de Silva)

කලිනුත් තිබුණා.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

නැහැ.

**එල්. සී. ද සිල්වා මයා.**
*(திரு. எல். சி. டி சில்வா)*
(Mr. L. C. de Silva)

අපේ ප්‍රදේශයේ "ජෝසෆ් කොලනියක්" තිබෙනවා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

බලපිටියේ ගරු මන්ත්‍රීතුමාට යම් දෙයක් ප්‍රකාශ කරන්නට තිබෙනවා නම් කරුණාකර ඒ ගැන සටහනක් තබා ගන්න. බාධා කරන්නට ගියහොත් නියමිත කාල වේලාව අනුව වැඩ කරන්නට බැරි වෙනවා. කථා කරන විට ප්‍රශ්න නොඅසන ලෙස කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

**සෙනෙවින්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

ගරු කථානායකතුමනි, මේ රටේ තරුණ තරුණියන්ට මේ ලැබී තිබෙන අලුත් වරප්‍රසාදය අවස්ථානුකූල වූත් ප්‍රශංසා කටයුතු වූත් එකක් බව මතක් කරන්නට කැමතියි. විවාහ වූ අයට වගේම විවාහ නොවූ තරුණ තරුණියන්ටත් ඉඩම් ලබා ගැනීමේ වරප්‍රසාදය [illegible] ඇති නිසා ඒ මගින් මේ රටේ ඉඩම් සංවර්ධනය කරන්නට අවස්ථාව සැලසී තිබෙනවා. එසේම ඒ තරුණ තරුණියන්ට රජයෙන් ආධාර දී ඔවුන්ගේ ආත්ම ගෞරවය රැක ගැනීමේත් විනය රැක ගැනීමේත් තත්ත්වයක් යටතේ යන්ත්‍රෝපකරණ පාවිච්චි කරමින් නවීන ක්‍රමයට ඔවුන් ගොවිතැන්හි යෙදවීමට මේ ජාතික රජය ප්‍රතිපත්ති සකස් කර තිබෙනවා. නුදුරු අනාගතයේදී රක්ෂා නොමැති පිටිසර තරුණ පිරිසගෙන් විශාල සංඛ්‍යාවකට රජයේ මේ අලුත් ප්‍රතිපත්තිය යටතේ අලුත් ඉඩම්වල පදිංචි වීමට අවසථාව ලැබෙනවා ඇති.

ගරු කථානායකතුමනි, මෙම විවාදයේ දී ගරු මුදල් ඇමතිතුමාට වැඩියෙන් විවේචනයට ලක් වූයේ ගරු ඉඩම් ඇමතිතුමායි. මා එදා විරුද්ධ පැත්තේ සිටිය දී එවකට තිබුණු ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුවේ ඉඩම් ප්‍රතිපත්තිය ගැන තදින් විවේචනය කළ බව ගරු කථානායකතුමාට මතක ඇති. මා පැය ගණන් කථා කරමින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුවේ ඉඩම් ප්‍රතිපත්තිය විවේචනය කළා. නමුත් ජාතික රජය පිහිට වූවායින් පසුව එදා සිටි ඉඩම් ඇමතිතුමා යටතේම ඔහුගේ පාර්ලිමේන්තු ලේකම්වරයා හැටියට වැඩ කිරීමේ අවස්ථාව මට ලැබුණා. මේ තනතුරේ වැඩ භාරගෙන මා දැන් මාස 5 ක් වෙනවා. පසුගිය අවුරුදු 9 තුළ මේ ඉඩම් ඇමතිතුමා විසින් ඉඩම් පිළිබඳව ගන්නා ලද සෑම ප්‍රතිපත්තියක්ම ගෙන තිබෙන්නේ ඉතාමත්ම අවංකව බව, ඉතාමත්ම ආශාවෙන් බව, උද්‍යෝගිමත්ව බව දැන් මට ඔප්පු වී තිබෙනවා. මේ මගේ අවංකම ප්‍රකාශයක් බවද වැඩි දුරටත් මතක් කරන්නට කැමතියි. නමුත් අවාසනාවකට මෙන් ඒ ගත් වැදගත් ක්‍රියා මාර්ග හා ඒ සැලැස්මවල් ඔහුගේ බලාපොරොත්තුව පරිදි ක්‍රියාවේ යොද[illegible] බැරි වී තිබෙනව, විශාල අඩුපාඩුකම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රාශියක් තිබුණු නිසා. ඒ අඩුපාඩු වලින් එකක් නම් කැබිනට් මණ්ඩලය පොදු වගකීමෙන් තොරව වැඩ කිරීමයි. ඒ කාලයේ දී මා කළ කථාවලදී අප්‍රමාණ වාර යක් ඔය කාරණය ගැන සඳහන් කරල තියෙනව. තවත් කාරණයක් නම් දෙපාර්තමේන්තුවල සිටි ඇතැම් නිලධාරීන් ගේ දුර්වල ක්‍රියා කලාපය නිසා එවැනි වැදගත් සැලැස්මවල් ක්‍රියාවේ යෙදවීමට අවශ්‍ය පරිපාලන යන්ත්‍රය නොමැති වීමයි. අනික් කාරණය මොකක්ද ? මම අහනව ප්‍රශ්නයක්. මට පෙර මේ අමාත්‍යාංශයේ සිටි පාර්ලිමේන්තු ලේකම්වරුන් පසුගිය අවුරුදු 9 තිස්සේ පොල් ගැවද කියා මම ඒ අයගෙන් අහනව. ඇතැම් අය වම්බටු හිටෙව්ව, ගොටුකොළ හිටෙව්ව මට මතකයි. ගල් ඔය ප්‍රදේශයට ගොස් පාරේ යන බාබර්වරුන් "ඉන්ටර්ඩික්ට්" කළා අපට මතකයි. මා මේ කරුණු ප්‍රකාශ කරන්නේ අවංක හැඟීමකින් යුක්තවයි.

මම තවත් කාරණයක් කියන්නම්. ගරු සී. පී. ද සිල්වා, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ඇමතිතුමා ආත්මාර්ථකාමී භාවයෙන් තොරව අවංක අදහසකින් ක්‍රියා කළ නිසයි, එතුමාට පමණක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් අයින් වෙලා අනික් පැත්තට එන්න පුළුවන්කම තිබුනෙ. වෙන කාටවත් බැරි වුනා, ඒ විධියට අනික් පැත්තට එන්න. එන්න බයයි. අදත් එන්න කැමති අය ඉන්නව. නමුත් එන්න බයයි. සිංහල කියමනක් තියෙනව, ඔය වැඩේ කළොත් අර බිලු ගැ කථාව කියනවය කියා. නමුත් සී. පී. ද සිල්වා ඇමතිතුමාට කිසිම දෙයක් කියන්න කිසිම කෙනකුට පුළුවන්කමක් නැහැ. එතුමාට හංගන්න කිසිම දෙයක් නැහැ. අවංක අදහසකින් යුක්තව, උද්‍යෝගිමත්ව, ආත්මාර්ථකාමී භාවයෙන් තොර ක්‍රියා මාර්ගයක් අනුගමනය කළ නිසා එතුමාට පමණක් අනික් පැත්තට එන්න පුළුවන්කම තිබුන.

ගරු කථානායකතුමනි, ජාතික රජයේ නව ඉඩම් ප්‍රතිපත්තිය යටතේ නව වැදගත් වෙනස්කම් කීපයක් ක්‍රියාත්මක කරන්නට යෝජනා කර තිබෙනව. අනික් පියවර නම් රජයෙන් ඉඩම් ලබාගෙන සිටින සෑම කට්ටි කරුවකුටම ඒ ඉඩම් සම්පූර්ණයෙන් අයිති වන පිළිවෙලට කටයුතු සැලැස්වීමයි. දැන් ඒ කොමිෂමේ වාර්තාව ලැස්තියි. දැන් ඒ වාර්තාව ප්‍රදේශවල දිසාපතිවරුන්ට යවා තිබෙනව, ඒ අයගේ අදහස් මොනවද, ඇතුළත් කළ යුතු දේ මොනවාද, වැඩ පිළිවෙළ සකස් කළ යුත්තේ—ක්‍රියාවේ යෙදවිය යුත්තේ—කෙසේද කියා දැන ගන්ට. ඒ වැදගත් පියවර ගත් පසු රජයේ ඉඩම් ලබා ගත් ගොවියා රජයේ කුලී කාරයකු හැටියට නොව, මේ ඉඩම් මගේය කියන හැඟීම ඇතිව ක්‍රියා කරන්නට පුළුවන්—ආත්ම ගෞරවය ඇතිව ක්‍රියා කරන්නට පුළුවන්—පුද්ගලයෙක් වෙනව. තමන්ටම අයිති පෞද්ගලික ඉඩම් හැටියට ඒවා වගා කිරීමෙන් ඔවුන්ට නව වැදගත් පහසුකම් රාශියක් ලැබෙනව.

ගරු කථානායකතුමනි, නව රජය බල යට පත් වන අවස්ථාවේදී පමණක් නොව ඊට පෙරත්, මා කලින් කීව වගේ, අපේ අතිරේක ආහාර ද්‍රව්‍යවල විශාල හිඟයක් තිබුන. ඒ හිඟය අදත් තියෙනව. මේ ද්‍රව්‍ය සියල්ලක්ම මේ රටේ නිපදවන්න පුළුවන්. අතිරේක ආහාර ද්‍රව්‍ය පිට රටින් නොගෙන්වා මෙහිම වවා ගැනීම සඳහා පෞද්ගලික අංශයේ ව්‍යාපාරිකයන්ට ඉඩම් දීමට නව රජය ගෙන තිබෙන ප්‍රතිපත්තිය ගැන විරුද්ධ පාර්ශ්වය බොහොම ලොකු බියක් ප්‍රකාශ කර තිබෙනව. එහෙත් මා මෙන්න මේ කරුණ කියන්න කැමතියි. මෙය විරුද්ධ පාර්ශ්වයත් පිළිගන්නවා ඇති. අපි මේ ආණ්ඩුව බාර ගත්තේ මාර්තු මාසයේයි. නමුත් අපට ඉතා ඉක්මණින්ම එණු, මිරිස්, බොම්බයි එණු ආදිය මේ රටේ නිපදවන්නට අවශ්‍ය වී තිබෙනව. අද හෙට මේ වැඩ පටන් නොගත්තොත් මේවා කරන්න වෙන්නෙ ලබන වර්ෂයේ මාස් කන්නයටයි. ඒ නිසා අද අදම ප්‍රමාද නොවී පෞද්ගලික අංශයෙන් ඒවා කරවා ගන්නට සිදු වී තිබෙනවා. මෙපමණ කලක් මේ රටේ සිටි දුප්පත් ගොවියා අයින් කර ධනපතීන්ට මේවා දෙන්නේ ඇයි කියා පත්තර මාර්ගයෙන් කරුණු ප්‍රසිද්ධ කරමින් විරුද්ධ පාර්ශ්වය කෑ ගහනවා. ඒ දේශපාලන වාසියක් ලබා ගන්න


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සෙනෙවිරත්න මයා.]
වෙන්න ඇති. අපි දුප්පත් ගොවියා අයින් කර නැහැ. මේ රට ස්වයංපෝෂිත කිරීමට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය වගා කිරීම සඳහා මේ රටේ දුප්පත් ගොවියා ගේ හිස පිට යම් වගකීමක් තිබුණද ඊට වඩා සිය ගුණයක් ඒ වගකීම අපි වැඩි කරනවා. මේ රටට අවශ්‍ය පාරිභෝගික ආහාර ද්‍රව්‍ය නිපදවීම සඳහා ඒ ගොවියා යොදවන අතරම, වඩා ඉක්මණින් රට ස්වයංපෝෂිත කිරීම සඳහායි ඊට අතිරේකව ධනපති යන් යොදවන්නට අප අදහස් කළේ.

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)
විරුද්ධ පාර්ශ්වයේ අයට ඔක කිව්වට තේරෙන්නෙ නැහැනෙ.

සෙනෙවිරත්න මයා.
(திரு. செனெவிரத்ன)
(Mr. Seneviratne)
යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) මේ ගැන බොහොම කෑගැහුවා. ඒ අයගේ බණ කොමියුනිස්ට් බණ. අපේ බණ ප්‍රජාතන්ත්‍රවාදී බණ. එතුමා කොපමණ කීවත් කොමියුනිස්ට් වාදයේ අවවාද අපට සරිලන් නේ නැහැ. අපි ප්‍රජාතාන්ත්‍රිකයි. මා පොඩි කවියක් කියන්නම්.

ඔවා දෙනු පරහට—තමා සම්මතෙහි පිහිටා සිට
දුසිරිත දනන් දෙන—ඔවා වැද්දන් කියන බණ වැනි

නොතේරුණත් කරන්න දෙයක් නැහැ. තමන්ට තමන්ගේ ප්‍රතිපත්ති අනුව එදා යම්කිසි කෙටුම්පත් පනතක් රට පිළිගන්නා හැටියට ඉදිරිපත් කරන්න බැරි වී "ඇයි මෙහෙම කරන්නේ" කියා අද ප්‍රජාතන්ත්‍රවාදය පිළිගන්න අපෙන් අහනව. ඉස්කෝල ගුරුවරයෙකුට බොහොම තරහ ගොස් කියනවා වගේ "ඇයි මෙහෙම කරන්නෙ, අපි නැවැත්වූ තැන සිට කරන්න බැරිද" කියා අහනව. විරුද්ධ පාර්ශ්වයට බොහොම ලොකු බයක් ඇති වී තිබෙනව. ඒ බය ගැන අපි කණගාටු වෙනව. ඒ බය සාධාරණයි; නමුත් අපේ ගමන අපි ඉදිරියටම යනවා.

ගරු කථානායකතුමනි, ගරු පානදුරේ මන්ත්‍රීතුමාගේ (ලෙස්ලි ගුණවර්ධන මයා.) කථාවේදී කියවුණා, තවත් වරක් මේ රට අධිරාජ්‍යවාදීන්ට විකුණන්නට යනවාය කියන එක. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විසින් තවත් පරම්පරා හතක් අටක් පිටරටවලට ණය ගැති කර තිබෙනවා 1964 ට කලින් දැක්කේ නැද්ද? එදා උන්නැහේලාට ඒක කියන්න මතක් වුණේ නැත්තෙ ඇයි? අපට මේ උරුමය බාර වී තිබෙන්නෙ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විසින් තවත් පරම්පරා පහක් හයක් මේ රට පිටරටට ණයගැති කර තිබියදීයි. අපි මේවා කරන්නේ අපේ මාවත අනුවයි. එනම් ප්‍රජාතන්ත්‍රවාදී මාවත අනුවයි. කොමියුනිස්ට්වාදී අධිරාජ්‍යවාදීන්ටවත් අපර දිග අධිරාජ්‍යවාදීන්ටවත් අපේ අනාගත පරම්පරාවල් ණයගැති නොකර මධ්‍යස්ථ විදේශීය ප්‍රතිපත්තියක් අනුගමනය කරමින් අපේ රට දියුණු කිරීමටයි අපි උත්සාහ කරන්නෙ.

මේ ඉස්සරහ පෙළේ දේශපාලන බුද්ධියකින් හා ජාත්‍යාලයකින් යුතු ආත්මාර්ථ කාමිත්වයෙන් තොර හොඳ මොළ ටිකක් තිබෙනවා. ඒවා කෙරෙහි අපේ ලොකු හැඟීමක් හා විශ්වාසයක් තිබෙනව. එමෙන්ම මේ පිටුපස ආසන වලත් අනික් පැත්තේ පිටුපස ආසන දෙපේලියේත් වැදි භාෂාවෙන් කියනවා නම් හොඳ අවංක අදහස් ඇති කැකුළන් ටිකක් සිටිනව. ඔය දෙපාර්ශ්වයේ මාර්ගයෙනුත් මේ රටේ දුප්පත් මහජනතාවගේ ආශීර්වාදයෙනුත් මේ රට සම්පූර්ණයෙන්ම ස්වයංපෝෂිත කර, මේ රට දියුණු කිරීමට ලැබෙනවාය කියන එක ගැන කිසි අනුමාන යක්නැති බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනව.

අ. භා. 12.3

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)
ගරු කථානායකතුමනි, මගේ කථාව ආරම්භ කරන්නට මත්තෙන් වැදගත් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කර ගැනීමට වුවමනා කර තිබෙනවා. රජයේ භාෂාව සිංහල භාෂාවය කියා රාජ්‍ය ඇමතිතුමාම මේ ගරු සභාව ඉදිරියේ කීප වරක්ම ප්‍රකාශ කර තිබෙනවා. එපමණක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නොව, වෙන තැන්වලත් ඒ ආකාරයට ප්‍රකාශ කර තිබෙනව. එහෙම නම් මෙම අය වැය කථාවේ සිංහලෙන් තිබෙන වාර්තාව මුල් පිටපත හැටියට අප පිළිගත යුතුව තිබෙනව. මෙම සිංහල පිටපතේ 28 වන පිටුවේ අන්තිම කොටසේ මෙවැනි විස්තර යක් තිබෙනව :

"ලබන මුදල් වර්ෂය පිළිබඳ ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තු අතර හොඳින් කැපී පෙනෙන ලක්ෂණයක් වනුයේ කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශයට රුපියල් 12 කෝටි 9 ලක්ෂයක් වෙන් කරනු ලැබීම යි. වර්තමාන වර්ෂය සඳහා ඒ වෙනුවෙන් වෙන් කර ඇත්තේ රුපියල් 10 කෝටි 15 ලක්ෂය යි. මේ මුදල උපයෝගි කරනු ලබන්නේ පෞද්ගලික අංශයෙහි දැනට පවත්නා ව්‍යාපාර ව්‍යාප්ත කිරීමට යි."

එතකොට සිංහල පිටපත මුල් පිටපත හැටියට අපි සලකනව. නමුත් ඉංග්‍රීසියෙන් තිබෙන්නෙ මෙන්න මේ ආකාරයටයි. 27 වන පිටුවෙන් පටන් ගෙන 28 වන පිටුවෙහි ඇති කොටසෙහි මේ අන්දමට දැක් වෙනව :

"A significant feature of the capital expenditure estimates for the next financial year is the provision of Rs. 120.9 million for the Ministry of Industries and Fisheries, compared with Rs. 101.5 million in the current year.—"

So far, so good.

"—This provision will be utilized for the expansion of existing undertakings in the public sector."

පෞද්ගලික ව්‍යාපාර සඳහාය කියා මුල් පිටපතේ තිබෙනව. පරිවර්තනය කරන ලද පිටපතේ තියෙන්නෙ එය ජනසතු නැත් නම් පොදු ව්‍යාපාර සඳහා යොදවනවාය කියායි. මේ කාරණා දෙකින් සත්‍යය මොකක්ද කියා දැනගන්න කැමතියි.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. **Wanninayake**)

Public sector රජයේ කටයුතු **සඳහා.**

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டாக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

මොන විධියෙන් සඳහන් කළත් අපට පිළිගන්න සිදු වී තිබෙන්නෙ තමුන්නාන් සෙ ඉදිරිපත් කළ මුල් පිටපතයි. එනම් සිංහල පිටපතයි. අර කතාවක් තිබෙනව කට බොරු කියතත් දිව බොරු කියන්නෙ නැහැයි කියල. මම නිකම් චෝදනා කරන්නෙ නැහැ. මගේ චෝදනාවල සත්‍යයක් තිබෙනව. තමුන්නාන්සෙලාගේ පක්ෂයේ අතීතය ගැන කල්පනා කරන විට, පක්ෂයේ මුතුන්මිත්තන්ගේ කාලයේ සිට, 1948 සිට 1956 දක්වා කාලය තුළ, ගෙන ගිය වැඩ පිළිවෙල, අනුගමනය කළ ප්‍රතිපත්ති, දැන් අනුගමනය කරන ප්‍රතිපත්ති, කරන ප්‍රකාශයන්, දැන් විකකට පෙර කථා කළ උප ඇමතිතුමා අනාවරණය කළ අදහස්, මේ සියල්ලක් ගැන කල්පනා කර බලන විට, කට බොරු කියතත් දිව බොරු කියන්නෙ නැහැයි කියන කථාව හොඳ හැටි ඔප්පු වෙනව.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

බොහොම ස්තුතියි ඒ වරද පෙන්න දුන්නට.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டாக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

ගරු කථානායකතුමනි, මම මේ සම්බන්ධයෙන් මෙයට වැඩි යමක් ප්‍රකාශ කරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. මෙයට කලින් ප්‍රකාශ කළ ඇතැම් කාරණා වගයක් විස්තර කර දෙන්නට බලාපොරොත්තු වෙනව. එතකොට දැනගන්න පුළුවනි, කොයි අන්දමේ වැඩ පිළිවෙළක් ගෙන යන්නට අදහස් කරගෙන සිටියාද කියා.

මේ ගැන පරීක්ෂා කර බලන ලෙස මම තමුන්නාන්සෙගෙන් ඉල්ලා සිටිනව. මන්ද? අපට අදහස් දෙකක් ප්‍රකාශ කර තිබෙනව. රජයේ භාෂාවෙන් එකක් කියනව. ඉංග්‍රීසි භාෂාවෙන්—විදේශීය භාෂාවකින්—එකක් කියනව. එම නිසා තමුන්නාන්සේගෙ සැලකිල්ල මෙයට යොමු කර වන්නටය කියා මම නැවත වරක් ඉල්ලා සිටිනව.

Six-Year Programme of Investment 1954-55 to 1959-60.

Foreword by J. L. Kotelawala, Prime Minister.

Introduction by M. D. H. Jayawardane, Minister of Finance. July 13, 1955.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

මෙම වාර්තාවේ සිංහල අනුවාදයක් මා දුටුවේ නැහැ. එම නිසා ඉංග්‍රීසියෙන් කියවා, පසුව සිංහලට පරිවර්තනය කරන්නම්. එහි 238 සහ 239 යන පිටුවල මෙසේ සඳහන් වෙනව:

"Industrialization in the programme is based on a new policy designed to 'help the private sector to help itself'. As a first step towards the implementation of this policy the Government-sponsored Corporations Act, No. 19 of 1955, has been placed in the Statute Book. This Act enables the transfer of Government enterprises to the private sector in three stages......Under the new policy, Government would undertake the initial risk partly or wholly, and once the industry is firmly established private capital would be invited to participate."

"ත්‍රී ස්ටේජස්" විස්තර කරන්නෙ නැහැ; වෙලාව නැති නිසා.

Then, at page 241:

"Existing Government Enterprises

During the six-year period Government also proposed to spend a sum of Rs. 40.8 million on the consolidation of the State industrial enterprises now in operation and on the establishment and operation of those not yet complete until such time as they are taken over by the private sector. Each of these enterprises is discussed below:—"

ලැයිස්තුව මෙසේයි:

The Cement Factory
The Leather Factory
The Plywood Factory
The Vegetable Oil Factory
The Paper Factory
The Ceramic Factory
The Caustic Soda-D.D.T.-Chlorine Factory
The Salt Industry.

ගරු කථානායකතුමනි, මෙම සැලැස්ම අනුව එක්සත් ජාතික පක්ෂයෙ ආණ්ඩුව ලංකාවෙ කර්මාන්ත දියුණුවට සම්බන්ධ වෙන්නෙ, ඒ සඳහා මුදල් වැය කරන්නෙ, ධනපති පන්තිය ආරක්ෂා කිරීමේ අදහසිනුයි. තමන් ඒ කටයුතු කිරීමට අදක්ෂ නිසා පළමුවෙන් මහජනයගෙ මුදල් වියදම් කර ඉන් පසුව තව දුරටත් දියුණු වීම සඳහා ධනපතීන්ට මේ කර්මාන්ත භාර දෙනව. පටන් ගන්නා විට අලාභ වේය කියන සැකය පවතින නිසා තමන් මුදල් යොදවා කර්මාන්ත පටන් ගන්නෙ නැහැ. දුප්පත් ජනතාවගෙ මුදල් යොදවා අලාභ විධියට හෝ ලාභ විධියට හෝ මෙම කර්මාන්ත පටන් ගන්නව. හොඳට වැඩ කෙරෙනව නම්, තවත් දියුණු කර ගැනීම සඳහා පුද්ගලික අංශයට භාර දෙනව. අලාභ නම්, ඒ අලාභය අයබදු ගෙවන්නන්ගෙ අවාසියයි; ඉන් පසුව වසා දමනව. වාසිදායක නම් වාසිය ධනපතියන්ටයි; මේකයි, එක්සත් ජාතික පක්ෂයෙ මූලික ප්‍රතිපත්තිය.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

මා යෝජනා කළ භාෂාවෙන් තිබෙන එක භාර ගන්න.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்கிரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

තමුන්නාන්සේ කියන්නෙ රජයේ භාෂාවෙන් තිබෙන එක පිළිගන්ට එපා කියාද? ඒක තමයි මම කිව්වෙ කට බොරු කිව්වත්, දිව බොරු කියන්නෙ නැහැ, කියා. මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය සිංහල මූලික වාර්තාවේ ගැබ් වෙලා තිබෙනව. මොන හේතුවක් නිසා ඉංග්‍රීසියෙන් අර විධියට දැම්මද කියා චෝදනා කරන්ට මට වුවමනාවක් නැහැ. පළමුවෙන් තිබුණු ප්‍රතිපත්තිය වෙනස් කළාද කියා අහන්ට වුවමනාවක් නැහැ. රාජ්‍ය භාෂාව පිළිබඳව අයවැය වාර්තාවේ තිබෙන පළමුවෙනි ප්‍රශ්නයයි මා ඉදිරිපත් කළේ. මෙය ඉංග්‍රීසියට පරිවර්තනය කරන තැනැත්තාට හදිසි වැරදීමක් වෙන්ට බැහැ. "පබ්ලික්" හා "ප්‍රයිවේට්" කියන වචන දෙක අහසට පොළව වගේ විරුද්ධ වචන දෙකක්. මේ සිංහල වාතීව ලියාපු අය එක්සත් ජාතික පක්ෂයේ නියම ප්‍රතිපත්තිය අවබෝධ කරගෙන සිටින කෙනෙක් නිසා උන්නැහේ ඇත්ත ලිව්ව.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

සභාවේ යෝජනා කළ එක පිළිගත්තම හරි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
(டொக்டர் எஸ். ஏ. விக்கிரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)

සභාවේ කොයි එක කියෙව්වත් රජයේ භාෂාව සිංහල නොවෙයිද? ඇමතිතුමා හිතා වෙන්නෙ සිංහල භාෂාව රජයේ භාෂාව කියන එක විහිළුවක්ද? වන්නියට අපහාස කරන්ට එපා. [බාධාකිරීමක්]

ගරු කථානායකතුමනි, දැන් මට පෙර කථා කළ පාර්ලිමේන්තු ලේකම්වරයා ආසනයේ නැහැ. උන්නැහේ ප්‍රකාශ කළ අදහසක් සම්බන්ධව කරුණු ස්වල්පයක් මතක් කර දෙන්ට ඕනෑ. සෝවියට් රුසියාව වැනි කොමියුනිස්ට් රටවලින් ආධාර ලබා ගැනීමත් ඇමරිකන් ආධාර ලබාගැනීමත් අතර වෙනසක් තිබෙනවද? කාට ණය වුණත් රටට සිදු වෙන්නෙ විපත්තියක් නේද? යනුවෙන් උන්නැහේ ප්‍රශ්න කළා. කථානායකතුමනි, ඇමරිකාවේ මුදල් ඇමතිවරයෙකු වන ඩිලන් නමැති මහත්මයා "U. S. Senate Relations Committee" වශයෙන් හැඳින්වෙන ඒ රටේ පාලන අංශයේ ප්‍රධාන ආයතනය ඉදිරියේ සාක්ෂි දෙමින් කර තිබෙන ප්‍රකාශයක් මෙන්න:

"Provision would be made to prevent the utilizing of the easy U.S. loans to develop industries in competition with the U.S."

ඉන්දියාවට ණය දීම සම්බන්ධයෙන් ප්‍රශ්න පැන නැඟුණු අවස්ථාවේදී ඒ මහත්මයා ඒ ආයතනයට දුන්න සහතිකය තමයි ඒ මා කියෙව්වෙ.

ඒ සාක්ෂියෙන් කියවෙනව, ඉන්දියාවට ණය දෙන නමුත් කාර්මික සංවර්ධනයට ඉඩ තබන්නෙ නැත, ඒවා වැළැක්වීමට කටයුතු සංවිධානය කරනවා, කියා. ආණ්ඩුවේ වගකියයුතු පුද්ගලයෙක් ඒ රටේ තිබෙන උසස්ම සංවිධානය ඉදිරියේ සාක්ෂි දෙමින් ඒ ප්‍රකාශය කළේ. ඒ රටේ ප්‍රතිපත්තිය ඒකයි. මේ රට අවුරුදු සිය ගණනක් අධිරාජ්‍යවාදීන්ට යටත්ව තිබීමේ විපාකයක් වශයෙන් වහල් හැඟීම් අපේ මිනිසුන් තුළ කොයිතරම් දුරට කාවැදී තිබෙනවාද කියතොත්, මේ පාර්ලිමේන්තු ලේකම්වරයාට අවබෝධ කර ගන්ට බැහැ තවම, පොදු ජනතාවට සම්

පූර්ණ වස්තුව අයිති, ධනපති ක්‍රමයෙන් තොර රටවලින් නොදියුණු රටකට ආධාර දෙන්නෙ ඒ නොදියුණු රටේ ආර්ථික දියුණුව මෙන්ම කර්මාන්ත දියුණුව ඇති කරගෙන දේශපාලන වශයෙන් මෙන්ම ආර්ථික වශයෙන්ද නිදහස් රටක් වශයෙන් පෙනී සිටීමට ආධාර වන අන්දමට අවංක චේතනාවෙන් බව. ඒක නොදන්නවා නොවෙයි. ඒ තරම් දෙයක නොදන්නෙ නැහැ. ඒ තරම් මෝඩයො නොවෙයි වන්නියෙ ඉන්නෙ. මා පිළිගන්නෙ නැහැ වන්නියෙ ඒ තරම් මෝඩයො ඉන්නවාය කියා. නමුත් වහල් අවබෝධයකින්, මේ රටේ සිටින ධනපති අතළොස්සක් අධිරාජ්‍යවාදී ඒකාධිකාරී ධනපතීන් සමග එක්කාසුවී මේ රටේ ධනය ධනපතීන්ටම රැස් කර ගැනීමේ වැඩ පිළිවෙළ අනුව කටයුතු කර රටත්, ජනතාවත් පාවාදීමට අධිරාජ්‍යවාදීන්ට එක්කාසු වීමට මේ අය තුළ කුමන්ත්‍රණයක් තිබෙන නිසාත්; එක්සත් ජාතික පක්ෂය ආරම්භයේ සිටම ඒ ප්‍රතිපත්තිය ගෙන ගිය නිසාත් අද මේ විධියට සෝවියට් දේශය වැනි සමාජවාදී රටවලින් දෙන ආධාර සම්බන්ධව කාරණා නොදන්නා විලාසයෙන්, නොතේරෙන ආකාරයෙන් බොරු ප්‍රකාශ කරනවාය කියා මා ප්‍රකාශ කරනවා. ඒ නිසා, සක්සුදක් සේ පෙනෙන, අහස පොළව මෙන් පෙනෙන; අධිරාජ්‍යවාදී රටවලින් නොදියුණු රටවලට දෙන ආධාරත්, සමාජවාදී රටවලින් නොදියුණු රටවලට දෙන ආධාරත් අතර පවතින වෙනසවත් නොතේරෙන මෝඩයින් මේ ආණ්ඩු පක්ෂයේ මුල් පේළිවල සිටිනවාය කියා මා ඔවුන්ට අගෞරවයක් නින්දාවක් කරන්නෙ නැහැ. ධනපති පන්තියට සේවය කරන්නට බැඳී සිටින ධනපති ආධාර ඇතිව, බලයට පත්ව සිටින; ස්වදේශීය හා විදේශීය ධනපතීන් බලයට පත් කළ මේ කොටස ඒ ධනපති පන්තියටම සේවය කළයුතුව තිබෙන නිසා විනා ඇමරිකන් ඒකාධිකාරී ධනපතීන්ගේ ආධාරත් සමාජවාදී රටවලින් ලැබෙන ආධාරත් අතර ඇති වෙනස පිළිබඳව කරුණු නොදන්න නිසා නොවෙයි.

ඊළඟට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මේ රටට කළ දේ මොනවාද කියා එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් ප්‍රශ්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

කරනව. ඒ සම්බන්ධයෙන් එකම කාරණයක් ඉදිරිපත් කරන්නට මා කල්පනා කළා. ආසියාතික රටවල යුද කඳවුරු තබා ගත් අධිරාජ්‍යවාදී රටවල් සමග පමණක් සම්බන්ධකම් ඇති කරගෙන, ඇත්ත වශයෙන්ම අධිරාජ්‍යවාදීන්ගේ වහල්භාවයට යටකර තිබුණු මේ රටේ; එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්ති වෙනස් කර මධ්‍යස්ථ ප්‍රතිපත්තියක් ඇති කරමින්, සමාජවාදී රටවල් සමග තානාපති සම්බන්ධකම් ඇති කර ගන්නට ප්‍රථමයෙන් ක්‍රියා කළේ බණ්ඩාරනායක අගමැතිතුමාගේ නායකත්වයෙන් තිබුණු ආණ්ඩුවයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව මේ රටේ නියම නිදහස ඇති කිරීමට ගත් ඒ ක්‍රියා මාර්ගයම එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිගාමී කොටසගේ කල්පනාවට භාජන විය යුතු බව මා ප්‍රකාශ කරන්නට සතුටුයි.

ඊළඟට ලංකාවේ කර්මාන්ත සම්බන්ධයෙන් කල්පනා කර බලමු. සමාජවාදී රටවල ආධාර ඇතිව නොයෙක් නොයෙක් කර්මාන්ත සම්බන්ධව අද ඉතා ශීඝ්‍රයෙන් වැඩ කටයුතු කරගෙන යනවා. වානේ කර්මාන්තශාලාවේ කටයුතු අද ශීඝ්‍රයෙන් කෙරී ගෙන යනවා. ටයර් කර්මාන්ත ශාලාවේ වැඩත් ශීඝ්‍රයෙන් කෙරී ගෙන යනවා. ඒවාගේම පිටි සාදන විශාල කම්හලක වැඩ කටයුතුත් අද කෙරී ගෙන යනවා. හාඩ්වෙයාර්, වානේ සහ වෙනත් ලෝහ තහඩුවලින් උපකරණ තැනීමේ කර්මාන්ත ශාලාවකුත් තනා ගෙන යනවා. ඒවාගේම යන්ත්‍රෝපකරණවලින් ගඩොල් සෑදීමේ කර්මාන්ත ශාලාවකුත් පිහිටුවන්නට කටයුතු කරගෙන යනවා. තවද, "කෙමිකල් ඉන්ඩස්ට්‍රීස්" යනුවෙන් හැඳින්වෙන රසායන ද්‍රව්‍ය පිළිබඳ කර්මාන්තය දියුණු කිරීමට ඉතාමත් වටිනා වැදගත් විස්තර සහිත සැලැස්මක් නැගෙනහිර ජර්මනියේ විශේෂඥයන් ඉදිරිපත් කර තිබෙනවා. ඒ විශේෂඥයන් ලංකාවේ මාස ගණන් සංචාරය කර, පරීක්ෂණ පවත්වා ඒ සැලැස්ම ඉදිරිපත් කර තිබෙනවා පමණක් නොවෙයි; ඒ අනුව කටයුතු කිරීමට වුවමනා විශේෂඥයන් පුහුණු කිරීමේ වැඩ පිළිවෙලකුත්, ඒවාගේම කොන්දේසි රහිතව, සියයට 3 නේ පොළියට රුපියල් 20 කෝටියක ණය ආධාරත් දීම සම්බන්ධවත් පැහැදිලි විස්තර සහිත වාර්තාවක් පසුගිය සභාග ආණ්ඩුවට ඉදිරිපත් කළා. සභාග ආණ්ඩුවත් නැගෙනහිර ජර්මන් ආණ්ඩුවත් මෙම කර්මාන්තය දියුණු කිරීමේ කැමැත්ත ඇතිව ඒ පිළිබඳව සම්මුතියකට එළඹුණා. නමුත් මෙම වාර්තාවේ ඒ ගැන වචනයක්වත් සඳහන් කර නැහැ. ප්‍රංසය අපට ආධාර කිරීමට කැමතිවීම ගැන ප්‍රශංසා මුඛයෙන් වචන ටිකක් සඳහන් කර තිබෙනවා. අසතුටු වී සිටි අමෙරිකන් අධිරාජ්‍ය වාදී රකුසා පිදේනි දීමෙන් සතුටු කර ගැනීම ගැනත් ප්‍රශංසා මුඛයෙන් සඳහන් කර තිබෙනව. අමෙරිකන් අධිරාජ්‍යවාදීන්ට රට පාවා දීමේ නින්දනීය ක්‍රියාව දක්ෂකමක් හැටියට මෙහි සඳහන් කර තිබෙනවා. නමුත් මේ රටේ දියුණුවට ආධාර කළ සමාජවාදී රටවල් ගැන එක වචනයක්වත් සඳහන් කර නැ.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

වාර්තාව හොඳ හැටි කියවා බලන්න.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

මම නම් වාර්තාව කියෙව්වා. නමුත් මට පේන්නෙ නෑ. තියෙනවා නම් මට පෙන්වා දෙන්න. එසේ පෙන්වා දුන්නොත් මා කළ චෝදනා ඉල්ලා අස් කරගන්නට ලෑස්තියි.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

මම පිළිතුරු දෙන විට පෙන්වා දෙන්නම්.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

මම මේ වාර්තාව සිංහල, ඉංග්‍රීසි භාෂා දෙකෙන්ම කියෙව්වා. මට පේන හැටියට නම් එහි මා කියන කරුණු සඳහන් වී නෑ. තමුන්නාන්සේට එය පෙන්වා දෙන්නට බැරිනම් තමුන්නාන්සේ කියන්නේ බොරුවක්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු කථානායක තුමනි, මේ විධියට වචන හුවමාරු කරන්න ගියාම කරගෙන යන කථාව අමතක වෙනවා. ලංකාවේ ජාතික සංවර්ධනයේ වේගය බොහොම මදිය කියා මෙම වාර්තාවෙහි එක් තැනක කියා තිබෙනවා. එය අපිත් පිළිගන්නවා. සමහර රටවල් බොහොම වේගයෙන් දියුණුව සඳහා කටයුතු කරගෙන යන බවත් ඒ එක්කම කියා තිබෙනවා. මොනවද මේ රටවල් ? ඒවා නම් කර නෑ. නම් කරන්නට බයයි. ඒ රටවල නිදහස සම්පූර්ණයෙන්ම නැති කිරීමටත් ඒ රටවල් යටත් කර ගැනීමටත් කටයුතු කරන අමෙරිකන් අධිරාජ්‍යවාදීන්ගේ යුද්ධ භූමි හැටියට පරිවර්තනය වුණු අග්නි දිග ආසියාවේ රටවල් කීපයක් ගැන පමණයි කල්පනා කර තිබෙන්නෙ. නමුත් නම් කියන්නට බයයි. තවම ලජ්ජා බය ටිකක් තියෙනවා. තව ටික දවසක් යන විට අධිරාජ්‍යයවාදීන්ගේ බලපෑම් නිසා දැනට තියෙන ලජ්ජා බය ටිකත් නැතිව යනවා. මහ ජනතාව විසින් සම්පූර්ණයෙන්ම පන්නා දමාවිය යන බියක් පමණයි තිබෙන්නෙ. ඒ බිය නිසාත් මේ ආණ්ඩුවේ ලඟ සිටින්නට තිබෙන ආසාව නිසාත් තමයි ඒ රටවල නම් මෙහි සඳහන් කර නැත්තෙ.

ගරු කථානායකතුමනි, මොනවද මේ රටවල් ? එකක් දකුණු කොරියාව. ලෝකයේ තිබෙන විශාලම යුද්ධ සේනා හතරෙන් එකක් තිබෙන්නේ මේ දකුණු කොරියාවෙයි. මෙය අමෙරිකන් අධිරාජ්‍යවාදීන්ගේ යුද කඳවුරක්. ආසියාවේ රටවල් තමන්ගේ යටත් විජිතයන් බවට පරිවර්තනය කර ගන්නට මාන බලන අමෙරිකන් අධිරාජ්‍යවාදීන් මේ රටට ආධාර දෙනවා. අද මෙය මුළු ආසියාවටම තර්ජනයක් වී තිබෙනවා. මෙම රටේ උද්ධමනය පාලනය කරන්නට බැරිය කියා ලෝක බැංකුවත් අමෙරිකන් ආණ්ඩුවත් දෙවතාවක්ම මේ රටට දෙන ආධාර නතර කළා.

අනික් රට නම් තයිවාන්. එහි ආර්ථික සංවර්ධනය ශීඝ්‍රයෙන් කෙරෙනව. එහෙත් තයිවාන්හි කර්මාන්තවල සම්පූර්ණ අයිතිය කාටද තියෙන්නෙ ? එහි කර්මාන්ත සම්පූර්ණයෙන්ම වාගේ තිබෙන්නෙ ඇමෙරිකන්කාරයින්ටයි. තයිවාන් අමෙරිකාවේම කොටසක් හැටියටයි ඔවුන් කල්පනා කරන්නෙ. එය හත්වන නාවුක හමුදාවේ වැඩ කටයුතුවලට [illegible] යක් වී තිබෙනවා. චීනයට තර්ජනය කරන්නෙ, දකුණු වියෙට්නාමයට තර්ජනය කරන්නෙ, බෞද්ධයන් තනි කරන ම්ලේච්ඡ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්නෙ එහි සිටිමිනුයි. බෞද්ධයන් විශාල වශයෙන් ජීවත් වන කැම්බෝඩියාව වැනි රටවල් සම්පූර්ණයෙන් නැති වන වැඩ කටයුතු කරගෙන යන්නෙ තයිවාන් කින රටේ සිටිමිනුයි. එහෙත් ඒ බව පැහැදිලි ලෙස කියන්න බයයි. බයත් ලජ්ජාවත් නිසා කොයි තරම් ප්‍රශ්න කළත් කියන්නෙ නැහැ.

තායිලන්තය අනික් රටයි. ඒ රටෙත් යම්කිසි විධියක දියුණුවක් කර්මාන්ත අතින් ඇති වෙලා තියෙනව. ආහාර වගාවන් දියුණු ලෙස කරගෙන යනව. හැබැයි, මොනවද එහි වැඩි වශයෙන් කරන වගාව ? මුළු ලෝකයම බඩ ඉරිඟු විශාල වශයෙන් වගා කරන රටවල් අතුරින් ප්‍රධාන අංකයේ ලා ගිණිය හැකි රටක් තමයි තායිලන්තය. Maize වලට කියන්නෙ බඩ ඉරිඟු කියල නේද ? විශාල වශයෙන් අද ලෝකයේ බඩ ඉරිඟු වගා කරන රටක් තමයි තායිලන්තය. කොහොමද ඒ බඩ ඉරිඟු වැවීම කරන්නෙ ? ලංකාවෙත් කරන්න යන්නෙ ඒ විධියටමයි. ජපන් රටේත් ඇමෙරිකාවේත් විශාල ධනපතියන්ට ඒ රටේ අක්කර ලක්ෂ ගණනාවක් බෙදා දී තිබෙනව. බඩ ඉරිඟු වගාවට තායිලන්ත ආණ්ඩුවය කියන්නෙ ඇමෙරිකන් ආණ්ඩුවකටයි. ඒ රටට ඔය රටවලින් ලැබෙන විශාල ආධාර නිසා තමයි ඒ රට බංකොලොත් නොවී තිබෙන්නෙ. පඩිනඩි ගෙවන්න වුවමනා කරන මුදල් ලබා ගන්නෙත් ආධාර වශයෙනුයි. පොලිසියේ වැටුප් ගෙවන්නෙත් ඇමෙරිකන් ආධාර මුදලිනුයි. මේ රටේ ජපන් කොම්පැනි මගින් ලක්ෂ ගණන් අක්කර ඉරිඟු වගා කරනව. මොකටද ? ජපානයේ බහුල වශයෙන් කුකුළන් ඇති කරනව. කුකුළ් පට්ටිවලට වුවමනා කෑම ටික සත්වාහාර ටික ලබා ගැනීමට යම් යම් කොන්දේසි ඇති කර ඔය විධියට වැඩ කටයුතු කර ගෙන යනව ඒ රටේ. සංඛ්‍යාලේඛන අනුව කල්පනා කර බලන විට තායිලන්තයේ කෘෂිකර්මය අතින් විශාල දියුණුවක් ලබා ඇති බව පෙනී යනව. නමුත් එහි කෙරෙන වගාවන් අතුරෙන් වැඩි හරියක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]
වගා කරන්නෙ එම රටේ ජනතාවගේ ප්‍රයෝජනය සඳහා නොව විදේශීය රටවලට ගෙන යාමටයි. මෙවැනි ආර්ථික ක්‍රමයක් ලංකාවෙත් ඇති කිරීමේ අරමුණකින් තමයි ඔවුන් වැඩ කරන්න පටන් අරන් තියෙන්නෙ.

තවත් සඳහන් කළ යුතු රටක් තිබෙනව ඒ රට තමයි හොංකොං. ඒ රට ගැන විස්තර කරන්න වුවමනාවක් නැහැ. ලෝකයේ හැම රටක්ම ඒ රට ගැන ඕනෑ තරම් කරුණු දන්නව. ඒ නිසා ඒ ගැන වැඩි විස්තරයක් මෙහිදී මා විසින් කළ යුතුය කියා මා කල්පනා කරන්නෙ නැහැ. "ෆ්‍රී පෝට්" හෙවත් නිදහස් වරායක් තමයි එහි තිබෙන්නෙ. සිහිකල්පනාවක් තියෙන කිසිම කෙනෙක් එවැනි තත්ත්වයක් තිබීම උචිතය කියන්නෙ නැහැ. එතනට විදේශීය ධනපති කොම්පැනිවල ආධාර තිබෙනව. එතන ජනගහනය ලක්ෂ 35 ක් තරම ඇති. ලංකාව වැනි ඉතිහාසයක්, සංස්කෘතියක් ඇති රටක වාසය කරන අපට ඒ ගැන විස්තර කරන්න විවේචනය කරන්න දෙයක් නැති නිසා, මා බලාපොරොත්තු වන්නෙ නැහැ, ඒ සම්බන්ධයෙන් කථා කිරීමට. කොයි හැටි වෙතත් මේ රටවල නම් නොකියා සිටීමෙන් අපට පැහැදිලි වෙනවා එක්සත් ජාතික පක්ෂය මොන විධියේ වැඩ පිළිවෙළක්ද ගෙන යන්න බලාපොරොත්තු වන්නෙ කියන කාරණය.

මේ අය වැය ලේඛනයෙන් ආදායම් බදු සහන මේවායයි පෙන්නීම සඳහා රාජ්‍ය ඇමතිතුමා විස්තර ලේඛනයක් මේ ගරු සභාවට ඉදිරිපත් කළා. එහි විවාහක දරුවන් දෙදෙනෙක් සිටින ආදායම් බදු ගෙවන්නකුට ලැබෙන සහනය පැහැදිලි කර තිබෙනවා. නමුත් තනිකඩයකුට ලැබෙන සහන ගැන එහි සඳහන් කර නැහැ. ඒ වාගේම එක් දරුවකු පමණක් සිටින අයට ලැබෙන සහන ගැනත් එහි සඳහන් කර නැහැ. දරුවන් දෙදෙනකු සිටින අය ගැන පමණයි, සඳහන් කර තිබෙන්නේ. සභාග ආණ්ඩුවෙන් පනවන ලද ආදායම් බදු හා සසඳා එහි ඇති පරතරය පෙන්නීමට ඒ ඇමතිතුමා උත්සාහ ගත්තා. අපි පිළිගන්නවා, මේ අය බදු යෝජනාවලින් ධනවතුන්ට වැඩි සහනයක් ලැබෙන බව. මම පෙන්නන්න කැමතියි, කසාද බැඳපු දරුවන් දෙදෙනකු හෝ ඊට වඩා සිටින අයට වඩා කසාද නොබැඳපු තනිකඩයින්ට මේ ආණ්ඩුවෙන් සහන දී තිබෙන බව.

රුපියල් 20,000 ක ආදායමක් ලබන දරුවන් දෙදෙනකු සිටින කෙනකුට අඩුවන මුදල රු. 375 යි. එහෙත් ළමයින් නැති තනිකඩයකුට රු. 1,050 ක සහනයක් ලැබෙනවා. ළමයින් දෙදෙනකු සිටින රු. 30,000 ක ආදායමක් ලබන කෙනකුට ලැබෙන සහනය රු. 950 යි. නමුත් තනිකඩයකුට රු. 2,050 ක සහනයක් ලැබෙනවා. රුපියල් 50,000 ක ආදායමක් ලබන ළමයින් දෙදෙනකු සිටින කෙනකුට රුපියල් 1,825 ක සහනයක් ලැබෙන අතර තනිකඩයකුට රු. 3,075 ක සහනයක් ලැබෙනවා. රුපියල් 75,000 ක් ලබන ළමයින් දෙදෙනකු සිටින කෙනකුට රු. 1,900 ක් ලැබෙන අතර තනිකඩයකුට රු. 3,100 ක් ලැබෙනවා. මෙයින් පෙනෙනවා, මේ ආණ්ඩුව මොන තරම් අසාධාරණ අන්දමකට බදු පනවනවාද කියා. රාජ්‍ය ඇමතිතුමා ඉදිරිපත් කර තිබෙන්නේ එක් පැත්තක් පමණක් පෙන්වන—වාසි පැත්ත පමණක් පෙන්වන—ලේඛනයක්. ඊට වඩා අවංක සම්පූර්ණ ලේඛනයක් ඉදිරිපත් කළා නම් තනිකඩයකුට ගිය ආණ්ඩුවෙන් ලැබුණු සහනයට වඩා වැඩි සහනයක් මේ ආණ්ඩුවෙන් ලැබී තිබෙන බව පෙනෙනවා. ළමයින් දෙදෙනකු සිටින කෙනකුට මෙපමණය, එක් ළමයකු සිටින කෙනකුට මෙපමණය, ළමයින් නැති තනිකඩයකුට මෙපමණය කියා වෙන් වෙන්ව විස්තර දක්වූවා නම් කොයි තරම් අසාධාරණ විදියකට ආදායම් බදු පනවන වාද කියා පෙනේවි. මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය වගකීම අඩුතරමට සහනය වැඩි කිරීමද කියා මම අහනවා. තත්ත්වය එසේ වුවත් රාජ්‍ය ඇමතිතුමා රෙද්දයි බැනියමයි ඇඳගෙන හරියට සිල් ගත් කෙනකු වාගේ—උතුරු සලුව පමණයි, අඩු—ශාන්තුවරයකු වාගේ අපට කිව්වා, මේ ආණ්ඩුව සාධාරණ විදියට අයබදු පනවනවාය කියා. මේ සහනය ගැන පමණක් පෙන්වා දීම යුක්ති සහගතද? තනිකඩයකුට ඊට වඩා විශාල සහනයක් දී තිබෙනවා. ඒක ඉදිරිපත් කෙළේ නැහැ. මට දී ඇති මේ ලේඛනය පිළියෙළ කෙළේ උන්නැහෙගෙ ලේඛනය පිළියෙළ කළ නැනැත්තාම නොවන බව මට විශ්වාසයි. මම අවංකව සෑම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ශීර්ෂයක් සම්බන්ධයෙන්ම කරුණු පෙන්වා දෙනවා. උන්නැහේ මේ ශීර්ෂයම පෙන්නුවේ මහජනයා නොමග යවන අදහසිනුයි. මගේ ගණන්වල වැරදි තිබෙනවා නම් මට පෙන්වා දෙන්න. මා කථා කරන අවස්ථාවේදී මුදල් ඇමතිතුමා මගේ ප්‍රශ්නවලට උත්තර දීමට අකැමැතියි. ඒ ගැන ස්තුති කරනවා. නමුත් පිළිතුරු කථාවේදී මේ ගැන පිළිතුරු දේවිය කියා මම විශ්වාස කරනවා.

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)
පිළිතුරු දෙන්නම්.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)
කථානායකතුමනි, මේ ආණ්ඩුවේ සමහර ප්‍රතිපත්ති පැහැදිලි වශයෙන් ප්‍රකාශ කිරීම ගැන මම ස්තුති කරනවා. මේ ආණ්ඩුව විසින් කර ඇති අය බදු අඩු කිරීමේ වැඩ පිළිවෙළ අනුව අපට පෙනී යනවා, ධනපති ක්‍රමය තහවුරු වන විධියටම ඒ අය බදු ප්‍රතිපත්ති සකස් කර තිබෙන බව. ඒ බදු ක්‍රමය, නියම ප්‍රජාතන්ත්‍රවාදී අදහස් දරන අය සම්පූර්ණයෙන්ම හෙළා දකිනවා. ඒවා බොහෝම වැදගත් ප්‍රතිපත්ති හැටියටයි, ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිපත්ති හැටියටයි, මුන්නැහේලා පිළිගෙන තිබෙන්නෙ. වස්තුව රැස්කර ගත් තරමට වැඩි වැඩියෙන් ලාභ ප්‍රයෝජන ලැබෙන ආකාරයටයි ඒ ප්‍රතිපත්ති සකස් වී තිබෙන්නෙ. ලාභ ප්‍රයෝජන වැඩි වැඩියෙන් ලබා ගන්නා උග්‍ර ධනපති ඒකාධිකාරී ආර්ථික ක්‍රමයක් ඇති කිරීමයි මුන්නැහේලා අනුගමනය කරන පිළිවෙත. ඒ නිසා තමයි ආදායමේ සීමාවක් තබා තිබෙන්නෙ. රුපියල් ලක්ෂයක් දෙලක්ෂයක් ලැබුණත් බදු අය කරන්නේ සියයට 80 යි, සියයට 20 ක් කොහොමත් ඉතුරු වෙනව. එපමණක් නොවෙයි, රුපියල් 40.000 කට වඩා ආදායමක් ලබන අය ඒ මුදල් යම් යම් දේ සඳහා යොදවා තව තවත් ධනය රැස් කරනවා නම් එසේ යොදවන මුදල් බදු ගෙවීමෙන් නිදහස් කරනවා. කොටින් කියනොත් රටේ සිටින ධනපතීන්ගේ ධනපති ක්‍රමය එන්ට එන්ටම උසස් කර, ධනය නැති අය එන්ට එන්ටම ප්‍රපාතයේ හෙළීමේ වැඩ පිළිවෙළක් මෙහි තිබෙන්නෙ. ඒ නිසා තමයි සභාග ආණ්ඩුවේ මුදල් ඇමතිතුමාට මේ ලෙස තදින් චෝදනා කරන්නෙ. එපමණක් නොවෙයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුවට චෝදනා කළා මාක්ස්වාදීන් සමග එකතු වුණාය කියා. සභාග ආණ්ඩුව අනුගමනය කෙළේ මාක්ස්වාදී ප්‍රතිපත්තිය කියා චෝදනා කළා.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආරම්භක බණ්ඩාරනායක මහත්මයා එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවට සම්බන්ධව සිටි කාලයේදී එසේ එක්සත් ජාතික පක්ෂය ඇතුළත ඉඳගෙන නියම මහජන සේවයක් ඉටු කරන්නට බැරියයි උන්නැහේට අවබෝධ වී, උන්නැහේට හිතවත් තවත් කණ්ඩායමකුත් සමග වෙන් වී ගොස් වෙනම පක්ෂයක් පිහිටුවාගත් බව තමුන්නාන්සේලා දන්නවා ඇති. ඊට පසු 1956දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රධානත්වයෙන් මහජන එක්සත් පෙරමුණු ආණ්ඩුව බලයට ආවා. ඒ ආණ්ඩුව යූ. එන්. පී. විරෝධී ආණ්ඩුවක් බව තමුන්නාන්සේලාට මතක ඇති. එසේ පිහිටුවා ගත් පසු පළමුවෙනි අවුරුදු 4 ඇතුළත සමාජවාදය කරා ගමන් කිරීමේදී උන්නැහේට විශාල බාධාවල් ඇති වුණා. ඒ කාරණා අමතක කරන්න හොඳ නැහැ. වෙස් මාරු කරගෙන සිටි පිරිස් දැන් නැවතත් එක්සත් ජාතික පක්ෂයට එකතු වී සිටිනවා. මේ ආණ්ඩුවේ ඉදිරි පෙළේ ආසනවල සිටින බොහෝ දෙනකු අවංකව කටයුතු කර නැති අයයි; නින්දිත ප්‍රතිපත්ති අනුගමනය කළ අයයි. එදා වෙස් වලාගෙන බණ්ඩාරනායක ආණ්ඩුවට රිංගාගෙන සිටි සී. පී. ද සිල්වා, සරත් විජේසිංහ, ජේ. සී. ඩබ්ලිව්. මුණසිංහ, දහනායක වැනි පිරිස දැන් මේ ආණ්ඩුවත් සමගයි. අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීවරයා නම් තමන්ගේ වාමාංශික අදහස් පුළුවන් තරමින් ක්‍රියාත්මක කරන්නට ගොස් බැරිව පසු බැස්සා. එදා ඒ ආණ්ඩුවේත් ඉඩම් ඇමති වූ මේ ආණ්ඩුවේ ඉඩම් ඇමතිතුමාත්, සරත් විජේසිංහ හා හලාවත මුණසිංහ වැනි අයත් සමාජවාදී ඉදිරි ගමන වැළැක්වීමට කටයුතු කළ අයයි. බණ්ඩාරනායක ප්‍රතිපත්ති අනුගමනය කරනවාය කියමින් එදා ඒ ආණ්ඩුව ඇතුළේ සිට ගෙන සමාජවාදී වැඩ පිළිවෙළ දුර්වල කරන්නට කටයුතු කළා. ඒ නිසා තමයි, සමාජ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

වාදී රටවලද ආධාරය ලබාගෙන මේ රටේ ආර්ථික සංවර්ධනය ඇති කිරීමට පසුගිය ආණ්ඩුවට බැරි වුණේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළට රිංගාගෙන සිටි එක්සත් ජාතික පාක්ෂික ද්‍රෝහීන් නිසා එදා වැඩ කටයුතු හරි හැටියට කරගෙන යන්නට බැරි වුණා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේත් දුර්වලකම් තිබුණු බව ඇත්තයි. නමුත් අර ද්‍රෝහීන්ගේ ක්‍රියා කලාපයත් සැළකිල්ලට ගැනීම අවශ්‍යයි.

**ගරු එම්. එච්. මොහමඩ් (කම්කරු, රැකී රක්ෂා හා නිවාස ඇමති)**
*(கௌரவ எம். எச். முகம்மது—தொழில், தொழில் காண், வீடமைப்பு அமைச்சர்)*
(The Hon. M. H. Mohamed—Minister of Labour, Employment and Housing)

බණ්ඩාරනායක මහත්මයාගේ ප්‍රතිපත්තිය කොමියුනිස්ට් පක්ෂය භාර ගත්ත වාද ?

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

එදා වැඩ පිළිවෙළ කඩාකප්පල් කරන්නට ලෑස්ති වූ ආකාරය පෙන්වන්නට එක නිදර්ශනයක් ඉදිරිපත් කරන්නම්. දැනට ටයර් කර්මාන්ත ශාලාවක් පිහිටුවා තිබෙනවා. කඩාකප්පල්කාරී ක්‍රියා නොසිදු වුවහොත් ලබන අවුරුද්දේදී ටයර් නිෂ්පාදනය කරන්නට පුළුවන් වෙනවා ඇති. එදා මහජන එක්සත් පෙරමුණේ ආණ්ඩුව පවතිද්දී ටයර් කර්මාන්ත ශාලාවක් පිහිටුවීමට යෝජනා ඉදිරිපත් වූ අවස්ථාවේදී එය ක්‍රියාත්මක කිරීම අවුරුදු හතරකට කළ නොහැකි වන ආකාරයට බාධා කරන්නට යෙදුණා. හලාවත මුණසිංහ කර්මාන්ත ඇමතිවරයා වශයෙන් සිටියදී විශේෂඥයන්ගේ උපදෙස් ගැන නොසලකා මේ ටයර් කර්මාන්ත ශාලාව හලාවත පිහිටුවීමට ලෑස්ති වුණා. නමුත් වතුර නැතිකම නිසාත්, අධික වියදම නිසාත්, වෙනත් නොයෙකුත් අපහසුකම් නිසාත් හලාවත මුණසිංහගේ වුවමනාවට කොතරම් බලවත් වුවත් මේ පිළිබඳ විශේෂඥයන්ගෙන් මෙය හලාවත පිහිටුවීමට අනුමැතිය ලැබුණේ නැහැ. පෞද්ගලික අංශය මගින් කර්මාන්ත දියුණු කළ යුතුය, රට සංවර්ධනය කළ යුතුය යන අදහස ඇතිව වැඩ කර ගෙන යන මේ ආණ්ඩුවත් දැන් ඒ කර්මාන්ත ශාලාවේ වැඩ සාර්ථක අන්දමින් කර ගෙන යන්නට ආධාර නොදෙන බවට මා අද චෝදනා ඉදිරිපත් කරනවා.

රජයේ අංශයට ජනසතු ව්‍යාපාර සාර්ථක ලෙස කරන්නට බැරිය කියන අදහසයි මේ ආණ්ඩුව දරන්නේ. වානේ යකඩ හා හාඩ්වෙයාර් වැනි කර්මාන්තයන් පිළිබඳව මේ රටේ තරුණයන් සෝවියට් දේශයට හා පෝලන්තයට ගොස් හොඳ පුහුණුවක් ලබාගෙන තිබෙනවා. සෝවියට් දේශයේ පුහුණුවක් ලබාගෙන ඇවිත් සිටින ඉංජිනේරු තරුණයන් ජාති හිතෛෂී භාවයෙන් වෙලී රටට සේවය කිරීමට ලෑස්ති වී සිටින විට ජනසතු ව්‍යාපාරවලින් නැත්නම් සංයුක්ත මණ්ඩලවලින් සාර්ථක ප්‍රතිඵල නොලැබෙතියි කීම ඔවුන්ට කරන නින්දාවක් බව මතක් කරන්නට කැමතියි. ඊට වඩා නින්දාවක් ඔවුන්ට කරන්නට බැහැ. නමුත් අද වෙලා තියෙන්නෙ මොකක්ද ? වුවමනා යන්ත්‍ර සියල්ලක්ම දැන් සෝවියට් දේශයෙන් ගෙනැවිත් ගොඩගසා තිබෙනව. නමුත් ඉංජිනේරු අංශයේ කෙරෙන වැඩ කඩාකප්පල් කරන අය ඒ ආයතනවල ඉන්නව. ඉඩම් සංවර්ධන ඇමතිතුමාගේ හවුල්කාරයො එතන ඉන්නව. ඇමතිතුමා නොසිටියට මට කරන්න දෙයක් නැහැ, මම ඒක ප්‍රසිද්ධියේ කියනව. වටිනා ඉලෙක්ට්‍රික් යන්ත්‍ර පෙට්ටිවල දමා ගෙනැවිත් තිබෙන නමුත් ඒවා ගබඩා කරන ගොඩනැගිලි හදා නැති නිසා ඒවා අව්වට වේලි. වේලී, වැස්සට තෙමි තෙමී තියෙනව. ඒ නිසා අද ටයර් කර්මාන්ත ශාලාවෙත් වානේ කර්මාන්ත ශාලාවෙත් වටිනා යන්ත්‍ර රාශියක් මළකඩ කන තත්ත්වයක් ඇති වෙලා තියෙනව. එපමණක් නොවෙයි, දක්ෂ කර්මාන්ත කාරයන්ට ඔවුන්ගේ රක්ෂාව පිළිබඳ ස්ථිරත්වයක් නැති නිසා, පුහුණුව ලබන අය පුහුණු වන විට ඔවුන්ගේ රක්ෂා වෙහි ස්ථිරත්වයක් ඇති කිරීමට උනන්දුවක් දක්වන්නෙ නැති නිසා, කනගාටු දායක තත්වයක් ඇති වී තිබෙනව. මේ ආණ්ඩුවෙ ප්‍රතිපත්තිය සංයුක්ත මණ්ඩල මගින් කෙරෙන ව්‍යාපාර වසා දැමීමද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කියා මම දන්නෙ නැහැ. දැනට ගරු සෞඛ්‍ය ඇමතිතුමා, හොරණ මන්ත්‍රීවරයා වශයෙන්—මුදල් ඇමතිවරයා වශයෙන්—ඉන්න කාලයේදී මා කලින් කී වාර්තාවේ ව්‍යාපාර සියල්ලක්ම පෞද්ගලික අංශයට භාරදීමේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය ගැන සඳහන් කරල තියෙනව. ඒ ප්‍රතිපත්තියම ගෙන යාමට මේ විධියේ වැඩ කරනවද දන්නෙ නැහැ. සැලැස්මක් උඩ වැඩ කරන ඒ විශේෂඥයන්ගේ, දක්ෂ කාර්මිකයන්ගේ සේවය කඩාකප්පල් කර රටට විපත්තියක් කිරීමට කටයුතු කරන බව—රටට ඉතාමත්ම අවශ්‍ය මූලික කර්මාන්ත ගෙන යාම වැළැක්වීමට කටයුතු කරන තත්ත්වයක් ඇති වී තිබෙන බව—මට කියන්නට පුළුවන්.

ගරු කථානායකතුමනි, ටයර් කර්මාන්ත ශාලාවත්, වානේ කර්මාන්ත ශාලාවත් ලබන අවුරුද්දේ ද්‍රව්‍ය නිෂ්පාදනය කරන තත්ත්වයට එන්නට ඕනෑ. ඒ සඳහා අවශ්‍ය අමු ද්‍රව්‍ය සකස් කර ගැනීමේ කට යුතු දැන් සකස් වන්නට ඕනෑ. ඒ යන්ත්‍ර සවි කළාට පසු ඒ යන්ත්‍රවල යම් යම් සුළු කොටස් කැඩෙන විට—ගෙවී යන විට—ඒ යන්ත්‍ර හරිගැස්වීමට අවශ්‍ය අමතර සුළු කොටස් ලබා ගැනීමේ වැඩ පිළිවෙළක් යොදවන්න ඕනෑ. මේ කර්මාන්ත දෙක අළුතෙන් පටන් ගන්න කර්මාන්ත දෙකක් නිසා ඒ අමතර කොටස් මේ රටේ නැහැ. ඒ අමතර සුළු කොටස් නොගෙන් වුවහොත් මුළු යන්ත්‍රයක්ම ක්‍රියාත්මක නොකර නවත්වන්න සිදු වෙනව. එසේ වුනොත් මුළු පැක්ටරියේම වැඩ නතර වන්න පුළුවන්. සමාජවාදි රටවල් මේ සම්බන්ධයෙන් අපට ආධාර කරන්න සූදානම් වී සිටින නමුත් ඒ රටවල් සමග මේ සම්බන්ධව කිසිම සාකච්ඡාවක් නැති නිසා—ඒ සාකච්ඡා පැවැත්වීම ගැන උනන්දුවක් නැති නිසා—අද මේ වැඩ කඩාකප්පල් වන තත්ත්වයට පත් වෙලා තියෙනව.

පරන්තන් රසායන සංස්ථාවේ ක්ලෝරීන් නිෂ්පාදනය වැඩි කිරීමට විධිවිධාන යොදනවය කියා අයවැය ලේඛනයේ ප්‍රකාශයක් කරල තිබුන. නමුත් අද පරන්තන් රසායන සංස්ථාවේ තිබෙන තත්ත්වය කුමක්ද? අද එහි නිපදවන ක්ලෝරීන් වලින් කරන්න දෙයක් නැහැ. ක්ලෝරීන් වලින් කරන්න දෙයක් නැතිවා පමණක් නොවෙයි, මේ ක්ලෝරීන් වායුව පිට කරන විට මුළු පැක්ටෙරියම මළකඩ කනවා. මුළු පැක්ටේරියම බොහෝ දුරට අද විනාශ වී තිබෙනව.

අපේ ගරු ඇමතිතුමාගේ යෝජනාවක් තිබෙනවා ක්ලෝරීන් තව වැඩිපුර නිපද වීමට කටයුතු කරනවාය කියා. ගරු කථානායකතුමනි, මේ සංයුක්ත මණ්ඩලය කෝස්ටික් සෝඩා, ක්ලෝරීන් සහ හයිඩ්‍රජනුත් හදනව. මේ කර්මාන්ත ශාලාව යූ. එන්. පී. ආණ්ඩුව මගින් ධනපති කොම්පැනිකාරයින් ලවා පළමුවෙන්ම කරවපු කර්මාන්තයයි. මෙය ධනපති අධිරාජ්‍යවාදී රටවල කොම්පැනිකාරයින් විසින් මේ රටේ කර්මාන්ත දියුණුව වැළැක්වීමට, අපේ රට බංකොලොත් කිරීමට, කළ කුමන්ත්‍රණ වැඩ පිළිවෙළක්. පළමුවෙන්ම ද්‍රව්‍ය තුනක් හදන්න යෝජනා කළා. කෝස්ටික් සෝඩා, ඩී.ඩී.ටී., ලොරිල් ඇල්කහෝල් ඒ ද්‍රව්‍ය තුනයි. ලොරිල් ඇල්කොහොල් කියන්නේ ස්ප්‍රීත්තුව කට පරිවර්තනය කරනු ලැබූ පොල් තෙල් වලටයි. ඒවා පොල් තෙල් වලට වඩා පස් ගුණයක් දියුණුයි. ඒවා නිෂ්පාදනය කර මේ රටේ පාවිච්චි කර වැඩි හරිය පිටරට පටවන්නයි අදහස් කළේ. ඒවා සෑදීමට "පරන්තන් කැමිකල් ඉන්ඩස්ට්‍රීස්" එකෝ කටයුතු යෙදුවා. ඩී.ඩී.ටී., ක්ලෝරීන්, ලොරිල් ඇල්කහෝල් හා හයිඩ්‍රජන් හදන්නට පරන්තන් කර්මාන්ත ශාලාවේ වැඩ පිළිවෙළ සකස් කළා. මේවා හදන්න ගන්නා අමු ද්‍රව්‍ය නම් එළිපන්ට්පාස්වල මුදවන ලුනුයි. ලුනු අමු ද්‍රව්‍ය වශයෙන් පාවිච්චි කර මේ ද්‍රව්‍යයන් හදන්න කටයුතු කළා. කෝස්ටික් සෝඩා, ඩී.ඩී.ටී. හා ලොරිල් ඇල්කහෝල් ආදිය ලුනුවලින් හදන්නට "ඉලැක්ට්‍රොලිසිස් ප්‍රෝසස්" කියා මේවා කෙරෙන යන්ත්‍ර ගෙනැවිත් මේ වැඩපොළ හදන්නට සියළුම මැෂින් ගෙනාවා. ලොරිල් ඇල්කහෝල් හදන මැෂින් ගෙනැවිත් පරන්තන්වල ගබඩා කර තිබෙනවා. ඩී.ඩී.ටී. හදන යන්ත්‍රත් ගබඩා කර තිබෙනවා. කෝස්ටික් සෝඩා හදන යන්ත්‍ර සවිකර තිබෙනවා. ඊළඟට තීරණය කළා ඩී.ඩී.ටී. සහ ලොරිල් ඇල්කහෝල් හදන එක නවත්වන්න. නමුත් ලුනුවලින් ක්ලෝරීන් හදනවා. එමෙන්ම හයිඩ්‍රජන් හදනව. කෝස්ටික් සෝඩා හදනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

දැන් ලංකාවට වුවමනා කරන කෝස්ටික් සෝඩා ප්‍රමාණය හදන්න බැරි වී තිබෙනවා. ඒ ක්ලෝරීන්වලට කරන්න දෙයක් නැති නිසයි. ක්ලෝරීන් ටොන් 800ක් පමණ කරන්න දෙයක් නැතිව තිබෙනවා. වුවමනාවට වඩා ඒවා නිපදවා තිබෙනවා. නමුත් කෝස්ටික් සෝඩා ටොන් 1,000ක් පමණ පිටරටින් ගෙන්වනවා. කෝස්ටික් සෝඩා නිෂ්පාදනය තව වැඩි කරන්නට ගියොත් පරන්තන් කර්මාන්ත ශාලාව විනාශ වෙනවා. ක්ලෝරීන් වායුව ගොස් මුළු පරන්තන් ප්‍රදේශයම විනාශ වෙනවා. ඒ වායුව මළකඩ ඇති කරන විෂ වායුවක්. අද සිදු වී තිබෙන්නේ තිබෙන ක්ලෝරීන් ටික පාවිච්චි කිරීම පමණයි. එහෙත්, හයිඩ්‍රජනුත් ක්ලෝරිනුත් පිට වෙන්නේ නැති විධියට කෝස්ටික් සෝඩා හදන්නට පුළුවනි. ඒ සඳහා පහසු ක්‍රම තිබෙනවා. ඒ පහසු ක්‍රම පිළිබඳව වාර්තාවක් සමාජවාදී රටවලින් ආ අය අපට පෙන්නුවා. එහෙත් අධිරාජ්‍යවාදී රටවලින් ඇවිත් මේ රට විනාශ කරන්න කටයුතු කරන කොම්පැනිකාරයෝ—එක්සත් ජාතික පක්ෂයේ අය කොන්ත්‍රාත් දී තිබෙන විදේශීය කොම්පැනිකාරයෝ—කිසි කෙනෙක් මේවාට ආධාරයක් කරන්න ආවේ නැහැ.

මේ සඳහා නැගෙනහිර ජර්මනිය පහසු යෝජනාවක් කළා. නමුත් ඒ වාර්තාව සඟවලා. ඒ වාර්තාව ගැන කිසිම ප්‍රශංසාවක් නැහැ. එපමණක් නොවෙයි, රටේ දියුණුවට ඉතාමත්ම වටිනා වාර්තාවක් ඉදිරිපත් කළ නැගෙනහිර ජර්මනිය සම්බන්ධව කළේ මොකක්ද? මේ රට යටත් රටක් හැටියට තබා ගන්නට කැමති බටහිර ජර්මනිය නැගෙනහිර ජර්මනියට විරුද්ධ වූ නිසා, මේ රට බටහිර ජර්මනිය සතු කර ගන්නට කටයුතු කරන ඒ බටහිර ජර්මනියේ ඕනෑකමට නැගෙනහිර ජර්මන් තානාපති කාර්යාලයේ සිටි නිලධාරීන් කිප දෙනෙකුට, ඔවුන්ගේ දරුවනුත් සමග, සුමානයක් ඇතුළත පිට වෙන්නට කිව්වා, මේ රටින්. සෝවියට් අභ්‍යවකාශ යාත්‍රිකයක් සුව

ව් යන්න සුමානයක් කල් ඉල්ලුවම දෙන්න බැරිය කිව්වා. මොකක්ද ඒ අය කළ වරද?

ගරු කථානායකතුමනි, කර්මාන්ත නැති කිරීම සඳහා අධිරාජ්‍යවාදීන් යොදා තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද? පරන්තන් කෙමිකල් ඉන්ඩස්ට්‍රීස් ෆැක්ටෙරියෙ ඩී.ඩී.ටී. හදන්න ගෙනාපු බඩු ඔක්කොම මල කඩ කාලා. ඩී. ඩී. ටී. යන්ත්‍ර සවි කරන්න යොදපු අඩිතාලම් ඔක්කොම මලකඩකාලා. ලොරිල් ඇල්කොහොල් හදන්න ගෙනාපු යන්ත්‍ර ඔක්කොම මලකඩ කාලා. ක්ලෝරීන් පිටවෙලා ෆැක්ටරියේ හැම දෙයක්ම මලකඩ බැඳිල. එපමණක් නොවෙයි, ක්ලෝරීන් ටොන් එකක් නිපදවන්න රුපියල් 2,600 ක් වියදම් වෙනවා. මේ තරම් විශාල මුදලක් වියදම් වෙනව නම් කර්මාන්තය සම්පූර්ණයෙන්ම බංකොලොත් වෙලා විනාශ වෙනවා. පරන්තන් කෙමිකල් ඉන්ඩස්ට්‍රීස් කර්මාන්තශාලාව නැවතත් රටට ආදායම් ලැබෙන අන්දමට සකස් කර ගන්න ඕනෑ. අවුරුදු තුනක කාලයක් තුළදී රුපියල් 45 ලක්ෂයක් පමණ අලාභ වුණු නිසා මේවා නැති කර දමා මෙම කර්මාන්තශාලාවෙන් ආදායමක් ලබා ගැනීමට, කර්මාන්ත දියුණු කිරීමට, ක්ලෝරීන් නිපදවන්නෙ නැතුව වැඩියෙන් වුවමනා කරන කෝස්ටික් සෝඩා නිපදවීමට කට යුතු යොදන්න ඕනෑ. මේකට පහසු ක්‍රම තිබෙනවා. අධිරාජ්‍යවාදීන්ගේ රටවල ඇමෙරිකාවෙ, කෝස්ටික් සෝඩ සියයට තිහක් හදන්නෙ ක්ලෝරීන් නිපදවන්නෙ නැතුව.

නමුත් සමාජවාදී රටවලින් වැදගත් වාර්තා ඉදිරිපත් කරන විට ඒවාට කරන සැලකිල්ල මොකක්ද? සමාජවාදී රටවලට මේ අය අපහාස කරනවා, නින්දා කරනවා. තානාපති කාර්යාල සම්බන්ධ ප්‍රතිපත්තියට සම්පූර්ණයෙන්ම පිටුපාලා සෝවියට් තානාපති කාර්යාලයෙනුත් නිලධාරියකු පිට කළා. දැන් භයානක ලෙස, ම්ලේච්ච, මිනීකන ඇමෙරිකානු අධිරාජ්‍යවාදීන්ට ගොදුරුවුණු උතුරු වියට්නාමය, වෙනුවෙන් ලංකාවේ තානාපති කාර්යලයේ හිටපු නිල ධාරියකු අස් කරන්න කීවා එක සුමාන යෙන්. ලෝකයේ යුද්ධ සේනා අතරින් 4 වැනි විශාල යුධ සේනාංකය ඇති දකුණු කොරියාව සමග එකතුව උතුරු කොරියාව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගිල ගැනීමේ තර්ජනයක් අමෙරිකන් අධිරාජ්‍යවාදීන් විසින් යොදවා තිබේ. එහෙම තත්ත්වයක් තිබෙන රටක් වෙනුවෙන් මේ ආණ්ඩුව කර තිබෙන්නේ කුමන සැලකිල්ලද? ඒ රටින් පෙනී ඉන්න කොන්සල්-ජෙනරාල්ට ඉංග්‍රීසි කථා කරන්න බැහැ. දූතට කාර්යාලයේ සිටින දෙදෙනාට රුසියන් ජර්මන් භාෂා කථා කරන්න බැහැ. චීන භාෂාවයි කොරියන් භාෂාවයි විතරයි කථා කරන්න පුළුවන්. නමුත් එතැන සිටි පරිවර්තකයන් අස් කළා. සුමානයකින් පිට කරන්නටය කියල කීවා. දෙදෙනටයි නැවතීමට අවසර දුන්නෙ. මොකද හේතුව? මේකට බැරෑරුම් තර්කයක් ඉදිරිපත් කරනව. "වියනා කොන්වෙන්ෂන්" එකේ මේ විධියට තිබෙනවාලු. එක් දහස් නවසිය තිස් ගණන්වල අත්සන් කරපු "වියානා කොන්වෙන්ෂන්" එක අනුව තානාපති කාර්යාල තරම් උසස් නැති "කොන්සුලේට්" තත්ත්වයේ කාර්යාලවලට නිල ධාරීන් පත් කර ගැනීමේදී ආණ්ඩුවේ කැමැත්ත ඇතුව, ආණ්ඩුවේ අවසර ඇතුව එය කරන්න ඕනෑලු. එවැනි තැන්වල උදවිය වැඩියෙන් සිටින්න අප අවසර දෙන්නෙ නැහැලු. එම නිසා සුමානයකින් අස් කරන්න ඕනෑලු. මේ කරපු නින්දිත, ලජ්ජා නැති ක්‍රියාව කර ඇත්තෙ වහල් තත්ත්වය නිසා අධිරාජ්‍යවාදීන් සතුටු කරන්න; අමෙරිකානු දූෂක අධිරාජ්‍යවාදීන් සතුටු කරන්න.

ඔවුන් අද උතුරු වියට්නාම් ජනතාව නැති කර දැම්මට වැඩ පිළිවෙළ යොදා ගෙන යනව. නමුත් අද ඔවුන් බේරී සිටින්නෙ කොහොමද? එකම කාරණයක් නිසා නොවෙයි නම් අද උතුරු වියට්නාමය ගිනිජාලාවක් බවට, ඇමෙරිකන් කාරයන් විසින් පරිවර්තනය කරනව. එසේ කරන්නට බැරි වී තිබෙන්නෙ සෝවියට් රොකට් නිසා. අද උතුරු වියට්නාමයේ සෝවියට් රොකට් සවි කර තිබෙනව. නොම්මර දෙළහක් උඩින් යන ඕනෑම අහස්යාත්‍රාවක් බිම දමන්න පුළුවනි. රටේ සීමාව තුළට අහස් යාත්‍රාවක් එනකොට රාඩාර්වලින් බලාගන්න පුළුවනි. ඉන් පසු රොකට් යාත්‍රාව දෙසට එල්ල කොට එය බිම දමන්නත් පුළුවනි. මෙන්න මේ කාරණය නිසා තමයි අද වියට්නාමය බේරී තිබෙන්නෙ. නමුත් අද ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනව. රටවල් ගිලගන්නා, රටවල ජනතාව අඹුදරුවන් නැත්තටම නැති කරන ඒ තරම් දරුණු ආක්‍රමණික යුද්ධයක් කරන ඇමරිකන් අධිරාජ්‍යවාදීන් අනුගමනය කරන උදවිය අද ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනව. මේකයි ඔවුන්ගේ යටත් රටවලට, නොදියුණු රටවලට ආධාර කරන යටත් විජිතවාදී ප්‍රතිපත්තිය. වියට් නාමයට පිහිටවන සෝවියට් දේශය වැනි රටවල ප්‍රජාතන්ත්‍රවාදය නැතිලු.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

The Sitting is suspended till 2 P.M. On resumption, the Deputy Speaker will take the Chair.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ. භා. 2 ට නියෝජ්‍ය කථානායක තැන් පත් සී. එස්. ෂර්ලි කොරයා මහතාගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.**

*இதன்படி அமர்வு பி. ப. 2 மணிவரை இடைநிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று. உப சபாநாயகர் [திரு. சீ. எஸ். ஷேர்லி கொறயா] தலைமை தாங்கினார்.*

*Sitting accordingly suspended till 2 P.M. and then resumed, MR. DEPUTY SPEAKER [MR. C. S. SHIRLEY COREA] in the Chair.*

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

ගරු කථානායකතුමනි, මා කථා කරමින් සිටියෙ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවෙ ප්‍රතිපත්ති සම්බන්ධවයි. ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිතුමාට එතුමාගෙ පාර්ලිමේන්තු ලේකම්තුමා විසින් විශාල ප්‍රශංසාවක් කරන්ට යෙදුණා. විරුද්ධ පාර්ශ්වයේ කෙනෙකු හැටියට එම මතයට එකඟවීමට මට පුළුවන්කමක් නැති එක ගැන මම කනගාටු වෙනව. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තිබියදී එම ආණ්ඩුවෙ ඉඩම් සංවර්ධන ප්‍රතිපත්ති, ආහාර නිෂ්පාදන කටයුතු යනාදිය සම්බන්ධයෙන් විශාල බාධා ඇති කළ කෙනෙකු සිටිය නම් ඒ මොහුයි. නියම ලෙස ආහාර අතින් ස්වයංපෝෂිත කිරීමෙ ප්‍රතිපත්ති මෙතෙක් කල් ක්‍රියාවෙ යෙදවීමට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

බැරිවීමේ මූලික හේතුව නම් ධනවාදී අදහස්, ධනවාදී ක්‍රම යනාදියෙහි එල්බ ගෙන සිටි මේ ඉඩම් ඇමතිවරයා මහජන එක්සත් පෙරමුණු ආණ්ඩුවෙත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුවෙත්, සභාග ආණ්ඩුවෙත් එම කටයුතුවල නොකඩවාම යෙදී සිටීමයි.

මේ ඇමතිවරයා, සභාග ආණ්ඩුවට ද්‍රෝහිකම් කර අස් වුණාට පසුව එම ඇමති අංශයෙ යටපත් කර ගෙන තිබුණු යම් යම් වැදගත් වාර්තා කීපයක් අපට ලබා ගන්න පුළුවන්කම ලැබුණ. එයින් පැහැදිලිවෙනව, එතුමා මොන තරම් වංචනික, මොන තරම් දේශද්‍රෝහී ප්‍රතිපත්ති අනුගමනය කර තිබෙනවද කියන එක. යම් යම් අවස්ථාවලදී විශෙෂඥයන් ඉදිරිපත් කළ වාර්තා ක්‍රියාවෙ නොයෙදෙව්වා පමණක් නොවෙයි. ඒවා ක්‍රියාවේ යෙදවීම වැළැක්වෙන පරිදි යටපත් කර කටයුතු කිරීම සඳහා වැඩ පිළිවෙළක් ගෙන ගිය කෙනෙක් තමයි, මේ ඇමතිවරයා. වියලි ප්‍රදේශය වගා කොට, අමතර ආහාර නිෂ්පාදනය කිරීම ගැන සොයා බැලීම සඳහා එකල සිටි ගරු අග මැතිනියගෙ විශෙෂ ආරාධනයක් පිට සෝවියට් විශෙෂඥයන් කීප දෙනෙක් පැමිණ පරීක්ෂණයක් පවත්වා වාර්තාවක්ද ඉදිරිපත් කළා. එම කටයුත්තට බාධා කිරීම සඳහා ඉඩම් සංවර්ධන ඇමතිවරයා බොහොම මහන්සි ගත්ත. වාරිමාගී ක්‍රම නැතිව අහස් දිය ප්‍රයෝජනයට ගෙන අක්කර 70 දහසක ප්‍රමාණයකුත් වාරිමාගී ක්‍රම ඇතිව අක්කර 7 දහසක ප්‍රමාණයකුත් වියලි ප්‍රදේශයෙන් වගා කිරීමට කටයුතු යෙදුවොත් මේ රට අතිරේක ආහාර අතින් හා කපුවලින් ස්වයංපොෂිත කිරීමේ වැඩ පිළිවෙළක් ආරම්භ කරන්නට පුළුවන් වේවිය කියා එහි පැහැදිලි වශයෙන් ප්‍රකාශ කර තිබුණ.

රටේ තිබෙන ඉඩම් ධනපතියන්ට අයිති නොකර ඒවා රජයට අයත් සමූහ ගොවිපොළවල් වශයෙන් සංවර්ධනය කිරීමට කල්පනා කළේ නැතිවා පමණක් නොවෙයි, මේ රටේ තිබෙන මුඩු ඉඩම් වගා නොකරන අතර, ධනපති ඉඩම් අයිතිකරුවන්ට තිබෙන පුද්ගලික බලතල වැඩි කර මින් ඔවුන් සමග එකතු වී එදා තිබුණු ආණ්ඩුව කෙසේ හෝ පරාජයට පත් කිරීම සඳහා ප්‍රතිගාමී වැඩ පිළිවෙළක් ගෙනයාමෙ බලාපොරොත්තුවෙන් එතුමා කටයුතු කළාය කියන එක, අද එතුමා ළඟ පෙනෙන්ට තිබෙන ප්‍රතිපත්තිවලට අනුව අපට නිසැකවම කියන්න පුළුවනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සේ එකල මේ ගරු සභාවේ හිටියේ නැහැ. අනික් උදවියට මතක ඇති, විශාල වැඩ පිළිවෙළක් ගෙන ගියා, ඇමරිකන් අධිරාජ්‍යවාදීන්ගේ සම්බන්ධකම් ඇතිව මහ වැලි ගඟ සංවර්ධනය කිරීමට. මහවැලි ගඟ උතුරට හරවා සංවර්ධනය කිරීමටයි අදහස් කළේ. අනිකුත් අධිරාජ්‍යවාදීන් මෙන්ම ඇමෙරිකන් අධිරාජ්‍යවාදීනුත් ලෝක බැංකු වාර්තාව මගින් ප්‍රකාශ කර තිබුණ, ගංගා නිම්න වැඩ පිළිවෙළක් මේ රටේ යොදවන්ට බැරිය කියා. ඒ අතරතුර සෝවියට් ආණ්ඩුව කැළණි ගඟ, කළු ගඟ, මල්වතු ඔය ආදී ගංගා ඔය නිම්නවල බහු කර්මාන්ත සංවර්ධන ව්‍යාපාර ඇති කළ හැකි බවත්, ඊට අවශ්‍ය ආධාර දිය හැකි බවත් ප්‍රකාශ කළා. ඊට අවශ්‍ය විශේෂඥයින්, යන්ත්‍ර සූත්‍ර, මුදල් ආධාර හා විද්‍යාත්මක ආධාර දීමේ ගිවිසුමක් දෙරට අත්සන් කළායින් පසුව ඇමෙරිකාව මේ ගැන කලබල වෙලා මේ රටේ අධිරාජ්‍යවාදීන්ගේ බලතල ආරක්ෂා කර ගැනීමටත්, සමාජවාදී රටවල් සමඟ සම්බන්ධකම් තහවුරු වීම වැළැක්වීමටත් කල්පනා කර මහවැලි ගඟ හැර වීමේ වැඩ පිළිවෙළ වහාම ආරම්භ කිරීමට ක්‍රියා කළා. ඇමෙරිකන් කණ්ඩායමක් මේ රටට ගෙන්වා අවුරුදු 2ක් තිස්සේ පරීක්ෂණ පවත්වා කඩිමුඩියේ වාර්තාවක් ඉදිරිපත් කර එය කළුගඟ හා මල්වතු ඔය ව්‍යාපාරවල වැඩ නවත්වා මහවැලි ගඟ සංවර්ධනය පටන් ගත්ත. ඊට පසුව මේ සභාවේ විවාදයක් ඇති වී එහි ඇති විනාශදායක තත්ත්වය අවබෝධ කරගෙන මේ සඳහා රුපියල් කෝටි 100ක් වැය කර රට උගස් තබන්ට මත්තෙන් තවත් පරීක්ෂණයක් පවත්වා නැවත වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ඇමතිවරයාට බල කර කියා සිටියා. මෙවැනි කාරණාවලට ආධාර දෙන එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ විශේෂ අංශයක් තිබෙනව. මහවැලි ගඟ සවංර්ධන වැඩ පිළිවෙළ ගැන සම්පූර්ණ වාර්තාවක් සමග සැළැස්මක් ඇති කරන්ට දැන් ඒ එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ විශේෂ අංශයට පවරා තිබෙන අතර ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සම්බන්ධයෙන් රුපියල් දස ලක්ෂයක ගිවිසුමක් අත්සන් කර තිබෙනව. ඒ අංශයෙන් දැන් මූලික වාර්තා දෙකක් ඇමතිමණ්ඩලයට ඉදිරිපත් වී තිබෙනව. ඒවා පාර්ලිමේන්තුවටවත්, මහජනයාටවත් ඉදිරිපත් කළේ නැහැ. තවම. ඒ ගැන කිසිකෙනෙක් තවම දන්නෙ නැහැ. එයින් එක වාර්තාවක වැදගත් ප්‍රකාශයක් ඇතුළත් වී තිබෙනව. මහවැලි ගඟ හැරවීමේ යෝජනා ක්‍රමය පිළිබඳ ඇමරිකන් විශෙෂඥයින්ගේ වාර්තාව වාරිමාර්ග දෙපාර්තමේන්තුව පමණක් නොව ඇමතිවරයාත් පිළිගෙන තිබුණා. වෙනෙකක් තබා මේ කටයුත්ත ක්‍රියාවේ යෙදවීමට එය අයවැය ලේඛනයට ඇතුළත් කරන්ට සූදානම් වූ හේතුවත් ඇමරිකන් විශේෂඥයින් ඉදිරිපත් කළ වාර්තාවේ තිබෙනව, මේ විධියට :

"The ratio of benefits to cost was declared as 2.3 : 1."

ව්‍යාපාර සඳහා සිදුවන වියදමත් ඉන් ලැබිය හැකි ආදායමත් දෙස බලන විට එය ඉතාම වාසිදායක ව්‍යාපාරයක් බවයි, ඒ වාර්තාවේ සඳහන් වෙන්නෙ. එහෙත් ඒ වාර්තාවේ හරි වැරදි බලා එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ විශේෂ අංශයේ විශේෂඥයින් කියනව, ඒ වාර්තාව සම්පූර්ණයෙන් වැරදිය කියා. නියම ආදායම හා වියදම සංසන්දනය කර බලන විට පෙනී යන තත්ත්වය 1.8 : 1යි. නමුත් ඇමරිකන් වාර්තාවේ තිබෙන්නෙ 2.3 : 1යි. එක්සත් ජාතීන්ගේ මණ්ඩලය කියනවා මේ ගණන්හිලව් වැරදිය, මේවා බොරු ගණන්ය, කියා. එක්සත් ජාතීන්ගේ මණ්ඩලය ගණන් බැලුවාම මේක ඉතාමත් වාසිදායක එකක් පමණක් නොවෙයි, එහි අනුපාතය 1.8 : 1ක් බව පෙනී යනවා. එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ මෙවැනි වැදගත් වාර්තා යටපත් කර තිබෙනව. විශේෂයෙන්ම දෙසැම්බර් මාසයේ ඉඩම් ඇමතිවරයාගේ ද්‍රෝහි ක්‍රියා කලාපයෙන් පසු අපට මේ වාර්තා කියවන්නට අවස්ථාවක් ලබා ගන්නට පුළුවන් වුණේ ඒ අමාත්‍යාංශයට ඊට පසුව පත්වූ ඇමතිවරයාගේ ආධාරය නිසයි. වියලි කලාපය දියුණු කිරීම සම්බන්ධව, පොළව යට ගැබ්වී තිබෙන ජලය ගොවිතැන් කටයුතු සඳහා ලබා ගැනීමේ වැඩ පිළිවෙළ සම්බන්ධව, ඒ මූලික වාර්තාවේ විස්තර වශයෙන් කරුණු දක්වා තිබෙනව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට මේ මුදල් ඇමතිවරයාගේ අයවැය ලේඛනයේ සඳහන් සමහර කරුණුවලිනුත් ඒ වාගේම එක්සත් ජාතික පක්ෂය කරගෙන යන ප්‍රචාරවලිනුත් සමහර විට ජනතාව වැරදි අවබෝධයක් ඇති කර ගන්නට පුළුවනි, දැන් මේ එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව ආවාට පසුවයි වියලි ප්‍රදේශය දියුණු කිරීම සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන්නේ කියා. මීට ප්‍රථමයෙන් වියළි ප්‍රදේශය දියුණු කිරීම පිළිබඳව එවකට තිබුණු ආණ්ඩු සැලකිල්ලක් නොදැක්වූවාය කියා සමහර විට බොහෝ දෙනෙකු තුළ වැරදි අවබෝධයක් ඇති වෙන්නට ඉඩ තිබෙනවා. නමුත් වියළි ප්‍රදේශය දියුණු කිරීම සම්බන්ධව පැහැදිළි විස්තර සහිත පැහැදිලි වාර්තා එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ විශේෂඥයන් විසින් පිළියෙළ කර තිබෙනවා. වියළි කලාපයේ සංවර්ධනය පිණිස පිළියෙල කර තිබෙන එවැනි වාර්තා එකක් දෙකක් සම්බන්ධව වගන්තියක් දෙකක් කියවන්නට මා අදහස් කරනවා. වියළි ප්‍රදේශය සංවර්ධනය කර, වියළි ප්‍රදේශයේ අමතර ආහාර ද්‍රව්‍ය වැවීමේ වැඩ පිළිවෙලක් ඇති කර, ඒ මගින් ලංකාව ආහාරයෙන් ස්වයංපෝෂිත කළ හැකි බැව් දැක්වෙන විස්තර ඇතුළත් පැහැදිළි වාර්තා ඉදිරිපත් කර තිබෙනව. නමුත් ඒවා සම්බන්ධයෙන් වගකිවයුතු ඉඩම් ඇමතිවරයා ඒවාට බාධා කරමින් ද්‍රෝහිකම් කරමින් ඒවා යටපත් කරනව. සංයුක්ත මණ්ඩල මාර්ගයෙන් එහෙම නැත්නම් මහජන ව්‍යාපාර මාර්ගයෙන් පොදු ජනතාව සන්තක ව්‍යාපාර හැටියට හෝ විශාල රජයේ ගොවිපොළවල් හැටියට හෝ සාමූහික ගොවිපොළවල් හැටියට මේ ප්‍රදේශ සංවර්ධනය නොකර, විශාල ධනවතුන්ට ධනය රැස් කිරීමට කම්කරු ජනතාව සූරාකමින් විශාල වතු වාගේ මේ ඉඩම්වල වගා කරන්නට අවස්ථාව සලසා දීමෙන් සම්පූර්ණයෙන්ම සංවර්ධනය නතර කිරීමට යොදා ඇති මේ වැඩ පිළිවෙළට ඉඩම් ඇමතිවරයාත් වැරදිකාරයකු බව මා මේ අවස්ථාවේදී තරයේම කියා සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වියළි ප්‍රදේශයේ සංවර්ධනය සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ මණ්ඩලය මගින් පිළියෙළ කළ වාර්තාවේ මෙසේ කියා තිබෙනවා :

"Comprehensive survey of the available surface and groundwater resources within the catchment areas of the Mahaweli Ganga and Dry Zone areas of the North and Central Provinces and the service areas of the diversion scheme including analysis and interpretation of existing hydro-meteorological data, modification of existing hydro-electric network and the establishment of new institutions and groundwater investigations by drilling."

වියළි ප්‍රදේශයේ මේ කටයුතු සම්බන්ධවත් කරන්නට තිබෙන කටයුතු සම්බන්ධවත් පරීක්ෂණ පවත්වා පිළියෙළ කර තිබෙන මේ වාර්තාවේ ඒ අනුව කරන්නට හැකි සියළුම වැඩ කටයුතු සම්බන්ධයෙන් විස්තර සඳහන් වෙනව :

"Formulation of an overall river basin development plan including reservoirs, canals, power stations and other hydraulic works.

Preparation of a sound agricultural development programme, formulation of practical cropping patterns including crop diversification, improvement of farming practice, including fodder crop for livestock, establishment of rural improvement programmes through studies of rural organization, land ownership, tenure and credit systems. Extension services will be included.

Economic appraisal for agricultural development and production through a rural economic survey and the determination of the benefits based upon irrigation practice."

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව තිබුණු කාලයේදී කැඳවන ලද එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ විශෙෂඥයින් විසින් වියලි ප්‍රදේශ සංවර්ධනය කිරීමේ වැඩ පිළිවෙල සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද මේ විධියේ විශාල වාර්තා තිබෙනවා. මේවා අද මහජනයාගේ ප්‍රයෝජනයට හෝ රටේ ප්‍රයෝජනයට හෝ ගොවි ජනතාවගේ ප්‍රයෝජනයට හෝ නොයොදා විශාල වතුකාරයින්ගේ ප්‍රයෝජනය සඳහා යොදන්නට මේ ආණ්ඩුව කටයුතු කරගෙන යනවා. මන්නාරම ප්‍රදේශයේ අක්කර 20,000ක් පමණ කජු වැවීම සඳහා ධනපතියන්ට දෙන්නටත් බින්තැන්න ප්‍රදේශයෙන් මයියංගන ප්‍රදේශයෙන් අනුරාධපුර ප්‍රදේශයෙන් අක්කර 20,000 ක පමණ ප්‍රදේශයක් විදේශ කොම්පැනි කාරයින්ට දෙන්නටත් වැඩ පිළිවෙල යොදාගෙන යනවා. මහජනයාගේ ප්‍රයෝජනය සඳහා නොගෙන යටපත් වී තිබුණු විශෙෂඥ වාර්තා ප්‍රයෝජනයට ගෙන පසුගිය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව විසින් මූලික වශයෙන් ඉදිරිපත් කරන්නට යෙදුණු සංවර්ධන ව්‍යාපාර අද විශාල ධනපතියන්ගේ ප්‍රයෝජනය සඳහා යෙදීමට එක්සත් ජාතික පක්ෂයේ හත් හවුල් ආණ්ඩුව විසින් කරන්නට යන ඉතාමත් වංචනික දේශද්‍රෝහී ව්‍යාපාරය ගැන අපගේ තදබල විරුද්ධතාවය ප්‍රකාශ කරනවා. රට විදේශීය ධනපතියන්ට පාවා දීමට මේ ඊනියා ජාතික ආණ්ඩුව ගෙන යන වැඩ පිළිවෙල හෙළාදැකීම මේ අවස්ථාවේදී මගේ යුතුකමක් වශයෙන් මම කල්පනා කරනව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තවත් කරුණක් නිදර්ශනයක් වශයෙන් පෙන්වා දිය යුතුව තියෙනවා. ගංගා නිම්න සංවර්ධන පණත පිළිබඳ විවාදයේදී මගේ සංශෝධනය විවේචනය කරමින් කථා කළ යාපනේ ගරු මන්ත්‍රීතුමා (ජී. ජී. පොන්නම්බලම් මයා.) මේ විධියට කියා තිබෙනවා :

"His speech made it abundantly clear that what he wants not merely as a solution to any problem, economic or agricultural, but as a whole, as a picture for the future, is the creation of collective farms and, if I may say so, even if I am the only person left, I will oppose that."

සමූහ ගොවි පොළවල් ඇති කිරීම හා රජයේ විශාල සංවර්ධන ව්‍යාපාර යෙදීම ගැන යාපනේ ගරු මන්ත්‍රීවරයා තනිවම වුවත් සම්පූර්ණයෙන්ම විරුද්ධ වන බව එදා කියා තිබෙනවා. ෆෙඩරල් පක්ෂයත්, ද්‍රවිඩ පක්ෂයත්, එක්සත් ජාතික පක්ෂයත් එකතුව මේ හත් හවුල් ආණ්ඩුවක් හැදීමේ අරමුණ කුමක්ද කියා අපට මෙයින් පෙනී යනවා. ධනපති ක්‍රමය තහවුරු කිරීමත් පොදු ජනසතු ව්‍යාපාර නැති කිරීමත් යන ප්‍රතිපත්ති උඩ උග්‍ර ධනපති ක්‍රමය අනුව කටයුතු කරගෙන යාමත් අරමුණු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරගත් නිසා මේ උදව්යට එකට එකතු වීමට පුළුවන් වුණාය කියා මම කියන්නට කැමතියි. ඊට අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමාත් එකතු වුණේ ඒ ප්‍රතිපත්ති උඩමද යන වග එතුමාගේ කථාවේදී අවබෝධ වන නිසා මා ඒ ගැන විවේචනයක් කරන්නට බලාපොරොත්තු වන්නෙ නෑ.

**ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන (කර්මාන්ත හා ධීවර ඇමති)**

*(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன—கைத்தொழில், கடற்றொழில் அமைச்சர்)*

(The Hon. D. P. R. Gunawardena—Minister of Industries and Fisheries)

මොනවටද එකතු වුණේ ?

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**

*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*

(Dr. S. A. Wickremasinghe)

ඉඩම් අක්කර දහස් ගණන් ලොකු ධනපතියන්ට දීම ගැන මා මීට වඩා යමක් කියන්නට බලාපොරොත්තු වන්නෙ නෑ. නමුත් එක් කරුණක් කිව යුතුයි. රට හදන්නය කියා අක්කර දහස් ගණන් ඉඩම් ලොකු ධනපතීන්ට දුන් ලෝකයේ බොහෝ රටවල් කාන්තාර බවට පරිවර්තනය වීම පිළිබඳ සාක්ෂි ලෝකය පුරාම තිබෙනවා. ඒ නිසා එක්සත් ජාතික පක්ෂයේ මූලිකත්වයෙන් පවත්වාගෙන යන මේ ඊනියා ජාතික රජය ගෙන යාමට බලාපොරොත්තු වන වැඩ පිළිවෙළ ඒ විධියේම විනාශදායක තත්ත්වයකට මුහුණ දීමට හේතුවන, අවුරුදු හතරකින් පහකින් පොළවේ සාරය සම්පූර්ණයෙන් විනාශ කිරීමට ඉඩ සලසන දෙයක් මිස දේශප්‍රේමී ජනතාවට සහාය දී ඒ අය වෙනුවෙන් සේවය කිරීමේ ආශාවෙන් කරන ව්‍යාපාරයක් නොවන බවත්, ධනපති ක්‍රමයත් ධනපති කොම්පැනි ක්‍රමයත් තහවුරු කිරීමට අධිරාජ්‍යවාදී සම්බන්ධකම් තව තවත් වැඩි කෙරෙන වැඩ පිළිවෙළක් බවත්, එය දුරදර්ශී වැඩ පිළිවෙළක් නොව, විශාල ධනපති පුද්ගලයන් සහ ධනපති කොම්පැනිකාරයින් අතලොස්සකගේ වැඩි දියුණුව පිණිස අක්කර දහස් ගණන් අපේ රටෙන් වෙන් කර දෙන වැඩ පිළිවෙළක් බවත් මා මේ අවස්ථාවේදී මතක් කරන්න කැමතියි. අපේ රටේ ආණ්ඩුවේ විශේෂඥයින්ගේ ක්‍රමානුකූල වැඩ පිළිවෙළක් යටතේ සමාජවාදී ප්‍රතිපත්ති අනුව පවත්වාගෙන යන සමූහ ගොවිපොළවල්—පෞද්ගලික අංශය වෙනුවට රජය මගින් රජයේ පාලනය යටතේ සාර්ථක ලෙස පවත්වාගෙන යන වැඩදායක ගොවිපොළවල්—යටතේ මහජන ව්‍යාපාර වශයෙන් විශාල වශයෙන් වගා කිරීමේ වැඩ පිළිවෙළ වළක්වා විශාල ධනපතියන් යටතේ ආහාර ද්‍රව්‍ය වගා කිරීම සඳහා කටයුතු කිරීමේ වැඩ පිළිවෙළක් බවත් මතක් කරන්න කැමතියි.

ධීවර අංශය භාරව කටයුතු කරන්නට සිටින කර්මාන්ත හා ධීවර ඇමතිතුමා ප්‍රකාශ කළා, ධීවර කර්මාන්තය සම්බන්ධයෙන් නොබෝදා නිකුත් කරන ලද වාත්තීව ජාතික ආණ්ඩුවේ වගකීමක් ඇතිව නිකුත් කරන ලද වාර්තාවක් නොවේය කියා. ඒ නිසා ඒ වාර්තාව ගැන වචනයක්වත් කථා කරන්න මා බලාපොරොත්තු වන්නෙ නැහැ. ලංකාවේ ධීවර කර්මාන්තය දියුණු කිරීම සඳහා වරින් වර නොයෙක් පරීක්ෂණ රාශියක් කර තිබෙන බව අප දන්නවා. නොයෙක් පර්යේෂණ පවත්වා තිබෙන බවත් අප දන්නවා. කොයි හැටි වෙතත් මේ වාර්තාවේ එකී පර්යේෂණවල ප්‍රතිඵල අඩංගු නොවී තිබීම ගැන අප කනගාටු වෙනවා. මේ රටේ ධීවර කර්මාන්තයේ යෙදෙන්නවුන්ගේත්, පාරිභෝගිකයින්ගේත් ප්‍රයෝජනය සඳහා අවශ්‍ය දේවල් අඩංගු වාර්තාවක් ඇමති මණ්ඩලයේත් වගකීම අනුව පිට කළ යුතුයි. මාළු මරන්නන් සහ මාළු පාරිභෝගිකයනුත් අතර සිටින ලොකු ධනපති වෙළෙන්දන්ගේ ප්‍රයෝජනයට නොවෙයි ධීවර සංස්ථාව ක්‍රියා කරන්නට ඕනෑ. නිෂ්පාදකයින්ගේත්, පාරිභෝගිකයින්ගේත් ප්‍රයෝජනය සඳහා රජය යටතේ පාලනය වන සංස්ථාවක පාලනය ගෙන යන විට නවීන ක්‍රම තව තවත් යොදා ගෙන වැඩි වැඩියෙන් දියුණු කළ යුතුයි. ධීවර කර්මාන්තයේ යෙදී සිටින කාර්මිකයින්ගේ සුභසිද්ධිය සැලසෙන ආකාරයට නවීන ක්‍රමයන් යොදා කටයුතු කරගෙන යා යුතුයි.

එතකොට ප්‍රශ්නයක් පැන නඟිනවා, එක්සත් ජාතික පාක්ෂික කවිකයින් ප්‍රසිද්ධ වේදිකාවලට ගිහින් කියන දේවල් නිසා. ඒ අය කියනවා, ගැඹුරු මුහුදේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ.]

ශිහිල්ලා ධීවර කර්මාන්තයේ යෙදෙන්න තරම් පළපුරුද්දක් ඇති විශේෂඥයින් මේ රටේ නැතෙයි කියා. ඒ ගැන එකක් මතක් කරන්න බලාපොරොත්තු වෙනවා. ඝානාවේ ලබා ගත් දියුණුව ගැන කල්පනා කර බලන්න ඕනෑ.

ඝානාවේ ධීවර කටයුතු හා නාවුක කටයුතු දියුණු කරගැනීම සඳහා සෝවියට් දේශයේ ඔඩෙස්සා නගරයේ නාවික හමුදුවල් පුහුණු කරවන විද්‍යාලයට දූන් ශිෂ්‍යයින් අසූ ගණනක් යවා පුහුණු කරවනවා. සමාජවාදී රටවලින් හොඳ පුහුණුවක් ලබාදීමට අවසථාව ඇතත් එයින් ප්‍රයෝජන ගැනීම සඳහා මේ රජයේ කිසිත් සංවිධානයක් ඇත්තේ නැහැ. සමාජවාදී රටවලට අපහාස වන අන්දමින් ඇතැම් ඇමතිවරු අද කථා කරනවා. මාක්ස්වාදී රටවල ප්‍රජාතන්ත්‍රවාදයක් ඇත්තේ නැත, ඒකාධිපතිත්වයක් තිබෙන වාය යනාදී වශයෙන් අසත්‍ය, දර්ශනයකට නොගැළපෙන, බුඹිමත් අයට නොවටිනා අන්දමේ නුසුදුසු පහත් දේ කියන නිසා ඒ රටවලින් ගත හැකි ආධාර ගැනීමට අවසථාවක් ලැබෙන්නේ නැහැ.

මුදල් ඇමතිතුමා විසින් නිකුත් කරන ලද අයවැය කථාවේ සිංහල අනුවාදයේ 33 වන පිටුවේ මෙසේ සඳහන් කර තිබෙනවා :

"'වෙළඳාම හෝ ආධාරය' යන විෂයය ගැන යමක් මේ අවස්ථාවේදී සඳහන් කරන්නට මා කැමතියි. විදේශීය භාණ්ඩ මිළ ගණන් අපට වඩාත් වාසි එළවන වී නම්, විදේශ සහාය ලබා ගැනීමට එතරම් අවශ්‍ය වන්නේ නැති බව කවුරුත් පිළිගන්නවා. සංවර්ධනය වන රටවල වෙළඳාම හා වෙළඳ භාණ්ඩ පිළිබඳ ගැටළු ගැන සම්පූර්ණයෙන්ම අළුත් ප්‍රතිපත්ති තිබිය යුතු බව, වෙළඳාම හා සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනය අවධාරණය කළා. අප රජය, සංවර්ධනය වන සෙසු ජාතීන් හා සමඟ සිට, මේ යෝජනා සම්පූර්ණයෙන්ම අනුමත කරන බවත්, මේ සම්බන්ධයෙන් දැන් පිහිටුවා තිබෙන, ලංකාව සාමාජිකත්වය දරන, ස්ථිර සංවිධානයේ කටයුතුවලට සම්පූර්ණ සහයෝගය දීමට පියවර වඩන බවත් කීමට කැමතියි."

ඒ සමඟම කියනවා, යුඬයෙන් පසු මේ සම්බන්ධයෙන් කරන ලද සාකච්ඡා සාර්ථක වූයේ නැත කියා. ආණ්ඩු පක්ෂය මේ කාරණය අවබෝධ කරගෙන සිටිනවාද කියා මම දන්නේ නැහැ. අධිරාජ්‍යවාදී රටවල්—ඇමරිකාව, එංගලන්තය, බටහිර ජර්මනිය වැනි රටවල්—නොදියුණු රටවල් බලවත් රටවලට යටත් වන විදියට මේ සංවිධානය ක්‍රියාත්මක කරවීම සඳහා කටයුතු කරන්නට ගිය අවසථාවේදී, නොදියුණු රටවලට ද සමාන අයිතිවාසිකම් ඇති වන අන්දමින් එම සංවිධානය ක්‍රියාත්මක කරවීම සඳහා ප්‍රජාතන්ත්‍රවාදයක් නැත, ඒකාධිපතිත්වයක් තිබෙන වාය කියන සෝවියට් දේශය, නැගෙනහිර ජර්මනිය, පෝලන්තය, චෙකෝස්ලොවැකියාව, රුමේනියාව වැනි සමාජවාදී රටවල් තමයි, නොදියුණු රටවල් සමඟ උරෙන් උර ගැටී අධිරාජ්‍යවාදී රටවල ඒ වැඩ පිළිවෙලට විරෝධය පා ඔවුන්ගේ ඒ ක්‍රියා මාර්ගය බිඳ දැමීමට කටයුතු කළේ. එහි ප්‍රතිඵලයක් වශයෙනුයි, එම සංවිධානය නොදියුණු රටවලටද ප්‍රයෝජන වත් වන ලෙස ක්‍රියාත්මක වන්නේ. මේ ආණ්ඩුවේ ඇමතිවරු මේ සංවිධානයෙන් නිසි ප්‍රයෝජන ලබාගැනීමට කටයුතු කරනවාද යන්න ගැන අපට සැකයක් තිබෙනවා.

එක්සත් ජාතීන්ගේ මණ්ඩලය අග්නිදිග ආසියාවේ ආර්ථික ක්‍රම සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනවා. සමාජවාදී රටවලින් අග්නිදිග ආසියාවේ රටවලට ලැබෙන ආධාර සම්බන්ධයෙන් මෙසේ කියා තිබෙනවා :

" *Export Trade*

India—the great increase to socialist countries of bilateral contracts is very important for creating additional trade."

බඩු හුවමාරු කිරීමේ වෙළඳ ගිවිසුම් අනුව සමාජවාදී රටවලට කාර්මික බඩු ආනයන කිරීමෙන් ඉන්දියාවට වැඩි වෙළඳ වාසියක් ලැබී තිබෙන බවයි එයින් කියන්නෙ.

"Asian countries in difficulty over foreign exchange and expansion of badly needed exports are glad to have the substantial increase of trade made possible by growing sales of Asian products to centrally planned economies."

සමාජවාදී රටවල් නොදියුණු රටවල් සමග බඩු භාණ්ඩ හුවමාරු කර හැකීමේ වෙළඳ ගිවිසුම් නිසා ඒ නොදියුණු රටවල් දියුණු කරන්න පුළුවන් වුණාලු.

ඉන්දියාව, ලංකාව වැනි රටවල නිෂ්පාදනය කරන කාර්මික භාණ්ඩ කොයි රටවලටද යවන්න පුළුවන් කියන ප්‍රශ්නය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පැන නගිනවා. ලංකාවෙ මහජනතාව නිෂ්පාදනය කරන දේ පිට රටට යවන්න පුළුවන් ක්‍රියා මාර්ගයක් තිබෙන්න ඕනෑ. සෝවියට් දේශය මොකක්ද කෙළේ? ජිනීවා සම්මේලනයේ ප්‍රතිපත්ති අනුව සමාජවාදී නොදියුණු රටවලින් නිෂ්පාදනය කර එවන බඩුවලට තීරු බද්ද සම්පූර්ණයෙන් ඉවත් කළා. ඒ නිසා නොදියුණු රටවලට ඒ අනුව වැඩි වෙළඳ වාසියක් ලැබුණා. ලංකාවේ නිෂ්පාදනය කරන බැටරි ඕනෑ තරමක් නැගෙනහිර ජර්මනියට දෙන්න පුළුවන්. ඔය විධියට ඒ උදවියට වැඩි ලාභයක් ගැනීමේ චේතනාවෙන් නොව, අපට වැඩි වාසියක් ලැබෙන අන්දමින් අපේ රටේ සංවර්ධනයට අදාළ වන අන්දමින්, බඩු හුවමාරු කර ගැනීමේ අවස්ථාව අපට ලැබී තිබෙනවා. වෙළඳාම සම්බන්ධයෙන් අපට වාසි වන අන්දමට ඒ විධියේ ක්‍රියා මාර්ගයක් සබාග ආණ්ඩුව මගිනුත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව මගිනුත් ඇති කළා.

දැන් ඒ ප්‍රතිපත්තිය සම්පූර්ණයෙන්ම වෙනස් කර අධිරාජ්‍යවාදී රටකට යටත්ව නැවතත් මේ රටේ කටයුතු පවත්වාගෙන යාමේ අදහසින් ලෝක බැංකු විශෙෂඥයන්ගෙන් උපදෙස් ගැනීමට බලාපොරොත්තු වන බව මුදල් ඇමතිතුමාගේ කථාවෙන් පැහැදිලි වුණා. ඒ ගැන මගේ කනගාටුව ප්‍රකාශ කරනවා. ඒ නිසා රු වැටුණු වළේ දවාලට වැටීමේ ප්‍රතිපත්තිය අනුගමනය කිරීමට වඩා වැඩි ඥානශක්තියක් මේ ආණ්ඩුවට නැති වීම ගැන කනගාටුව ප්‍රකාශ කරන අතර, රටේ ඇතිවේගෙන ආ දියුණුව සම්පූර්ණයෙන් නැති කර රට නැවතත් අධිරාජ්‍යවාදීන්ට යටත් කර වහල් කර දීමට දරන මේ ප්‍රයත්නය ගැන අපේ තද විරෝධය ප්‍රකාශ කරමින්, වැඩි වේලාවක් කථා කිරීමට මට අවස්ථාවක් සලසා දීම ගැන තමුන්නාන්සේට කෘතඥ වෙමින් මගේ කථාව මින් අවසන් කරනවා.

අ. භා. 2.34

එඩ්මන්ඩ් විජේසූරිය මයා. (මස්කෙළිය)
(திரு. எட்மன் விஜேசூரிய—மஸ்கெலிய)
(Mr. Edmund Wijesuriya—Maskeliya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගරු මුදල් ඇමතිතුමාට මේ අයවැය ලේඛනය සකස් කරන්නට සිද්ධි වුණේ ආර්ථික අතිනුත්, විදේශගත ධනය අතිනුත්, මේ රට ඉතාමත් හීන තත්ත්වයට වැටී තිබෙන අවස්ථාවකයි. එවැනි අවස්ථාවකදී රටේ මහජනතාවට සෑහෙන තරමකින් පිළිගන්න පුළුවන් ඒ වාගේම රටේ ජනතාවට ප්‍රයෝජනවත් වන අන්දමේ අයවැය ලේඛනයක් ඉදිරිපත් කිරීම ගැන අපේ ගරු මුදල් ඇමතිතුමාට මස්කෙළිය කොට්ඨාශයේ ජනතාව වෙනුවෙන් අවංක ස්තුතිය පුද කරන්න කැමතියි.

පසුගිය වකවානුවේදී මේ රට හැම පැත්තෙන්ම හීන තත්ත්වයකට වැටුණු බව අප කවුරුනුත් දන්නවා. එහෙත් පසුගිය රජය මේ රට කෑවාය, රට හීන තත්ත්වයට පත් කළාය, යනාදී වශයෙන් කියමින් ඒ රජයට චෝදනා එල්ල කිරීමෙන් අපට සෑහීමට පත්වීමටවත් තෘප්තිමත් වීමටවත් බැහැ. පසුගිය මහා මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂයේ නායකතුමාත් සෙසු නායකතුමන්ලාත් මේ රටේ ජනතාවට දුන් පොරොන්දුව නම් මුහුණ පා තිබෙන භයානක තත්ත්වයෙන් තමන් රට මුදා ගන්නා හෙයින් තමන් කෙරෙහි විශ්වාසය තබා තමන්ට මේ රටේ බලය ලබා දෙන ලෙසයි. මේ රටේ ජනතාවගෙන් වැඩි කොටසක් ඒ ප්‍රකාශය ගැන විශ්වාස තැබුවා. ඒ පොරොන්දුව ගැන විශ්වාස තැබුවා. ඒ නිසා තමා මේ රටේ පාලන බලය එක්සත් ජාතික පක්ෂයට ලැබුණේ. දැන් ඉතින් මේ ජාතික ආණ්ඩුවට ලොකු වගකීමක් පැවරී තිබෙනවා. කොතරම් බැරෑරුම් වැඩ කොටසක් ඇතත් මේ රට වැටී ඇති භයානක තත්ත්වයෙන් ගොඩ ගැනීමේ වගකීම මේ ජාතික ආණ්ඩුවට පැවරී තිබෙනවා. ඒ නිසා අනික් පැත්තට චෝදනා එල්ල කරමින් නොසිට තමන් වෙත පැවරී ඇති වගකීම ඉටු කරන්නට අධිෂ්ඨානයක් අප තුළ ඇති කර ගන්නට ඕනෑ.

මේ අයවැය ලේඛනය හොඳ එකකැයි ගරු මුදල් ඇමතිතුමාට ප්‍රශංසා කළත් එක් කාරණයක් මේ අයවැය ලේඛනයෙහි සඳහන් නොවීම ගැන මා නම් කනගාටු වෙනවා. කන්ද උඩරට සාගින්නෙන් පීඩිතව, ලෙඩින් පෙළෙමින්, දුකින් බරව සිටින ගැමි-කම්කරු ජනතාව ගැන මේ අයවැය ලේඛනයෙහි සඳහන් වී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එඩ්මන්ඩ් විජේසූරිය මයා.]

නැහැ. මිට අවුරුදු 14 කට පමණ උඩදී ඒ කන්ද උඩරට ජන ජීවිතය ගැන සොයා බලා, ඒ ජනතාවගේ අත්‍යවශ්‍ය කටයුතු ගැන සොයා බලා වාර්තා කිරීම පිණිස උඩරට ගැමි කොමිෂන් සභාව පත් කළා. දැනට 14 අවුරුද්දක් ගත වී ඇතත් ඒ කොමිසමෙන් නිර්දේශ කරන ලද කරුණු වලින් හයෙන් පංගුවක් පමණයි, ඉටු වී තිබෙන්නේ. ඉදිරි කාලයේදීත් මේ අන්දමට කටයුතු සිදු වුණොත් නම් ඒ කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක වන්නට තවත් අවුරුදු 75 ක් පමණ ගත වෙනවා ඇති. එම නිසා මා ඉතා බැගෑපත්ව ජාතික ආණ්ඩුවේ නායකතුමාගෙනුත් සෙසු නායකතුමන්ලාගෙනුත් ඉල්ලා සිටින්නේ, උඩරට ගැමි කොමිසන් සභාවේ නිර්දේශ අනුව උඩරට පුනරුත්ථාපනය කිරීමේ කටයුතු ගැන විශේෂ උනන්දුවක් දක්වා ක්‍රියා කරන ලෙසයි. දැනට වෙන් කර ඇති මුදල් ප්‍රමාණයට වඩා විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කොට මෙතෙක් ඉවසිලිමත්ව සිටි උඩරට ප්‍රදේශයේ ජනතාවට සැනසිල්ලක් ලබා දෙන ලෙසටයි. අපේ ගරු අගමැතිතුමා වැඩි කලක් යන්න පෙර ඒ අයට ඒ සැනසිල්ල ලබා දෙනවාට මගේ හිතේ කිසිම අඩමානයක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊ ළඟට මා ඉඩම් සම්බන්ධව වචනයක් කියන්න ඕනෑ. පැලක් ගසා ගැනීමට තරම්වත් ඉඩම් කැබෙල්ලක් නැතිව මේ රටේ ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් ජීවත් වෙනවා. 1960 ජූලි මැතිවරණයේදී මා මස්කෙළිය ආසනය දිනාගෙන මේ ගරු සභාවට ඇවිත් හාපුරා කියා මගේ මංගල කථාව කරද්දී මා යෝජනාවක් ඉදිරිපත් කළා. අක්කර සියයකට වැඩි සෑම වත්තකින්ම සියයට දෙක බැගින් ගෙන ඒ අසරණ ජනතාවට පැලක් ගසා ගැනීමට ඉඩම් කැබැල්ලක් දිය යුතුය කියා. නමුත් ඒ යෝජනාව ක්‍රියාත්මක කිරීමට වැඩ පිළිවෙළක් ඇති කළේ නැහැ. ඊට පසු 1963 දී කෝලාහලයක් කරල බොහොම අමාරුවෙන්, අක්කර සියයට වැඩි ඉඩම් වලින් සියයට දෙක බැගින් ගත යුතුය කියන යෝජනාව ඒ අවුරුද්දේ රාජාසනයේ කථාවට ගැබ් කරවා ගත්තා. නමුත් එයත් හරියට ක්‍රියාත්මක වුනේ නැහැ. මේ අවස්ථාවේදී ගරු අගමැතිතුමා මේ ගරු සභාවේ සිටින නිසා මම එතුමාගෙන් ඉතා ඕනෑකමින් සහ කරුණාවෙන් ඉල්ලා සිටිනවා, ඒ යෝජනාව ක්‍රියාත්මක කර පැලක් ගසා ගැනීම සඳහා ඉඩම් කැබැල්ලක් ලබා ගැනීමේ භාග්‍යය—ඒ වරප්‍රසාදය—එතුමාගේ කාල සීමාවේදී සෑම කෙනකුටම සලසා දෙන්නය කියා. මගේ මේ පැල ගසා ගන්නේ මගේ ඉඩමේය කියන හැඟිම ඇතිව පැලක් ගසා ගැනීමේ භාග්‍යය ලංකා මාතාවගේ සෑම පුත්‍රයකුටම ලැබෙන්නට ඕනෑ. ඒ භාග්‍යය—ඒ වරප්‍රසාදය—ලැබුණොත් ඒ ජනතාව ගරු අගමැතිතුමාට ජාති ජාති කෘතඥ වෙනවාට කිසිම සැකයක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය කාලයේදී අපේ රටේ මුදල් තත්ත්වය ඉතාම භයානක තත්ත්වයකට පත්වී තිබෙන බව අපි කවුරුත් දන්නව. ඒ ගැන කිසිම සැකයක් නැහැ. අපේ ගරු අගමැතිතුමා භාරගෙන තිබෙන්නේ ඉතා මත් භාරදූර කටයුත්තක්. නමුත් එතුමා ඒ භාරදූර කතව්‍යය භාර ගත්තේ ලොකු අධිෂ්ඨානයක් ඇති කරගෙන බව මම දන්නව. මේ භයානක තත්ත්වයෙන් රට මුදා ගන්නට නම් මේ රටේ නිෂ්පාදනය කරන ද්‍රව්‍ය වැඩි කර ගන්නටත්, ඒ ද්‍රව්‍ය වලට වැඩි මිළක් ලබා ගන්නටත් අපි වැඩ කටයුතු කරන්න ඕනෑ. ඒ අතරම පිටරටින් බඩු ගෙන්වීම පුළුවන් තරම් අඩු කරන්නටත් අපි උත්සාහ කරන්නට ඕනෑ. විශේෂයෙන්ම මේ රටේ ජනතාවට අත්‍යවශ්‍ය සහල් ටික පිටරටින් ගෙන්වන්නෙ නැතිව, සහල් අතින් අප ස්වයංපෝෂිත වන විධියේ වැඩ පිළිවෙළක් සකස් කරන්නට ඕනෑ. කෘෂිකර්මය ගැන විශේෂ උනන්දුවක් දක්වන බව අයවැය ලේඛනයෙහි සඳහන් වී තිබීම අපි සියළු දෙනාගේම සතුටට කාරණයක්. අපේ රට ගොවිතැනින් යැපෙන රටක්. ගොවිතැනින් යැපෙන රටක් අඩු වශයෙන් ආහාර අතින්වත් ස්වයංපෝෂිත වින්නට ඕනෑ. එසේ නැත්නම් එය ඉතා කනගාටුදායක තත්ත්වයක්. එංගලන්තය වැනි කාර්මික රටක් පිටරටකින් ආහාර ටික ගෙන්වා ගැනීම අපට තේරුම් ගන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පුළුවන් දෙයක්. නමුත් අපේ රට ගොවි තැනින් යැපෙන රටක්. මේ රටේ කුඹුරු අක්කර නව ලක්ෂයක් පමණ තිබෙනව. මේ සෑම කුඹුරකටම අවශ්‍ය පෝර ලැබෙන විධියේ ක්‍රමයක් යොදා, අවශ්‍ය බිත්තර වී ටික සපයා දී; එසේ වී වපුරන්නෙ නැතිව තවානේ දමා පැළ සිටවීමට සැලස් වීමේ ක්‍රම ඇති කළොත් තිබෙන කුඹුරු අක්කර නවලක්ෂයෙන් මේ රටේ ජනතාවට වුවමනා හාල් ප්‍රමාණය ලබා ගන්නට පුළුවන් වෙනවාට මගේ හිතේ කිසිම සැකයක් නැහැ. අද ඒ විධියට පෝරත් නවීන ක්‍රමත් යොදන්නේ නැතිව අපට වුවමනා කරන සහල් ප්‍රමාණයෙන් සියයට 56 ක් පමණ ලබා ගන්න පුළුවන් නම් පෝර යොදා නවීන ක්‍රම අනුව වැඩ කළොත් දනට තිබෙන කුඹුරු ප්‍රමාණයෙන්ම අපට වුවමනා කරන සම්පූර්ණ සහල් ප්‍රමාණය ලබා ගන්නට පුළුවන් වෙනවාට කිසිම සැකයක් නැහැ.

එමෙන්ම අපේ විදේශ ධනය දියුණු කරන්නට නම්, විදේශ ධනය තර කරන්නට නම්, තේ වැඩි වැඩියෙන් නිෂ්පාදනය කර ඒ තේවලට වැඩි මිලක් ලබා ගන්නට අපි උත්සාහ කරන්න ඕනෑ. දස අවුරුදු සැලැස්ම යටතේ යෝජනාවක් අනුව නැවත වගා කිරීමේ ක්‍රමය යටතේ තේ අක්කර 50,000 ක් නැවත වගා කිරීම දන් ක්‍රියාත්මක වේගෙන යනවා. එය ආරම්භ කළේ 1958 අවුරුද්දෙයි. එහෙත් අපි බලාපොරොත්තු වූ අන්දමට එය හරි හැටියට ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒ සඳහා ගෙවන්නේ රජයෙන් ගෙවන මුදලක් නොවෙයි. පිටරට පටවන සෑම තේ රාත්තලකින්ම සත 4 බැගින් අර ගෙනයි තේ නැවත වගා කිරීමේ ව්‍යාපාරයට යොදවන්නේ. මේ අන්දමින් අවුරුද්දකට කෝටි 2 ක පමණ මුදලක් ලැබෙනවා. එහෙත් අද වනතුරුම කෝටි 3 කට වඩා මේ සඳහා වැය කර නැහැ. මූලික අවස්ථාවේදී, 1959, 1960 හා 1961 යන වර්ෂවල, තේ අක්කරයක් නැවත වගා කිරීම සඳහා ගෙව්වේ රුපියල් 2,500 ක් පමණයි. ඊට පසු එය රුපියල් 3,750 දක්වා නැංගෙව්වා. එ ප්‍රමාණය ඉතා ඉක්මණින්ම රුපියල් 4,500 දක්වා වැඩිකර ඉක්මණින්ම තේ අක්කර 50,000 සම්පූර්ණ කරන්නට කටයුතු යොදන්නය කියා මා ඉතා ඕනෑකමින් ඉල්ලනවා.

මේ රට දියුණු කිරීම සඳහා අපේ හිත් යොමු කළ යුතු තවත් කාරණාවක් තිබෙනව. සමුපකාර ව්‍යාපාරය මගින් මේ රට දියුණු කිරීමට හොඳට ඉඩ ප්‍රස්ථාව තිබෙනව. ඒ සමුපකාර ව්‍යාපාරය ආරක්ෂා කර එය දියුණු කර මේ රටේ ජනතාවගේ ප්‍රයෝජනයට වැඩ කටයුතු කරන්නට අපට යුතුකමක් තිබෙනව. මේවා ගැන සොයා බලා දියුණු කිරීමට කටයුතු කරන ලෙස අපේ ගරු මුදල් ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. එතුමාගේ අයවැය කථාවේ අන්තිම කොටසේ ඉතා වැදගත් කාරණාවක් සඳහන් කර තිබෙනවා. ඒ මෙයයි:

"මගේ කථාව අවසන් කිරීමට පෙර, රාජ්‍ය සේවාවේ සියළුම අංශවලට, මා විසින් ඉල්ලීමක් කරනවා. කිසිම රජයකට රාජ්‍ය සේවාවේ සහයෝගය නැතිව, තම ප්‍රතිපත්ති කාර්යක්ෂමවත්, සාර්ථකවත් සපුරාලීමට පුළුවන්කමක් නැහැ."

මෙය ඉතාම වැදගත් කාරණාවක්. ඒ නිසා විශේෂයෙන්ම මෙන්න මෙක කියන්න ඕනෑ. සමුපකාර සේවයේ යෙදී සිටින පරීක්ෂකතුමන්ලා අන්න ඒ සංඛ්‍යාවට අඩංගු වෙනවා. මම ගරු ඇමතිතුමාගෙන් විශේෂ ඉල්ලීමක් කරනව, ඒ අයගේ අඩුපාඩුකම් ගැන කල්පනා කර බලා, ඒ අයට සුදුසු වැඩ පිළිවෙලක් යොදන්නට කියා. එසේ ඉල්ලා සිටින අතර ඒ පිළිබඳව මා ළඟ ඇති සන්දේශයක් එතුමාට භාර දෙන්න කැමතියි. මෙයට වඩා වැඩි කාලයක් මගේ කථාවට ගත කරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. මගේ කථාව මෙයින් සමාප්ත කරනව.

අ. භා. 2.51

**මංගල මූණසිංහ මයා.** (බුලත්සිංහල)

*(திரு. மங்கள முனசிங்க—புலத்சிங்கள)*

(Mr. Mangala Moonesinghe—Bulathsinhala)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක්සත් ජාතික පක්ෂයේ රජය මෙවර අය වැය ලේඛනය ඉදිරිපත් කිරීමට පෙර අප බලාපොරොත්තු වුණා, අලුත් දේශපාලන මාවතක් අරගෙන තිබෙන්නට පුළුවනිය කියා. ඒ අනුව අයවැය ලේඛනයක් ඉදිරිපත් කරාවිය කියා අප බොහෝ දෙනකු බලාපොරොත්තු වුණා. ඒ පැත්තෙ මන්ත්‍රී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මංගල මූණසිංහ මයා. ]

වරුන් අපට කීවෙ, "වේට් ඒපා ද බජට් ඇන්ඩ් සී" කියායි. අපි ඇත්ත වශයෙන්ම අලුත් දේවල් බලාපොරොත්තු වුණා; ගෝනියා පාෂා වාගේ අලුත් දේවල් ඉදිරිපත් කරාවිය කියා අපි බලාපොරොත්තු වුණා. මෙම අයවැය ලේඛනය ඉදිරිපත් කළාම ජනතාව රබන් ගහනව, රතිඤ්ඤා පත්තු කරනව අපට අහන්න ලැබෙයි කියල මම හිතුව. නමුත් ඒ කිසිවක් අපට ඇහුනෙ නැහැ. නමුත් ලොකු හෝටල්වල නම් ඒ දවස්වල අපට ඇහුණා, වීදුරු හැපෙන සද්දය. විස්කි, ෂැම්පේන් වීදුරුවල සද්දය—ධනපති උදවිය සන්තෝෂ වන සද්දය—අපට ඇහුණා. මෙම එක්සත් ජාතික පක්ෂයේ අයවැයෙන් සිදු වුණේ ඒකයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**

*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*

(An hon. Member)

එක්සත් ජාතික පක්ෂයේ අය පමණක් නොවෙයි.

**මංගල මූණසිංහ මයා.**

*(திரு. மங்கள முனசிங்க)*

(Mr. Mangala Moonesinghe)

**ඔව්, ෆෙඩරල් පක්ෂයේ අයත් ඉන්නව.**

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම අයවැය ලේඛනයෙන් සාමාන්‍ය ජනතාවට කිසිම සහනයක් ලැබුණෙ නැහැ. නමුත් විශාල කොම්පැනිකාරයින්ට, ලක්ෂ පන්සියයකින් විතර සහනයක් ලැබී තිබෙනව. සාමාන්‍ය ජනතාවට මෙයින් සහනයක් සැලසී තිබෙනවාය, පරිප්පුවල තීරු බද්ද, අලවල තීරු බද්ද ඉවත් කළාය කීවාම, එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් අත්පුඩි ගහන්න පටන් ගත්ත. ඇත්ත වශයෙන්ම බලනව නම් අඩු කර තිබෙන තීරු බද්ද කොපමණද? එක අල හොන්ඩරයකට තීරු බද්ද තිබෙන්නෙ ශත 20යි. පරිප්පු හොන්ඩරයකට තීරු බද්ද රුපියලයි. හොන්ඩරයකට රාත්තල් 112 ක් තියෙනව.

**ගරු මන්ත්‍රීවරයෙක්**

*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*

(An hon. Member)

ඕක ඉස්සෙල්ලත් කීව.

**මංගල මූණසිංහ මයා.**

*(திரு. மங்கள முனசிங்க)*

(Mr. Mangala Moonesinghe)

අපි දන්නව මේව අහන්න කැමති නැති බව. මේව කියන කොට රිදෙනවා. මේ විධියට බලන කොට රාත්තලකට සතයක්වත් අඩු වෙන්නෙ නැහැ. සතයකින්වත් ලාභයක් ලැබෙන්නේ නැහැ. සතයකින්වත් ලාභයක් නැත්නම්, අඩුවක් නැත්නම් ඒ ලාභයත් යන්නෙ වෙළෙන්දාට, සාමාන්‍ය ජනතාවට ඒ සතේ හෝ ශත භාගයේ හෝ ශත කාලේ ලාභයවත් ලැබෙන්නෙ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රැකී රක්ෂා ප්‍රශ්නය ගැන මෙම මැතිවරණ කාලයේදී එක්සත් ජාතික පක්ෂය බොහොම කෑ ගැහැව්ව, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ රජය යටතේ රැකීරක්ෂා ප්‍රශ්නය ඉතාම උග්‍ර වී තිබෙනවාය, අවුල් වී තිබෙනවාය කියා. ඒ අතරම කීවා බඩු මිල නැග තිබෙනවාය කියල. මෙන්න මේ කාරණා දෙක උඩයි එක්සත් ජාතික පක්ෂය මැතිවරණ කාලයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට විරුද්ධව සටන් මෙහෙයෙව්වෙ. එම නිසා ජනතාවට යම්කිසි සහනයක් ලැබේවිය, රට හැඩගස්සන්න යම්කිසි සැලැස්මක් ඉදිරිපත් කරාවිය කියා අප බලාපොරොත්තු වුණා. එහෙත් ඉදිරිපත් කළේ හෙට අනිද්ද කරන්න පුළුවන් වැඩ නොවෙයි. ගරු මුදල් ඇමතිතුමා කියනව, වයස 18 ත් 23 ත් අතර අයගෙ රැකී රක්ෂා නැතිකම 78 දාහ දක්වා නැග තිබෙනවාය කියා. [බාධා කිරීමක්] නැංගෙව්වෙ කවුද කියා මම කියා දෙන්නම්. කොහොමද මෙම ප්‍රශ්නය විසඳන්න හදන්නෙ? සිසු භටයින් 150 කට විතර රක්ෂා තියෙනවලු. ලිපිකරුවන් 1,000 කට විතර ඇබෑර්තු තියෙනවලු. ආණ්ඩුවේ සංස්ථාවල 2,000 කට විතර ඇබෑර්තු තියෙනවලු. ඔය විදියට ඔක්කොම 15,000 ක් විතර වෙයි. අර සංඛ්‍යාවෙන් කාලකටවත් මේ විදියට රක්ෂා සපයන්න බැරි වෙයි. මීට අවුරුදු 9 කට පෙර එක්සත් ජාතික පක්ෂය නේද මේ රට ආණ්ඩු කළේ? ඒ කාලය තුළ තමුන්නාන්සෙලා රැකී රක්ෂා ප්‍රශ්නය විසඳුවද? තමුන්නාන්සෙලා එදා ආණ්ඩුව භාර ගන්න විට රක්ෂා නැතුව 33 දාහක් පමණ සිටිය. 1956 දී ආණ්ඩුව භාර දෙන විට ඒ සංඛ්‍යාව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

84 දාහට නංගලයි, භාර දුන්නෙ. එහෙනම් අද කෙසේද රැකීරක්ෂා ප්‍රශ්නය විසඳන්නෙ? ඒ කාලෙ ආණ්ඩුව භාර දුන්නෙ, රැකී රක්ෂා නැති අයගෙ ප්‍රමාණය තව දුරටත් වැඩි කර නම් මෙම අයවැය ලේඛනයෙන් එම ප්‍රශ්නය විසඳෙන්නේ කොහොමද? මේ අය වැය ලේඛනයෙන් ඒ සඳහා නියම වැඩ පිළිවෙළක් ඉදිරිපත් කර තිබෙනවාද? මේ මගින් මහජනතාවට නම් සහනයක් ලැබුණේ නැහැ.

යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්‍ය එන්. එම්. පෙරේරා) ගිය අවුරුද්දෙ අය වැය ලේඛනයක් ඉදිරිපත් කළා. යම් යම් සහන කෙළින්ම මහජනතාවට දීල තිබුණා, එම අයවැය ලේඛනය මගින්. නුපුහුණු හා අර්ධ පුහුණු කම්කරුවන්ගෙ වාර්ෂික පඩිය ඒ මගින් වැඩි කර තිබුණා. පුද්ගලික අංශයෙ ලාබවලින් සියයට 25 ක් කම්කරුවන්ට දෙන්නය කියා යෝජනා කළා. ගෙවල් හිමියන්ගෙන් ඒ ගෙවල් ආණ්ඩුවට අර ගෙන දුප්පතුන්ට බෙදා දෙන්න ක්‍රමයක් සකස් කළා. රජය මගින් පොත්පත් මුද්‍රණය කර දුප්පත් ළමයින්ට අඩු මිලට සපයන්න යෝජනා කළා. විශ්ව විද්‍යාලයට යන දුප්පත් ළමයින්ට මහජන බැංකුවෙන් ණය මුදලක් දීමට කටයුතු සකස් කර තිබුණා, ඔවුන්ගෙ ඉගෙනීම් කටයුතු පහසුවෙන් කර ගැනීම සඳහා. නියම මහජන අයවැය ලේඛනයක්ය කියා කෙළින්ම කියන්න පුළුවන් වන්නෙ, එවැනි එකකටයි. මෙවැනි දේවලින් එකක්වත් තමුන්නාන්සෙලගෙ අයවැය ලේඛනයෙ නැහැ. මේව කියනකොට තමුන්නාන්සෙලට බොහොම රිදෙනව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "මෙම අය වැය ලේඛනයෙන් සැලැස්මක් ඉදිරිපත් කර නැහැ; නමුත් බලාපොරොත්තු වෙන්න, විශ්වාස කරන්න; අපි මේ රට දියුණු කරනව, ආර්ථික සංවර්ධනයක් ඇති කරනව" යනාදී වශයෙන් මේ අය අපට කියනව. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව පළමු වන වරට ආ රජයක් නම් ඒ කීම පිළිගන්න අපට පුළුවනි. නමුත් මේ බෙර යමයි. මීට අවුරුදු 9කට පෙරත් ගැහුවෙ. ඊට වඩා වෙනසක් නැහැ. 1947-56 දක්වා එක්සත් ජාතික පක්ෂය ආණ්ඩු කළ කාලෙ අපේ විදේශ විනිමය මීට වඩා තිබුණා එකල අපේ තේ පොල් රබර් මීට වඩා වැඩි මිළකට විකුණා ගන්ට පුළුවන් වුණා. ඒ එක්සත් ජාතික පක්ෂයේ දක්ෂකමක් නිසා නොවෙයි; කොරියන් යුද්ධය නිසයි. "කොරියන් බූම්" එක නිසයි, අපේ ද්‍රව්‍ය වැඩි මිළකට විකුණා ගන්ට පුළුවන් වුණේ. ඒ වැඩිපුර මුදල් තිබුණු කාලයේ වුණත් තමුන්නාන්සේලා සංවර්ධන වැඩ පිළිවෙළක් පටන් ගත්තෙ නැහැ. පෞද්ගලික අංශයේ එකම කර්මාන්තයක්වත් පිහිටෙව්වෙ නැහැ. මොකක්ද වුණේ, ධනපති පන්තිය පුළුවන් තරම් සල්ලි හම්බ කර ගත්ත. ඒ කාලයේ ධනපතීන්ගේ සාක්කු පිරුණා. (බාධා කිරීමක්).

ඔව්, මම දන්නව, මේව කියන කොට තමුන්නාන්සේලාට බොහොම රිදෙන බව. ඒ කාලයේදීවත් සංවර්ධන වැඩ පිළිවෙළක් ආරම්භ නොකළ නිසා ඒ මුදල්වලින් රටට සේවයක් වුණේ නැහැ. මෙරට පෞද්ගලික ධනපතියන්ටත්, විදේශික ධනපතියන්ටත් තමුන්නාන්සේලා සහන දුන්න. විදේශික ධනපතීන්ගෙන් තමුන්නාන්සේලා ඉල්ලා සිටිය, මේ රටට ඇවිත් අපේ රටට මුදල් යොදා රට දියුණු කරන්ට කියා. ඒ දියුණුව ලැබුණේ නැහැ. ඒ නිසා තමයි, තමුන්නාන්සේලා 1953 මුදල් තත්ත්වය අමාරු වුණු අවස්ථාවේදීත් ධනපතීන් ආරක්ෂා කරගෙන දුප්පත් ජනතාවගෙ බඩට ගැහැව්වෙ; හාල් සේරුව සත 25 සිට 70 ට නැග්ගුවෙ. බඩ ගිනියි කිව්ව හින්ද ඒ අවස්ථාවේදි දුප්පත් ජනතාව 750 ක් විතර අපේ හිරගෙවල දැම්ම. දුප්පතුන්ගෙ කකුල් කැඩුව; අත් කැඩුව; අන්තිමේදි වෙඩි තැබුව. මේකයි, තමුන්නාන්සේලා අයවැය ලේඛන මගින් දැනට අවුරුදු 9 කට කලින් කළේ. එහෙම නම් අපි කොහොමද, මේ ගැන විශ්වාසය තබන්නෙ? ජනගහනය අඩු ඒ කාලයේ බැරි වුණා නම් අද කරන්නේ කොහොමද?

ඇත්ත වශයෙන්ම ජනගහනය වැඩි වුණත් රැකීරක්ෂා ප්‍රශ්නය විසඳීමටත්, රට සංවර්ධනය කිරීමටත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය 1956 න් පසු වැඩ පිළිවෙළක් ඉදිරිපත් කර තිබෙනව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව මගින් කර්මාන්ත සිය ගණනක් පටන් ගෙන තිබෙනව. ගමනාගමන ව්‍යාපාරය ජනසතු කර තිබෙනව. වරායවල් ජනසතු කර තිබෙනව. රක්ෂණ සංස්ථා එකක් පිහිටුවා තිබෙනව. ඇත්ත වශයෙන්ම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මංගල මුණසිංහ මයා.]

සාමාන්‍ය ජනතාවට ඔළුව උස්සාගෙන පාරේ යන්ට අවසථාවක් ලබා දුන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ රජයයි.

එක්සත් ජාතික පක්ෂය එන්නෙ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්ට යයි පසුගිය මැතිවරණ කාලයේදී කිව්ව. මගේ කථාව අවසන් කරන්ට ප්‍රථමයෙන් ඒ සම්බන්ධව එක කරුණක් කියන්ට ඕනෑ. සභාග රජය පත්‍ර ආණ්ඩුවට ගන්ට යන අවසථාවේදී අපට චෝදනා කළා, පත්‍ර ආණ්ඩුවට ගැනීම වැරදිය කියා. අපි බේරේගෙදර පත්‍ර විතරයි, ගන්ට අදහස් කළේ. අනික් පත්‍රවලට අත තියන්ට ගියේ නැහැ. අපේ අදහසව තිබුණේ පත්‍ර ඒකාධිකාරිය බිඳීම ටයි. ඒ කාලයේ ඔවුන් අපෙන් ඇහැව්වෙ: "මෙසේ නොකර ඇයි, අළුත් පත්‍රයක් පටන් ගන්න බැරි"? කියායි. අද අපි ඒක කර තිබෙනව. අද "ඇත්ත" සහ "ජනදින" පත්‍ර පටන් ගෙන තිබෙනව. ඇත් මේ පත්‍ර දෙක ලංකා ගමනාගමන මණ්ඩලයෙ බස්වලින් ගෙන යන්ට ඉඩ දෙන්නෙ නැහැ. ඒ කාලයේදී අපට චෝදනා කළා ඒකාධිපති ක්‍රමයක් අනුගමනය කරගෙන යනවාය කියා. නමුත් අපි එක පත්‍රයක්වත් ලංකා ගමනාගමන මණ්ඩලය මගින් ගෙන යාම නැවැත්තුවේ නැහැ. ඒ කාලයේ සියලුම පත්‍ර ලංකා ගමනාගමන මණ්ඩලය මගින් ගෙන ගියා. නමුත් අද අපේ පත්‍ර ලංකා ගමනාගමන මණ්ඩලය මගින් ගෙන යාම නවත්වා තිබෙනව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒවාගේම පත්‍රයක් ගෙනයන්න නම් ටෙලිෆෝන් එකක් වුවමනා කරනව. ඒ අනුව "ජනදින" පත්‍රයට ටෙලිෆෝන් එකක් දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා සිටියා. නමුත් දෙපාර්තමේන්තුවෙන් කියනව, "ලූප්ස්" නැති නිසා ටෙලිෆෝන් එකක් දෙන්නට බැරිය කියා. නමුත් අපි ඒක පිළිගන්නෙ නැහැ. ඊට පසුව අපි පත්‍රයේ වුවමනාවන් සඳහා ලංකා සමසමාජ පක්ෂයේ වෘත්තීය සමිතියේ ටෙලිෆෝන් එක පාවිච්චි කළා. ඊක කාලයක් ඒක පාවිච්චි කරන විට ආණ්ඩුව ඒක දැනගෙන අද ඒ ටෙලිෆෝනයත් කපා තිබෙනව. ඒකට හේතුවක් වශයෙන් කියනව රුපියල් තුන්දහසක මුදලක් දෙපාර්තමේන්තුවට අය වෙන්නට තිබෙනවාය කියා ඒක නිසයිලු ටෙලිෆෝන් එක කැපුවෙ. නමුත් අප ඒක පිළිගන්නෙ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තොන්ඩමන් මහත්මයාගේ වෘත්තීය සමිතිය, ලංකා කම්කරු සංගමයේ වෘත්තීය සමිතිය පාවිච්චි කරන ටෙලිෆෝන් එකක් තිබෙනවා. තොන්ඩමන් මහත්මයාගේ ඒ ටෙලිෆෝන් එකෙන් අයවිය යුතුව තිබෙන ණය මුදල ජූනි මාසය වන විට රුපියල් දොළොස්දාහයි. නමුත් ඒ ටෙලිෆෝන් එක කපා නැහැ. රුපියල් තුන් දහසක ණයක් තිබෙනවාය කියා අපේ ටෙලිෆෝන් එක නම් කපා දැම්මා. ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ ඕකද කියා මා ප්‍රශ්න කරනවා. මේක මහ පුදුම ප්‍රජාතන්ත්‍රවාදයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇමරිකාවේ ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ කුමක්ද කියා මා දන්නව. තමුන්නාන්සේත් දන්නවා, අපේ හම කලු නිසා ඇමරිකාවේදී තමුන්නාන්සේටයි මටයි එක බස් රථයක යන්න බැහැ. සුදු ඇමරිකන්කාරයොත් සමග අපිට ඇමරිකාවේදී එක බස් රථයක ගමන් කරන්න බැහැ. අපේ දරුවෙක් සුදු ඇමරිකානුන්ගේ පාඨශාලාවකට දමන්න බැහැ. සුදු ඇමරිකන්කාරයො යන හෝටල්වලට අපට යන්න බැහැ. ඕකද ප්‍රජාතන්ත්‍රවාදය කියන්නෙ? මීට වඩා දීර්ඝ වශයෙන් මා කථා කරන්නෙ නැහැ. මේ අයවැය ලේඛනයට අපේ බලවත් විරුද්ධත්වය ප්‍රකාශ කරමින් මගේ කථාව අවසාන කරනවා.

අ.භා. 3.8

**ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන**
*(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன)*
(The Hon. D. P R. Gunawardena)

Mr. Deputy Speaker, at the beginning I did not think of participating in this Debate, but as the Debate progressed I thought it was very unwise to remain silent; I had remained silent for nearly five long months, and it was necessary to express my ideas very clearly in support of the first Appropriation Bill of the National Government.

I wish to congratulate, the Hon. Minister of Finance on the skill and dexterity with which he surveyed the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

whole economic scene in Ceylon and placed before this House solutions to the present economic and social ills of this country.

I was a bit surprised at the sneering manner in which a very senior Member of the House spoke of the performance of the Hon. Minister of Finance. I refer to no less a person than my distinguished Friend, the hon. Member for Yatiyantota (Dr. N. M. Perera). Unfortunately, he is not in his seat at the moment. I wish he were here because I could then reply pointedly to some of the remarks he made, and give my answer to unwarranted statements that cannot be substantiated by facts. I wish my friend from Dompe were here— [*Interruption*].

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

He is here.

ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන
(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன)
(The Hon. D. P. R Gunawardena)

I am glad. My eyesight is a bit weak now, and I propose to wear my useful spectacles. I am very glad that the hon. Member for Dompe (Mr. F. R. Dias Bandaranaike) has come.

Before I deal with other matters I wish to deal with some of the remarks made by my honourable and good Friend, the hon. Member for Devinuwara (Mr. P. H. W. de Silva). He is a mild-mannered man, and I welcome his criticism. It was objective criticism, useful criticism, constructive criticism. The National Government welcomes criticism of that sort. Sir, I have certain weaknesses : I am very fond of children. I am very fond of my own children. Sometimes I get other children up and spend my time with them when I am away from my home. Sometimes even the distinction that a child is legitimate or illegitimate does not enter my mind. The hon. Member for Devinuwara asked me what the position of my Ministry or of the Government is with regard to the development plan of the Ceylon Fisheries Corporation. Before I deal with other matters I wish to comment on the remarks made by the hon. Member for Devinuwara and what he thought about this plan itself. As I said before, I am fond of children, but I do not like to claim others' children as my own. As a matter of fact the hon. Member for Devinuwara stated very clearly that this development plan of the Ceylon Fisheries Corporation was placed before the country a few weeks after the National Government assumed office.

The hon. Member for Devinuwara stated very specifically certain facts. He said :

"Firstly, this is a very ambitious plan drawn up without full and sufficient data and surveys which should be available before a comprehensive plan of this nature involving the investment of Rs. 1,500 million is undertaken by the Government involving an annual investment of over Rs. 75 million. I think certain aspects of this have to be reconsidered and revised."—[OFFICIAL REPORT, 20th August 1965 ; Vol. 61, c. 795-796].

He goes on to say :

"The Ceylon Fisheries Corporation, the framers of this report . . . ."

That is correct. It is true that two officers who worked with me when I was Minister of Agriculture and Lands—who did a certain amount of work in the Ministry of Agriculture and Lands—one as my Private Secretary and the other as the Deputy Director of Agriculture (Administration) had a considerable amount to do with the framing of this plan. I have not the slightest doubt about that. But that does not give me any right to claim that this is my plan or the Ministry plan or the plan of the National Government.

The hon. Member for Devinuwara went on to say :

"The Ceylon Fisheries Corporation, the framers of this report, was set up on 1st October 1964 . . . ."

Even as a corporation it is not very old.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන]

Some people want to come back in three months—is it? Why, Sir, it takes a fairly long time for a person to be born, I am told, and unless you have a miscarriage or some such thing it is not possible to have your own child in three months. I am told that the hon. Member for Yatiyantota saw the light of day in seven months. I do not know whether it was a Caesarean or a Segment operation. I am not a surgeon myself, so I do not know. However, I understand that he grew up wrapped in cotton wool. When the Coalition parties—the L. S. S. P., the Communist Party and the S. L. F. P.—speak of toppling this Government and coming back in three months, it is my humble submission that even with the experts of the L. S. S. P. you cannot produce what you want in three months.

The hon. Member for Devinuwara continues :

"The Ceylon Fisheries Corporation, the framers of this report, was set up on 1st October 1964, and they state :

'Since its establishment the Board of Directors of the Corporation has been engaged in drawing up a long-term plan for the development of Ceylon's fisheries . . . . The Board of Directors visited various fishing centres in the Island and discussed the problems of the industry with the fishermen. We now present a Plan for which we take responsibility, fully conscious of the magnitude of the task involved. We are confident that the Plan can be implemented."

Lower down the hon. Member quotes a further portion of the report :

"'At the end of the twelfth year the Corporation, the Government and the country would have an asset which is annually earning a profit of 184 million rupees . . . .'"—[OFFICIAL REPORT, 20th August, 1965 ; Vol. 61, c. 796].

I want to comment on some of these things. In the first place, this plan was ready and they were anxious to give publicity to it at that stage. I did not want to stand in the way because I thought it was a good thing to have some sort of a plan placed before the country for discussion when all its weaknesses could be examined.

This plan is only a plan—a very approximate one. The data available to the planners were very meagre ; with those meagre facts it is not desirable to work out a detailed plan, and this is only a tentative plan. The Government has not considered fully all the proposals in the fisheries plan yet. We propose to do so very soon ; but we are asking in this Budget that certain sums of money be given. The hon. Member for Devinuwara asked whether it is Rs. 93 million or Rs. 11 million less than Rs. 93 million. The Rs. 11 million represents the assets of the Fisheries Department taken over by the Fisheries Corporation. We have only made provision for Rs. 39 million this year, knowing as we do, that the corporation is just beginning to recruit its staff and that it cannot possibly spend Rs. 93 million. That is the position the hon. Member for Devinuwara (Mr. P. H. W. de Sillva) took. He congratulated the National Government on providing the largest amount of capital expenditure for fisheries. That is reproduced here. He says in the HANSARD.

"The monies that have been allocated include the amounts underspent in the previous year and there is not one new project in the field of industry contained in the Estimates presented by the Hon. Minister of Finance. The only new vote is for Rs. 39 million for fisheries development. And in respect of this Rs. 39 million there is a foot-note. I do not know Mr. Speaker, how they have arrived at that figure. Originally the estimated capital expenditure was to be Rs. 93 million, but according to the foot-note it says that of this amount Rs. 11 million represents the value of assets taken over from the Fisheries Department. The provision made in the Estimates for this year is Rs. 39 million . . . ."—[OFFICIAL REPORT, 20th August 1965 ; Vol. 61, cc. 793-4].

That is correct.

Sir, I do not want to enter at this stage into a controversy about the 11-ton boat and the 3½-ton boat. The hon. Member for Devinuwara is aware—I believe he was Minister of Industries and Fisheries at the time the first 3½-ton mechanized boat went out fishing—that I was myself a passenger on that boat and I went six miles out to sea. In 1958 there was a French Naval architect by the name of Claud Michaelgras who was responsible for this 3½-ton mechanical

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

boat. I know this nautical architect tried his best to ask the department to undertake the construction of this 3½-ton boat. He visited the Department of Fisheries a number of times. And, afterwards, I remember one evening he saw me and put up his arms—you know the way the Frenchmen normally do without any restraint—and said, "It is useless trying to get anything done from the Fisheries Department." Then he started building a boat himself. I used to see him stripped to his waist working as a carpenter assembling the different parts of the boat for building the really worthwhile boat, and it is that 3½-tonner that has increased the catch, as the hon. Member for Devinuwara said and today practically doubled the catch from about 30 to 35,000 tons to about 70,000 tons. We have no idea whatever of completely giving up the 3½-ton boat; I can give that assurance. The 3½-ton mechanized boat has increased the catch of fish in this country; in a very short period it has doubled the catch. But it is unable to deliver the goods fully and we have to experiment with other sizes, too. It may be a 11-tonner, 15-tonner, or 20-tonner, but we have to experiment. There is considerable difference of opinion even in the research section of the Fisheries Department. The situation became so bad that one of our best research assistants left; he is now teaching biology at the Vidyodaya University. There is always a difference of opinion between scientists. There is another scientist in the department who believes that Dr. Weerakoon's figures are not reliable, that the estimate of the potential catch of fish in this plan is not exaggerated, that the estimate is based on reliable facts and research. He is a research assistant who has worked for ten years. I have the papers with me but I have not the time to read them. During the Committee stage, if the hon. Member for Devinuwara is interested, he can get more information.

The present position with regard to this plan is that it is a "rolling" plan. In the light of the first year's experience we propose to revise the figures and various other proposals that you find mentioned here. We will add to our experience as we proceed, and the ten-year plan will go on. Our plans are approximate. Even the one-year plan of the hon. Member for Yatiyantota, when he was Minister of Finance, was approximate. We are not committed to everything in this plan. We are not committed to the shape and the size of the 11-ton boat. We have not given up our faith in the capacity of the 3½-tonner to bring a catch of fish. Hon. Members will have an opportunity of examining these proposals more fully during the Committee stage and I am sure the hon. Member for Devinuwara will help us in this matter. Of course, he found that it was possible to catch fish in Devinuwara which he failed to catch in Ambalangoda! We are prepared to acknowledge that fact.

Should I say anything about the marketing aspect? Normally, I do not interfere in the day to day working of a corporation. Unless I am satisfied that the work is not being done properly or that there is definite sabotage going on, I do not get the members of the board to the Ministry office and discuss with them the day to day affairs of a corporation. I normally leave such matters to them. But, if anything goes wrong, I get them to the Ministry office, discuss with them, and tell them where they have gone wrong and what the view of the Ministry is. If they have blundered with regard to marketing in the manner that some hon. Members of the Opposition claim, I can assure you that the Ministry will go into it fully and see that the errors are corrected.

I did not know, until I came here, even the names of the people who were acting as agents for the sale of fish at St. John's market. A long list was given. The hon. Member read it. You find it at column 802 Volume 61 of HANSARD—M. M. Samsudeen & Brothers, E. A. Algama, H. Somaratna and others. The hon. Third Member for Colombo

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඩී. ඊ. ආර්. ගුණවර්ධන]

Central (Mr. Pieter Keuneman)—he too is not in his seat—queried why Davith Singho has not been included. All I can say is that Davith Singho and Appu Singho, his brother, were asked to come in, but they have not come. I do not know why, I will find out.

We were trying our best to get the co-operation of the private sector in this matter. We know that the producer does not get an adequate price at the producing end; we know that the consumer finds it extremely difficult to buy fish at a price within his reach. So, we wanted to re-form, to some extent, the marketing structure in order to make fish cheaper to the consumer and in order to help the producer to get a better price than he is getting at present. That is all we attempted to do. The coming months will show whether we are succeeding or not. If there are any errors in our marketing scheme, well, they will be subjected to correction, and everything will be done to gain the main objective, that is, the consumer gets fish at a price at which he can buy and the producer gets a fair price for his labour. The middleman who now gets the major portion of the profit must be either satisfied with much less than what he is getting now, or, if the consumer insists and the producer insists that a fairer deal is necessary, we may have to eliminate the fish "*mudalalis*" in the interests of the producer as well as the consumer. I do not want to say anything more than that about the Fisheries Plan.

Now, a word about the industries. I am sorry the hon. Member for Medawachchiya (Mr. Maithripala Senanayeke), who was the Minister of Industries for a very long period after my hon. Friend, the Member for Devinuwara, left that office, is not here. Normally, I do not like to say hard things about people when they are not present, and I propose to take another opportunity when he is present to indulge in criticism of that nature. But, I want to make a few observations in general.

So much has been said about the industrial development in the last few years. The hon. Member for Yatiyantota, when he was the Minister of Finance, said that most of the industries were "*seeni bola*" industries. It is a very apt description. Many of the defects in regard to industrial development are the result of the absence of a proper industrial development plan. We have some sort of a fisheries plan, but there is no industrial plan of any nature except, of course, the Ten-Year Programme to which, I think, the hon. Member for Devinuwara as well as myself contributed. We placed an agricultural plan before the country in 1958, and a few months later, the Ten-Year Programme. But, Sir, no one has attempted to implement the Ten-Year Plan; they have picked up bits from it. It contains very valuable information for the development of agriculture, industries, fisheries and various other enterprises of the country. The hon. Member for Dompe (Mr. F. R. Dias Bandaranaike) placed before the country a plan called the Three-Year Plan or the Short Term Implementation Programme, but when we study the achievements, we find that the targets have not been reached; in some instances, even a commencement has not been made. So, in the absence of an industrial plan, the development of industries in this country has been lop-sided and wasteful.

Many of the defects in regard to industrialization of the country are the result of the absence of a proper industrial development plan. As a result, the industries that have been set up both in the private and public sectors have not been decided upon on the basis of proper evaluation of economic criteria or a scale of priorities. In this connection reference may be made to the following remarks in the book "Short Term Implementation Programme" issued by the Department of National Planning in 1962:—

"The particular circumstances of our economy require priority to be given to certain types of investments that would

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

increase production, show profits, provide employment, and/or save foreign exchange faster than others. An *ad hoc* approach could result in the selection of industries that are poor candidates for investment as judged by these and other criteria. A wrong selection may impose a burden on the economy, saddle it with unremunerative projects and deprive it of the benefits of other more desirable investments which are elbowed out ".

The capital which might have gone into an industry with low priority could have been more profitably spent on a more important industry which has a very great chance of success.

Viewed in the light of these comments, the question arises whether it was in the over-all interest of the country to embark, at this stage, on certain of the industries that have been set up in both the private and public sectors. The following further quotation from the Short Term Implementation Programme is relevant in this connection :

"Delay in making investments in by-products in Sugar and Chemicals shows an imperfect handling of priorities. By-products utilization leads to better capital output ratios than investment in the production of unrelated goods. There is also a range of industries which can be based on fish, cosmetic, fruits and glass sands. The return on capital and the saving of foreign exchange would possibly be greater in these cases than, say, in Iron and Steel and probably Flour ".

Apart from the industries set up in the public sector which, as indicated above, do not appear to have been determined on the basis of proper economic criteria, the lack of an industrial plan has resulted in a lop-sided development of industries in the private sector where industries which should normally take low priority have been fostered at the expense of more important industries. Neither the Ministry of Industries nor the Development Division appears in the past to have attempted to guide or control industrialization in the private sector on a properly planned basis.

It is true that there is a booklet known as the Investors' Guide. It does not guide anybody anywhere ; it does not give any information that is worthwhile. It was primarily an analysis of the imports into the country which, on the basis of such analysis, attempted to indicate that industries could be profitably set up by way of import substitution. No attempt was made either to assess the scale of priorities or to see that industrial development was on an integrated basis in order to ensure, among other things, that there were no shortages, on the one hand, or over capacity, on the other. Far from giving accommodation, the position appears to have been that the initiative in regard to the setting up of industries had to come from the private industrialists themselves. Industrialists were expected to select the industries they wished to set up and make an application to a committee known as the Industrial Acceptance Committee, which then considered these applications and decided which of them should be sanctioned. As far as has been possible to ascertain, the main criteria adopted by this committee in regard to particular industries were the extent of import substitution, the possible foreign exchange savings, and the employment potential. It is clear that in these circumstances no proper development of industry that would bring the greatest benefit to the country in the shortest possible time was possible and, furthermore, this state of affairs would inevitably lead to these defects, some of which may be summarized as follows : Excessive development of industries which should have received low priorities, for example, the confectionery industry. The chocolate industry is the most significant of all. Then there are razor blades, and wire nails.

The demand today is expected to be between 5,600 and 6,000 hundred weight in the chocolate industry a year. Since the demand is mainly from the younger age groups whose numbers are increasing rapidly, an increase in the demand of chocolates can be expected. But even with this widening market, it is impossible to get the presently installed machines

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන ]

working even at a reasonably high peak. According to the estimates made during the course of the survey, the present factories working one shift can make well over 30,000 hundred weight of chocolates. It is highly doubtful whether we will consume this amount of chocolate even at the end of the century. This situation, of course, has arisen due to the utterly unplanned policy of approving industries, and it is today leading to the extinction of small units in this industry. Three or four of these small units were the first to start production and in the case of some of them they showed great entrepreneur skill making use of discarded and scrap machinery.

Then, Sir, the position with regard to the razor blades industry is much worse. Installed capacity in this industry is extremely high. In fact, it is claimed that one of the firms could easily meet the entire demand of the Island. That is, if one factory goes into production, it can meet the entire demand of the island. A chaotic situation has thus arisen in the industry where all three are working well below capacity and their factories are closed for the greater part of the year. The installed capacity of one year is about 40 million dozens. Since domestic consumption is 5 million dozens a year, the machines are idle for long periods of time with the result that the depreciation of machinery is very high. Approval for all three firms was given at about the same time, July 1961. In fact, two firms were given approval on the same day. But no attempt seems to have been made to see that the installed capacity was keeping with domestic demand. And you know, Sir, if you try to shave with one of these, you have to go to a doctor for first aid treatment.

First of all, I think, we may have to impose some standards on the manufacturers of some of these products. I do not want to speak about the match industry. Except for one or two units, the other units in the industry, with the help they received by means of the quotas and banderole, have not been able to produce a match which fires.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

Strikes.

ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන
(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன)
(The Hon. D. P. R. Gunawardena)

Yes, strikes. I am not speaking of other matches or match-makers like some old gentleman who was found a seat in the board of directors of a corporation.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

Oils and Fats Corporation.

ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන
(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன)
(The Hon. D. P. R. Gunawardena)

Chocolate industry—There are nine producers in this industry which is a classic example of an industry which has been allowed to develop without any plan. Although chocolate manufacture has had a long history in Ceylon, all attempts, prior to import control of the sixties, were failures due to foreign confectionery. It was only with the granting of protection that they are growing to be an industry which could supply the entire domestic requirements.

Thus, it is time that the planning authorities intervened at least to minimize the full-scale effects of this impending collapes. One way out is to compel them to produce some only for the export market. Chocolate is an industry that can find an export market and our products compare very favourably even with English and Swiss products. It has mechanized production to the extent where it can produce chocolates at a lower price than other firms in this industry. Also it has the financial backing which is necessary for its promotion.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Razor blades—There are three firms in production in this industry, the first firm having started production in December 1962. The imports in 1962 were abnormally high due to stocking up prior to controls which came with the beginning of domestic production. The demand today for a quality blade is estimated to be between 3½ and 4 million dozens. But since the quality of the local blade is not up to the imported one, the demand is little higher than this figure because you cannot shave more than once or twice.

Domestic production of blades in 1963 was 879,677 dozens, imports in 1963 were 208,332 dozens, the apparent consumption being thus 1,088,009 dozens. This low figure is due to the presence of large left-over stocks of imports.

Installed capacity in this industry is extremely high. In fact, it is the claim of one of the firms that they could easily meet the annual demand of the entire Island in a few weeks. The situation has thus arisen in this industry where all three firms are competing. But some of the other things are equally interesting.

Wire nails—There are 12 approved firms in this industry. The first firm started production in 1964. There are now 11 firms in production in this industry while one more is expected to come into production by the end of this year. The total output for 1960-63 was about 75,000 cwt. The general complaint is that there is tremendous excess capacity in this industry. Though most of the firms work well below capacity they were yet able to sell only 85 per cent. of the output. The total installed capacity in the industry today, working only one shift, is 150,000 cwt. Even in 1961 the installed capacity of the industry was sufficient to meet the demand of the country for the next decade. But yet approval was given to three or four firms with the result that two to three lakhs of rupees foreign exchange was wasted in importing unnecessary machinery which might have gone into some other industry. Although the demand for wire nails is expanding rapidly it may have been better for three or four firms to specialize in production. Today, with eleven to twelve firms, it is difficult for a central planning body to have some control over the industry and to allocate raw material and exchange, until consumption improves.

It is the same story when you examine some of the other industries. We are very grateful to the University of Ceylon for the survey conducted to find out the position of some of these small industries in the country. From that point of view it is a very valuable report.

In regard to refrigerators the story is the same, and also in regard to air conditioners. Fortunately, no one has started producing air conditioners. Of the four approved firms only the third, namely, Walkers Limited, is producing the genuine product.

The position is the same with regard to accumulators for motor vehicles. There are six approved firms in this industry. Four of them are doing nothing more than assembling imported components; the remaining two firms have made heavy capital investments and are attempting to manufacture as many components as possible.

There are two firms in the electric bulb industry, one having started production in November 1961, while the second is expected to start by the middle of 1965.

The position with regard to dry cell batteries is similar to that of the electric bulb industry. Nearly Rs. 6 lakhs worth of machinery was imported and the first firm started production in 1959.

There are five approved firms for the manufacture of electric fans, of which none had started production at the time of the survey. I believe one firm has started during the last few months.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන]

I do not want to tire you with figures of this type, but just to give an idea of this so-called industrialization that has taken place I want to give you the gist of a survey conducted by the professor and the students of the University of Ceylon.

This is excessive development of industries which should have received no priority. There is considerable over-capacity in some industries, like confectionery, biscuits, footwear, plastic products, and so on. There is inadequate capacity in some industries leading to shortages and bottlenecks—production of cans and bottles—and in the packaging industry generally there is a bottleneck. There is inadequate attention given to industries that could utilize local raw material. Inadequate attention has been paid to the utilization of by-products of existing industries. Paranthan Chemicals in the public sector is one of the most glaring examples where the chlorine not only goes to waste but destroys that whole area. They are using only a portion of the caustic soda. That is the position.

We propose to set up within a few weeks—I have spoken to the people who will man these—a Bureau of Standards and an Industrial Advisory Council where representatives of the private sector as well as those of the public sector will advise the Ministry with regard to the industrial development. We also propose to set up, in co-operation with the Ministry of Trade and Commerce, an Export Council so that excess productive capacity will be utilized to the best advantage of the country by the export of some of our products and by offering incentives for export, just as India is doing today.

Now, let me say a word or two about the public sector. I like to speak about the activities of the Small Industries Corporation where we have tried our best, by having units in the public sector, to make an impact on prices of tiles, particularly tiles used for buildings. A number of factories have been set up, one at Bangadeniya, one at Yatiyana, one at Weuda and another at Anuradhapura, and construction is proceeding at Mullaitivu.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

At Mahiyangana ?

ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන
(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன)
(The Hon. D. P. R. Gunawardena)

The factory at Mahiyangana was put up by the Land Development Department and not by the Industries Department through the Small Industries Corporation.

In the first place, most of these factories have been sited in these places not because economic factors favoured them, but due largely to pressures from various sources.

A factory at Bangadeniya was set up. After it was set up the Department of Industries and the Small Industries Corporation found that the clay available on the spot was not suitable.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

Shame !

ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන
(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன)
(The Hon. D. P. R. Gunawardena)

Mr. Speaker, clay has to be transported from Kochchikade to the factory to mix with the clay found at Bangadeniya in order to get a mixture suitable for a tile which will be able to stand the wear and tear of the elements.

I visited the factory at Bangadeniya and I found a huge pile of discarded tiles behind the factory. Rejections are too high for a factory to work at a profit. Today, the factory at Bangadeniya works on clay transported from Kochchikade by lorry and that clay is used to bring the mixture up to a standard which can produce a good tile.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

It is the same at Yatiyana or even worse because you have to transport ten per cent. of the clay from Anuradhapura to Yatiyana. You will not believe me when I say this, but it is the truth that ten per cent. of the clay is brought from Anuradhapura to bring up the standard of the clay from the deposits at Yatiyana. Anuradhapura is the worst place from which you can get clay because you get in the clay a mixture of lime which makes it almost impossible to produce a good tile.

I do not know what the position at Mullaitivu will be, but, fortunately, the siting at Weuda is very good because there are ample deposits of good clay.

ඩී. බී. වෙලගෙදර මයා. (ජනසතු සේවා ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)

(திரு. டி. பி. வெலகெதர—தேசிய மய சேவை அமைச்சரின் பாராளுமன்றக் காரிய தரிசி)

(Mr. D. B. Welagedera—Parliamentary Secretary to the Minister of Nationalized Services)

Five miles off Weuda.

ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන

(கௌரவ டி. பி. ஆர். குணவர்தன)

(The Hon. D. P. R. Gunawardena)

In respect of Weuda, the siting was done on the advice of the Geological Survey Office ; but when the siting of the other factories was done, the Geological Department was not consulted, nor were the earlier reports submitted by the department considered as to the existence of unsatisfactory clay deposits in these places. There is no disagreement between the C. I. S. I. R. experts and the experts of the Geological Department, but this is the way that things were done.

The National Government does not propose to permit this sort of waste of public money.

ගරු මන්ත්‍රීවරු

(கௌரவ அங்கத்தினர்கள்)

(Hon. Members)

Hear ! hear !

ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන

(கௌரவ டி. பி. ஆர். குணவர்தன)

(The Hon. D. P. R. Gunawardena)

As Minister of Industries and Fisheries in the National Government, I can assure this House that I will go into these matters and see that the officers do their work and that we follow the advice of the technical experts.

ගරු මන්ත්‍රීවරු

(கௌரவ அங்கத்தினர்கள்)

(Hon. Members)

Hear ! hear !

ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන

(கௌரவ டி. பி. ஆர். குணவர்தன)

(The Hon. D. P. R. Gunawardena)

We will follow those experts whose advice can be depended on.

I do not wish to go into other aspects of industries. You know what the position today is in respect of the cement industry. The clinker grinding plant was put up at Galle largely under pressure from the hon. Member for Akuressa (Dr. S. A. Wickremasinghe). It is virtually complete but it is a problem to get down clinker from Kankesanturai. We thought we might import clinker from Japan and produce cement here and make a profit of Rs. 10 on a ton ; but harbour facilities at Galle have not been completed even for that purpose.

We had discussions the other day with the General Manager of Railways, Mr. Rampala, and we asked him to bring down the clinker somehow to Galle even at a loss. He said, "I am prepared but I have no wagons and locomotives. Two years ago I insisted that orders be placed for wagons and locomotives."

But your Coalition Government, your S. L. F. P. Government, your Sirima Bandaranaike Government, which know nothing about industries, and your Minister of Industries, who knows less, did not take the trouble to place the orders. If you do not



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන]

have the necessary harbour facilities, at least the railway should be given the necessary facilities by the provision of wagons and locomotives.

Plants have been put up and completed, but they are remaining idle because Sirima Bandaranaike, as Prime Minister, failed miserably to co-ordinate the work of the various ministries and we are today in this mess as a result. And she talks of coming back as Prime Minister in three years. She talks of toppling the Government.

One thing more, because my hon. Friend the Member for Dompe (Mr. F. R. Dias Bandaranaike) is here and I should reply to him.

ගරු මන්ත්‍රීවරයෙක්

(கௌரவ அங்கத்தவர் ஒருவர்)

(An hon. Member)

Pugoda !

ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන

(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன)

(The Hon. D. P. R. Gunawardena)

Pugoda—yes ! I have more interests at Pugoda than the hon. Member for Dompe. I have more relatives there ; I have more friends there ; and I have more people known to me there than the hon. Member for Dompe. I do not think a person who spends his time in the ivory towers of Mahanuga Gardens knows those villagers as much as I do.

I have decided to shift the textile factory from Pugoda for very valid reasons—economic reasons. You do not put up factories just to please a Minister or a Member. You put up a factory to see that it is run economically, that it brings money to the country and gives employment to people properly. As a matter of fact, in 1962 or 1963 I commented on this matter in this very House from that seat which the hon. Member for Devinuwara (Mr. P. H. W. de Silva) is now occupying. I stated that transport facilities were not available, that the mill area was subject to floods, that it was too far from the main railway line, and that, so far as I was aware, Pugoda did not grow any cotton. All these things must be considered carefully before you site a factory if you want to make it a success. I would like to have a factory at Pugoda if it were possible. It is very close to Avissawella and people have only to cross the river for work or to buy textiles.

I will read to the hon. Member for Dompe these facts :

"Land : approximately 58 acres of coconut land and 5 acres of paddy land were acquired for the textile mill at a cost of approximately Rs. 1,750 per acre. In addition, 26 acres of land were acquired for the housing site for which no compensation has yet been paid. The land acquired for the mill site has been levelled and turfed at a cost of approximately Rs. 385,000. Since then, two stores have been constructed by the Engineering Corporation to accommodate the construction materials supplied by the Chinese Government. The cost of these two stores is estimated to be Rs. 20,000.

Roadways : The Colombo-Pugoda road *via* Malwana is, according to the Director of Irrigation, submerged at various points and, in particular, between the sixth and seventh mile to a depth of about eight feet during a minor flood and up to twenty feet during a major flood of the Kelani-ganga which flows parallel to this road. The Colombo-Pugoda road *via* Delgoda is also reported to be submerged at various points during both minor and major floods, but to a lesser extent. It had therefore been decided to construct the Mandawela road linking the mill with the Kandy road to ensure uninterrupted flow of traffic during the period of the floods. This road has been partly constructed and it is understood from the Executive Engineer, Colombo North, that the delay in completion is due to the fact that the sanction of the Director of Public Works has not yet been received for the construction of the culverts along this road. The approximate cost of the construction of this road is Rs. 300,000. It may be relevant to point out here that whilst this road will solve the problem of transport during both minor and major floods, it will only serve the workers living in the vicinity. The workers living in other areas are bound to be affected not merely by flooded out roads but also by heavy rains which prevail

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

during the year. The incidence of absenteeism at this mill is therefore bound to be high."

At Veyangoda absenteeism is as high as 35 per cent; here it will be over 50 per cent. That is not all. So we cannot possibly have a mill there. It must be sited in a place close to consuming centres, close to places where you can get your cotton supplies at the lowest cost; and road and rail transport must be available to a mill of this size.

So the Government will come to a decision not because we do not want the hon. Member for Dompe to have a mill at Pugoda, but because the country cannot have mills of this type sited in places where all the factors will work against their success. We are interested in economic development. We want efficient units. That is the position.

About other matters I do not want to speak. We propose—at present steps have been taken already—to establish an economic planning unit in the Ministry to work in co-operation with the planning secretariat. Some officers have already been appointed. I propose to complete that work within a short time. It will be a planning unit which will take in the public sector as well as the private sector, where there will be representatives of both sectors.

I got up to speak because I thought I ought to reply to the questions put to me by the Member for Devinuwara, because his criticism was constructive, was based on facts; it is not the wild criticism that the Member for Yatiyantota indulges in today. He gets away sometimes with all sorts of statements, but when I get back to the Ministry and check some of the figures I find that he just rattles off figures without any basis. The hon. Member for Yatiyantota must realize that the days when young students listened to the professor are gone. There are young students who have studied and are working in the Ministries as well as in the corporations who can teach him a lesson or two in economics. It is a pity that he took to politics; I am responsible for it. He should have gone to the University and remained a lecturer. Then nobody would have criticized him because no student criticizes a lecturer or professor; he just listens.

The administration is a little more difficult than lecturing at universities. You have to translate your words into action. You have to follow up and see that things are done, that results are obtained; and that is one thing which the hon. Member for Yatiyantota and that whole breed of men in the Lanka Sama Samaja Party have not learned up to date. They can get on to platforms and go on talking for hours, but when they are entrusted with administering something they fail miserably. Whether it is my old friend, Dr. Colvin R. de Silva, who is not here, or the hon. Member for Yatiyantota, or the expert from Akuressa (Dr. S. A. Wickremasinghe) or the hon. Third Member for Colombo Central (Mr. Keuneman) who indulges in long theoretical dissertations, I wonder what their performance will be when they are entrusted with administrative work. We had their experience for seven months! At the end of it the country was facing a very grave crisis.

It was quite clear that the S.L.F.P. had failed miserably to solve any of the problems. They thought that with the support of the L. S. S. P. and the C. P. they would be in a better position. But, instead of trying to solve the problems, they started to do something else. Fortunately, at the elections the country rejected them—the corrupt, inefficient leadership of the Coalition Government. These men, who for thirty years studied economics and talked of socialism could not find a leader in their midst;

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන]

they had to go and get an old, feudal lady, politically illiterate—I repeat that even today, a politically illiterate lady—and chose her as their leader. During the four and a half years or so that she was Prime Minister, the hon. Member for Dompe (Mr. F. R. Dias Bandaranaike) went round the country trying to make the people believe that she was a genius, that she could solve everything, perhaps with a magic wand or saree. As a matter of fact most people thought, and she herself began to believe, that she was an international leader. Socialist studies! Socialist front! Socialist ties! However, there is a limit to credulity, there is a limit to deception. What happened to these men of thirty years' experience? They could not find a leader. What has really happened to them? They had to choose as their leader of the socialist front a somewhat heavy-footed Kandyan dancer, trained in the halls of Horagolla by a maestro in acrobatics. People began to believe that she was a political leader. I sympathize with my hon. Friend, the Member for Katugampola (Mr. Subasinghe). What has happened to him? You feel dazed when you look at him. Look at them after 30 years. What has happened?

No, Sir. I think the National Government has placed before the country proposals—I do not want to go into them—which will relieve all sections of the people, which will give an impetus to industrial development in this country, in the public sector as well as in the private sector. The Hon. Minister of State made it quite clear that this is a mixed economy. In October 1960, or so—when I spoke the hon. Member for Devinuwara (Mr. P. H. W. de Silva) was not here then—this was what I said in this House—Official Report, 11th October, 1960; Volume 40 column 819:

"Mixed economies occupy an important place in the modern world. Sweden is a well-known example. Swedish national government owns and operates the post offices and railways. Swedish cities and towns own and operate local utilities, such as power and light. These are forms of public property. Swedish trade unions and co-operatives own their meeting places and stores. This is collective property. Families own their homes and their farms, with the wide variety of domestic capital goods needed to equip households, family workshops and family operated farms. This is private property."

In this country too, we have public property, collective property owned by the co-operatives and private property. But it is necessary to see that the economy expands. So far as I am concerned, it does not matter if a few people make money in the process as long as the economy expands. My Friends talk of socialism. Socialism today means that you have to deliver the goods, and services. The people are not going to live on your words. You must produce goods at a price the people can buy and provide services like transport, electricity and various other things. I think the National Government, in its Budget, has proposed measures for doing that.

As I said earlier, I do not want to make a long speech. Had some of the Members who are not here been present, I might have made a long speech, but normally I do not like to criticize Members when they are not in their seats. I wish the then Minister of Industries were here; I wish the hon. Member for Yatiyantota were here. I wish the hon. Third Member for Colombo Central were here. Had they been here, I would have gone into a more detailed criticism of some of their speeches.

අ. භා. 4.25

**පී. එම්. කේ. තෙන්නකෝන් මයා. (මිහින්තලේ)**

*(திரு. பீ. எம். கே. தென்னகூன்—மிஹிந்தலே)*

(Mr. P. M. K. Tennekoon—Mihintale)

රට ජාතිය සමය තෙරුවනට බැතී බර
වින පමුණු වන නායකයිනට හැම වර
දුන්තෙමි පහර දෙන්නට අදද හිත කර
ගරු උප කථානායක තුමෙනි අව සර

පාලන බලය ලැබගත් පිරිස මගෙ රට
මුළු ජනතාව දන වාදයට ගැතී කොට
අය වැය දෙසුම වැඩකට නොමැති දුටු විට
නිහඬව සිටින්නට පුළුවන් ද බැහැ මට

රජරට හැම තැනම හැම වැලිකැටය කම
තවරා සිහලුලේ ඔවුනගෙ ජනිත බිම
ජාතිය මෙනෙක් රැක ගෙන සිටි සදහ ටම
මියගිය සිහළුනට ගරු සරු කරමි මම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඔවුනගෙ ලෙයින් පැවතෙන දන පතින් ඇලේ
පැවලෙන්නෝ නොවෙති නිවටව දෙමින් බලේ
මගෙ ආසනය මා ඉපදුන මිහිත් තලේ
හැම හෙළයෙකුම ජාතික කැක්කුමෙන් වෙලේ

වනිකානුවෙන් එන බලතල තුරන් කොට
සෝදා දමා මිසදිටු ගන දුරෙන් රට
අනුබුදු මිහිඳු මාහිමියන් වහන් සෙට
මම වැඳ වැටෙන්නෙමි මගෙ රට රැකෙන් නට

අය වැය කතාවේ
පවතින දුබල තාවේ
ගැනුන් කතාවේ
වන්නි පෙදෙසෙන් මේ ව තාවේ

ඔපය පිට පැත්තේ
ඇතුලත කිසින් නැත්තේ
අය වැයෙහි තත්තේ
බයානක අන්දමිනි ඇත්තේ

කරන්නට මේ පික
වෛර දැරූ දිගු කා ලෙක
වැඩ අමැඩ දා යක
රජය රට කැවා පජා තික

රකින්නට දන පතී
හැදුව අය වැය ලුණු නැතී
හොඳ් දකට සම වෙතී
රටේ දනපති හොඳට කතී

අහිංසක යන්ගේ
බඩ පණුවන් මැ රෙන්නේ
රට කන එ වුන්ගේ
අයිතියයි රජයත් ර කින්නේ

අය බදු කපා දනපතීනගෙ ඉහල පෙල
රැකගනු පිණිස ඔවුනට දී නොයෙක බල
තරමක සිනා මතුවූවද මුහුණු වල
මේ අය වැයයි මගෙ ජාතික විපතෙ මුල

බුදල් බද්ද හිටි හැටියෙම ඉවන හලේ
යහපත පිණිසමය දනපති කපටි රැලේ
මින් කලකට ඉහත ඩී. ඇස්. සිටින වෙලේ
කළ අය වැයයි මේවර හත් හවුල කලේ

රජයේ පිරිස මෙපමන කල් මැන දෙඩුව
අල රතු ලූණු වැනි හැම්ගෙන පොදු බඩුව
සතයයි රාත්තලකින් අඩුකළ අඩුව
මහජනතාව විසඳති මේ අව නාඩුව

ඒවා පමණක් ද මෙහි මිනිසුන් කන්නේ
රෙදියාරෙකින් සත දහයලු අඩු වන්නේ
මේවා පැලස්තර දනපති මිනි සුන්නේ
අසරණ දුප්පතා මියයයි බඩ ගින්නේ

සතුටුයි බුම්තෙල් තරමක අඩුව තීසා
නවමත් සිනි ඒ මිළටම කිරනු අසා
ඇලවූ පැලැස්තර ගැලවී සිදුර වසා
හොර හත්හවුල ලැබගනු ඇත අහුබ දසා

දනපති අලින්ගේ බදුබර ඉවන යවා
හුරා කන්න ඔවුනට අනුබලය දෙවා
පිළියෙල කරන ලද මේ අය වැයට පවා
දෙස්දෙති වන්නියේ ජනයා උදය හවා

වන්නියෙ උපන් ඇමතිඳු නායක වන්නී
ගොවිජනතාවගේ ඇසුරෙන් පිට පැන්නී
රටකැ උදව්යෙග බලයට බය ගැන්නී
දනපතියනට සිය සහයෝගය දුන්නී

හොර වැසි උවදුරෙන් මගෙ රට යට වෙන්ට
යන හැටි පෙනි පෙනි ඇහැ පියවා ඉන්ට
පුළුවන් වුණත් හත් හවුලේ මිනි සුන්ට
සිංහල ලේ තිබෙනතුරු බැහැ ඉඩ දෙන්ට

ඇටකටු හෙලබිමෙහි පොලොවට කළ පෝර
සටනෙදි මළක් හුරු කගපත අත නැර
අපගේ මුතුන් මිත්තන්ගේ අව තාර
ඇත මගෙ රටේ ඔවුනට දෙමු රට බාර

මහ වැව් තනා දාගැබ් අහසට බැන්දේ
පෙති පෙති ගසා සතුරන් ජයසිරි වින්දේ
සිංහල රටට හොර වැසියන් ගෙන් චස්දේ
රජයට සුළු උනා ලොකු වී ඇත වන්දේ

උතුරට—නැගෙනහිරටත් මේ ඇමැතී වරු
සිමා වෙලා ඇත මුලසුන මැතිඳ ගරු
මින් පසු මේ රටේ හෙලයන් සිටින තුරු
ඔවුනට යලිත් බලයක් ලැබ ගැනුම බොරු

දමිළුන් රකින්නට සිංහල පනත මරා
ජාතික රජය වෙහෙසෙනවා රටට හොරා
පියවර නගනවා මිස පෝරකය කරා
අපි ඉඩ නොදෙමු ජීවත් වී සිටින තුරා

උතුරෙයි—නැගෙනහිර හැම තැනම හෙළ බස
ඉවනට දමා ඔසවා දෙමළ බස ගිස
කටයුතු කරනු සැලවූදාට දස දෙස
ඉවරයි හත් හවුලේ මැති ඇමති එළි බැස

අරලිය ගහ ගෙදර සදහට තිබෙන ලෙස
බුදු පිළිමය සදා සවිකළ වෙසඟ මස
නැහැ අද ගැටෙන්නට පොදු මිනිසුනගෙ ඇස
කෝ ? එය නගන්නෙමි මම අග මැතිට දොස

එය ලොකුකතෝලික කෙනකුට ගැවුන පසු
උප දෙස් අගමැතිට දී මෙන් පිරිස් සෙසු
ගැළ වූ බවත් පසුගිය දිනවල දී ඇසූ
පුවතක් කෙනෙකු කීවා ඒ මැදුරේ විසූ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. එම්. කේ. තෙන්නකෝන් මයා.]

දින හතරක්ම මසකට මේ අය පෝයේ
දෙන බව නිවාඩුව මැතිවරනෙදි කීයේ
කල් දමනවා කොමිෂන් තබ තබ ආයේ
හඩ මාරුවෙන හැටි හත් හවුලේ ගියේ

ගුරුවරු සියල්ලෝ ශ්‍රී. ඇන්. පියට ඇලී
කටයුතු නොකල හින්දා නව රජය යලී
නින්දිත නිවට කැත විදියට ගනිතී පලී
ඉවරයි ලබන මහ මැති වරණයෙදි අලී

රටේ ජනතාව මැතිවරණෙදි පන්නා
දැමූ අය රජය මේ ලඟදී ගෙන්නා
ඔවුනට යලිත් ලොකු ලොකු තැන් බදු දුන්නා
කොහේ ගියත් රට කනවා රට කන්නා

ශ්‍රී. ඇන්. පියට ගැති කම්කල තරු ණන්නේ
එක අසුනකින් සියයක් නම් ගම් ගන්නේ
ඔවුනට අද හෙටම රැකියා සැප යෙන්නේ
මේ පුවත වන්නි පෙදෙසේ නොවැ රැව්
දෙන්නේ

රජරට අපට පිරිමහ ගන්නට වේල
රජයෙන් බෙදන්නේ කැකුලෙන් කුඩු හාල
එනිසා පිරී ඇත අද ඉස්පිරි තාල
ඇයි, හත් හවුලෙ වැඩ මේ තරමට බාල ?

මහ වැලි නදිය හරවා රජ රටට දමා
ගොවිතැන් දියුනුවට ජලයෙන් එබ්ම තෙමා
දෙන්නෙමි කිවද ගරු. සී. පී. ඇමති තුමා
තවමත් ගලන්නේ ගඟ මුහුදටම තමා

නියඟින් තැවෙන පිරිසට මගෙ අසුන තුලේ
සැපයු සහන වැඩ දැක උණු කඳුළු ගැලේ
මේ කැත වැඩකි මේ ජාතික රජය කලේ
යොදවනු මැන කථානායක මැතිඳ මොලේ

කැත්තට උදැල්ලට හොඳ හැටි සුරත හුරු
පස් කැපු තරුනෙකුට එඩිතර ගතිය දැරු
දිනකට එකයි සත හතලිහ ලැබෙන තුරු
දහදුක් විඳිති රැකියා දුන් අයුරු මරු

කොළුවෙකු සත අනූවයි ගැහැණියක හට
දෙයි රුපියලක් මුළු දවසම කුලිය කොට
මේ අපරාධ දැක ඉවසිය නොහැක මට
ගිනිබත් කල යුතුය ජාතික රජය හෙට

දහයක් වුවත් මේ පවුලක එක ගොන්නේ
රුපියල් තිහක වැඩ මාසයකට දෙන්නේ
එහෙයින් අපේ ගැමි දරුවන් බඩ ගින්නේ
හත් හවුලේ අයට නැහැ මෙය වැට හෙන්නේ

අක්කර දහස් ගණනින් දන පතින් හට
බදු දෙන නමුදු ජීවන මිල බහින් නට
ගොවි ජනයා විගා කළ දිවි රැකෙන් නට
ඉඩමට ඔප්පු නැහැ—ඕනෑ අහන් නට

ඉස්තීර වහලවල් හැම ගෙයකටම තනා
දෙන බව කී නමුදු මැතිවරණයෙදී වෙනා
කෝ එම පොරොන්දුව අද අසති බොහෝ දෙනා
හත් හවුලේ කෙබර මුළු රටට එලි උනා

දහදුක් විඳින ගොවි ජනයා රැක ගන්න
පයිරි මඩුවෙ ගැමී රෝහල තන වන්න
පසු ගිය රජය කළ නියමය යට වෙන්න
හේතුව අසමි සුව ඇමතිඳ වග දන්න

මනමාලියක හට
මංගල ඇඳුම සොය නට
අල්ලපු ගෙදර කට
ගිහින් ගත්තා සුභ මගුල හෙට

ඒ ඇඳුම අන්දා
විරලසෙහි මල් රන්දා
කසාදය බන්දා
යන මොහොත ලංවිය කැන්දා

ඇඳුම් හිමී ගැනීට
මගුල් ගෙයි බත දීමට
පරමාද වීමට
හේතු විමසා දන් කතා සිට

මනාලිය ඉන්නා
තැනට පිම්මෙන් පැන්නා
ඇඳුම් ගල වන්නා
මනාලිය නිරු වතින් උන්නා

එලෙස මේ රජ යට
අඩුව පුරවා ගැනු මට
ණයට ගෙන රට රට
හැඳුව අය වැය දකින කොට මට

මනාලිට සිදු වුන
දෙයම රටටත් සිදු වන
සැකය ගැන තැන තැන
කථා ඇත මැති සඳුනි මුල සුන

මුලසුන මැ තීන්දේ
මෙමෙහෙමයි අපට වන්දේ
දන පතින් පින්දේ
විරුදුවයි මම දෙන්නෙ චන්දේ

අ. භා. 4.29

**විමලා කන්නන්ගර මිය. (සෞඛ්‍ය ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

(திருமதி விமலா கன்னங்கர—சுகாதார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)

(Mrs. Wimala Kannangara—Parliamentary Secretary to the Miinister of Health)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පොදු මහජනතාවගේ සාධාරණ නිදහස සමහර අවස්ථාවලදී ඔවුන් නොදැනුවත්වම, තවත්

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

මූසාවෙන් එය වසන් කොට, වේදිකාවලින් නොයෙක් මාදිලියේ ප්‍රකාශයන් කරන අනුශාසක වරුන්ද පාලක වරුන්ද කෙතෙක් ප්‍රයත්න දැරුවත් පොදු ජනතාව තත්ත්වය ඇති සැටියෙන් වටහාගෙන ඒකාධිපති වාදයක් කරා යැමෙන් වැළකී, මනුෂ්‍යත්වයේ මූලික නිදහස ආරක්ෂා කර ගැනීම සඳහා මෙම ප්‍රජාතන්ත්‍රවාදී ජාතික රජය තෝරා ගැනීම මූලික ජයග්‍රහණයක්.

අ. භා. 4.30

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy-Speaker)

**කරුණාකර නිශ්ශබ්ද වන්න. ගරු කථානායකතුමා දැන් මූලාසනය ගන්නවා ඇති.**

**අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, කථානායකතුමා මූලාසනාරූඪ විය.**

*அதன் பிறகு உபசபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலிருந்து நீங்கவே, சபாநாயகர் அவர்கள் தலைமை தாங்கினார்கள்.*

[*Whereupon* MR. DEPUTY-SPEAKER *left the Chair, and* MR. SPEAKER *took the Chair.*]

**විමලා කන්නන්ගර මිය.**
*(திருமதி விமலா கன்னங்கரா)*
(Mrs. Wimala Kannangara)

මීට පෙර තිබුණු හවුල් රජයේ අදක්ෂ පාලනයේ ප්‍රතිඵලයක් වශයෙන් භයානක ආර්ථික තත්ත්වයකට මේ රට වැටී තිබෙන අවස්ථාවකදී රට එම තත්ත්වයෙන් මෑත් කොට මනා ආර්ථික සැලැස්මක් කරා ගෙන යැම් වස් ජාතික රජයේ අය වැය යෝජනා වන් ගෙන් ඉදිරිපත් කොට ඇති යෝජනා වන් රටේ ආර්ථික තත්ත්වය දියුණු කිරී මෙහි ලා ගන්නා ලද පළමුවැනි පියවරක් ලෙස ජාතික මමත්වයක් ඇති සැම දෙනෙක්ම ප්‍රීතියෙන් පිළිගෙන තිබෙනවා. ගොවි ජනතාවක් හා කම්කරු ජනතාවක් ඇති කොට්ඨාශයක් වන ගලිගමුවෙන් මෙම ගරු සභාවට ඉදිරිපත් වී සිටින මම ගොවි කම්කරුවන්ට සෙත සලසන අය වැය ලේඛනය සම්බන්ධයෙන් මේ රජයට මගේ ස්තුතියත් ප්‍රශංසාවත් පුද කරනවා.

ගරු කථානායකතුමනි, 1956 න් පසුව වරින් වර හය වරක්ම මුදල් ඇමතිවරුන් විසින් අය වැය කථා ඉදිරිපත් කරන ලද නමුත් එන්නට එන්නටම පොදු ජනතා වට උසුලන්නට බැරි තරම්න් ජීවන වියදම වැඩි වුණා. මෙසේ ජීවන වියදම වැඩි වීමත් සමගම ඔවුන්ට අවශ්‍ය රෙදිපිළි, කරවල, උම්බලකඩ, සිමෙන්ති, කිරි ආහාර ද්‍රව්‍ය ආදී නොයෙක් දේ නැති වීම නිසා ඒවා ලබා ගැනීමට ඔවුන්ට මහත් දුෂ්කරතාව යන්ට මුහුණ පාන්නට සිදු වුණා. ඒවා ලබා ගැනීමට බොහෝ මුදල් ද වැය කරන් නට සිදු වුණා. මේ තත්ත්වයෙන් පොදු ජනතාව මුදා ගැනීමට දැන් ඉදිරිපත් කර තිබෙන අය වැය ලේඛනයෙන් යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. ඉහළ නඟින ජීවන වියදම අඩු කිරීමට මෙම අයවැය ලේඛනය මඟින් දෙයාකාරයක වැඩ පිළි වෙලක් යොදා තිබෙනවා.

ඉන් පළමුවැන්න මිළ පහත බැස්සවීමට කටයුතු කිරීමයි. බඩු මෙරටට ගෙන්වීමේදී අය කරන ගාස්තු අඩු කිරීමත් අවශ්‍ය ද්‍රව්‍ය පිටරටින් ගෙන්වීමේදී ඒ සඳහා අවශ්‍ය ප්‍රමාණය මුදල් වෙන් කිරීමත් නිසා අවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍යයන්ගේ සුලභවීම හා මිළ අඩු වීම නිසැකයෙන්ම සිදු වෙයි. කුළු බඩු ආදී ද්‍රව්‍ය නොමැතිකම නිසාත් රෙදිපිළි නොමැතිකම නිසාත් සමහර අවස්ථාවලදී අධික මිළ නිසාත් පෝලිම් වල රස්තියාදු වීම් ආදී කරදරවලට මුහුණ පා සිටි ගෘහිණී යට මෙයින් ඉමහත් සෙතක් සැලසී තිබෙ නවා. පාරිභෝගිකයාට අවශ්‍ය ද්‍රව්‍ය නියම මිළට ලබා දීමෙන් වියදම් අඩු කිරීම දෙවැනි ක්‍රමයයි. එවිට බඩු වැඩි මිළට විකිණීමට වෙළෙන්දාට ඉඩක් නොලැබෙන නිසා එයින්ද ජනතාවට සැලසෙන්නේ ලොකු සෙතක්. මිළ පාලනය කිරීමේ නීති සම්පාදනය කර, මෙරටෙහි නිපදවෙන ටෝච් බැටරි, බයිසිකල් ටයර් හා ටියුබ්, උදළු ආදී යෙහි මිළ අඩු කර, වැඩි මිළට බඩු විකුණන වෙළෙන්දන්ට විරුද්ධව ඉතා තද නීති මඟින් දඬුවම් දීමට සලස්වන බැවින් ජීවන වියදම පහත බසිනවාට කිසිත් සැක යක් නැහැ.

විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරු කී දෙයක් තමයි, පෞද්ගලික වෙළෙන්දාටත්, පෞද්ගලික අංශයටත් මේ අයවැය යෝජනාවලින් විශාල ලාභ ප්‍රයෝජන ලබා දී තිබෙනවාය යන්න. සියලුම පෞද්ගලික වෙළෙන්දන් කළුකඩකාරයින් හැටියටත්, හොරුන් හැටියටත් හංවඩු ගසා ඔවුන්ගේ අයිතිවාසිකම් වගීයෙන් වගීය අඩු කර, තුන් හවුලේ රජයෙන් නැත්තටම නැති කිරීමට ක්‍රියා කරන අවස්ථාවේදී බලයට සමහර අවස්ථාවලදී ඔවුන්ට වැටහෙද්දීත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විමලා කන්නන්ගර මිය.]

පත් අපේ නව රජය ඔවුන් සඳහාත් සහනදායක වැඩ පිළිවෙලක් මේ අයවැය යෝජනාවන්ට ඇතුළු කර තිබෙනවා. ඒ අනුව පෞද්ගලික අංශයට තම මුදල් කිසිත් බියක් සැකක් නැතිව රට සංවර්ධනය සඳහා යෙදවීමට අවස්ථාවක් සැලසී තිබෙනවා.

මේ අයවැය යෝජනාවන්ගෙන් කෘෂිකර්මය නඟාලීමට විශේෂ ක්‍රියා මාර්ගයක් ගෙන තිබෙනවා. සංවිධානාත්මකව නව සැලැස්මක් යටතේ කෘෂිකර්ම කටයුතු ඉතා වේගවත් ලෙස දියුණු කිරීම සඳහා රජය හැම ආධාරයක්ම දීමට බලා පොරොත්තු වෙනවා. වියළි කලාපයන්හි මෙතෙක් කල් කිසිත් වගාවක් නොකරන ලද විශාල බිම් ප්‍රමාණයන් උද්‍යෝගිමත් පුද්ගලයින්ට හා සමාගම්වලට ලූනු, මිරිස්, කහ ආදී පිටරටින් ගෙනෙනු ලබන දේ වගා කිරීම සඳහා දීමට රජය අදහස් කරනවා.

මම මේ අයවැය යෝජනාවන් ගැන විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන්ගේ අවධානය යොමු කරවන්න කැමතියි:

1. ඉදිරියට ඇති වර්ෂ තුනේදී අක්කර ලක්ෂයක් පමණ වගා නොකළ බිම් ප්‍රමාණයක් අළුතෙන් වී වගා කොට වී බුසල් කෝටි තුනහමාරක් නිපදවීමට සැලැස්වීම;

2. නව සංවිධානයක් අනුව අඩු මිළට පොහොර සපයා අක්කරයකින් ලැබෙන අස්වැන්න ප්‍රමාණය වැඩි කිරීමට සැලැස්වීම;

3. අක්කර 10,000 ක් පුද්ගලයින් අතර ලූනු, මිරිස්, අඹ, මුං, තල ආදිය වගා කිරීම සඳහා බෙදා දීම;

4. අක්කර 30,000 ක් කජු වගා කිරීමට වෙන් කිරීම;

5. ජනපද ක්‍රම යටතේ පවුල් පන්දාහක් පදිංචි කිරීම;

6. සුළු වාරිමාර්ග ක්‍රම 25 ක් ඇති කොට තරුණ සින් 1,250 ක් පදිංචි කරවීම.

මේ කරුණු මෙම අයවැය යෝජනාවේ ඉතාමත් ජනප්‍රිය කරුණු වශයෙන් සාමාන්‍ය ජනතාව සලකා ප්‍රීතියට පත් වන වාට කිසිම අනුමානයක් නැහැ. එය ජාතික රජයට විශාල ගෞරවයක්. එපමණක් නොවෙයි, කථානායකතුමනි, ධීවර කර්මාන්ත යේ දියුණුව සඳහා කෝටි 60ක් වෙන් කර තිබෙනවා. ධීවර කර්මාන්තය සම්බන්ධ යෙන් අනුගමනය කරන වැඩ පිළිවෙළ අනුව වැඩි කල් නොගොස්ම තෝරාගේ පමණක් නොව, මෝරාගේ සිට හාල් මැස්සා දක්වා මිල අඩු වනවාට කිසිම සැකයක් නැහැ.

ඉහත දැක්වූ කරුණු අනුව සෑම ජනතා කොටසකටම සැහීමකට පත් වීමට කරුණු යෙදෙනවා ඇති. ඒ අනුව තම දහදිය මහන්සියෙන් කරන ලද ක්‍රියාවන්ගෙන් වැඩි පල නෙලා ගැනීමට ගොවියාට අවස්ථාව සැලසෙන අතර, දැනට වඩා උසස් ජීවන තත්ත්වයක් ලැබීමට මාගී පැදෙන බව මම ප්‍රකාශ කරන්න කැමතියි. බඩු මිල පහත බැසීමේ ප්‍රතිඵලයක් වශ යෙන් මෙතෙක් කලක් පාරිභෝගිකයාට මුහුණ පාන්නට සිදු වූ අනවරයන්ගෙන් ඔවුන් මිදී ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් වනවාට කිසිම අනුමානයක් නැහැ.

තවද කථානායකතුමනි, පසු ගිය රජයේ අදක්ෂ පාලනය හේතුකොටගෙන උගත් තරුණ තරුණියන් විශාල සංඛ්‍යාවකට රැකීරක්ෂා නොමැතිව ඔවුන් අතරමං වී සිටිනවා. රජයේ කෘෂිකර්ම පුහුණු ලබා සිට වූ 7,500කට අධික පිරිසක්ද, අභ්‍යාස විද්‍යාල ප්‍රවේශය සමත් 8,000කට අධික පිරිසක්ද, රජයේ කලායතනයේ අවුරුදු 5ක් පුහුණුව ලබා ඇති 1,000ක් පමණ පිරිසක්ද, අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයෙන් සමත් තරුණ තරුණියන් ලක්ෂයකට අධික පිරිසක්ද රැකීරක්ෂා නොමැතිව මෙසේ අතරමං වී සිටින විශාල පිරිසට ඇතුළත් වෙනවා. ඒ සියලු දෙනාටම සහන යක් සැලසෙන පරිදි ඒ ප්‍රශ්න විසඳීමට ජාතික රජය විසින් සංවිධානාත්මක වැඩ පිළිවෙළක් ආරම්භ කර තිබෙනවා. උගත් තරුණ තරුණියන්ට සහනයක් ලබා ගැනීමේ අවස්ථාව සැලසෙන පරිදි අයවැය කථාවෙන් යෝජනා ඉදිරිපත් කිරීම ගැන ගරු මුදල් ඇමතිතුමාට අපේ ගෞරවය පුද කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තවද, රැකීරක්ෂා කායඛාලවල ලියාපදිංචි වී ඇති කම්කරු සංඛ්‍යාව වර්ෂියෙන් වර්ෂය ඉහළ නැග ගොස් ඇත. මේ අයටද, පොදු ආයතනවලත්, නව කර්මාන්ත මධ්‍යස්ථානවලත් විදුලි යෝජනා ක්‍රමවල ප්‍රතිඵල වශයෙන් ඇති වන කර්මාන්ත මධ්‍යස්ථානවලත් රැකීරක්ෂා ලබා ගැනීමේ අවස්ථාව සැලසෙනවා ඇත. ඒ වාගේම පේෂකර්මාන්ත මධ්‍යස්ථාන 1,000ක් ඇති කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්ද, නිවාස යෝජනා ක්‍රම වැඩි වීමේ ප්‍රතිඵලයක් වශයෙන්ද, වතු පාලකයින්ගේ ලාබ වැඩි වීම නිසා සංවිධානය කරන වැඩ පිළිවෙළේ ප්‍රතිඵලයක් වශයෙන්ද තව තවත් රැකියාවන් ලබා ගැනීමට බොහෝ දෙනෙකුට අවස්ථාව සැලසෙනු ඇත.

තමුන්නාන්සේට මතක ඇති, කථානායකතුමනි, ගරු මුදල් ඇමති වන්නිනායක මහතා විසින් උදලු හා අලවංගු සුලභ කර ඇති බවත්, ඒවායෙන් ජාතික රජයේ මිනී වලවල් කැපෙනවා ඇති බවත් විරුද්ධ පාර්ශ්වයේ එක් ගරු මන්ත්‍රීවරයකු විසින් කී බව. විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් මිනිවළවල් කථාව කීවේ අද ඊයේ නොවෙයි. ඉකුත් 9 අවුරුද්ද තිස්සේම මහජන වේදිකාවලට නැගී එක්සත් ජාතික පක්ෂයේ මිනීවළ කැපූ බව ප්‍රකාශ කළා. එය ප්‍රකට කාරණයක්. නමුත් වැළලීමට තිබෙන කුණු ගොඩවල ප්‍රමාණය අනුව සලකන විට විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් විසින් කපන ලද වළවල් ගණන ප්‍රමාණවත් නොවන බව කියන්නට සිදු වී තිබෙනවා. ඉකුත් 9 අවුරුද්ද තුළ ඇති කරන ලද දූෂණ, අල්ලස් කුණු කරවල ගඳ, අදක්ෂ පාලනය, ජාති භේදය, ආගම් භේදය, අසරණකම ආදී මේ සියල්ලම අපේ ලාබෙට දී ඇති පෝර සහ රසායනික පෝර සමඟ කලවම් කොට එම වළවල්හි දමා වසා, නව යෝජනා නමැති වෘක්ෂ සරුවට වැඩෙන ලෙස එම වළවල්හි සිටුවීම අපේ ප්‍රයත්නයයි. ඒවායේ ඵල නෙලා ගැනීමට ඔබතුමන්ලාට වුවද අවහිරයක් නොවන්නට විග බලා ගැනීමටද අපි බලාපොරොත්තු වෙමු.

අවසාන වශයෙන් නව රජය බලයට පත් කිරීමට අපමණ වෙහෙස ගත් ගරුතර මහා සංඝරත්නයටත්, දුක් වින්ද [illegible] තාවටත්, තරුණ තරුණියන්ටත් සතුටු විය හැකි අයවැය ලේඛනයක් මේ වර ඉදිරිපත් කර තිබෙන බවත්, ඒ අනුව උසස් අනාගතයක් බලාපොරොත්තු විය හැකි බවත් ප්‍රකාශ කරන අතර ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී යුගයක් බිහි කිරීමට සමිති සමාගම්වලත්, රජයේ සේවක පිරිස්වලත්, සෑම ජනතා කොටස්වලත් සහයෝගය මෙම රජයට ලැබීමෙන් හා මෙරට ආරක්ෂා කරන දෙවි දේවතාවුන් වහන්සේලාගේ ආශිර්වාදයද ලැබීමෙන් ස්වර්ණමය යුගයක් ඒකාන්තයෙන්ම බිහිවේවායි ප්‍රාර්ථනය කරමු.

අ. භා. 4.48

**එච්. එම්. නවරත්න මයා.** (මිනිපෙ)
*(திரு. எச். எம். நவரத்ன—மினிப்பே)*
(Mr. H. M. Nawaratna—Minipe)

ගරු කථානායකතුමනි, කඳුකර ප්‍රදේශයේ දුප්පත් ජනතාවගේ නියෝජිතයකු වශයෙන් මෙම අයවැය ලේඛනයේදී වචන ස්වල්පයක් කථා කිරීමට ලැබීම මගේ භාග්‍යයක් කොට සලකනවා. මීට පික වේලාවකට ඉහතදී කථා කළ මස්කෙළියේ ගරු මන්ත්‍රීතුමා (එඩ්මන්ඩ් විජේසූරිය මයා.) ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයකු වශයෙන් සිටිමිනුත් උඩරට ප්‍රදේශවල අඩුපාඩුකම් ගැන සඳහන් කිරීම නිසා මගේ අවංක ස්තුතිය එතුමාට පිරිනමන්නට කැමතියි. 1815 දී ලංකාව ඉංග්‍රීසින්ට යටත් වූ බව අප කවුරුනුත් දන්නා දෙයක්. 1818 දී කැප්පෙටිපොල මහ අදිකාරම්තුමා ඇතුළු උඩරට ගොවි කම්කරු ජනතාව විසින් ඉංග්‍රීසින්ට විරුද්ධව කැරැල්ලක් මෙහෙයැ වූ නමුත් අපේ අභාග්‍යයකට මෙන් ඒ කැරැල්ල සාර්ථක වුණේ නැහැ. ඒ කැරැල්ලේ ප්‍රතිඵලයක් වශයෙන් උඩරට ප්‍රදේශය නොදියුණු තත්ත්වයෙන් තිබෙන්නට ඉඩ හැරී බවත් තමුන්නාන්සේ දන්නවා ඇති. උඩරට ප්‍රදේශවලට අවශ්‍ය ආරෝග්‍යශාලා, පාඨශාලා, මංමාවත් ආදී සෑම දෙයක්ම ඒ ප්‍රදේශයට නොදී උතුරු පළාතට දෙන්නට යෙදුණා. 1948 දී ලංකාව නිදහස ලැබූවාට පසු උඩරට ගැමි පුනරුත්ථාපනය පටන් ගත්තේ වී නමුත් අද වනතුරු එයින් සැලකිය යුතු සේවයක් සිදු වී නැති බව කනගාටුවෙන් ප්‍රකාශ කළ යුතුව තිබෙනවා. උඩරට ගැමි පුනරුත්ථාපන කටයුතු සඳහා මේ අයවැය ලේඛන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එච්. එම්. නවරත්න මයා.]

යෙන් මීට වඩා මුදල් වෙන් කරනවා ඇතැයි මා අපේක්ෂා කළා. දැනට වෙන් කර ඇති රුපියල් ලක්ෂ 41 කේ ඒ මුදල ඒ උඩරට ප්‍රදේශයට අවශ්‍ය ආරෝග්‍යශාලා, පාඨශාලා හා පාරවල් දියුණු කර ගැනීමට ප්‍රමාණවත් වන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, ඉඩම් ප්‍රශ්නය සම්බන්ධව මේ රජය ක්‍රියා කරන්නට බලාපොරොත්තු වන පිළිවෙල මා පත්‍ර මාර්ගයෙන් දැක්කා. අයවැය කථාව මුද්‍රණය කර ඇති පොතේ 41 වැනි පිටුවේ මේ පිළිවෙළට සඳහන් වී තියෙනව:

"ඉඩම් බෙදා හැරීම පිළිබඳ සෑම අවස්ථාවලදීම සැලකිල්ලට යොමු විය යුතු ප්‍රධාන කාරණයක් නම්, ගොවි ජනතාවගේ අයිතිවාසිකම්ය යන ප්‍රතිපත්තිය රජය විසින් නොවෙනස්ව පවත්වාගෙන යනු ලබන අතර, කෘෂිකාර්මික නිෂ්පාදනය සඳහා ප්‍රාග්ධනය සහ මැනවින් සකස් කළ සැලසුම් සහිතව ඉදිරිපත් විය හැකි පුද්ගලයන්ට සහ පෞද්ගලික සමාගම්වලටද සුදුසු බදු කොන්දේසි යටතේ රජයේ ඉඩම් ලබා දීම, දැනට පවත්නා තත්ත්වයන් අනුව අවශ්‍ය වෙතැයි රජය විශ්වාස කරනවා."

ඉඩම් විශාල ධනේශ්වර පන්තියට දීම ගැන අපේ විරුද්ධත්වයක් නැහැ. නමුත් කිව යුත්තක් තියෙනව. 1964 දී දැනට මා නියෝජනය කරන මිනිපේ ආසනයේ ඇති කරන ලද ගොවි සමිති 5 ක් ඉඩම් අක්කර 500 ක් එදා ඉඩම් ඇමතිවරයා වශයෙන් සිටි, අදත් ඉඩම් ඇමතිවරයා වශයෙන් ඉන්න ගරු සී. පී. ද සිල්වා ඇමතිතුමාගෙන් ලබා ගත්තා. ඒ ඉඩම් අක්කර 500 ඒ ගොවි සමිති 5 ට හිමි කර දෙන ලෙස ඒ සමිති ඉල්ලා සිටි නමුත් අද වන තුරු ඔවුන්ට ඒවා ලැබී නැහැ. නමුත් මූසාජී කොම්පැනියට මහියංගනයේ ඉඩම් අක්කර දහස් ගණන් දීල තියෙනව. ගොවීන්ට දෙන ලද ඉඩම්වලින්, ගරු ඉඩම් ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමා නියෝජනය කරන මහියංගනය ආසනයේ අළුත් වරම විවිධ සේවා සමුපකාර සමිතියෙන් වී බුසල් 90,000 ක් 1964 දී ආණ්ඩුවට මැනල තියෙනව. ඒ අස්වැන්න ගොවි මහතුන්ගේ ශ්‍රම ශක්තියෙන් උපදවන ලද ඒවා. මූසාජී කොම්පැනියට ඉඩම් අක්කර දහස් ගණන් දුන්නත් ගොවි මහත්වරුන්ගේ ශ්‍රම ශක්තියෙනුයි, ඒ අස්වැන්න නිපදවන්නෙ. මිනිපේ ආසනයේත් ඉඩම් නැති ගොවීන් විශාල වශයෙන් ඉන්නව. මූසාජී කොම්පැනිය වැනි කොම්පැනිවලට දෙන අතර ගොවි මහත්වරුන්ටත් අක්කර 50, 100 බැගින් දෙනව නම් මේ රට ස්වයංපෝෂිත කිරීමට පුළුවන් වන බව මම නිර්භයව ප්‍රකාශ කරනව.

ගරු කථානායකතුමනි, මේ අයවැය ලේඛනයෙන් ගොවියාට දී තිබෙන සහනය මදි; කම්කරුවාට දී තිබෙන සහනය මදි. ගොවියා තමයි, මේ රට ස්වයංපෝෂිත කිරීමට තමන්ගේ උදැල්ලෙන් වැඩ කරන පුද්ගලයා, ඒ නිසා මිනිපේ, මහියංගනය වැනි ආසනවල ගොවි ජනතාවට ඉඩම් අක්කර සියය, පණහ ආදී වශයෙන් දෙනව නම් මූසාජී කොම්පැනිය වැනි කොම්පැනිවලට ඉඩම් දීමෙන් ලැබෙන ප්‍රයෝජනයට වැඩි ප්‍රයෝජනයක් ලැබෙන බව මා ප්‍රකාශ කරන්න සතුටුයි. රතු ලූනු වගාව සඳහා යාපනයට දෙන තරම් සහනාධාර මිනිපේ ප්‍රදේශයේ රතු ලූනු වගාවටත් දෙනවා නම් ලංකාවට අවශ්‍ය රතු ලූනුවලින් විශාල ප්‍රමාණයක් මිනිපේ ප්‍රදේශයෙනුත් නිපදවන්න පුළුවන් බව මම ප්‍රකාශ කරන්න සතුටුයි.

ගරු කථානායකතුමනි, මේ අයවැය ලේඛනයෙන් සීසල් බද්ද අඩු කරල තියෙනවය කියා ගරු මුදල් ඇමතිතුමා ප්‍රකාශකර තිබෙනව. සීසල් බද්ද අඩු කිරීමෙන් ගොවියාට සෙතක් සැලසේය කියා මම විශ්වාස කරන්නෙ නැහැ. මිනිපේ ප්‍රදේශයේ පතෝල, මුරුංගා ආදිය විශාල වශයෙන් උපදිනව. නමුත් මිනිපේ සිට ලොරිවලින් පතෝල ගෙනැවිත් මධ්‍යම වෙළඳ පොළට දුන් විට මධ්‍යම වෙළඳ පොළින් ගොවි ජනතාවට ලැබෙන මුදලින් ලොරි ගාස්තුව ගෙවන්නටත් අමාරුයි. මධ්‍යම වෙළඳ පොළෙන් පතෝල රාත්තලකට ලැබෙන මුදල ශත 5 කට වඩා වැඩි වන්නෙ නැහැ. නමුත් සාමාන්‍ය ජනතාවට මධ්‍යම වෙළඳ පොළෙන් ශත 35 කට වඩා අඩුවෙන් පතෝල රාත්තලක් ලබා ගන්න පුළුවන්කමක් නැහැ. ඒ තත්ත්වය ඇති කරන්නෙ මැද ඉන්න මුදලාලියි. එළවළු සඳහා ගොවියාට කොයි තරම් අඩු මුදලක් ලැබුනත් පාරිභෝගිකයාට ඒ එළවළු මිළට ගන්න වන්නේ ඉතා වැඩි මිළකටයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු කථානායකතුමනි, නොයෙකුත් ආකාරයෙන් මුක්කු ගසා ඉදිරිපත් කරන ලද මේ අයවැය ලේඛනයෙන් ලංකාව වැනි රටක වෙසෙන පොදු ජනතාවට කිසිම සෙතක් සැලසේය කියා මම හිතන්නෙ නැහැ. ඇත්ත වශයෙන්ම උඩරට ප්‍රදේශ වලට නම් කවදාවත් සෙතක් සැලසෙන්නේ නැහැ. මා එසේ කියන්නේ මේ නිසයි. උඩ රට දියුණු කිරීමට අපි බලා පොරොත්තු වුණේ උඩරට ගැමි පුනරුත්ථාපන කොමිසම පිහිටුවීමෙන් හා එයට මුදල් දීමෙනුයි. දැන් මේ උඩරට ගැමි පුනරුත්ථාපන කොමිසම සෑදී තිබෙන්නේ හැම දෙපාර්තමේන්තුවකින්ම යම් යම් කොටස් එකතු කරලයි. නමුත් උඩරට ප්‍රදේශ දියුණු කිරීමට නම් උඩරට ගැමි පුනරුත්ථාපන කොමිසම මහනුවර මධ්‍යම මණ්ඩලය හැටියට පිහිටුවා දෙපාර්තමේන්තු වලින් වෙන් කර තනිකර දෙපාර්තමේන්තුවක් හැටියට පිහිටුවා කටයුතු කළොත් උඩරට ජනතාවට සේවයක් කරන්නට පුළුවන් වේවි. මා වැඩිදුර කථා කරන්න යන්නේ නැහැ. මේ අයවැය ලේඛනය සම්බන්ධයෙන් මගේ ඡන්දය විරුද්ධව දෙන බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

අ. භා. 4.56

**ඩී. බී. රණතුංග මයා. (කොත්මලේ)**
*(திரு. டீ. பி. ரணதுங்க—கொத்மலே)*
(Mr. D. B. Ranatunga—Kotmale)

ගරු කථානායකතුමනි, පුරා අවුරුදු 9 ක් තිස්සේ අදූරදර්ශී රජයක පාලනයට යටත්ව නොසැලකිල්ලට භාජන වී තිබුණු මා නියෝජනය කරන ප්‍රදේශය වැනි ප්‍රදේශ වලට මේ අයවැය ලේඛනයෙන් සැලසී ඇති විශාල සෙත පැහැදිලි කර දීමටත්, විශේෂයෙන්ම මිහින්තලේ මන්ත්‍රීතුමාගේ (පී. එම්. කේ. තෙන්නකෝන් මයා) කවි කථාවට පිළිතුරු දීමටත්, මටත් කවි කීප යක් කියන්නට අවසර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

නව රජයෙ පැනසර—අයවැය පනතෙ විසිතුර
කියන්නට දිගහැර—කථානායකතුමනි, අවසර

ජන රජයෙ ජාතික—අගමැති සේනානායක
මුදල් පරිපාලක—ඇමති වන්නියෙ වන්නිනායක

ඇමතිවරු එක් වී—මහජන උකට[illegible]
අයවැයක් දක් වී—රටට ඉන් ලොකු සහනයක් වී
බදු බරින් නිදහස—ලැබූ රට දෙයි මදහස
විපිදූ පස උදහස—ඉපිසියාවෙනි මගේ අදහස

නැතිකොට මෙතෙක් තිබූ අල්ලස් දූෂණය
රැක ගෙන විමුක්තිය රට දැය සාසනය
ගෙන යන බව කියන දැහැමින් පාලනය
කාටත් සෙතකි මේ අයවැය ලේඛනය

ජාතික රජයෙ කැබිනට් නම් පබලු පොටේ
මෙහෙයවී පරිද්දෙන් අගමැති කනක කැටේ
කියවන විටදි අයවැය දියුණුවට රටේ
මසුරන් හැලුනි වන්නියෙ නායකගෙ කටේ

කන බොන අදින බඩු මිල පහලට දම්මයි
බදුබර සහන බව ඊළඟ වැද ගැම්මයි
මෙය අද රටේ එක හඬකින් එළි ගැන්මයි
ජාතික රජය පොදු ජනතාවගෙ අම්මයි

පරිප්පු අල මිරිස් හා තව උදලු නලේ
මිළ අඩු කළේ වන්නියෙයි බුමි තෙලේ
තිබුණලු කලින් රජයට රත්තරන් මොළේ
ඒ පඬිවරුන් මොනවද මේ රටට කළේ

පාලක පිරිස මෙහි ගතවුණු යුගයෙ සිටී
පොදු ජාතික දනය වනසා ඇමුව හැටී
එනිසා තිබුණි මේ රට හිඟමනට වැටී
මේ ගැන කොමිසමක් පත් කර සොයනු වටී

අද්‍යාපනය පිළිබඳ දරුවනගෙ ඔබේ
තිස් අට කෝටි මුදලක් වැය කරනු ලැබේ
තව එක ගැටළුවකි විසඳුම පිණිස සබේ
සිසු ගුරු වැටුප ගැන සැලකිය යුතුව තිබේ

කඳු රට මුදල් උපයන අම තේ දල්ල
දනපති මෝල් හිමියන් රැස කති කොල්ල
යොදවා රජය මේ ගැන නිසි සැලකිල්ල
ගැමි ජනයාට ගෙන දෙනු මැන සැනසිල්ල

අසරණ සුළු ඉඩම් හිමියට අද ගෙවන
සත හත අටකි දළු කැඩමටවත් නොහෙන
තේ දළු රාත්තලකට නිති අඩු ගණන
අණ කළ යුතුය, වෙන්නට සත තිහ පමණ

අය වැය පිළිබඳව රජයෙන් ගෙනා පනත්
රට පිළිගනී රතු පිරිසක් හිනා වුණත්
අළලා ඒ විවේචන හා කතා වෙනත්
අවසර යමක් කීමට කොත්මලේ ගැනත්

හැම් බේකන් නොව සිංහල හාලේ
බත අර බතලයි අප කන්නේ
විදුලි එළිය නැත ලාම්ප තෙල් කුප්පිය
පැල්පත්වල ඇවිලෙන් නේ
සේද සැටින් නොව නැතී බැරි අය කපු
රෙද්දෙනි ඇඳුමක් මහ ගන්නේ
ඒවගේ මිල අඩු කළ මේ පනතින්
පොදු ජනයාටය අත දෙන්නේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. රණතුංග මයා.]

කුඹුරු වැඩටයි වැවිලිවලටයි වෙලෙත්
හේනෙත් ගෙදර වත්තේ
උදළු නල අලවංගු පසුගිය රජය
තුළ කීයටද ගත්තේ
එවැනි බඩුවල මිළ කැපූ මේ අය
වැයෙන් සහනයක් ඇත්තේ
රටේ ගොවි කම්කරු හැමෝටයි
පැහැදිලියි එය මොකද නැත්තේ

සතරුස් සැනැප්මෙන් එකසිය අසූවක
කඳු හෙල් ගහන ගොඩ මඩ සරු පළාතක
කොත්මල් කුසෙහි ඉපදුණු ගව්රවේ රුක
පැහැදිලි කරමි එහි ජනතාවගේ දුක

ජනගහනයකි හැට පන් දහසකට වඩා
ජීවිත සටන ගැන දිව රෑ නොහැර විඩා
ගොවියන්ගෙන් කෙරෙන සේවය නොමැන කුඩා
ඔවුනගෙ දිළිඳු බව මම සැල කරමි හඩා

ගොඩමඩ ඉඩම් අක්කර කාලකුදු නැතී
හොඳ පළපුරුදු ගොවීයෝ මෙහි එමට වෙතී
රජරට වනය ගිම් වග වලසුනට නිතී
ගොවිතැන් පිණිස දුන්නොත් ඒ අය ට ඇතී

ගල්ඔය, කන්තලේ, මිනිපේ. මැදිරි ගිරි
වලවේ නිම්න කැලයෙන් වත් කොහොම හරි
මේ ගොවියාට, ඇති පීඩිත බවෙහි එරි
අක්කර පහ බැගින් දෙන්නට මොකද බැරි

පොල් හෝ පැහිරි කොකොවා හෝ කුරුඳු පොතු
මගෙ කොත්මලේ නැහැ දක්නට රබර වතු
තේ එනසල් කෝපි මෙහි වැසි දනට සතු
රැක්මට රජය සහයෝගය ලැබිය යුතු

සාරයි කුඹුරු වවනොත් යල, මහ කන්නේ
කරදර මැදයි ඒවට දිය සැපයෙන්නේ
මේ රජ බිමෙහි දන සම්පත් මතු වන්නේ
මෙතුවක් සිටිය මැතිවරු එය නැහැ දන්නේ

වාහනයක් යනෙන පාරක් නොවක් නැති
ඉන්නට ගෙයක් කන්නට කිසි දෙයක් නැති
මෙතුවක් රජයකින් කිසි සහනයක් නැති
රැකියා නොමැති අය හත් අට දහස් වෙති

ඉගුනුම පිණිස කොත්මලේ දූ දරුවන්නේ
විදුහල් ගමන් පහසුව නැහැ සැලසෙන්නේ
වාසිවිවලට කොහොමද මේ අය යන්නේ
නැහැ කිසි කෙනෙකු මේවා ගැන සලකන්නේ

එක මැදි විදුහලකි මුළු පෙළෙදසට ඇත්තේ
විදුහල් පති දරයි නැගුමට එහි තත්තේ
ටෙලිෆෝනයක් වැනි දේ එනැනට නැත්තේ
ඉගෙනුම් ගරු ඇමැති මෙය සැලසිය [illegible]

ගැමි රෝහලක් හෝ පාරක් නොමැතී හෙයින්
යායුතු ලෙඩුන් ඔසවා ගව් ගණන් පයින්
හම් කීපයකි අසරණ වුණු සියලු දෙයින්
එහි ජනතාව පසුවෙති නිති මරණ බයින්

ජාතික සටන් හැමෙකම් පෙරමුණ ගත්තු
කොත්මල් මවගෙ ගැටවර දූවරු පුත්තු
කවදත් සිංහලේ වීරුදර ගිතවත්තු
එය පිළිගනිත් කැබිනට් මුදුවෙණි ඇත්තු

දෙස් පාලනය පොදු සේවය හොඳට හුරු
නායකයෙකුගෙ මෙහෙයිමෙන් එළිය කෙරු
ජනතාවගේ සහයෝගය තියෙන තුරු
ජාතික රජය බලයෙන් පහ කරනු බෑරු

දෙස් පාලනය පොදු සේවය හොඳට හුරු
නායකයෙකුගෙ මෙහෙයිමෙන් එළිය කෙරු
ජනතාවගේ සහයෝගය තියනෙ තුරු
ජාතික රජය බලයෙන් පහ කරනු බොරු

සිව් දිග්වලින් දන උල්පත් පැදේවී
රට දූය එසින් කිරි පැණියෙන් නැවේවී
පොදු ජන විමුක්තියෙ නිසි මග සැදේවී
කොත්මලයටත් දුන්වත් හඳ පායාවී

රට දූය මුහුණ පා සිටි බිහිසුණු මරණින්
බේරා සුවය දුන් නිදහස් පිවි කිරණින්
ජන ආදරය වැඩි වී දෙවී රැකවරණින්
ජාතික රජය සැරදේ තෙසරණ සරණින්

විරුදු පසේ හැම අයෙකුගෙ මූණයි
ජාතික රජයෙහි මැතිවරු රැනයි
අයවැය කියවා සැනයෙන ගානයි
මගෙ කවි දෙසුමද මින් අවසානයි

අ. භා. 5.3

ඩබ්ලිව්. ඒ. කරුණාසේන මයා. (පැල්මඩුල්ල)

(திரு. டப்ளியு. எ. கருணசேன—பெல்மதுல்ல)

(Mr. W. A. Karunasena—Pelmadulla)

ගරු කථානායකතුමනි, අවුරුදු හතර හමාරක පමණ කාලයක් පසුගිය රජයේ අයවැය ලේඛන පහකටම සවන් දී සිට ප්‍රථම වරට විරුද්ධ පාර්ශ්වයේ සිට ජාතික රජය ඉදිරිපත් කළ ප්‍රථම අයවැය ලේඛනය ගැන වචන ස්වල්පයක් කථා කරන්නට ලැබීම ගැන මා ප්‍රථමයෙන්ම තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනව. නියෝජිතයින් වශයෙන් මේ ගරු උත්තරීතර සභාවට පැමිණ සිටින්නෙ මේ රටේ ජනතාව වෙනුවෙන් පොදු සේවයක් කිරීම [illegible] ඇත්ත වශයෙන්ම මගේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අත්දැකීම් අනුව බලන විට, අපේ දේශපාලන ගුරුවරුන් රාශියක්ම ඒ පැත්තෙ රැස්ව සිටිනව. නමුත් අප මේ ස්ථානයට එවා තිබෙන්නෙ, අප අවංකව කල්පනා කර බලනව නම්, වැඩ කරන ජනතාව කෙරෙහි නියම හැඟීමක් ඇතුව ඒ ජනතාව උදෙසා කටයුතු කිරීමටයි, සේවය කිරීමටයි. නමුත් මම කනගාටු වෙනවා. අපේ දේශපාලන පියවරුන් වශයෙන් සලකන පුද්ගලයන් අද ඒ පැත්තේ ඉඳගෙන,—පසුගිය අවුරුදු හතරහමාරක පමණ කාලය තුළ පමණක් නොවෙයි, අපේ දේශපාලන ඉතිහාසයේ විශේෂයෙන්ම 1947න් පසු කාල පරිච්ඡේදය තුළ මේ රටේ දේශපාලනය ගැන මා ලබා ඇති අවබෝධය අනුව—කරන කථා ගැන, හැසිරෙන ආකාරය ගැන බලන විට අපේ දේශපාලනඥානය ඊට වඩා හොඳ බව අවංකව කියන්න පුළුවනි. මා එසේ කියන්නෙ, පසුගිය සතියෙ මෙම උත්තරීතර සභාවෙ කථා කළ එක්තරා උප ඇමතිවරයකු කථා කළ ආකාරය ගැන කල්පනා කිරීමෙනුයි. දේශපාලනය ගැන කිසිම හැඟීමක් නැති ගමේ ගොඩේ දෙමව්පියකු, සහෝදර සහෝදරයකු මේ ගරු සභාවට පැමිණ ඒ කථාවට එදා සවන් දීගෙන සිටියා නම්, සමහර විට මෙම ගරු සභාව පාර්ලිමේන්තුවක් නොව තිරිසන් ගතිපැවතුම් තියෙන අය වෙනුවෙන් වෙන් වූ ස්ථානයක් කියා සිතනවාට කිසිම අනුමානයක් නැහැ. මේ ගරු සභාවේ ගරු ඇමතිවරුන් සිටිනව; ගරු අගමැතිතුමාත් එදා සිටිය නම්—මා ගරු අගමැතිතුමාට ගෞරව කරනව—එතුමා ඒ විධියෙ දෙයක් අනුමත කරාවියයි මම හිතන්නෙ නැහැ.

මම වැඩිය කතා කරන මන්ත්‍රීවරයෙක් නොවෙයි. මම කවදාවත් කිසිම මන්ත්‍රීවරයකුට අගෞරව කරන්න ලෑස්ති වෙන්නෙ නැහැ. මම මගෙ ගෞරවයත්, තමුන්නාන්සෙලගෙ ගෞරවයත්, ජනතාවගෙ ගෞරවයත්, මෙම උත්තරීතර පාර්ලිමේන්තුවෙ ගෞරවයත් රකින කෙනෙක්.

තමුන්නාන්සෙල ලෑස්ති වෙනව, අපට සෑම වේලෙම නොයෙකුත් විධියෙ දෝෂාරෝපන කරන්න. නොයෙකුත් ආකාර යෙන් පසුගිය රජයෙ දොස් කියනව. සමහර විට තමුන්නාන්සෙලත් අවුරුදු පහක් ඔය බෙරේම ගසාවි. මීට පෙර සිටි ආණ්ඩු පක්ෂයෙ කෙනෙකු හැටියට මම කියන්න කැමතියි, අපිත් ඔය පදේ අවුරුදු හතරහමාරක් ගැහුවය කියා. නමුත් ඔය ගහන පදේ ඔය විධියට ගැහුවොත් අපට අත්වුණ ඉරණම අවසානයෙ තමුන්නාන්සෙලටත් අත් වේවි. ඔය ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා 1944 දී පැල්මඩුල්ල ආසනයට ගිහින් බුලත්විට කකා දේශපාලන සටන කළා, ලෝක ප්‍රසිද්ධ කථානායකවරයකුව සිටි මොලමුරේ මහතාට විපක්ෂව. එදා එතුමගෙ දේශපාලනඥානය උඩ ගෙනිච්ච දේශපාලන ව්‍යාපාරයත් අද ගෙනියන ව්‍යාපාරයත් ගැන කල්පනා කරන විට මට මේ විධියට කියන්න පුළුවනි: අපේ ගමේ ගොඩේ අම්මල නාත්තල නාකි වෙච්චාම පන්සල් ගිහින් සිල් ගන්ව; අන්න ඒ වගෙයි එතුමගෙ දේශපාලන ව්‍යාපාරයත්.

අපි අපේ දේශපාලන ඥානය තව තවත් දියුණු කර ගන්නෙ ඔය පැත්තෙන් කරන කතාත් මේ පැත්තෙන් කෙරෙන කතාත් අසා ඉඳල ඒ අනුවත්, අනික් අතින් පොත්පත් ආශ්‍රයෙනුත් බව කියන්න ඕනැ. තමුන්නාන්සෙල අයවැය ලේඛන විවාදයෙදී පමණක් නොවෙයි, සෑම කතාවකදිම කියනව, අපි ජාති භේද ආගම් භේද යනාදිය අවුස්සනවය කියා. 1947 සිට තමුන්නාන්සෙල නේද, ආගම් භේද සහ ජාති භේද යනාදිය ඇවිස්සුවෙ කියා මම අහනව. ලියෝ ප්‍රනාන්දු මහත්මයගෙ බස්වල පිටුපසින් ආගම බේරගන්න යනුවෙන් සඳහන් කර පල්ලි, පන්සල් සහ කෝවිල් යනාදියෙහි චිත්‍ර ඇඳපු දැන්වීම් අලවා තිබුණ.

1947 ඡන්දයෙදි තමුන්නාන්සෙල වැඩ කළ හැටි මට මතකයි. 1952 ඡන්දයෙදි කටයුතු කළ හැටිත් මතකයි. ඒ වගේම 1956 ඡන්දයත් මතකයි. 1960 මොකද කළේ? අපි ජාති භේද වපුරනවය කියා කීව. විශාල සිතියමක් ඇඳල නිදර්ශන පෙන්නුව. ඒ සිතියමේ පිටපත් හන්දිවල අලවා තිබුණ. අපේ ප්‍රදේශවලත් ද්‍රවිඩ අය සිටිනව. අර සිතියම ප්‍රදර්ශනය කර, සිංහල ජනතාව සහ ද්‍රවිඩ ජනතාව අතර

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[කරුණාසේන මයා.]

සංවිධානයක් ඇති කරන්න උත්සාහ කළා. ඒ වගේම ආගමටත් කරදර කළා. බෞද්ධයකු හැටියට මා නිර්භයව ප්‍රකාශ කරනව, "අපි අපේ බෞද්ධකම මේ දක්වා නියම විධියට රැක්ක; මින් ඉදිරියටත් රකිනව" කියා. මේ අපේ රටය, ජාතියය, අගමය කියන හැඟීමෙන් වැඩ කරනව නම් අපට රට වෙනුවෙන් මීට වඩා සේවයක් කරන්න පුළුවනි.

පසුගිය රජය විසින් ඉදිරිපත් කළ අය වැය ලේඛනවල වැරදි පෙන්නුම් කරන්ට මේ අය ඉදිරිපත් වුණා. සමහරවිට වැරදි තියෙන්න පුළුවනි. රන් අකුරින් ලිය වෙනවාය කියන තමුන්නාන්සෙලගෙ අය වැය ලේඛනය කොතරම් දුරට සාර්ථක වෙයිද කියා බලමු. අපි තවම දන්නෙ නැහැ, කුමන කුමන බඩුවල මිල අඩු වෙලා තියෙනවද කියා. තමුන්නාන්සෙල මින් පසු රට ඇතුළෙ ගමන් කරන විට පෙනී යාවි, කොතරම් බඩු ලාබ වී තිබෙනවද කියා.

මගෙ ප්‍රදේශය උඩරටට අයිති ප්‍රදේශයක්. උඩරට ගැමි කොමිෂන් සභාවට සබරගමුවත් ඇතුළු කරන්නය කියා අපි පසුගිය රජයෙනුත් ඉල්ලා සිටිය. සබරගමුව පළාතෙන් පැමිණි මන්ත්‍රීවරුන් ආණ්ඩු පක්ෂයෙත් සිටිනව. උඩරටට නැති නම් කන්ද උඩරටට දෙන බලතලවලට සබරගමුවත් ඇතුළු කරන්නය කියා මා ඉල්ලනව.

තමුන්නාන්සෙලට මතක ඇති පසුගිය කාලෙ ඡන්ද ව්‍යාපාරය ගෙන ගිය අන්දම ගැන. පසුගිය රජයට පහර එල්ල කළා, මැණික් සංස්ථාව ගැන කියමින්. අද මැණික්වල වටිනාකම සියයට 60 කින් 40 කින් තරම බැහැල තියෙනව. බණ්ඩාරනායක රජය ඇතිවුණාට පසුව තමයි, සාමාන්‍ය මුස්ලිම් මහත්වරුන්ට ගෙයක් හදාගෙන, කාරෙකක් පාවිච්චි කරන්න තරම් ධනයක්වත් හම්බ කර ගන්න ලැබුණේ. ඊට කලින්, මුක්තාර් වැනි උසස් ධනවතුන් අතේ යි, මැණික් වෙළඳාම තිබුණේ. 1956 න් පසුව මැණික් ගල් පිළිබඳව සාමාන්‍ය දැනීමක් ඇති සුළු වෙළෙන්දන්ටත් තමන්ගේ වෙළඳාම කරගෙන බේරුවල, චීනකොටුව, ගාල්ල, පානදුර ආදි ප්‍රදේශවල ලක්ෂ ගණන් වටිනා ගෙවල් හදාගෙන ජීවත්වන්ට පුළුවන් වුණා. මැණික් කර්මාන්තයේ යෙදී සිටින දුප්පත් උදවිය බලාපොරොත්තු වුණා, ඔවුන්ට මේ රජයෙන් යම්කිසි සහනයක් ලැබෙයි කියා. අද පිටරට මුදල් යවන්ඩ වෙනත් නොයෙක් මාර්ග තිබෙන නිසා මැණික් ගල් ගොඩ ගැසී තිබෙනව. ඊයෙ පෙරේද මේ මැණික් කර්මාන්තයේ යෙදී සිටින කීපදෙනෙක් මට කිව්ව, "එන්. එම්. පෙරේරා මහත්මයා මුදල් ඇමති වෙලා හිටිය නම් හොඳයි, අපට දැන් සවුත්තුයි. අපි කර ගත්තෙ වරදක්" කියා. ලංකාවේ ජාතික ආදායමෙන් ¼ ක් තරම මේ මැණික් කර්මාන්තයෙන් ලබා ගන්ට පුළුවන්. එම නිසා ගරු මුදල් ඇමතිතුමාගෙන් මා ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනව, මේ මැණික් සංස්ථාවට තැනක් දීල මේ රටේ ජාතික ධනය වැඩි කර ගන්ට ක්‍රියා කරන්න කියා. ඒ ගැන පරීක්ෂණයක් පවත්වා අප කරන්ට බලාපොරොත්තු වුණාටත් වඩා හොඳින් එය කරන්ට උත්සාහ කරන මෙන් ආණ්ඩු පක්ෂයෙන් මා ඉල්ලා සිටිනව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට රාජ්‍ය සේවා කොමිසම ගැන වචනයක් කියන්ට ඕනැ. රාජ්‍ය සේවා කොමිසම පොදු වස්තුවක් නිසා ඊට මෙතෙක් පත් වුණේ ස්වාධීන අයයි. මට ආරංචියි, මගේ කොට්ඨාශයට තරඟ කර පැරදුණු සීතා මොලමුරේ සෙනෙවිරත්න මැතිනියගේ ස්වාමිපුරුෂයා එහි සභාපති පදවියට පත් කර සිටිනව කියා.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

වැරදියි. සභාපති නොවෙයි.

**කරුණාසේන මයා.**
*(திரு. கருணாசேன)*
(Mr. Karunasena)

කොමිසමට පත් කර තිබෙන බව ආරංචියි. පත්‍රයේ පළ වී තිබෙනවා මා දැක්කා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)
සභාපති නොවෙයි.

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)
සභිකයෙක්.

කරුණාසේන මයා.
(திரு. கருணசேன)
(Mr. Karunasena)
එසේ පත් කර තිබෙනව නම්, එතුමාගේ මහත්මිය තවම දේශපාලනයේ නිරත වී සිටින නැනැත්තියක නිසා නම කටයුතු සවාධීනව කරන්ට එතුමාට ඉඩ ලැබේදැයි සැකයක් අප තුළ තිබෙනව. ඊට ඉඩක් නොලැබෙන පරිදි කටයුතු කරන මෙන් ගරු අගමැතිතුමාගෙන් මා ඉල්ලා සිටිනව.

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)
ඇයි, තමුන්නාන්සෙලගෙ කාලයේ කොබ්බෑකඩුව මහත්මයා පත් කළේ.

කරුණාසේන මයා.
(திரு. கருணசேன)
(Mr. Karunasena)
ඔහු දේශපාලනයේ නිරතවී සිටියෙ නැහැ.

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)
ඔහුත් ආසනයක් තරඟ කර පැරදුණු කෙනෙක්. [බාධා කිරීමක්]

කරුණාසේන මයා.
(திரு. கருணசேன)
(Mr. Karunasena)
ඔහු දේශපාලනයේ නිරතවී සිටියෙ නැහැ. නෑදෑයෙක් වන්ට පුළුවනි. එහෙම පරම්පරාව බලාගෙන ගියොත් අපි සියළු දෙනාම නෑදෑයන් වෙන්ට පුළුවනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කොයි පැත්තෙන් කෙරුණත් හොඳක් කෙරෙනව නම් අපි සන්තෝෂ වෙනව. එහෙත් අපි අදහස් කරන්නෙ නැහැ, තමුන්නාන්සේලා කොයිතරම් දේශනා කළත් තමුන්නාන්සේලාගේ කාලය තුල අප තරම්වත් රටට සේවයක් කරයි කියා. මා ඊට නිදර්ශනයක් පෙන්නුම් කරන්නම්. 1956 න් පසුව තමයි, අපේ ගම්බද ශිෂ්‍යයින්ට විශ්ව විද්‍යාලවලට ඇතුළත් වෙන්ට පුළුවන් වුණේ.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)
නිදහස් අධ්‍යාපනය නිසා. [බාධා කිරීමක්]

කරුණාසේන මයා.
(திரு. கருணசேன)
(Mr. Karunasena)
ජාතික අධ්‍යාපන ප්‍රශ්නයේදී තමුන්නාන්සේලා පමණක් නොව බණ්ඩාරනායක මැතිතුමාත් ඊට ඇතුළත් වුණ ඒක රාජ්‍ය මන්ත්‍රණ සභා යුගයෙදී ඇතී වුණු දෙයක්. ඒකට අපි කවුරුත් හවුල් කාරයො. විශ්ව විද්‍යාල දෙකක් අළුතෙන් පිහිටුවා නියම විධියට ජාතික අධ්‍යාපන ක්‍රමයක් සකස් කළේ 1956 න් පසුව බව නිර්භයව ප්‍රකාශ කරනව. දුප්පත් විශ්ව විද්‍යාල සිසුන්ට ණය සහනයක් ඇතී කරන්ට පසුගිය අයවැය ලේඛනයෙන් මුදල් වෙන් කර තිබුණා. එහෙත් මේ අය වැය ලේඛනයෙන් එම මුදල් කපා හැර තිබෙන බව පෙනී යනව. මා මේ අවසථා වෙදි ඉල්ලා සිටිනව, දැනට විශ්ව විද්‍යාල වලට ඇතුළුවී සිටින ශිෂ්‍යයන්ටවත් ඒ ණය සහනය ලබා ගන්ට කටයුතු සල සන්න කියා. මගේ හැඟීම අනුව තමුන්නාන්සේලාගේ අයවැය ලේඛනයට විරුද්ධව ඡන්දය දෙන බව ප්‍රකාශ කරමින් මගේ වචන සවල්පය අවසාන කරනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආ. භා. 5.14

ගරු එම්. එච්. මොහමඩ්
(கௌரவ எம். எச். முகம்மது)
(The Hon. M. H. Mohamed)

Mr. Speaker, before I make my comments on the Budget proposals presented by the Hon. Minister of Finance, and on the speeches made by the Opposition, let me take this opportunity to congratulate the Hon. Minister of Finance on presenting for the first time, in this House, a progressive Budget. To appreciate this Budget, Mr. Speaker, it will be necessary for us to glance at the previous budgets. Only then the hon. Members of the Opposition will be able to appreciate the relief that has been given to the common man because they were trying to make out that this Government gave relief only to the capitalists.

Mr. Speaker, the public have appreciated this Budget. The public had stated without any distinction that this is the first time a Budget has been presented for the benefit of the ordinary working people. Mr. Speaker, to prove my case, the Budget was presented on the 9th of August. The Opposition parties organized a joint meeting to commemorate the hartal. They gave tremendous publicity to it and expected the working class people to come in large numbers to attend their meeting. They created the impression and tried to convince the working class people that this Budget is a Budget for the benefit of the capitalist.

So on the 12th of this month the Opposition had their meeting at Hyde Park and they expected a large crowd. The persons who were expected to address the meeting were not only the L.S.S.P. and the Communist Party but also the S. L. F. P. Mr. R. G. Senanayake and Mr. T. B. Ilangaratne were also scheduled to speak at this meeting. The meeting was held but it proved that the Budget had been a popular Budget and had been accepted by the people as the best Budget.

I wish to produce a picture here, Sir, which appeared in the "Ceylon Daily News" of August 13. The caption of the picture reads: "Perched upon a platform supported by building trestles, with banner in front and banner behind but few people to be seen, L. S. S. P's Dr. Colvin R. de Silva addresses a hartal commemoration meeting in Hyde Park, Colombo, yesterday evening. Also on the platform are Mr. D. G. William, the L. S. S. P. trade union worker, Mr. R. G. Senanayake, the Dambadeniya M. P., and Mr. T. B. Ilangaratne, representing the S. L. F. P. which took part in hartal celebrations for the first time." I wish to table this picture, Sir, so that it will go on record to show the success of the meeting against the Budget! I wish to table it—[*Interruption*].

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

I do not think it is necessary.

ගරු එම්. එච්. මොහමඩ්
(கௌரவ எம். எச். முகம்மது)
(The Hon. M. H. Mohamed)

I wish to table it. Then there is another picture in the "Forward" depicting a hartal meeting at Hyde Park, which has been taken in such a way as to show only the stage.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Are you tabling that also ?

**ගරු එම්. එච්. මොහමඩ්**
*(கௌரவ எம். எச். முகம்மது)*
(The Hon. M. H. Mohamed)

Yes, Sir.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

You can make a statement on it. It is not necessary that you should table it.

**ගරු එම්. එච්. මොහමඩ්**
*(கௌரவ எம். எச். முகம்மது)*
(The Hon. M. H. Mohamed)

If the hon. Members of the Opposition wish to see it I do not mind giving it to them.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

They would not have any objection.

**ගරු එම්. එච්. මොහමඩ්**
*(கௌரவ எம். எச். முகம்மது)*
(The Hon. M. H. Mohamed)

Sir, it has been proved beyond doubt that this Budget is the most popular Budget ever to be presented in this House. In the days gone by their hartal meetings were attended by thousands, but what has happened to these people now ? They are with us now, and not with them. I think this will convince the Opposition that the workers are with us.

Before I proceed to deal with the Budget I wish to bring another matter to your notice. Sir, the Borella electorate is in a very privileged position. I say so because all the other electorates have only the Members who won at the election in this House ; all the electorates are being represented in this House by the victors and the vanquished have disappeared. But, in the case of the Borella electorate, I find the victor as well as the vanquished within the four walls of this House, and that only in different capacities—I am down here, while the vanquished is up. I know that my speech will be reported in the "Daily News" and the "Times" but may I appeal to the reporter of the "Jana Dina" in the interest of my electorate to report my speech on the first page of the paper and also see to it that that speech is correctly reported.

Now, Sir, coming to my good Friend, the hon. Member for Yatiyantota (Dr. N. M. Perera), he was the other day bowling wild, most of them were no-balls and wide off the stumps. I am now bowling to the wicket for I cannot allow him to go scot free after making certain very serious charges against the Hon. Minister of Finance of this Government. The hon. Member for Panadura (Mr. Leslie Goonewardene) while speaking this morning said that he was glad that hon. Members had maintained a high standard in this Debate, but if he had listened to the hon. Member for Yatiyantota he would not have made that statement. I am sorry, the hon. Member for Yatiyantota is not here because he said that he was prepared to take just as hard as he gave and would not run away. I hope the hon. Member will read in the HANSARD what I have had to say about him.

Sir, it is not necessary for us to refer to the Budgets during the period of the late Mr. Bandaranaike. Let us take the Budgets of the Sirimavo period. The first Budget of the Sirimavo period was presented by the hon. Member for Dompe (Mr. F. R. Dias Bandaranaike). They are



Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[ගරු එම්. එම්. මොහමඩ්]

accusing us that we have given only a nominal reduction of a cent or two here and there and that we have made a reduction in the price of *alavangoes*. But I can assure you that this Government will give you a straight *alavango*.

Coming back to the Budget presented by the hon. Member for Dompe when he was Minister of Finance, this is what he did in his first Budget. He increased the minimum postage stamps on letters from 5 cents to 10 cents. The Opposition back-benchers who are now complaining that we have given only small reductions should listen to this recital of the things that their Government did during their regime. They burdened the people with taxes. They hit the people below the belt and today they come here and accuse us of having given only small reductions !

In the Budget of 1961-62 the duty on a box of matches was increased by 1½ cents ; the import duty on tobacco for the manufacture of cigarettes was raised by Rs. 8 per pound which added two cents to the cost of a cigarette. How can you condemn our Budget ? We have given relief to the people.

**මංගල මුණසිංහ මයා.**
*(திரு. மங்கள முனசிங்க)*
(Mr. Mangala Moonesinghe)

You bring it down !

**ගරු එම්. එච්. මොහමඩ්**
*(கௌரவ எம். எச். முகம்மது)*
(The Hon. M. H. Mohamed)

We brought down the price of rice too. What right have you to condemn this Budget—[*Interruption*]. It may be bitter medicine to you, but kindly give us a hearing. Import duties on motor spares were increased—motor spares and other sundry items.

**මංගල මුණසිංහ මයා.**
*(திரு. மங்கள முனசிங்க)*
(Mr. Mangala Moonesinghe)

Motor cars—[*Interruption*.]

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

When hon. Members hit they must be ready to take it back also, that is the sporting way of doing things. You have hit them and they are hitting you back. You must take it now.

**ගරු එම්. එච්. මොහමඩ්**
*(கௌரவ எம். எச். முகம்மது)*
(The Hon. M. H. Mohamed)

I hope the newspapers will give full publicity to this matter.

The price of sugar and flour was increased by five cents per pound. Can anybody deny that ?

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Will the Hon. Minister please address me ?

**ගරු එම්. එච්. මොහමඩ්**
*(கௌரவ எம். எச். முகம்மது)*
(The Hon. M. H. Mohamed)

This is how they gave a place in the sun to the common man ! There is an acute shortage of housing.

**මංගල මුණසිංහ මයා.**
*(திரு. மங்கள முனசிங்க)*
(Mr. Mangala Moonesinghe)

What have you done about that ?

**ගරු එම්. එච්. මොහමඩ්**
*(கௌரவ எம். எச். முகம்மது)*
(The Hon. M. H. Mohamed)

The import duty on cement was increased by them by 50 cents a bag. Cement is not used by capitalists.

**මංගල මුණසිංහ මයා.**
*(திரு. மங்கள முனசிங்க)*
(Mr. Mangala Moonesinghe)

What have you done about that ?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

We have thrown you out !

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු එම්. එච්. මොහමඩ්
(கௌரவ எம். எச். முகம்மது)
(The Hon. M. H. Mohamed)

I hope you will bear with me, Sir. It is very necessary to read the entire list.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

The Hon. Minister can read out what he wants but he must please address me.

ගරු එම්. එච්. මොහමඩ්
(கௌரவ எம். எச். முகம்மது)
(The Hon. M. H. Mohamed)

The import duty on sarees was increased by 10 per cent; the duty on kerosene oil was increased by 6½ cents a gallon; the duty on sarongs was increased by 20 per cent. and the duty on radio spare parts was increased by 25 per cent. Import duty on eggs was increased to Rs. 10. On iron and steel it was increased to 10 per cent. The duty on copper, brass, and so on, was also increased. I do not want to give the figures.

The fees under the Motor Traffic Act on driving licences and so on were increased. You hit the poor taxi driver below the belt. There was a Sales Tax of 7½ per cent. which you replaced with a 20 per cent. surcharge on import duty. That was the cause of the rise in the cost of living.

Then I must refer to that mad, stupid tax called the Foreign Exchange Tax of 25 per cent. In the 1963-64 T. B. Ilangaratne Budget, the duty on petrol was raised by ten cents per gallon.

I have referred to the Budgets presented by the hon. Members from Tumpane and Dompe. Now I come to the golden brains. The hon. Member for Yatiyantota is under the impression that he is the cleverest in this House. He may be a double doctor, he may be an economist but he lacks what is necessary to produce a Budget. You must have common sense to produce a Budget. Pure and simple common sense is sufficient to produce a decent Budget. He had all the qualifications but he had no common sense. That is unfortunate. But our Minister of Finance has not only common sense but also the common touch. That is the difference.

Mr. Speaker, this is what the golden brains who comes here and talks of doing big for the worker actually did. He increased the duty on petroleum products. He increased the price of super petrol by 12 cents a gallon, ordinary petrol by 10 cents, auto diesel oil by 7 cents, heavy diesel oil by 7 cents, furnace oil by one cent and lubricating oils by 20 cents a gallon. The duty on kerosene oil was increased to 10 cents a gallon. The excise duty on tobacco was increased to 50 cents a pound. That was how the so-called friend of the workers, of the working-class, who is now rejected by them, came here and presented the Budget about which he speaks so much.

Mr. Speaker, if you look at HANSARD you will see how very interesting is the speech of the hon. Member for Yatiyantota on this Budget. Referring to the Finance Minister's reference to the division of the country by conflicts of all kinds—communal, religious and linguistic, he says, "Wonderful! Who started all these?" Let it be anybody who created it. But today there is amity among all communities. Nobody can deny that. Therefore, they shamelessly fan the flames of communal discord and come here and talk big about communal unity. When the hon. Members opposite go to Jaffna they talk about communal unity; when they come here they speak differently. Some of their speeches really are not fit to be read because of the type of language they use. They will not be tolerated for long.

Every person who lives in this country should have equal rights as a citizen. He should have a right to live in this country. Nobody can deny that right. I ask you, can you deny that right? Can you deny me those

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එම්. එච්. මොහමඩ්]

rights because I am a Muslim ? You cannot do so. For 9 1/2 years you have been trying it and creating chaos in this country. This Government will not be a party to it, and it will see that all communities are united and the country prospers. May I point that out to the hon. Member for Yatiyantota ?

The main complaint of the hon. Member for Yatiyantota is that the Finance Minister had been mean. This is what he said at Column 198:

> "Yes. I did not hide anything. But you hide everything and you have been so mean that you do not give a little credit to those people who have done something."

What have they done ? Why should we give credit to you ? You have been rejected by the people. You have been condemned by the people.

> "It is so even in regard to the diesel oil tax. Does your Minister mention in this Budget what was done in the last Budget in regard to the diesel oil tax ? "—[Official Report, 18th August, 1965; Vol. 61, cc. 198-9.]

Why should we mention it? We condemned your Budget. This is what a double doctor, an economist, says. I do not want to be unkind and I do not want to refer to it. He wants to know why it was not implemented. He must ask the question from the Hon. fair Leader of the Opposition why his proposal was not implemented. Why is he asking us? We cannot answer that question. The question will be answered by the hon. Member for Attanagalla (Mrs. Sirimavo R. D. Bandaranaike).

The word " mean " was used by the hon. Member for Yatiyantota. I know the hon. Member for a long time. During my municipality career, he was the Mayor. I remember I moved a Motion on 1st October for the removal of Dr. N. M. Perera. He talked of meanness. I will show how Dr. N. M. Perera has been behaving in the past for the information of the backbenchers who think he is a great hero. I moved a Motion for his removal. The reason for the Motion was this: One of the members of my ward, a Buddhist priest, wrote a letter to the Mayor making certain complaints about stray cattle and the nuisance created by a municipal drain. This was addressed to him as Mayor of Colombo, Dr. N. M. Perera.

When I visited the Buddhist temple in my ward, the Buddhist priest told me that though he had written a letter to the Mayor, a person had called on him with the original letter written by him who purported to be the president of the Maligawatte L. S. S. P. Branch. I felt very annoyed and insulted. When a person writes a letter complaining to the Mayor about a particular matter, instead of communicating with me or getting the official of the municipality to communicate with the complainant, the Mayor, in other words, with the idea of winning back the Maligawatte Ward, forwards the letter to his party branch and requests his party man to make inquiries. The Mayor did not deny it. He could not deny because I had the original letter with me. He said, " Yes, I did it ". In other words, his argument was that the Buddhist priest had written a letter and that he would have communicated with me, but as the letter came direct to him he wanted some information and he sent it to his party office. This is how the hon. Member has been behaving. I would like to know whether it is correct behaviour or whether it is mean. I would like to know from the Opposition whether it is mean or gentlemanly to hit a man below the belt. I think the hon. Member for Dambulla (Mr. T. B. Tennekoon) can answer that question.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

How is it relevant to this Debate?

ගරු එම්. එච්. මොහමඩ්
(கௌரவ எம். எச். முகம்மது)
(The Hon. M. H. Mohamed)

He used the word " mean ". I want to show that he had been meaner—that is all. Unfortunately, he is not here.

Digitized by Noolaham Foundation. noolaham.org | aavanaham.org

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

I just want to know how it is relevant. Yes, go on.

ගරු එම්. එච්. මොහමඩ්
(கௌரவ எம். எச். முகம்மது)
(The Hon. M. H. Mohamed)

I want to bring this to your notice. He is not the Speaker of this House. He is in the habit of asking Members to sit down, and when he addresses the Ministers—I hope you will take special note of the hon. Member—he speaks thus. : "I say, you sit down!" He said once, "childish statement". I do not mind that. But he also said this: "If you do not know what you are talking, keep your mouth shut." The hon. Member for Panadura (Mr. Leslie Goonewardene) said that the Debate was of a high standard. This is what I replied to him: "There is a limit to stupidity". Anyway, this is neither here nor there. I only want to point out to you that we are under your protection in this House, you have always been protecting our rights, and I hope that you will make a special note to see to it that when the hon. Member for Yatiyantota addresses a Minister he does so as "Mr Minister" or "Hon. Minister", and not "You sit down!" That is not fair, because he is a pundit on constitutional procedure and he should know better.

The hon. Member for Yatiyantota asked the question, "These are the benefits you have granted to the capitalist class, but what did you give to the poor?", and he also stated that we have been giving all the encouragement to the private sector. We do not deny that. It is our position that the private sector is necessary in a democratic society. Nobody can deny that. He says that we have been giving incentives to the private sector, but during their time they have been investing on their own about Rs. 385 million. That is what he said. He said that the private sector had confidence in them and he read out certain reports from different papers. I would like to read for the information of hon. Members this statement from the presidential address delivered by one Mr. Senanayake as President of the Chamber of Ceylonese Merchants by Descent :

"I consider it a great pleasure and privilege to be given the opportunity of being welcomed to this our second Annual General Meeting. I am sad to say when I addressed you last year our position was very unstable. I may go so far as to say that the private sector was doomed. However, with the coming into power of the National Government there is the assurance given in the Throne Speech that the private sector would be protected. I am happy to say that our future is now bright and we can breathe more freely."

The hon. Member for Yatiyantota was trying to make out that during their time the private sector had the utmost confidence in them. That is not true ; it is absolutely false to say so. How can they have confidence in Marxists? The Marxists do not believe in the private sector or in freedom. How can they say so? We have given the private sector incentives because they had been suppressed. They could not expand. Today, we feel that the private sector should be encouraged. We openly say so and make it absolutely clear that the private sector will be given all encouragement.

But may I point out to the private sector on this occasion that we have given them all these incentives and it is the duty of the private sector to co-operate with this Government, to join this Government in its ventures and to see that the country is developed. That is the purpose for which all these incentives have been given. It is not to fatten the private sector. That fact must be clearly understood by all. We have given these incentives instead of taking their money in the form of taxes. We want to help the private sector to use that money for development purposes. That is the reason why these incentives are offered. We are not giving them an open cheque or a blank cheque. That has to be clearly understood by every one.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එම්. එච්. මොහමඩ්]

The hon. Member for Yatiyantota (Dr. N. M. Perera) spoke about planning. He referred to a Ten-Year Plan, a Three-Year Plan and his own One-Year Plan. But I would like to say that they were lucky that Parliament was dissolved. If Parliament had continued I am certain the people would have had a plan of their own to skin them alive. The hon. Member and his followers would not have been able to walk on the streets. They would have been pelted with stones if the planning of the hon. Member had continued. The people had nothing to eat for three long years. Certainly, the people would have had their own plan to skin them alive for what had happened to them. I hope, Sir, that I am not using hard words, but this is the type of language they understand.

Before I come to the question of worker-participation which the hon. Member has referred to, I wish to refer to this statement :

"In all sincerity I think this Budget is a fraud. This Government came into existence as a result of a fraud."

Who is talking ? The hon. Member for Yatiyantota, a man who had deceived the working class for 30 years, who had misled them, whose party had been rejected by them. A man of that type is talking. He says further :

"It came into existence with the support of the Federal Party, Mr. Thondaman's Congress and so on. . . . "

I want to ask a question. You will remember the time when the hon. Member went to Nuwara Eliya and played a game of cricket. I want to know whether they had a mandate from the people to play cricket and then join hands with the S. L. F. P. to form the Coalition Government. Did they have a mandate then ? Was that not a fraud and a deception ? I ask the hon. Member for Yatiyantota (Dr. N. M. Perera). That is the biggest fraud that has ever been perpetrated on this country—the Coalition Government.

In regard to his reference to the Federal Party and Mr. Thondaman, I wish to tell him that we are a National Government ; we are not hiding anything from anybody. We say that we are a Government consisting of the Federal Party and Mr. Thondaman's Congress and the S. L. F. S. P. and the M. E. P. We are not hiding anything from anybody. We have made it quite clear.

The reason is that they have been responsible for the downfall of the Sirima Bandaranaike Government. We were together at that time, we are together now and we will continue to be together until we see our country freed of Marxism.

The hon. Member for Panadura (Mr. Leslie Goonewardene) spoke of atom bombs. He said that America had smuggled atom bombs into this country, but I want to tell you that our atom bomb is Mrs. Bandaranaike —I am sorry—the hon. fair Member for Attanagalla. She will destroy the S. L. F. P. and, therefore, we have to be grateful to her. I hope she will use the atom bomb very soon.

My good Friend, the hon. Member for Yatiyantota, (Dr. N. M. Perera) always talks and then thinks. You will recall that the Hon. Minister of Finance in his Budget speech said that the Government intended to appoint a commission to go into the question of profit-sharing. But the hon. Member for Yatiyantota, without knowing what the scheme or the plan would be, without knowing the details, says this :

"Do not talk about something you do not know. Profit-sharing is not something new. It has gone on for a hundred years."

I do not know in which country it has gone on for a hundred years—

"It had been tried in various countries and it has always failed. It has never succeeded. You can have your fanciful ideas of profit-sharing but they will never succeed."

For the information of the hon. Member, may I point out that it has been carried on very successfully in England and other democratic countries.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

He goes on :

"Why should a worker join in profit-sharing in lieu of increased wages and when it is dependent on the employer's incapacity, dishonesty and cooked-up figures."—[OFFICIAL REPORT, 18th August, 1965 ; Vol. 61 ; c. 283-284].

I think it is very unfair for the hon. Member to have spoken in these terms on that matter without knowing the details. The Hon. Minister has said that he proposes to appoint a committee in regard to that matter. The hon. Member has every right to go before that committee and express his views, but to make such statements as he has made before the details are known is unfair.

I am going to mention this matter at every public meeting. I am going to bring it to the notice of the workers that before the scheme has been formulated the hon. Member for Yatiyantota has already decided to oppose it. He is opposing a scheme even before it comes into existence. Is that fair ? Is that just ? This is the type of argument and talk put forward by the hon. Member for Yatiyantota.

Then the hon. Member for Baddegama (Mr. Neal de Alwis) made certain references to the Labour Department. He said in his speech that labour officers are guided by the Employers' Federation. He said that retired labour officers are employed by the Employers' Federation and they are able to influence the Labour Department.

May I appeal to the hon. Member, without making irresponsible statements in this House, to bring to my notice specific cases. If a particular case is brought to my notice, I shall investigate it. In fairness to the officers of the Labour Department, it is not proper for an hon. Member to come to this House and to make charges of this nature without definite proof.

I would therefore appeal to the hon. Member, in future, to bring these matters to my notice first, and if he does not receive a satisfactory reply he is then welcome to place them before the House.

The hon. Member also referred to certain regulations. The Industrial Disputes Act was not formulated by the National Government ; it was done during the period of the late Mr. Bandaranaike. That Act has not been amended. Unless it is amended it is very difficult to offer any relief to the workers. I have brought that to the notice of the Government and the Government is now giving due consideration to amend the Industrial Disputes Act in order to give speedy and immediate relief to the workers. That is all I have to say about that particular matter.

It is true that a large number of labour disputes are pending. That is a legacy that has come down to us from the previous Minister of Labour. For four and a half years he was in office but still they are accusing this Government for the delay in the disposal of these cases. Nine thousand cases have been pending from their time. It is the National Government that is taking action to expedite them. If the former Minister of Labour wishes to contradict me I am prepared to give way.

එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා. (මිනුවන්ගොඩ)

(திரு. எம். பீ. டி சொய்சா சிறிவர்தன—மினுவாங்கொட)

(Mr. M. P. de Zoysa Siriwardena—Minuwangoda)

Carry on !

ගරු එම්. එච්. මොහමඩ්

(கௌரவ எம். எச். முகம்மது)

(The Hon. M. H. Mohamed)

Why blame us ? We must blame you for the delay. We have already taken action to appoint Labour Officers, Presidents of Labour Tribunals, stenographers and interpreters. I feel that once these appointments are made a large number of these cases could be disposed of quickly. I think, my predecessor will agree with me.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එම්. එච්. මොහමඩ්]

He had made certain references to my Labour Department. I do not think it is necessary to deal with every item he has raised. Action has already been taken to put things in order as early as possible.

Hon. Members of the Opposition accuse us of being reactionaries. They are the progressives in this country! I ask the previous Government what action they had taken to provide amenities to the workers. We are aware of the type of contract labour system that has existed in this country. There was exploitation of labour in its worst form. What action did you take to remove exploitation? Marxists have encouraged that system so that they could have control over the workers. The present Government has approved a Bill to control the employment of labour by contractors and it is before the Legal Draftsman. Is that a progressive or reactionary step?

With regard to sanitary and welfare facilities, if you go today to a workplace you will find that conditions are terrible: the workers have no place to wash themselves, to ease themselves and to have their meals. I would like to know from the so-called labour leaders and the last Government what action they took to provide these amenities to the workers. You did nothing. I am happy to inform the House that regulations to provide amenities to the workers are being framed and they will be placed before this House very soon. I would like to ask you whether that is a progressive or reactionary step.

Well, Sir, they were talking about unemployment. There are many other Bills I am bringing forward. One is the employer-employee participation in profits management. Already the Government has approved it and the Bill is with the Legal Draftsman.

Regarding legal aid to trade unions, this matter is receiving my careful consideration. My personal view is that no lawyer should be permitted to appear before a tribunal in fairness to the worker. The industrial dispute will serve no useful purpose if the lawyer comes there and makes it a small Hultsdorp. In England, if there is a dispute between the employer and the employee, the employer, employee and the President of the tribunal sit across the table and discuss the dispute and whatever award is given is accepted by both parties. There is no reason why an outsider should come and try to influence somebody. This matter is receiving the attention of the Government and, I am sure, it will be placed before the House soon.

In regard to Vocational Training, the Government has decided to have double sessions. To begin with, the Urugodawatte Vocational Training Centre will have double sessions and take in an additional 200 students. That is the easiest way to increase the intake of students. Once they are trained they could find employment without any difficulty. The Government has felt that it should be encouraged.

I do not want to dwell in detail regarding employment. I have already taken one hour. I wish to touch on the matter of employment. The Members of the Opposition are making a big fuss. They say there are 500,000 unemployed and want to know what we have done. I want to bring to the notice of the Opposition a very interesting matter. The two Bandaranaike Governments have been trying to tackle this problem from 1956 and even today they have not tackled it. They have now allowed us to tackle it and I make bold to say we will tackle it.

In 1956 a sub-committee was appointed. What have they done? I ask my predecessor, what have you done? You have probably enjoyed a cup of tea and done nothing else. From 1956 to 1961 this sub-committee has had eleven meetings. How can you solve a problem by having eleven meetings for five years? That sub-committee was re-constituted in 1961. They have had six meetings and nothing has come out of it. I think

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

that committee is no more. A new committee was appointed by this Government on the 25th of May 1965. The interim report of the Cabinet Sub-Committee on unemployment is already before the Cabinet and the Cabinet has approved it. This report gives details of the proposals of the sub-committee. This is the work that we are doing and after sitting there for 4½ years doing nothing, I ask, what right have you to criticize us when we have been here only for five months ?

මංගල මුණසිංහ මයා.
(திரு. மங்கள முனசிங்க)
(Mr. Mangala Moonesinghe)

You sat there for nine years before doing nothing.

ගරු එම්. එච්. මොහමඩ්
(கௌரவ எம். எச். முகம்மது)
(The Hon. M. H. Mohamed)

What we did nine years before is not the question.

මංගල මුණසිංහ මයා.
(திரு. மங்கள முனசிங்க)
(Mr. Mangala Moonesinghe)

Why not ?

ගරු එම්. එච්. මොහමඩ්
(கௌரவ எம். எச். முகம்மது)
(The Hon. M. H. Mohamed)

If you were so efficient you should have solved in 9½ years what we could not do for 9 years, according to you. Why did you not solve it ? You were incapable of running a government, incapable of shouldering the responsibilities of government. And yet you come here and ask what we did for nine years.

මංගල මුණසිංහ මයා.
(திரு. மங்கள முனசிங்க)
(Mr. Mangala Moonesinghe)

83,000 unemployed when you left.

ගරු එම්. එච්. මොහමඩ්
(கௌரவ எம். எச். முகம்மது)
(The Hon. M. H. Mohamed)

According to the hon. Member, the figure was 83,000 when we left. They have increased it to 500,000. That is the efficient way in which they have solved the unemployment problem in this country. If they go and tell the people that, the people will give them right royal treatment. They come here now and talk of an unemployment figure of 83,000. [*Interruption*].

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

If hon. Members keep on disturbing, how can we go on with this Debate ? The time is limited. The Hon. Minister had one hour and he has only seven minutes left. He is making out a case for himself. Hon. Members can attack it, tear it to pieces if they like, if they are capable of doing so. I want order in this House, please.

ගරු එම්. එච්. මොහමඩ්
(கௌரவ எம். எச். முகம்மது)
(The Hon. M. H. Mohamed)

I want to make one point clear. This Government has been elected by the people. The Public Service must realize that this is a Government established by the people and that we are here to serve the people. It is a Government of the people, not a Government of the Government servants. I have to give them a warning. There has been sabotage, as we have heard. There are loyal Government servants, and we must give them all credit. There are, however, a few in Government departments who are Marxists. They are carrying on a vicious campaign against this Government. They have formed themselves into party cells, I am told. They are acting according to instructions given by their party headquarters. The Inland Revenue Department has eight of them. I can give their names, but I do not think the Hon. Minister of Finance will like my doing so.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

The Hon. Minister need not mention names.

**ගරු එම්. එච්. මොහමඩ්**
*(கௌரவ எம். எச். முகம்மது)*
(The Hon. M. H. Mohamed)

I shall mention the names to the Hon. Minister of Finance. The hon. Member for Yatiyantota read out a certain document and that document was given out from the Inland Revenue Department. My information is reliable. The hon. Member got that copy from the Inland Revenue Department through a clerk. This campaign is operated in the following manner :

(1.) Sabotage by malicious and false propaganda ;

(2.) Practical sabotage by active participation in it.

1. (*a*) In regard to the first type of sabotage, propaganda against the National Government is carried on by Marxists in the Public Service who have been well trained in party "cells". They and their sympathizers start conversations with others on subjects of topical interest and attribute various false reasons and motives and try to explain or interpret newspaper reports in a most hideous and appalling manner ; at the same time they speak of the so-called blessings of Marxism and Leninism. This is purely to create restlessness and indiscipline and also to tend them to flout authority.

(*b*) Propaganda is also carried on during working hours by selling magazines, news sheets and periodicals published by Marxist parties.

2. (*a*) Sabotage is also taking place in other calculated ways. Deliberately and intentionally, a go-slow policy is adopted. This results in accumulation of work.

(*b*) Shoddy and incomplete work by subordinate officer when a file or case is sent up to his superior officer creates multiplicity of work and consequent loss in numerous ways.

(*c*) In this situation the necessity to work overtime arises. Overtime thus created is undoubtedly an unnecessary drain on the nation.

(*d*) It is also stated that stationery and forms are being wasted by the saboteurs, by allowing open ink wells to dry up, and using printed forms to clean their desks, etc.

(*e*) Members of the public who call over at government offices and who are ignorant of procedural methods are made to go from pillar to post instead of giving them the correct information.

In this manner, they try to make this Government unpopular. I have got a long list of alleged acts of sabotage which I do not want to read out. I am handing it over to the Hon. Minister of Finance to look into the matter fully and take approximate action.

I want to speak a few words about housing. The Government has already prepared legislation which would provide sufficient incentives for putting up houses that could be given out at low rentals. Many people are today in difficult circumstances due to lack of suitable housing accommodation. We are going to offer incentives. I do not want to go into details at present, but I can assure you that incentives will be offered for building houses. While on this subject of housing, I would like to know from the former Minister how many houses they built during their regime. If I remember right, the figure is 1,500 houses for 4½ years. I have prepared a scheme in respect of which I have already called for tenders. The Hon. Prime Minister will be laying the foundation-stone on October 8th for the first housing scheme. As the Hon. Minister of Industries remarked, the previous Government consisted of fast workers, but they are only workers, they cannot deliver the goods. I can assure you that I am a fast worker and that I am quite capable of delivering the goods too.

I do not think it is necessary to speak any further, and I do not want to take any more of your time. May I appeal to hon. Members on the other side who love democracy and who want to preserve individual freedoms —there is no freedom in Marxism ; they do not believe in individual freedoms—to support us and give us their co-operation. I can see the hon. Member for Minuwangoda (Mr. M. P. de Zoysa Siriwardena) looking at me, and I hope he will be convinced

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

before long that if the Marxists get the chance they will eliminate them first. I can assure you that if they get their chance none of you will be safe, and, therefore, I appeal to you all who have respect for democracy and religion not to be guided by them.

ද සොයිසා සිරිවර්ධන මයා.
(திரு. டி சொய்சா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)

They are following us.

ගරු එම්. එච්. මොහමඩ්
(கௌரவ எம். எச். முகம்மது)
(The Hon. M. H. Mohamed)

You mark my words. I will not be surprised if in about six months they say that you are following them. I want to point out as a Muslim that Marxism is against religion. I love my religion and have the greatest respect for my religion. Marxists do not love any religion. You may have read in the local papers that in U. A. R., the highest authority, Al-azhar University, the oldest Muslim institution, has given a ruling to the Muslims that a Muslim is forbidden to marry a Marxist. If you marry a Marxist, you are not a Muslim. We have the greatest respect for the U. A. R., which they call a socialist country, a progressive country, and for the ruling given by the highest authority there that a Muslim is forbidden to marry a Marxist because a Marxist is an atheist. I hope you will realize your folly sooner or later. Do not be guided by a lady.

ද සොයිසා සිරිවර්ධන මයා.
(திரு. டி சொய்சா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)

The Hon. Minister of State stated that even they were following Mr. Bandaranaike's policies.

ගරු එම්. එච්. මොහමඩ්
(கௌரவ எம். எச். முகம்மது)
(The Hon. M. H. Mohamed)

He is not a lady!

ද සොයිසා සිරිවර්ධන මයා.
(திரு. டி சொய்சா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)

The lady is following the policies of her husband.

ගරු එම්. එච්. මොහමඩ්
(கௌரவ எம். எச். முகம்மது)
(The Hon. M. H. Mohamed)

When you call him a lady, Mr. Bandaranaike must be turning in his grave.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

The Hon. Minister is going out of the point.

ගරු එම්. එච්. මොහමඩ්
(கௌரவ எம். எச். முகம்மது)
(The Hon. M. H. Mohamed)

Sir, may I point out that they will realize their folly very soon.

ද සොයිසා සිරිවර්ධන මයා.
(திரு. டி சொய்சா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)

Sir, he is addressing me, and that is why I have to reply.

ගරු එම්. එච්. මොහමඩ්
(கௌரவ எம். எச். முகம்மது)
(The Hon. M. H. Mohamed)

I have a soft corner for the ex-Minister.

ද සොයිසා සිරිවර්ධන මයා.
(திரு. டி சொய்சா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)

I am glad that—

ගරු එම්. එච්. මොහමඩ්
(கௌரவ எம். எச். முகம்மது)
(The Hon. M. H. Mohamed)

The hon. Members who love democracy should know that they have no place on that side. If you realize it we welcome you to our side at any time. Many of them have decided to

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එම්. එච්. මොහමඩ්]

come over to this side but we have told them, " Please do not be in a hurry, we will let you know." Sir, four hon. Members on that side have spoken about it and we had told them, " Please do not be in a hurry ". I would not tell a lie in this House.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Order, please! The Hon. Minister has almost exhausted the time allotted and is going outside the Budget.

**ගරු එම්. එච්. මොහමඩ්**
*(கௌரவ எம். எச். முகம்மது)*
(The Hon. M. H. Mohamed)

Sir, I thank you for permitting me to speak at some length.

One last word: May God bless this Government to carry on its programme of work.

අ. භා. 6.15

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Order, please! The Deputy Speaker will now take the Chair.

**අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායක තැන්පත් සී. එස්. ෂර්ලි කොරයා මයා. මූලාසනාරූඪ විය.**

*அதன்பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று நீங்கவே, உபசபாநாயகர் [திரு. சீ. எஸ். ஷேர்லி கொறயா] அக்கிராசனத்தமர்ந்தார்.*

*Whereupon* MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY SPEAKER [MR. C. S. SHIRLEY COREA] *took the Chair.*

**රත්නසිරි වික්‍රමනායක මයා. (හොරණ)**
*(திரு. ரத்னஸிரி விக்ரமநாயக்க—ஹொறணை)*
(Mr. Ratnasiri Wickramanayaka—Horana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික යයි කියා ගන්නා මේ ආණ්ඩුවේ පළමුවැනි අයවැය ලේඛනය දැන් මේ ගරු සභාවේ සාකච්ඡා කරගෙන යනවා. ජාතික ආණ්ඩුවේ කථාවලින් මා ඉතාමත් ආශාවෙන් බලාගෙන සිටියේ කර්මාන්ත හා ධීවර කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමාගේ කථාවට සවන් දීමටයි. කාරණා ගණනාවක් උඩයි ඒ ඇමතිතුමාගේ කථාවට සවන් දීමට මා ආශාවෙන් බලාගෙන සිටියේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1960 මාර්තු මැතිවරණයේදී වර්තමාන ධීවර හා කර්මාන්ත ඇමතිතුමාගේ නායකත්වය යටතේ දේශීය සහ විදේශීය ධනපතීන්ට විරුද්ධව අප ඒකරාශිවී මහජන එක්සත් පෙරමුණ යටතේ එක්සත් ජාතික පක්ෂය යට විරුද්ධව සටනක් මෙහෙයවූවා. මෙහෙයවා ආධුනිකයින් වශයෙන් අප මේ පාර්ලිමේන්තුවට ආවාට පසුව, මට මතකයි, එදා එක්සත් ජාතික පක්ෂයේ තාවකාලික ආණ්ඩුවට සහයෝගය දීමට ඔහු යෝජනාවක් ඉදිරිපත් කළ බව. ඒ යෝජනාවට විරුද්ධව අධි කණ්ඩායමක් විරුද්ධ වීමේ ප්‍රතිඵලයක් වශයෙන් අපව මහජන එක්සත් පෙරමුණෙන් නෙරපුවා. එපමණක් නොවෙයි, නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාගේ කථාවට සවන් දීමට මා තුළ ආශාවක් තිබුණේ ඒ කාරණා නිසා පමණක් නොවෙයි. ඇත්ත වශයෙන්ම මා එතුමාට එදත් ගරු කළා; අදත් ගරු කරනව. මන්ද, මා තුළ විශ්වාසයක් තිබෙනව, ඔහුට යම්කිසි වැඩ කොටසක් භාර දුන්නොත් ඒ භාර දුන් වැඩ කොටස ක්‍රියාවට පරිවර්තනය කිරීමට ඔහුට ශක්තියක් තිබෙන බවට. අද මේ අළුත් ජවනිකාවක රඟපාන එතුමාගේ කථාවට සවන් දීමෙන් පසු සමාජවාදය පිළිබඳව අළුත් පාඩමක් ඔහු අපට ඉගැන්වූ බව මට කණගාටුවෙන් කියන්නට සිද්ධවී තිබෙනව.

රදළ පවුලකට අයත් සිරිමා බණ්ඩාරනායක, අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමිය සමග එකතුවී ලංකාවේ සමාජවාදයක් ගොඩනංවන්නේ කෙසේද කියා එතුමා අපෙන් ප්‍රශ්නයක් ඇසුවා. අහේතුවකට මෙන් කර්මාන්ත හා ධීවර කටයුතු පිළිබඳ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ඇමතිතුමා දැන් මේ සභාවේ නැහැ. එදා මාර්තු මාසයේ මැතිවරණයෙන් පසු මේ රටේ ජාතික ආණ්ඩුවක් පිහිටුවන්නට වුවමනාය කියා යෝජනාවක් ගෙනැවිත් ඒ යෝජනාව ප්‍රතික්ෂේප වූවාට පසුව තනියම ආණ්ඩුවක් පිහිටුවීමේ අදහසින් ඔහු ජනතාව ඉදිරියට ගියා. ඊටපසුව ඒ ඇමතිතුමා තමාගේ මහජන එක්සත් පෙරමුණත්, ලංකා සමසමාජ පක්ෂයත් ලංකා කොමියුනිස්ට් පක්ෂයත් සමග එකතුවී වාමාංශික එක්සත් පෙරමුණ නමින් සංවිධානයවී වැඩ පිළිවෙළක් ලංකාවේ ගෙන ගියා. ඒ කරුණු අපට අමතක වී නැහැ. ඒ අවදියේදී එතුමා අනෙක් පක්ෂ දෙකට නොකියා එදා තිබුණු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවට ඇතුල්වීමට හොරෙන් සාකච්ඡා කළාද නැද්ද කියා ප්‍රශ්න කරන්නට සතුටුයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ඇතුළුවීමට එසේ කළ රහස් සාකච්ඡා නිසා එතුමා එදා ඒ මාක්ස්වාදී පක්ෂ දෙකට හානියක් කළා පමණක් නොවෙයි, ඒ පක්ෂ තුන අතර තිබුණු යම් යම් සම්බන්ධකම් හා ප්‍රතිපත්ති ගණනාවකටත් හානි කළා. එසේ කළ එතුමා අද අපෙන් ප්‍රශ්න කරනව, රදළ පවුලකට අයිති සිරිමා බණ්ඩාරනායක මැතිනිය යටතේ සමාජවාදයක් ගොඩනංවන්නේ කොහොමද කියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා අපට චෝදනා ඉදිරිපත් කළ නිසයි මේ තර්ක ඉදිරිපත් කරන්නට සිද්ධවී තිබෙන්නෙ. අවංක නායකත්වයක් යටතේ අප දේශපාලන භූමියට පැමිණෙන්නට අදහස් කළේ අවංක සේවයක් කරන්ටයි. නමුත් එදා එකක් කියා, අද තව එකක් කියා හෙට තවත් එකක් කියන්නට පුළුවන් නම් එය නායකත්වයේ අවංකභාවයද කියා අප ඒ ඇමතිතුමාගෙන් අසන්නට ඕනෑ. එපමණක්ද? මට මතකයි, එදා එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවට ඇතුළුවීමේ වැඩ පිළිවෙළ ගැන සාකච්ඡා කරගෙන යද්දී, එදා ඒ රජයේ සිටි ඉඩම් ඇමතිතුමා ඉවත් කරන තුරු, ඒ ඉඩම් ඇමතිතුමා සිටිනතුරු තමා කවදාවත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවට එකතු වන්නේ නැත කියා එතුමා කීවාද නැද්ද කියා අප ප්‍රශ්න කරනවා. එහෙම කථාවකුයි එදා එතුමා කිවෙ. ඒ විධියට එක් එක් අවස්ථාවට වෙනස් වෙනස් දේශපාලන න්‍යායන්, ධර්මයන් ඉදිරිපත් කරමින් තමයි එතුමා තමාගේ වැඩ පිළිවෙළ ගෙන ගියෙ. එසේ කළ එතුමා අද මේ ගරු සභාවට පැමිණ අපට දොස් කියනව, රදළ පවුලකට අයත් සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මිය සමග කෙසේ සමාජවාදයක් ගොඩනැංවිය හැකිද කියා. නමුත් අවංක වශයෙන් කියනවා නම්, දේශීය සහ විදේශීය ධනපතීන්ට විරුද්ධව සටන් කිරීමට නායකත්වයක් නැතිව සිටියදී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකත්වය ගැනීමට ඉදිරිපත්වීම ඇත්ත වශයෙන්ම ජාතියේ අනාගතයේ යහපත් ලක්ෂණයක් බව මා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. ඒ ගරු ඇමතිතුමා එදා පස්සට ගිහින් දේශපාලන ලෝකයේ අලුත් මුහුණුවරක් ගෙන දේශීය ධනපති පන්තියත් සමග ආණ්ඩුවක් හදන්නට ගියාට ඔහුගේ ගෝලයන් වන අපි ඔහුගේ පාඩම්වලින් ඉගෙනගෙන ඒ මාර්ගය ඔස්සේ නොගොස් ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුවත් සමග සමගිව වමේ කඳවුරක් වශයෙන් නියම සමාජවාදී මාර්ගයේ තව තවත් ගමන් කරන්නට පටන් ගත්තා. අද අපට ගමන් කරන්නට සිදු වී තිබෙන්නේ කලකිරී සිටින ජනතාවක් ඔස්සේයි. ජනතාවගේ ඒ කලකිරීම ඔස්සේම, අලුතෙන් සමාජවාදයක් ගොඩනඟන්නට යන ඒ ඇමතිවරයා විතරක් නොව ඒ ඇමතිතුමා සිටින ආණ්ඩුවත් වැඩි කලක් යන්නට මත්තෙන් නෙරපා දැමීමට අවස්ථාවක් එළඹෙය කියා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අයවැය ලේඛනය සාකච්ඡාවට භාජනය කරන මේ අවස්ථාවේදී අප තුළ විශ්වාසයක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු කර්මාන්ත ඇමති තුමා එතුමාගේ කථාවේදී තවත් කරුණු දෙකක් තුනක් ගැන සඳහන් කළා. කර්මාන්ත ඇති කිරීම සම්බන්ධයෙන් අදහස් ගණනාවක් එතුමා විසින් මේ ගරු සභාවේදී සඳහන් කරන්නට යෙදුණා. ඒවට සමහර විට මා එකඟ වන්නට පුලුවන්. අමු ද්‍රව්‍ය ඇති, ගමනාගමන පහසුකම් ඇති, ජල ගැලීම් වලින් යට නොවන ස්ථානවලයි කර්මාන්ත ශාලා ඇති කළ යුත්තෙ. මම ඒ තර්කය පිළිගන්නවා. ඒ එක්කම, මේ රටේ පළමු වැනි වරට කාර්මික වැඩ පිළිවෙලක් ඇති වුණේ 1956 දී ඒ ඇමතිතුමාත් එක්කාසු වී බණ්ඩාරනායක මහතා යටතේ පිහිටු වන්නට යෙදුණු ආණ්ඩුවෙන් බව ඒ ඇමතිතුමාත් පිළිගන්නට ඕනෑ. එදා ක්‍රමවත් වැඩ සැලැස්මක් නොතිබුණු බව මා පිළිගන්නවා. අදත් ක්‍රමවත් වැඩ සැලැස්මක් තිබෙනවා යයි මම හිතන්නෙ නෑ. එදා ක්‍රමවත් වැඩ සැලැස්මක් නො තිබුණු නමුත් රට කාර්මික කිරීමේ මුල් පියවර තැබුවේ 1956 දී ඒ ඇමතිතුමාත් එකතු වී ඇතිකළ ආණ්ඩුව නේද කියා මම ප්‍රශ්න කරනවා. ඒ ඇමතිතුමා යම් කිසි වැඩ කොටසක් කළාය කියා පෞද්ගලික වශයෙන් මගේ හැඟීමක් තිබෙනවා. නමුත් අදත් ක්‍රමවත් වැඩ සැලැස්මක් ඇති වී නැති බව මෙම අය වැය ලේඛනය දෙස බලන විට අපට පෙනී යනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඕනෑම වැඩ සැලැස්මක් නියම විධියට ක්‍රියාත්මක කරන්නට නම් රටේ ජනතාව අතර සමගියක් ඇති විය යුතු බව අප කවුරුනුත් පිළිගත යුතුයි. ඒවාගේම ජනතාවට බියෙන් තොරව ජීවත් වීමට අවස්ථාව තිබිය යුතුයි. ආණ්ඩුව කෙරෙහි ජනතාවගේ විශ්වාසයක් තිබිය යුතුයි. යම් කිසි වැඩ කොටසක් ක්‍රියාත්මක කිරීමේ ශක්තියක් ඇති සංවර්ධන යෝජනා ක්‍රම ක්‍රියාවට පරිවර්තනය කිරීමේ ශක්තියක් ඇති ආණ්ඩුවක් තිබිය යුතුයි. පළි ගැනීම්වලින් තොර ජනතාවට සාමයෙන් ජීවත් වීමේ අවස්ථාව සලසා දෙන ආණ්ඩුවක් තිබෙනවාය කියා මහජනතාව තුළ විශ්වාසයක් තිබිය යුතුයි. මෙන්න මේ විධියේ වාතාවරණයක් ඇති වුණාට පසුව පමණයි සංවර්ධන වැඩ සැලැස්මක් ක්‍රියාත්මක කරන්නට පුළුවන් වන්නෙ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මුදල් ඇමතිතුමා ඔහුගේ කථාවේ අන්තිම කොටසින් ජනතාවගේ සහයෝගය ඉල්ලා තිබෙනවා. රජයේ සේවකයින්ගේ සහයෝගය ඉල්ලා තිබෙනවා. රජයේ සේවකයින්ගේ සහයෝගය ඉල්ලන්නේ ඔවුන්ට නොයෙකුත් කරදර කිරීමෙන් පසුව නේද කියා මේ අවස්ථාවේදී මම අහන්නට ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා චෝදනාවක් කරනවා නොවෙයි. ගුරුවරුන් ගැන කල්පනා කර බලන්න. අද ගුරුවරුන් මාරු කරනවා, ඔවුන්ගේ වැඩ නවත්වනවා. අනිකුත් සේවකයන් ගැනත් ඒවගේමයි. ලංගම සේවකයින් හිටි හැටියේ මාරු කරනවා. ඔවුන්ට ඒ විධියට කරදර කොට ඔවුන්ගේ සහයෝගය ලබා ගන්නට පුලුවන්ද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? ඔවුන් තුළ ඇති වන්නේ කලකිරීම් නේද? හිත් වේදනා නේද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යම් කිසි ආණ්ඩුවකට, ඊට විරුද්ධව වැඩ කළ අයගෙන් සහයෝගය ලබා ගන්නට වුවමනා නම් 1956න් පසුව ඇති වුණු ආණ්ඩු මෙන් කරුණාවෙන් යුක්තව, සමාදානයෙන් යුක්තව, පළි ගැනීමේ චේතනාවෙන් තොරව කටයුතු කළ යුතුයි. මේ ආණ්ඩුවත් ඒ විධියට වැඩ කරතොත් ආණ්ඩුවේ ඕනෑම හොඳ වැඩකදී මහජනතා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වගේ සහයෝගය, රජයේ සේවකයින් ගේ සහයෝගය නොඅඩුව ලැබෙනවා ඇතැයි මම විශ්වාස කරනවා.

මෙපමණක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද පොලීසිය ගැන කල්පනා කර බලන්න. අපේ පළාත්වල පොලීසිය ආණ්ඩු පක්ෂයට වැඩ කළ අය ටත් ගහනවා. විරුද්ධ පක්ෂයට වැඩ කළ අයටත් ගහනවා සාක්ෂි කාරයාටත් ගහ නවා, පැමිණිලි කාරයාටත් ගහනවා, විත්ති කාරයාටත් ගහනවා. සවස 6 න් පසුව මහ මාර්ගයෙහි ගමන් කරන අහිංසකයින්ටත් ගහනවා. ඉතින්, මේ ආණ්ඩුව මහ ජනතාවගේ සහයෝගය ඉල්ලන්නේ මේවා ගැන සොයා බලා සාම යක් ඇති කිරීමෙන් පසුවද කියා මම අහනවා. මෙවැනි දේ නැති කිරීමට ක්‍රම වත් වැඩ සැලැස්මක් ඇති කිරීම මේ ආණ්ඩුවේ පරම යුතුකමක් බව මම කියා සිටිනවා. සැලැස්මක් හරියාකාර ක්‍රියාත් මක කිරීමට නම් ඒ සඳහා කුඩු මහත් ජන තාවගේ සහයෝගය ලබා ගන්නට ඕනෑ. එම සහයෝගය සෑම අංශයකින්ම—ගමේ ග්‍රාම සංවර්ධන සමිතියේ සිට, විවිධ සේවා සමුපකාර සමිතියේ සිට උසස්ම ආයතනය දක්වා—ලැබිය යුතුයි. එහෙම නම් එම සහ යෝගය මහජනතාවගෙන් ලබා ගැනීමට බලාපොරොත්තු වන්නෙ පළිගැනීම්වලින් දැයි අහන්න සිදු වී තිබෙනව.

තවත් එක් ප්‍රශ්නයක් කෙරෙහි මේ ආණ්ඩුවේ සැලකිල්ල යොමු කරන්න මා බලාපොරොත්තු වෙනව. මේ රටට වුවමනා කරන හාල් ප්‍රමාණයෙන් සියේට හතළිහක් පමණ තවමත් පිටරටවලින් මේ රටට ගෙන්වා ගනු ලබන බව ගරු මුදල් ඇමතිතුමා එතුමගෙ කථාවෙන් පෙන්වා දී තිබෙනව. එය එසේ බව අප පිළිගන්නව. මේ කාරණය යටතේ එක් කාරණයක් දැන් මා නමුන්නාන්සෙට මතක් කරන්න කැමතියි. යම්කිසි ද්‍රව්‍යයක් ඕනෑම රටක නිපදවීම වැඩි කර ගැනීමට බලා පොරොත්තු වෙනව නම් ඒ සඳහා නිපද වන්නා ධෛර්‍යවත් කළ යුතුව තිබෙනව. නිපදවන්නට වුවමනා ධෛර්‍යය ලබා දීම සඳහා ඔහුට යම්කිසි ස්ථිර වැඩ පිළිවෙලක් පෙන්වා දීමත් කළ යුතුව තිබෙනව. නිපද වන්නා උනන්දු කරවීම පිණිස ගතයුතු ක්‍රියා මාර්ගය පැහැදිලි එකක් විය යුතුව තිබෙනව.

එම චේතනාව පෙරදැරි කරගෙන අපේ කර්මාන්ත හා ධීවර කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා 1956න් පස්සෙ යම්කිසි ක්‍රියා මාර්ගයක් ඇති කළ බව අප දන්නව. එතුමා වී නිපදවන්නන්ට ස්ථිර මිළක් ගෙවන ලෙස නියම කළා. වී බුසලකට රුපි යල් දොළහක් බැගින් ගෙවීමටත්, ඔහුට වුවමනා කරන පෝර ලබා දීමේ ක්‍රමවත් වැඩ පිළිවෙළක් ඇති කිරීමටත් ගත් උත් සාහය වැදගත් එකක් බව නොපිළිගන්න කෙනෙක් නැහැ. අදත් ඒ වැඩ පිළිවෙළ හරියාකාර ක්‍රියාත්මක නොවන බව මා කියනව. එසේ කියන්නට සිදුවීම කනගාටු වට කාරණයක් වුවත් නොකියා බැහැ. අපේ ගම්බද වී නිපදවන්නා සාමාන්‍ය යෙන් දුප්පත් කෙනෙකු බව අප දන්නව. ඔහු නිපදවන වී බුසලකට අදත් රුපියල් දොළහ බැගින් ලබා ගැනීම පහසු දෙයක් නම් නොවෙයි. මොකක්ද ඊට හේතුව? ඊට හේතුව මෙයයි: දුප්පත් අයට එදි නෙදා ජීවිතය ගෙන යාම සඳහා වුවමනා කරන මුදල් නැතිව ගියාම වී බුසලක් දෙකක් විකුණා මුදලක් ලබා ගන්න සිදු වෙනව. සමුපකාර සමිතියට වී බුසලක් දෙකක් විකුණා එවෙලේම මුදල් ලබා ගන්නයි ඒ උදවිය බලාපොරොත්තු වන්නෙ. එහෙත් වී විකුණා මාසයක් දෙකක් ගත වන තුරු සමහර සමුපකාර සමිතිවලින් මුදල් ලබා ගන්න පුළුවන් කමක් නැහැ. මා දන්නෙ නැහැ මේ තත්ත්වය කාගෙ වරදින් සිදු වෙනවද යන්න. [බාධා කිරීමක්] හවුල් ආණ්ඩුව පැවැති කාලයේදී හෝ මේ කාලයේදී හෝ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රත්නසිරි වික්‍රමනායක මයා.]

යම්කිසි වැරැද්දක් සිදු වෙනවා නම් ඒ ගැන සඳහන් කර ඒවා හදා ගැනීම අපේ යුතුකමක්. ඒ නිසා ඒ ගැන දැන් සඳහන් කිරීමේ වැරැද්දක් මට පෙනෙන්නෙ නැහැ. සමුපකාර සමිතියකට වී භාර දුන් නාම භාර දුන් පුද්ගලයට තමන්ට ලැබිය යුතු මුදල් ප්‍රමාණය ප්‍රමාද නොකර ලබා දීමේ ස්ථිර වැඩ පිළිවෙළක් ඇති කිරීම සම්බන්ධයෙන් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට වැඩ කිරීම යෝග්‍ය බව ඉතා ඕනෑකමින් මේ අවස්ථාවේ සඳහන් කරනව.

අවසාන වශයෙන් මා කියන්නෙ මෙයයි: කර්මාන්ත හා ධීවර කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමාගේ සමාජවාදී මාර්ගය ඔස්සේ යන්න අප බලාපොරොත්තු වන්නෙ නැහැ. දේශීය ධනේශ්වර පන්තියට එදා අප විරුද්ධ වුණා. විදේශීය ධනේශ්වර පන්තියටත් එදා අප විරුද්ධ වුණා. 1960 මාර්තු මාසයේදී පැවැත්වුණු මහා මැතිවරණයේදී අප සටන් කළේ ඒ ප්‍රතිපත්තිය අනුවයි. එම ප්‍රතිපත්තිය අනුව ඉදිරියටත් ගිහිල්ලා වැඩ කරන්නයි අප බලාපොරොත්තු වන්නෙ. එතුමා එදා ඒ ප්‍රතිපත්ති අනුව වැඩ කරගෙන ගිය නමුත් අද ධනේශ්වර පන්තියේ ආණ්ඩුවකට එකතු වී ධනේශ්වර අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට බැඳී සිටීම පුදුමයට කාරණයක්. ඒ ආණ්ඩුවට විරුද්ධව සටන් කිරීමට අප ඇප කැප වී සිටින බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනව.

අ. භා. 6.33

**වී. ධර්මලින්ගම් මයා. (උඩුවිල්)**
*(திரு. வி. தர்மலிங்கம்—உடுவில்)*
(Mr. V. Dharmalingam—Uduvil)

கௌரவ உப சபாநாயகர் அவர்களே, இலங்கைத் தமிழ் அரசுக் கட்சியின் பதினேழு ஆண்டு சரித்திரத்தில் இன்று ஒரு புதிய சகாப்தம் ஏற்பட்டிருக்கின்றது. கடந்த பதினேழு ஆண்டுகளாக எதிர்க் கட்சியில் இருந்து கொண்டு, எந்த ஒரு அரசாங்கத்தையும் எதிர்த்துக் கொண்டிருந்த நாம் இன்று அரசாங்கத்தில் ஒரு அங்கமாக இருந்து இந்த வரவுசெலவுத் திட்டத்தை ஆதரிப்பதில் பெரிதும் மகிழ்ச்சியடைகிறேன். இந்தச் சந்தர்ப்பத்தில் சமீபத்தில் யாழ்ப்பாணத்துக்கு வருகை தந்த கௌரவ உள்துறை அமைச்சர் (கலாநிதி டபிள்யூ. தகநாயக்க) அவர்கள் கூறிய ஒரு கூற்றுத்தான் எனது ஞாபகத்திற்கு இங்கு வருகின்றது. இலங்கையின் ஆண்டு சரித்திரத்தில் இன்று பதவியில் இருக்கின்ற தேசிய அரசாங்கம் அமைக்கப்பட்டமை ஒரு முக்கியமான நிகழ்ச்சியென்று அவர் குறிப்பிட்டார். உண்மையிலேயே தேசிய அரசாங்கம் அமைக்கப்பட்டமை இந்த நாட்டின் சரித்திரத்திலேயே ஒரு முக்கியமான நிகழ்ச்சியேயாகும். இந்தத் தேசிய அரசாங்கத்தில் தமிழரசுக் கட்சியினர் சேர்ந்தது பற்றி தமிழரசுக் கட்சியின் விரோதிகள் பலவிதமாகப் பேசி வருகின்றனர். எமது கூட்டுப் பற்றி இவர்கள் சிங்களப் பிரதேசங்களில் ஒரு விதமாகப் பேசுகின்ற நேரத்தில் யாழ்ப்பாணத்திற்கு வரும்பொழுது வேறு விதமாகப் பேசுகின்றனர். இவர்களுடைய பேச்சுக்கள் தென்னிலங்கையில் ஒரு விதமாகவும் வட இலங்கையில் வேறு விதமாகவும் இருக்கின்றது. உண்மையில் எமது அடிப்படைக் கொள்கைகளையோ இலட்சியங்களையோ எந்த விதத்திலும் கைவிடாது ஒரு தற்காலிகமான ஒப்பந்தத்துடன்தான் நாம் ஐக்கிய தேசியக் கட்சி ஒரு தேசிய அரசாங்கத்தை அமைக்க உதவி செய்தோம். ஆனுல் எமது அடிப்படை இலட்சியங்களில் ஒன்றையாவது நாம் கைவிட்டு விடவில்லை என்று இங்கு குறிப்பிட விரும்புகிறேன். எமது சமஷ்டிக் கோரிக்கையையோ அல்லது எமது அடிப்படைக் கொள்கைகளையோ நாம் கைவிடாமலேயே தேசிய அரசாங்கத்துடன் சேர்ந்துள்ளோம். சமசமாஜக் கட்சியும், கம்யூனிஸ்ட் கட்சியும் எப்படி தமது அடிப்படைக் கொள்கைகளைக் கைவிடாது எந்த விதத்தில் ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சியுடன் ஒத்துழைத்தனவோ அதைப்போலத்தான் நாமும் எமது அடிப்படைக் கொள்கைகளைக் கைவிடாது

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ஐக்கிய தேசியக் கட்சியை ஆதரித்துத் தேசிய அரசாங்கத்தை அமைத்தோம்.

சென்ற ஒன்பது ஆண்டுகளாக இந்த நாட்டில் நடைபெற்ற ஆட்சியானது ஒரு பகுதியினருக்கு மட்டுந்தான் பயன்பட்டு வந்துள்ளது என்பதை யாரும் மறைக்க முடியாது. இந்த நாட்டு மக்களை மொழி, மத, இன அடிப்படையில் பிரித்து அவர்களில் ஒரு பகுதியினருக்கு மாத்திரமாகவே கடந்த ஒன்பது ஆண்டுகாலமாக இந்த நாட்டில் ஆட்சி நடைபெற்றது. காலஞ்சென்ற திருவாளர் எஸ். டபிள்யூ. ஆர். டி. பண்டாரநாயக்காவின் ஆட்சியாக இருந்தாலென்ன, அல்லது திருமதி சிறிமாவோ பண்டாரநாயக்காவின் ஆட்சியாக இருந்தாலென்ன, அல்லது கூட்டரசாங்கமாக இருந்தாலென்ன இந்த அரசாங்கங்கள் எவற்றிற்கும் இந்த நாட்டில் தமிழ் மக்களும் வாழ்கின்றார்கள், அவர்களுக்கும் இந்த நாட்டில் உரிமைகள் இருக்கின்றன என்ற உண்மை தென்படவில்லை. தமிழ் பேசும் மக்களும் இந்த நாட்டில் இருப்பதாகவே அவர்கள் உணர்ந்ததுமில்லை. தமிழ் பேசும் மக்களை ஒதுக்கி அவர்களுக்கு எதிராகப் பாகுபாடு காட்டிக் கடந்த ஒன்பது வருடங்களாக இந்த நாட்டில் ஆட்சி நடைபெற்றதென்பதை யாரும் மறுக்க முடியாது. மொழிப் பிரச்சினை, குடியேற்றப் பிரச்சினை மற்றும் எல்லாப் பிரச்சினைகளிலும் சென்ற ஒன்பது ஆண்டுகளாக இந்த நாட்டிலிருந்த அரசாங்கங்கள் தமிழ் மக்களை ஒதுக்கியே வந்துள்ளன என்பதை நான் இங்கு சுட்டிக் காட்ட விரும்புகிறேன்.

சென்ற பொதுத் தேர்தல் காலத்தில் டாக்டர் கொல்வின் ஆர். டி சில்வா அவர்கள் எனது தொகுதியில் நடைபெற்ற கூட்டமொன்றில் பேசுகையில் இலங்கையில் புதிதாக இருநூறு தொழிற்சாலைகளை அமைத்திருக்கிறோம் என்று கூறினார். ஆனால் இந்த இருநூறு தொழிற்சாலைகளில் ஒரு தொழிற்சாலையாவது சென்ற ஒன்பது ஆண்டுகளில் வடக்குக் கிழக்குப் பகுதிகளில் அமைக்கப்படவில்லை. பாஷையில் மட்டுமல்ல, பொருளாதார அபிவிருத்தித் திட்டங்களிற் கூட சென்ற அரசாங்கங்கள் பாகுபாட்டுடன்தான் நடந்திருக்கின்றன. அது மட்டுமல்ல, இடது சாரி அங்கத்தவர்கள் எதிர்க்கட்சியிலே இருக்கும்போது காங்கேசந்துறைத் துறைமுகத்தின் முக்கியத்துவத்தைப் பற்றி எவ்வளவோ பேசினார்கள். கட்டாயமாக அத்துறைமுகத்தைக் கட்ட வேண்டும், அபிவிருத்தி செய்ய வேண்டுமென்றெல்லாம் அவர்கள் பேசினார்கள். ஆனால், அமைச்சராக வந்தார்கள்; அரசாங்கத்தோடு ஒத்துழைத்தார்கள், அப்போது அவர்களுக்கு காங்கேசந்துறைத் துறைமுகத்தின் முக்கியத்துவம் தெரியவில்லை; அதனை அபிவிருத்தி செய்ய வேண்டுமென்று அவர்கள் நம்பவில்லை. இன்று இத்தேசிய அரசாங்கம் இத்துறைமுகத்தின் முக்கியத்துவத்தை உணர்ந்து அதற்காக பணம் ஒதுக்கியிருப்பதை யிட்டு நன்றி தெரிவிக்க நாங்கள் ஆசைப்படுகிறோம்.

சென்ற பாராளுமன்றத்திலே, எத்தனையோ தடவைகளிலே பரந்தன் கெமிகல் பக்கெரியை அபிவிருத்தி செய்ய வேண்டுமென்று எனது கட்சியினர் அரசாங்கத்தை வற்புறுத்தி யிருக்கிறார்கள். ஆனால், அவர்கள் இந்தத் தொழிற்சாலையை விஸ்தரிக்க வேண்டுமென்பதை உணரவில்லை. உணர்ந்திருந்தாலும், அத்தொழிற்சாலை தமிழ் பேசும் பிரதேசத்திலே இருக்கின்றது; அதை ஏன் நாம் விஸ்தரிப்பான் என்ற காரணத்தால் அவ்விடயத்தில் அவர்கள் நடவடிக்கை யெடுக்கவில்லை. இன்றைய வரவுசெலவுத் திட்டத்திலே பரந்தன் தொழிற்சாலையை விஸ்தரிப்பதற்கு பணம் ஒதுக்கப்பட்டிருப்பதையும் இது சம்பந்தமாக சில நடவடிக்கைகள் எடுக்கப்பட்டிருப்பதையும் காண நாங்கள் மகிழ்ச்சியடைகிறோம்.

மகாவலி கங்கையை யாழ்ப்பாணத்துக்குத் திருப்ப வேண்டுமென்று எனது கட்சியினர் பல ஆண்டுகளாக கேட்டிருக்கிறார்கள். கம்யூனிஸ்ட் கட்சியும் மற்றும் இடது சாரிக் கட்சிகளுங்கூட மகாவலி கங்கையை யாழ்ப்பாணத்துக்குத் திருப்ப வேண்டுமென்று எங்களுடன் சேர்ந்து கேட்டன. 1956 ஆம் ஆண்டிலும் 1960 ஆம் ஆண்டிலும் தோழர் கந்தையா அவர்கள் பருத்தித்துறையிலே

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ධර්මලිංගම් මයා.]

கம்யூனிஸ்ட் கட்சி சார்பில் போட்டியிட்ட நேரத்திலே, தேர்தல் விஞ்ஞாபனத்திலே மகாவலி கங்கையை யாழ்ப்பாணத்துக்குத் திருப்புவதுதான் தங்களுடைய முதல் நோக்கமாக இருக்குமென்று குறிப்பிட்டிருந்தார்கள். அரசாங்கத்தை, ஆளும் கட்சியை அவர்களுடைய கட்சியினர் சேர்ந்தார்கள்; தங்களுடைய கொள்கையை மறந்துவிட்டார்கள்!

இன்றைய அரசாங்கம் மகாவலி கங்கையை யாழ்ப்பாணத்துக்குத் திருப்ப நடவடிக்கை எடுத்துவருவதைக் கண்டு நாங்கள் சந்தோஷப்படுகிறோம்.

மீன்பிடித் தொழிலைப் பற்றி எத்தனையோ தடவைகளிலே, இந்தப் பாராளுமன்றத்திலே நாங்கள் குரல் எழுப்பியிருக்கிறோம். இலங்கைக் கடலிலே பிடிக்கப்படுகின்ற மீன் தொகையில் 62 விதமான மீன் வட, கிழக்கு மாகாணங்களைச் சேர்ந்த கடலிலே பிடிக்கப்படுகின்றதென்பதை எவரும் மறுக்க முடியாது. அதிலும் 50 விதமான மீன் யாழ்ப்பாணக் கடலிலே பிடிக்கப்படுகின்றதென்பதையும், 30 விதமான மீன் மயிலிட்டித் துறைமுகத்திற் பிடிக்கப்படுகின்றதென்பதையும் நான் இங்கு சுட்டிக்காட்ட விரும்புகிறேன்.

வெளிநாட்டிலிருந்து மீன் இறக்குமதியின் பொருட்டு ஏராளமான பணம் வெளியில் அனுப்பப்படுகின்றது. வெளிநாட்டுச் செலாவணி மிகவும் குன்றிய நிலையில் இருக்கின்ற இந்நேரத்திலே எம்மால் எவ்வளவு தூரத்துக்கு வெளிநாட்டுச் செலாவணியைச் சேகரிக்க முடியுமோ அவ்வளவுக்கு அதனை நாம் சேகரிக்க வேண்டும். இப்படியான நிலையிலிருந்த போதிலும் சென்ற அரசாங்கம் மீன்பிடித் தொழிலாளர்க்கு, முக்கியமாக வட, கிழக்கு மாகாணங்களிலுள்ள மீன்பிடித் தொழிலாளர்க்கு எவ்வித உதவியையோ, சலுகையையோ செய்ய முன்வராததையிட்டு நாங்கள் மிக வருத்தமடைகிறோம். நான் எத்தனையோ தடவைகள் சுட்டிக்காட்டியும் கூட சென்ற அரசாங்கம் இவ்விடயத்தில் எந்நடவடிக்கையும் எடுக்கவில்லை. ஆனால், இன்றைய அரசாங்கம் மீன்பிடித் தொழிலை விஸ்தரிப்பதற்கு ஏராளமான பணத்தை ஒதுக்கியிருக்கிறது. அத்துடன் இன்னும் எத்தனையோ நடவடிக்கைகளையும் எடுத்து வருகின்றது. இப்பணத்தில் குறிப்பிட்ட அளவு தொகையையாவது வடக்கு, கிழக்கு மாகாணங்களில் செலவழிக்க வேண்டுமென்று நான் கேட்டுக்கொள்ள விரும்புகின்றேன். மயிலிட்டித் துறைமுகப் பகுதிகளில் நான் முன் கூறியது போல, முப்பது சத வீதமான மீன் பிடிக்கப்படுகின்றது. ஆனால், அங்கு மீன் பிடிப்பவர்களுக்குச் சென்ற அரசாங்கம் எந்தவித உதவியை யாவது செய்ய முன்வரவில்லை. கூட்டரசாங்கமோ அல்லது பண்டாரநாயக்க அரசாங்கமோ, அல்லது ஸ்ரீமாவோ அரசாங்கமோ வென்றால் வேறு எத்தனையோ பகுதிகளின் மீன்பிடித் துறைமுகங்களை அமைத்தது. ஆனால், வடக்கு, கிழக்கு மாகாணங்களிலே, 65 சதவீத மீன்கள் பிடிக்கப்படுகின்ற பகுதிகளிலே, ஒரு மீன்பிடித் துறைமுகத்தையாவது அவர்கள் அமைக்கவில்லை. அதுமட்டுமல்ல, கஷ்டம் வந்த நேரத்தில் கூட எந்தவித உதவியும் செய்ய சென்ற அரசாங்கம் மறந்துவிட்டது.

சென்ற டிசம்பர் மாதம் அடித்த சூறாவளியை நீங்கள் அனைவரும் ஞாபகத்தில் வைத்திருப்பீர்கள் என நினைக்கின்றேன். அதனால் மிகவும் பாதிக்கப்பட்ட மக்கள் மயிலிட்டித் துறைமுகப் பகுதிகளிலே வசிப்பவர்கள் தாம். ஐம்பது, அறுபது பேர் உயிரிழந்தார்கள்; வத்தைகள், பாதைகள் முதலிய எல்லாக் கருவிகளையும் இழந்தார்கள். சென்ற அரசாங்கம் ஓர் அமைச்சரை என்ன நடந்தது என்று பார்வையிடும் பொருட்டு அங்கு அனுப்பியது; ஆனால் உதவியளிக்க எந்த வித நடவடிக்கையும் எடுக்கப்படவில்லை. அமைச்சர் மட்டுமல்ல. மகா தேசாதிபதியவர்கள் கூட அங்கு வந்தார். அப்படியிருந்தும் எந்தவித நடவடிக்கையும் அவர்கள் பொருட்டு எடுக்கப்படவில்லையென்பதை நான் சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

இந்த நேரத்திலே எமது அமைச்சர்களுக்கு நான் ஒரு விண்ணப்பம் செய்ய விரும்புகின்றேன். பாதிக்கப்பட்ட அம்மக்களுக்கு வேண்டிய உதவியை, காலம் சென்றாலும் கூட, தவறாது கூடிய விரைவிலே செய்து கொடுக்க வேண்டுமென்று நான் அவர்களைக் கேட்டுக் கொள்கின்றேன்.

ஸ்ரீலங்கா சுதந்திரக் கட்சி அரசாங்கத்தினர், "இந்நாட்டின் தேசிய வைத்தியத்துக்கு வேண்டிய உதவிகளைச் செய்வோம். அதனை விஸ்தரிப்பதற்கு வேண்டிய நடவடிக்கைகளை எடுப்போம்" என்று பல மேடைகளிலும் இந்தப் பாராளுமன்றத்திலும் பேசினார்கள். நான் பல தடவைகளிலே இந்தப் பாராளுமன்றத்திலே வற்புறுத்தியிருக்கின்றேன், சித்த ஆயுள்வேதத்தையும் அபிவிருத்தி செய்ய வேண்டுமென்று. அதனை மேலும் வளரச் செய்வதற்கு வேண்டிய நடவடிக்கைகளை எடுக்க வேண்டுமென்றும் கூறியிருக்கிறேன். ஆனால், நாம் கேட்ட வேண்டுகோள்கள் எல்லாம், கோரிக்கைகள் எல்லாம் கொஞ்சமேனும் கவனிக்கப்படவில்லை. அதையிட்டு எந்தவித நடவடிக்கையையும் சென்ற அரசாங்கம் எடுக்கவில்லை. கொழும்பிலே உள்ள சித்த ஆயுள்வேதப் பகுதியை யாழ்ப்பாணத்துக்குக் கொண்டுவர வேண்டுமென நான் கேட்டேன். ஆனால், சென்ற அரசாங்கம் செய்தது என்னவென்றால், சித்தப் பகுதியின் பதிவையும் கூட இரத்து செய்துவிட்டதுதான். எனவே, நான் இந்த அரசாங்கத்தைக் கேட்டுக் கொள்ள விரும்புகின்றேன், கூடிய விரைவிலே சித்த ஆயுள்வேதப் பள்ளிக்கூடத்தை யாழ்ப்பாணத்திலே ஆரம்பித்துத் தரவேண்டுமென்று. அதனை ஆரம்பிக்கும் வரைக்கும் யாழ்ப்பாணத்திலே உள்ள சித்த ஆயுள்வேதப் பகுதியைப் பதிவுசெய்து தரவேண்டும். இதுவரை நான் கூறியவற்றிலிருந்து, காலஞ்சென்ற பண்டாரநாயக்காவின் அரசாங்கமும், திருமதி சிறிமாவோ பண்டாரநாயக்காவின் அரசாங்கமும், கூட்டு அரசாங்கமும், தமிழ் பேசும் மக்களை எவ்வளவு தூரம் ஒதுக்கி வந்திருக்கின்றது என்பதை நன்குணரக் கூடியதாக இருக்கின்றது.

கௌரவ உப சபாநாயகரவர்களே, ஒரு நிதியமைச்சருக்குள்ள பொறுப்புக்கள் மிகமிக அதிகம். அதிலும் தேசிய அரசாங்கத்தின் நிதியமைச்சருடைய பொறுப்பு—இன்றைய அரசாங்கத்தின் பொறுப்பு—பொருளாதாரம் சிரழிந்த நிலையிலுள்ள நாட்டின் ஆட்சிப் பொறுப்பை ஏற்றுள்ள அமைச்சர்களுடைய பொறுப்பு—எவ்வளவு பாரதூரமானது என்பதை ஒவ்வொருவராலும் நன்குணர்ந்து கொள்ள இயலும். இப்படியான கஷ்டமான நிலையிலே பொறுப்பான இக்கடமையை ஏற்க முன்வந்தது மாத்திரமன்றி, சிறந்ததொரு வரவுசெலவுத் திட்டத்தைத் தயாரித்தளித்துள்ளமை குறித்து கௌரவ நிதி அமைச்சர் (கௌரவ யூ. பி. வன்னிநாயக்க) அவர்களுக்கு நாங்கள் நன்றிபாராட்டக் கடமைப்பட்டவர்களாவோம்.

1956 ஆம் ஆண்டிலே ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சி ஆட்சி பீடமேறிய காலத்தில் இலங்கையின் பொருளாதார நிலை—அரசாங்கத்தின் பொருளாதார நிலை—மிகவும் உச்சத்திலிருந்தது என்பதை எல்லோருமே ஏற்றுக் கொள்வார்கள். கௌரவ எட்டியாந்தோட்டைப் பிரதிநிதி (கலாநிதி என். எம். பெரேரா) அப்பொழுது எதிர்க்கட்சித் தலைவராக இருந்தார். அப்பொழுது சிம்மாசனப் பிரசங்க விவாதத்தில் அவர் பேசுகையில் "The country and the Government were never so prosperous as in April 1956." 1956 ஆம் ஆண்டு ஏப்ரல் மாதத்தில் இருந்தது போன்ற செழிப்பான நிலையில் நாடும், அரசாங்கமும் ஒருபோதுமே இருக்கவில்லை என்று குறிப்பிட்டுள்ளார். அதன் பின்னர் எங்கள் நாட்டின் பொருளாதார நிலை படிப்படியாகக் குன்றிப் போனது நாங்கள் எல்லோரும் அறிந்த உண்மை. 1961 ஆம் ஆண்டில் கௌரவ தொம்பே பிரதிநிதி (திரு. எவ். ஆர். டயஸ் பண்டாரநாயக்க) அவர்கள் நிதி அமைச்சராக வந்தபொழுது ஐக்கிய தேசியக் கட்சியைப் பலமாகக் கண்டித்தார். அவர் கூறியதை நான் அப்படியே ஆங்கிலத்தில் வாசித்து காட்டுகின்றேன். "Speaking on the first Budget, he blamed the U. N. P. for preserving the external assets and not

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ධර්මලින්ගම් මයා.]
spending it on the people" அதாவது வெளிநாட்டுச் செலாவணியைச் சேமித்து வைத்து மக்களுக்குச் சுவறக் கூடியதாகச் செலவு செய்யவில்லை என்று அவர் தனது முதலாவது வரவு செலவுத் திட்டப் பிரசங்கத்திலே ஐக்கிய தேசியக் கட்சி அரசாங்கத்தைக் கண்டித்தார். இவ்வாறு கண்டித்துப் பேசிய அவரும், அவருக்குப் பின்னர் சிறிமாவோ அரசாங்கத்தின் நிதி அமைச்சர்களாக இருந்தவர்களும் like a drunken sailor on shore. மதுபோதையில் வெளியில் கரைக்கு வந்த மாலுமியைப் போல வெளிநாட்டுச் செலவாணியை மனம் போனபடி செலவு செய்து எமது நாட்டையும் அரசாங்கத்தையும் வங்குரோட்டு நிலைக்குக் கொண்டுவந்து விட்டார்கள் என்பதை நாம் அறிவோம். இப்படியான இக்கட்டான ஒரு சூழ்நிலையிலே தான் எமது நிதி அமைச்சர் பொறுப்பேற்றிருக்கிறார். அவர் சமர்ப்பித்த வரவு செலவுத் திட்டத்தைப் பார்த்தால், அவர் தனது பொறுப்பை யுணர்ந்தே கடமையாற்றியுள்ளார் என்பது நன்கு புலனாகின்றது.

நாடு இன்றிருக்கும் நிலையில், எமது தேசிய அரசாங்கத்தின் முதற்கடமை எங்களது வெளிநாட்டுச் செலாவணியைப் பாதுகாப்பது தான். நமது நிதி அமைச்சர் அவர்கள் அதற்கு வேண்டிய எத்தனையோ நடவடிக்கைகளை எடுத்திருக்கிறார். கௌரவ எட்டியாந்தோட்டைப் பிரதிநிதி அவர்கள் இவ்வரவு செலவுத் திட்ட விவாதத்தை ஆரம்பித்து வைத்துப் பேசும்பொழுது, கடந்த ஒன்பது ஆண்டுகளாக தனது அரசாங்கமும் அதற்கு முன்பிருந்த அரசாங்கமும் கைத்தொழில் அபிவிருத்திக்காக செய்த வேலைகளைப் பற்றிக் குறிப்பிட்டார். அவர் பெருமையுடன் கூறினார், கடந்த ஒன்பது ஆண்டுகளாக ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சி அரசாங்கமும், கூட்டரசாங்கமும் எடுத்த நடவடிக்கைகளினால் நாட்டின் கைத்தொழில் மிகவும் சிறந்த முறையிலே வளர்ந்து சில பொருட்களின் உற்பத்தியிலே சுயதேவையை பூர்த்திசெய்யக் கூடிய நிலையை அடைந்து விட்டது என்று. air-conditioners, refrigerators and brassieres போன்ற பொருட்களிலே சுயதேவையைப் பூர்த்தி செய்யக் கூடிய நிலையை அடைந்து விட்டோம் என்று அவர் கூறினார். சோசலிசம் பேசுகின்ற நண்பர் என்னென்ன பொருட்களில் சுயதேவைப் பூர்த்தியடையவேண்டுமென்று நினைத்தார் என்பதை நாம் பார்க்கும்போது விசித்திரமாக இருக்கிறது. பெரும் தனவந்தர்கள் பாவிக்கக்கூடிய refrigerators, air-conditioners and brassieres ஆகிய—

**එස්. එම්. රාසමානික්කම් මයා. (පද්දිරිප්පු)**
(திரு. எஸ். இராசமாணிக்கம்—பட்டிருப்பு)
(Mr. S. M. Rasamanickam—Paddiruppu)

பிறேசியர் என்றால் நாகரீகப் பெண்களுக்குத் தேவையான மார்பு மூடிகள்.

**ධර්මලින්ගම් මයා.**
(திரு. தர்மலிங்கம்)
(Mr. Dharmalingam)

—இந்த விதமான பொருட்களில்தான் சுய தேவையை பூர்த்தி அடைந்தோம் என்று கூறியதைப் பார்க்கும் பொழுது கௌரவ எட்டியாந்தோட்டைப் பிரதிநிதியவர்களது சோசலிசம் எப்படிப்பட்ட சோலிசமென்று எமக்கு விளங்காமல் இருக்கின்றது. எமது நிதியமைச்சர் அவர்கள் உப உணவுப் பொருட்களில் கூடிய விரைவில் சுய தேவைப் பூர்த்தியடைவதற்கான பல திட்டங்களைத் தீட்டி இந்த வரவு செலவுத் திட்டத்தை சமர்ப்பித்திருப்பதையிட்டு நான் பாராட்ட விரும்புகிறேன். உப உணவுப் பொருட்களுக்காக நாம் வருடா வருடம் பதினெட்டுக் கோடி ரூபாய்களைச் செலவு செய்கிறோம். உப உணவுப் பொருட்களில் நாம் சுயதேவைப் பூர்த்தியடைந்தால் இவற்றிற்காகச் செலவிடும் பணத்தை வேறு நல்ல பல தேவைகளின் பொருட்டுச் செலவு செய்ய முடியும். எனவே இவ்வரிய வரவு செலவுத் திட்டத்தைச் சமர்ப்பித்தமைக்காக நான் எமது கட்சியின் சார்பில் கௌரவ நிதி அமைச்சர் அவர்களைப் பாராட்டி எமது பேச்சை முடித்துக் கொள்ளுகிறேன்.

අ. භා. 6.55

**රාජා වෙලේගම මයා.**
(திரு. ராஜா வெலேகம)
(Mr. Raja Welegama)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වන් නියෝ නායකයකු වන ගරු වන් නිනායක මුදල් ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද එතුමාගේ කුළුඳුල් අයවැය කථාව පිළිබඳව වන් නියට නැකම් කියන ප්‍රදේශ නියෝජනය කරන මට කථා කිරීමට අවස්ථාවක් ලැබීම ගැන මම සන්තෝෂ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වෙනවා. එතුමා තම කථාව ඉතා දක්ෂ විලාශයකින් කිරීම ගැන මම එතුමාට ස්තුති කරනවා. එහෙත් එම කථාවේ අන්තර්ගත දේ පිළිබඳව නම් මට එතුමාට ඒ විදියට ස්තුතිවන්ත වීමට පුළුවන්කමක් නැහැ. ඉතා දක්ෂ උගත් මන්ත්‍රීතුමන්ලා විසින් සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරමින් දීර්ඝ වටිනා කථා රාශියක් කර එතුමාගේ සංඛ්‍යා ලේඛන විවේචනය කළ නිසා මා ඒ පිළිබඳව කථා කිරීමට අදහස් කරන්නේ නැහැ. මා බලාපොරොත්තු වන්නේ ඉතා වැඩදායක විවේචනයන් කිහිපයක් ඉදිරිපත් කරන්නයි.

මන්ත්‍රීවරු කිහිප දෙනෙක්ම අල, ලූනු පිළිබඳව කථා කළා. විරුද්ධ පාර්ශ්වයේ සිටින අපි කරන චෝදනාව මහජනයාට අල, ලූනු සම්බන්ධයෙන් සහනයක් නොලැබෙන බවයි. අල, ලූනු පිළිබඳ තීරු බද්ද ඉවත් කිරීම නිසා සහනයක්, ප්‍රයෝජනයක්, ලැබෙන්නේ වෙළෙන්දන්ටයි. ඒ නිසා සමහර විට අපේ රටට වැඩි වැඩියෙන් ඒ ද්‍රව්‍ය ගෙන්වීම හේතු කොටගෙන අපේ රටේ අල, ලූනු වැනි දේ වගා කිරීමට ගන්නා උත්සාහය අඩපණ වන්නට, අධෛර්ය වන්නට පුළුවනි. දැනට මිරිස් සඳහා සහතික මිලක් ඇති කොට මිරිස් නිෂ්පාදනය වැඩි දියුණු කිරීමට විශාල වැඩ පිළිවෙලක් තිබෙනවා. අපේ ප්‍රතිපත්තිය විය යුත්තේ නැවෙන් ගෙනවුත් කෑම නොවෙයි ; අපේ රටේම නිෂ්පාදනය කොට ස්වයංපෝෂිත වීමයි.

මේ අයවැය යෝජනාවලින් උදළු, අලවංගු ආදිය සුලභ කිරීමට උත්සාහ කිරීම ගැන මම සතුටුවෙනවා. නමුත් අලවංගු වැඩි කිරීමෙන් ඒ තරම් වැඩි ප්‍රයෝජනයක් වන්නේ නැහැ. වුවමනා පමණ අලවංගු තිබෙනවා. හෑරීමයි, ප්‍රශ්නය. බදු බර සම්බන්ධයෙන් මම වචන දෙක තුනක් කීමට අදහස් කරනවා. මම ගරු මුදල් ඇමතිතුමාට ස්තුවන්ත වෙනවා, අපේ රටේ ජනතාව මත අමුතු බදු බර නොපැටවීම ගැන.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
මේ පැත්තට එන්න.

**රාජා වෙලේගම මයා.**
*(திரு. ராஜா வெலேகம)*
(Mr. Raja Weiegama)

අපි ඔය පැත්තට එනවා. හැබැයි, තනියම නොවෙයි ; අපි සියලු දෙනාම. එතකොට තමුන්නාන්සේලාට මේ පැත්තට එන්න සිද්ධ වේවි.

අය බදු ගැන කියන විට ගැනෙන්නේ ධනපතියන් පමණක් නොවෙයි. පහළ මධ්‍ය පන්තියේ අයත් අය බදු ගෙවනවා. ඒ අයට සහනයක් සැලසීම ගැන අපි සන්තෝෂ වෙනවා. අපි විරුද්ධ වන්නේ ලාංකික හා විශේෂයෙන්ම විදේශීය ධනපතියන්ට මේ අයවැය යෝජනාවලින් විශාල සහන දීම ගැනයි. දුප්පත් ජනතාවට ලැබෙන සහනය මෙන් තුන් ගුණයක් පමණ විදේශීය ධනපතියන්ට සහනය ලැබෙනවා. කෝටි 5 ක පමණ සහනයක් ඔවුන්ට ලැබෙනවා. ඔවුන්ට ඒ තරම් විශාල බදු සහනයක් දීමට අවශ්‍යතාවක් ඇත්තේ නැහැ. මැතිවරණ කාලයේදී ආණ්ඩු පක්ෂය කියා සිටියේ සාමාන්‍ය ජනතාවට සහනයක් ලබා දෙනවාය කියායි. නමුත් එදා දුන් ඒ පොරොන්දුව ඉටු නොවූ බව මම කනගාටුවෙන් කියන්න කැමතියි. විසා බද්ද, බැංකු භර බද්ද, විදේශීය විනිමය බද්ද ආදිය ඉවත් කිරීමෙන් ධනපතියන්ට ලබා දුන් කෝටි 5 දුප්පත් ජනතාවට සහනය ලබා දීමට යෙදෙව්වා නම් අපට සතුටු වෙන්න තිබුණා. විශෙෂයෙන්ම මහජනතාවට අවශ්‍යව ඇත්තේ කෑම, ඇඳීම සහ නිවාස ආදියයි. ඒ නිසා ධනපතියන්ට මේ විධියට වැඩි සහන සලසන්නේ නැතිව ඒ පන් කෝටියෙන් අහිංසක ජනතාවට තව රෙදි යාරයක් දෙකක් ගැනීමේ අවස්ථාව හෝ ඔවුන් වෙනුවෙන් නිවාස කීපයක් ඇති කිරීමේ අවස්ථාව හෝ සැලසුවා නම් මීට වඩා යුක්තිසහගත බව මම ප්‍රකාශ කරන්න කැමතියි.

ඒ වාගේම රක්ෂණ ගිහය මැඩීම සම්බන්ධයෙන් අයවැය කථාවෙන් යෝජනා ඉදිරිපත්කර තිබෙනවා. ඒ යෝජනා සම්බන්ධයෙන් නම් අපට කිසිසේත්ම සතුටු වෙන්නට බැහැ. මේ ගැන මම එක්තරා ප්‍රකාශයක් කරන්න කැමතියි. විශෙෂයෙන් අපේ ගම්බද ප්‍රදේශවල රක්ෂණ ගිහයට වඩා විශාල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රාජා වෙලේගම මයා.]

ප්‍රශ්නයක් වී තිබෙන්නේ ඒ තරුණයන් රැකීරක්ෂාවල නොයෙදීමයි. රැකීරක්ෂා නැති, රැකීරක්ෂා නොකරන විශාල සංඛ්‍යාවක් ගම්බද ප්‍රදේශවල ඉන්නව. ඊට හේතුව මොකක්ද? ඒ සෑම කෙනෙක්ම අපේක්ෂා කරන්නෙ එක්කො කන්තෝරුවක පියුන් වැඩක්; එහෙම නැත් නම් ලංගමයේ කොන්දොස්තර වැඩක්; එහෙමත් නැත් නම් මුර වැඩක්. ඒ නිසා මෙයින් මතුවන වැදගත් කාරණයක් රජයට නොපෙනීම ගැන මම කනගාටු වෙනව. අද අපේ රටට අවශ්‍ය මේසන්වරු සෑහෙන සංඛ්‍යාවක් නැහැ. වඩු බාස්වරු සෑහෙන සංඛ්‍යාවක් නැහැ. අද ගම්බද පළාත්වලත් නගරබද පළාත්වලත් නොයෙක් විධියේ ගොඩනැගිලි වැඩ ඇති කරගෙන යනවා. ඒ සඳහා අවශ්‍ය කම්කරුවන් පිරිසක් සිටිය යුතුයි. ඒ වාගේම බාබර්වරුන් නැහැ, කෝකිවරුන් නැහැ. ඔය විධියේ ව්‍යාපාරික වෘත්තී සඳහා අවස්ථාව සලසන්නට ඕනැ. නමුත් ඒ ගැන ජාතික රජය සලකා නොබැලීම ගැන මම කනගාටු වෙනවා.

ඉඩම් සම්බන්ධයෙන් මෙහිදී අවධාරණයෙන් ප්‍රකාශ කළ යුතු කාරණයක් තිබෙනවා. ගොවිතැන් කිරීම සඳහා ඉඩම් අක්කර දහස් ගණනක් ධනපති කොම්පැනිවලට දීමට කර තිබෙන යෝජනාව ගැන මගේ තදබල විරුද්ධත්වය මේ ගරු සභාවේදී මා ප්‍රකාශ කරන්න කැමතියි. ඒ මොකද? ඒ සඳහා ඉඩම් දීමට නම් ඉඩම් ඉතිරිව ඇත්තේ මා නියෝජනය කරන මොනරාගල, වන්නිය, උතුරු මැද පළාත ආදි ප්‍රදේශවලයි. අනික් ප්‍රදේශවල අද ඉඩම් නැහැ. ඊට හේතුව මොකක්ද? අධිරාජ්‍ය වාදීන්ගේ පාලන සමයෙදී මුඩු ඉඩම් පණත කියා පණතක් ඇති කර කන්ද උඩ රට ඉඩම් සියල්ලම තේ වගා කිරීම සඳහා අධිරාජ්‍යවාදීන්ට දීමයි. කන්ද උඩ රට සිටි දුප්පත් මිනිසුන්ට අද සිදු වී තිබෙන්නේ වියලි කලාපයේ ජනපදවලට ගොස් ජීවත් වීමටයි. නමුත් මේ රජයෙන් යෝජනා කර ඇති පරිදි ගොවිතැන් කිරීමට අක්කර දහස් ගණන් ධනපති කොම්පැනිවලට බෙදා දුන්නොත් අර ජනතාවට ඉන්න හිටින්න තැනක්වත් නැතිව යනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
ඇයි මහවලතැන්න.

**රාජා වෙලේගම මයා.**
*(திரு. ராஜா வெலேகம)*
(Mr. Raja Welegama)
මට දී ඇති කාලය ඉතාමත් සීමා සහිත නිසා ඒවාට පිළිතුරු දී මගේ කාලය නැති කර ගැනීමට මම අදහස් කරන්නෙ නැහැ.

ගම්බදව දැනට වැඩිවෙමින් පවතින ජනගහනය ගැන බලන විට ඒ දුප්පත් ගම්බද ජනතාවට පදිංචි වීමට තිබෙන රජරට වියලි කලාපයේ ඉඩම් ධනපති සමාගම්වලට දීම ගැන මම නැවතත් මගේ බලවත් විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. ඉඩම් සම්බන්ධයෙන් අද ආණ්ඩුව විසින් අනුගමනය කළ යුත්තේ දැනට ඇති ඉඩම් තව තවත් එළි පෙහෙළි කිරීම නොවෙයි. කිසිම සැලැස්මක් නැතිව වියලි කලාපයේ ඉඩම් එළි කිරීම නිසා අද අපට ඉතාමත් අසීරු තත්ත්වයකට මුහුණ පාන්නට සිදු වී තිබෙනවා. එහි ප්‍රතිඵලයක් වශයෙන් අද වර්ෂාව නැතිව ගොස් තිබෙනවා. පොළොවේ සාරවත් බව නැති වී ගොස් තිබෙනවා. වන සම්පත විනාශ වී ගොස් තිබෙනව. ඒ නිසා අද කළ යුත්තේ යම්තම් ඉතිරි වී තිබෙන කැලෑ ටික එළි කර දැමීම නොවෙයි. දැනට ගොවිතැන් සඳහා එළිකර, ගොවිතැන් කටයුතු කර ගෙන යන ඉඩම්වලින් වැඩිම ප්‍රයෝජන ගැනීම සඳහා වැඩපිළිවෙළක් යෙදීමයි. දැනට තිබෙන කුඹුරුවලින් වැඩි අස්වැන්න ප්‍රමාණයක් අක්කරයකින් වී බුසල් පණහකටත් සියයකටත් අතර ප්‍රමාණයක්—ගැනීම සඳහා උත්සාහයක් කරනවානම් අලුතෙන් කැලෑ එළි කර කුඹුරු අස් වැද්දීමට වුවමනා වන්නෙ නැහැ.

තවත් කාරණයක් කියන්නට කැමතියි. තෙත් ප්‍රදේශයේ ඉතාම සරු සාර ඉඩම් අක්කර ලක්ෂ ගණනක් වැවිලි සඳහා යොදවා තිබෙනවා. විදේශීය හෝ ස්වදේශීය ධනපති කොම්පැනිකාරයනුයි, මේ වැවිලි අයිතිකරුවන් වී සිටින්නේ. ඔවුන් සතු විශාල වතුවල නොවවන ලද ඉඩම් කට්ටි තිබෙනවා. ඒ නොවවන ලද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඉඩම් කට්ටිවල වැවිලි යොදන ලෙස කොම්පැනි කාරයන්ට බල කරන්නට මේ ආණ්ඩුවට නොහැකිද ? ඒ ඉඩම් කට්ටිවල එළවලු ආදිය වගා කරන්නට පුළුවනි. දුප්පත් ජනතාව අතර බෙදා දෙන්නට තිබෙන ආණ්ඩුවේ ඉඩම් ටික ධනපති කොම්පැනිකාරයන්ට නොදී නොවවා තිබෙන කොම්පැනිකාරයන් සතු ඉඩම් වගා කිරීම සඳහා කටයුතු යෙදිය යුතු බව යෝජනාවක් වශයෙන් මේ අවස්ථාවේදී ඉදිරිපත් කරනවා.

මගේ කථාව අවසන් කරන්නට මත්තෙන් මට ප්‍රථමයෙන් කථා කළ උඩුවිල්හි ගරු මන්ත්‍රීතුමා විසින් සඳහන් කරන ලද කාරණයකට පිළිතුරු දෙන්නට අදහස් කරනවා. මහවැලි ගඟ උතුරට හරවනවා යයි පසුගිය ආණ්ඩුව පොරොන්දුවක් දුන් නමුත් එය ක්‍රියාත්මක නොවුණු බව ඒ මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. ඒ යෝජනාව ඉදිරිපත් කළ, ඒ සම්බන්ධයෙන් ක්‍රියා කළ ඇමතිතුමා අද මේ ආණ්ඩුවේත් කැබිනට් මණ්ඩලයේ ඉන්නවා. ඒ නිසා ඒ පිළිබඳව යම් කිසි චෝදනාවක් ඉදිරිපත් කරන්නට තිබෙන්වා නම් එය මේ ආණ්ඩුවේ ඉඩම් ඇමතිතුමාට ඉදිරිපත් කරන්න. චෝදනා එල්ල විය යුත්තේ එතුමාට මිස මේ පැත්තට නොවෙයි.

ආයුර්වේදය සම්බන්ධයෙන්ද පසුගිය කාලය තුළ කිසිවක් නොසිදු වූ බව ඒ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. ආයුර්වේදය සම්බන්ධයෙන් යම්කිසි සේවයක් සිදු වුණා නම් එසේ සිදු වූයේ 1948 සිට 1956 දක්වා කාලය තුළදීද, එසේ නැත්නම් 1956 සිට 1965 දක්වා කාලය තුළදීදැයි මා ඒ ගරු මන්ත්‍රීතුමාගෙන් ප්‍රශ්න කරනවා. කුමන කාල සීමාවේදී ආයුර්වේදයට සේවයක් වුණාදැයි හදවතට තට්ටු කර විමසා බලන්න.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පසුපස ආසනවල සිටින මන්ත්‍රීවරුන් ගැන මේ ආණ්ඩුවේ මැති ඇමතිවරුන් ලොකු කරුණාවක් දක්වා කථා කරන බව පෙනී යනවා. පසුගිය කාලයේදී ඩෙන්සිල් පීරිස් නම් මහත්මයකු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන් ගැන පත්තරවලට ලියා තිබුණු ලිපියක් ගැන මේ අවස්ථාවේදී මතක් කරන්නට කැමතියි. උඩරට පළාත්වලින් පැමිණි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන් ඉතා නිවට පිරිසක් බව පෙන්වීමට ඒ ලිපියෙන් උත්සාහ ගෙන තිබුණා. නමුත් ඒ අදහස සම්පූර්ණයෙන්ම වැරදි බව මතක් කරන්නට කැමතියි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන් වූ අප කවදාවත් ඒකාධිපතිවාදයට එකඟ වන්නේ නැහැ. අපට ආදරයක්, කරුණාවක් දක්වන මේ ආණ්ඩුවේ ඇමතිවරුන්ටත් පාර්ලිමේන්තු ලේකම්වරුන්ටත් මා කියන්නේ ඒකාධිපතිවාදයට අප නොකැමති වන්නා සේම මේ රටේ ඒකාධිපතිවාදය සාර්ථක නොවන බවයි. 1956 මහා මැතිවරණයේදී සර් ජෝන් කොතලාවල මහතා ප්‍රකාශ කර සිටියේ තමන්ට ආසන 10 ක් ලැබුණත් තමන් ආණ්ඩුවක් පිහිටුවන බවයි. නමුත් ඔහුට ආසන 10 ක් ලැබුණේ නැහැ. ඔහුගේ පක්ෂයට ලැබුණේ ආසන 8 යි. 1960 මාර්තු මැතිවරණයේදී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය පිහිටුවා ගත් දහනායක මහත්මයා කීවේත් තමන්ට ආසන 10 ක් ලැබුණොත් ආණ්ඩුවක් පිහිටුවන බවයි. නමුත් අන්තිමට සිදු වූයේ ඔහුට ඔහුගේ ආසනයත් අහිමිවීමයි. ඒ අත්දමේ ඉතිහාසයක් ගැන දැනීමක් ඇතිව සිටින අප ඒකාධිපතිවාදයට සම්බන්ධ නොවන බව කෙළින්ම ප්‍රකාශ කරනවා. පත්තරවලින් අපට දක්වන අනුකම්පාව ගැන අපට කියන්නට ඇත්තේ මෙපමණයි.

ඇත්තෙන්ම අප සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට පක්ෂපාතයි. ඇය කුස්සියේ සිට පැමිණියා මිස ඇයට කිසිම දේශපාලන දැනුමක් නැති බව පත්තරවලින් නම් කියනවා. කුස්සියේ ඉඳල ආවත්, කොහේ ඉඳල ආවත් අපි ඉතාමත් පක්ෂපාතව එතුමී අනුගමනය කරන්නේ ඉතා වැදගත් හේතුවක් ඇතිවයි. එතුමීගේ දයාබර ස්වාමිපුරුෂයා වූ—මේ රටේ ඉතා විශිෂ්ට පුත්‍ර රත්නයක් වූ—එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ශ්‍රීමතාණන් 1956 සිට සමාජ විප්ලවයක් ඇති කර මේ රටේ සාමාජවාදී අදහස් දරණ පිරිසකට නායකත්වය දුන්නා. ප්‍රතිගාමීන් විසින් එතුමාගේ ජීවිතය විනාශ කළ අවස්ථාවේදී කුස්සියේ සිට හෝ කොහේ සිට හෝ එතුමී ඇවිත් තම ආදරණීය ස්වාමිපුරුෂයාගේ නායකත්වය ලැබූ ඒ පිරිස අතරමං කරන්නෙ නැතිව ඒ ශක්ති පමණින් භාර ගෙන තම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රාජා වෙලේගම මයා.]

ස්වාමිපුරුෂයා මේ රටේ ගෙන ගිය සමාජ වාදී වැඩ පිළිවෙළ නව පියවර කීපයක් ඉදිරියට ගෙන ගිය නිසයි, අප එතුමී පිටි පස්සෙ යන්නෙ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ආණ්ඩු පක්ෂයේ සිටින නායකයන් ගැන කල්පනා කරන විට අපට බොහොම කනගා වුයි. මේ රටේ ඒකාධිපතිවාදයක් ඇති කරන්න ගොස් අතරමං වූ නායකයෝ ඒ පැත්තෙ අද ඉන්නව. මේ කුඩා දිවයින දෙකට බෙදන්න ඕනෑය, මේ රටේ රාජ්‍ය දෙකක් ඇති කරන්න ඕනෑය කියා මොර දුන් නායකයෝ ඔය පැත්තෙ අද ඉන්නව. එසේම නායකත්වය දී මහජනයා අතරමං කර ගිය නායකයෝ ඔය පැත්තෙ අද ඉන්නව. පිලිප් ගුණවර්ධන ඇමතිතුමා ගැන වචනයක් කියන්න කැමතියි. එතුමාගේ ඇස් පෙනෙන්නෙ නැති නිසා යම් කිසි මන්ත්‍රී කෙනෙක් ගැන හරියට පෙනීමක් නැත කියා එතුමා ප්‍රකාශ කළා. එසේ සිදු වූයේ මහළු වයසට යාම නිසා වන්නට ඇති. ඒ නිසාම වන්නට ඇති, එතුමාට අද ඒ තරම් මතකක් නැහැ. පසුගිය කාලයේදී එතුමා අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායිකාව වන—අද විරුද්ධ පක්ෂයේ නායිකාව වන—ගරු සිරිමාවෝ බණ්ඩාර නායක මැතිනියගේ නායකත්වය යටතට එන්න කැමැත්ත ප්‍රකාශ කළ බව හොරණ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. එය සත්‍ය කාරණයක්. මා හිතන හැටියට එය මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන් පමණක් නොව මුළු රටම දන්නව. සිරිමාවෝ බණ්ඩාර නායක මැතිනියට රදළ අම්මණ්ඩිය කියා අපහස කළත්, එතුමා යම් යම් කොන්දේසි වගයක් උඩ එතුමීගේ නායකත්වය භාර ගැනීමට ලැස්තිව සිටි බව මේ සභාවේ ගරු මන්ත්‍රීවරුන් මුළු රටත් හොඳින් දන්නව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තව එක ප්‍රකාශයක් පමණක් කර මගේ කථාව අවසාන කිරීමට බලාපොරොත්තු වෙනව. අද මේ ජාතික ආණ්ඩුව නමින් පිහිටුවා තිබෙන්නේ අස්ථිර ආණ්ඩුවක්. මා එසේ කියන්නේ විවිධ මත දරණ, නොයෙක් දෙනාගේ නායකත්ව යටතේ ඇති පක්ෂ එකට සම්බන්ධ වී මේ ආණ්ඩුව පිහිටුවා තිබෙන නිසයි. තමුන්නාන්සේලා කා ආරක්ෂා කිරීමටද, කාට සේවය කිරීම වද සූදනම් වී සිටින්නේ යන්න මේ අය වැය කථාවෙන්ම පැහැදිලි වන බව අපට කිසිම භයක් නැතිව කියන්නට පුළුවන්. මට එක අනා වැකියක් කියන්නට පුළුවන්. අපේ රාජ්‍ය ඇමතිතුමා කීව, ආණ්ඩු වෙනස් වන්නේ අවුරුදු දහයෙන් දහයටය කියා. එතුමාට තරම් විචක්ෂණ දේශපාලන බුද්ධියක් මට නැති වුනත්, ලබන වාරයේදී මේ රටේ ආණ්ඩුවක් පිහිටුවන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායිකාව වන සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය බව මට නිර්භයව කියන්නට පුළුවනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කථා කරන්නට අවස්ථාව ලබා දීම ගැන තමුන්නාන්සේටත්, මගේ කථාවට සවන් දීම ගැන ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට සහ විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ටත් මගේ ස්තුතිය පිරිනමමින් මගේ කථාව අවසාන කරනව

අ. භා. 7.14

විජේසිරි මයා.
*(திரு. விஜேசிறி)*
(Mr. Wijesiri)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික රජයේ පළමු වැනි අය වැය කථාවට පක්ෂව කුණ්ඩසාලේ ජනතාව වෙනුවෙන් මේ ගරු සභාවේ මගේ පළමු වැනි කථාව කිරීමට අවස්ථාව ලැබීම ගැන මාගේ ඉමහත් සන්තෝෂය මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනව. අවුරුදු 9 කට පසු දුක් විඳින ගොවි කම්කරු ජනතාව බදු බරින් නිදහස් කළ එකම අය වැය වාර්තාව, වන්නියේ දුගී ජනතාවගේ නායක ගරු වන්නිනායක මුදල් ඇමතිතුමා ඉදිරිපත් කළ අය වැය වාර්තාව බව මම මේ ගරු සභාව ඉදිරියේ ආඩම්බරයෙන් ප්‍රකාශ කරන්න සතුටුයි. විරුද්ධ පක්ෂය පසුගිය මාස 4 තුළදී ජාතික රජය කෙරෙහි එල්ල කළ හැම චෝදනාවක්ම මැඩ පවත්වා ජාතික රජයේ මන්ත්‍රීවරුන් වශයෙන් අපට අපේ ආසන තුළ නිදහසේ හැසිරීමට අවස්ථාව ලබාදුන්නේ ගරු යූ. බී. වන්නිනායක මුදල් ඇමති තුමා බව මම ආඩම්බරයෙන් ප්‍රකාශ කරන්නට සතුටුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විරුද්ධ පාර්ශ්වය ලංකාවේ හැම අස්සක් මුල්ලක් නෑරම රැස්වීම් පවත්වා මේ ජාතික රජය මාස තුනෙන් පෙරළෙනවාය,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මාස හතරෙන් පෙරළෙනවාය, මාස හයෙන් පෙරළෙනවාය කියා ඇඟිලි ගනිනවාය හීන දකිනවාය කියා කියනව. එහෙත් වන්නිනායක ගරු මුදල් ඇමතිතුමා විසින් ඉදිරිපත් කළ අයවැය ලේඛනයෙන් පසුව ඒ අයගේ ප්‍රකාශ ප්‍රලාප බවට මහජනයා පිළිගෙන තිබෙන බව මා නොකීවාට තමුන්නාන්සේ පිළිගන්නවා ඇති.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසු පස පෙළේ සිටින මන්ත්‍රීවරයෙකු වශයෙන් — කුණ්ඩසාලෙ මැතිවරණ කොට්ඨාශය නියෝජනය කරන මන්ත්‍රීවරයා වශයෙන්—මා තමුන්නාන්සේට කියන්න සතුටුයි, මේ ජාතික රජය මේ ගත් පියවර උඩ කුණ්ඩසාලේ ජනතාව නම් මගේ ආසනයට මා වැඩ කළත් නොකළත්—මුදල් ඇමතිතුමා විසින් මේ ගෙනෙන ලද අයවැය වාතීාව නිසා—තව අවුරුදු ගණනාවකටම මගේ ආසනය නම් ස්ථිර බව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පෙරේදා මහනුවර හර්තාල් ගුණානුස්මරණ රැස්වීමක් පවත්වන්නට යෙදුණා. එහෙත්, මීට කලින් එවැනි රැස්වීම්වල සිටි පිරිසෙන් සියයට 10 ක් වත් මෙවර එහිදී දකින්නට නොලැබුණු බව මා තමුන්නාන්සේට ආඩම්බරයෙන් කියන්න සතුටුයි. මේතාක් කල් දුක් විඳි ජනතාව ජාතික රජය කෙරෙහි විශ්වාසය තබා අප පසුපස ගමන් කරන බව ඒ කාරණයෙන්ම පෙනෙනවා.

කථික මහත්වරුන්, ඇමතිවරුන් හා විරුද්ධ පාර්ශ්වයේ නායකවරුන් මෙතෙක් දවසක් මේ අයවැය විවාදය ගැන දීර්ඝ විස්තරයක් කර තිබෙනව. ජාතික රජය පිහිටුවීමට ප්‍රධාන වශයෙන්ම ආධාර දුන්නේත් එමෙන්ම මුදල් දුන්නේත්, උඩරට ජනතාව බව පසුපස ආසනයක සිටින උඩරට මන්ත්‍රීවරයෙක් වශයෙන් මා තමුන්නාන්සේට කියන්න කැමතියි. එමෙන්ම මේ ජාතික රජය උදළු හා අලවංගුවල මිල අඩු කිරීමෙන් සන්තෝෂයට පත් වී සිටින්නේත් උඩරට ජනතාව බව මා තමුන්නාන්සේට සන්තෝෂයෙන් කියන්න කැමතියි. සිකුරාදා සවස උඩරට ආසනයක් නියෝජනය කරන සොරනාතොට ගරු මන්ත්‍රීතුමා (කේ. වයි. එම්. විජේරත්න බණ්ඩා මයා.) එතුමාගේ කථාව ආරම්භ කරන අවස්ථාවේදී ඉඟියක් කරමින් එතුමාගේ කථාව ආරම්භ කළා. එතුමාට කලින් කථා කළ වත්තේගම ගරු මන්ත්‍රීතුමාගේ (පී. බී. ඒ. වීරකෝන් මයා.) දුර්වලකමක් අල්ලාගෙන එතුමා මේ ගරු සභාව ඉදිරියේ කියාගෙන ගියා පළමු වන අයවැය වාර්තාව නොවෙයි, දෙවැනි අයවැය වාර්තාව ඉදිරිපත් කලාට පසුවයි, එතුමාට කථා කරන්න ලැබුණේ කියා. මා එතුමාට එකක් කියන්න සතුටුයි. මනුෂ්‍යයන් අතුරෙන් එතුමා වගේ අප සියළුදෙනාම අංග සම්පූර්ණ අය නොවන බව.

ගරු මුදල් ඇමතිතුමා විසින් මේ ගරු සභාවට ඉදිරිපත් කළ අයවැය වාර්තාව පිළිබඳව නොයෙක් චෝදනා එල්ල කරන්න යෙදුණා. වලපනේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. එම්. හේරත් මයා.) විසින් මේ ඩීසල් බදු ප්‍රශ්නය ගැන දීර්ඝ විස්තරයක් කරන්න යෙදුණා, ලොරි හිමියන්ට සහනයක් ලබා දුන්නාය කියා. නමුත් මා ලොරි හිමියකු වශයෙන් තමුන්නාන්සෙ ඉදිරියේ කියන්න සතුටුයි, ලොරි හිමියන්ට සහනයක් ලැබුණා නම්, එය ලැබුණේ ජාතික රජයෙන් නොවෙයි, පෞද්ගලික වශයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ රජයෙන්, බණ්ඩාරනායක රජයෙන්. උදාහරණයක් වශයෙන් එක් කාරණයක් ගෙන හැර දක්වන්න කැමතියි. සමහර විට තමුන්නාන්සේලා කවුරුත් දන්නව ඇති ලග්ගල මාටින් අප්පුහාමි කියන පුද්ගලයා ගැන. ඔහු තමයි 1959 අතුරු මැතිවරණයේ දී අත්තනගල්ල ආසනය වෙනුවෙන් ඉදිරිපත් වුණු සිරිමා බණ්ඩාරනායක මැතිණියගේ නම යෝජනා කළේ. ඔහු ලොරි හිමියකු බව මතක් කරන්න සතුටුයි. ඔහු 1956 සිට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ලැදිව, බණ්ඩාරනායක මැතිතුමාටත්, මැතිණියටත් පක්ෂව කටයුතු කළ කෙනෙක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1956 ට ප්‍රථමයෙන් මේ පුද්ගලයාට අයත්ව තිබුණේ මග කඩාවැටෙන තරමේ ලොරි දෙක තුනක් පමණයි. ඒ වාගේම මේ කාලයේ රථයක් ධාවනය කළ හැකි රූට් එක—ධාවන මාර්ගය—ලකුණු කිරීමේ ක්‍රමයක් තිබුණ. ඒ අනුව එක්තරා මාර්ගයක එක්තරා දුරක් පමණයි ලොරියක් ධාවනය කිරීමට අවසර දෙන්නෙ. මම සඳහන් කළ මේ පුද්ගලයත්, විරුද්ධ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විජේසිරි මයා.]

පක්ෂය කියනවා වාගේ කල්ලතෝනින් ගෙන් ලංකාවෙ සිටින එකම කල්ලතෝනියා මාටින් අප්පුහාමි බව පිටකොටුවට කියම කවුරුත් දන්නව ඇති. 1956 න් පසු මේ පුද්ගලයා, කොළඹ නගරයේ පමණක් නොව ලංකාවේ සෑම දිග් භාගය කම තමන්ට නිකුත් කර ඇති බලපත්‍රයට පිටස්තරව ලොරිවල බඩු පටවා ගෙන ගියා. මේ නිසා කිප අවස්ථාවකදීම මේ පුද්ගලයාට අයත් ලොරි නීති විරෝධී අත්අඩංගුවට ධාවනය කරවීම නිසා ඔහුට විරුඬව නඩු පවරා ඒ අනුව ගැසට් නිවේදනයක් නිකුත් කර මේ ලොරි රාජසන්තක කළා. ඒ අවස්ථාවේදී හිටපු බණ්ඩාරනායක අගමැතිතුමා ළඟට ඇවිත් මේ ගැන කරුණු කීවාට පසු; මහජන තාවගේ හිත දිනාගන්න මහජනතාවට සෙත සලසනවාය කියා, ඒ රූට් ක්‍රමය—ධාවන මාර්ගය නියම කිරීමේ ක්‍රමය—අහෝසි කළේ ඒ පුද්ගලයාගේ ලොරි ආරක්ෂා කර ගැනීමට බව තමුන්නාන්සේට මතක් කරන්න කැමතියි.

ඒ සමගම වලපනේ ගරු මන්ත්‍රීවරයා (ටී. බී. එම්. හේරත් මයා.) කීවා පරණ වාහන මිලයට අරගෙන හරිහම්බ කර ගන්නෙ එක්සත් ජාතික පක්ෂයට හිත වත් අයය කියා. නමුත් ඒ ගරු මන්ත්‍රීවරයාට කියන්න කැමතියි, ජිනරතන මාවතේ සිටින ඉම්පීරියල් ගරාජය හිමි පියදාස මුදලාලි ලංගම අධ්‍යක්ෂවරයකු කළේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මිස එක්සත් ජාතික පක්ෂය නොවන බව. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, ඒ අයගේ වුවමනා එපාකම් පිරිමසා ගැනීම පිණිස යම් යම් පුද්ගලයන්ට අවස්ථා සලසා දුන් බව මේ අවස්ථාවේ මතක් කර දෙන්න කැමතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අල, රතුළූනු, රටළූනු වැනි දේවල්වල තීරු බද්ද ඉවත් කිරීමෙන් එයින් පාරිභෝගිකයාට සහනයක් සැලසෙන්නෙ නැතෙ කියා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙත්. සමසමාජ, කොමියුනිස්ට් පක්ෂවලත් ඇතැම් මන්ත්‍රීවරුන් තරයේම කියා සිටිය. නමුත් පසුගිය අවුරුදු නවයක කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ රජයෙන්, සභාග රජයෙන් අයවැය ඉදිරිපත් කළාට පසු එයින් යම් ප්‍රයෝජනයක් සැලසනා නම් සැලසුනේ පෞද්ගලික වෙළෙන්දාට. එහෙම නැත්නම් පිටරටින් මෙරටට බඩු ගෙන්වන වෙළෙන්දාට බව මතක් කර දෙන්න සතුටුයි. පසුගිය අවුරුදු නවය ඇතුළත යම් අයවැයක් ඉදිරිපත් කළා නම්, ඒ හැම අවස්ථාවේදීම පුරුද්දක් වශයෙන් සියයට 25කින් 30කින් හෝ 40කින් මිල වැඩි කිරීමක් කළ නිසා, හැම මුදල් ඇමතිවරයකු විසින් බඩු මිල වැඩි කළා මිස අඩු කිරීමක් පුරුද්දක් වශයෙන් නොකළ නිසා, වෙළෙන්දන් බඩු මිල වැඩි කිරීමට මිස අඩු කිරීමට පුරුදු වුණේ නැහැ. අන්න ඒ නිසයි වෙළඳුන් අද දවසේ බඩු මිල අඩු කිරීමට උත්සාහ නොදරන්නෙ. මේ වියරු වැටී සිටින වෙළෙන්දන්ගෙන් රට බේරා ගැනීම පිණිස එඩිතර පියවරක් ගන්නා හැටියට මෙමු ජාතික රජයේ ගරු අගමැතිතුමා ගෙනුත් මුළු කැබිනට් මණ්ඩලයෙනුත් මා ඉල්ලා සිටිනව. මෙම වෙළෙන්දන් සමග සටන් කිරීමට, තරඟ කිරීමට ලංකාව පුරා සමුපකාර සංගම් එකසිය අසූ ගණනක් පිහිටුවා තිබෙනව. ඔය වෙළෙන්දන් සමග සටන් කර මේ රටේ ජීවන වියදම බැස්ස වීමට ගතයුතු එකම මාර්ගය නම් සීමා සහිත විවිධ සේවා සමුපකාර සමිති පිහිටුවීම බව කියන්ට ඕනැ.

පසුගිය මාස 4 තුළ මෙම ගරු සභාවේදී එල්ල කරන ලද චෝදනාවලින් වැඩි හරියක් එල්ල වුණේ අපේ ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමතිතුමාටයි. අවුරුදු නවයක් තිස්සෙ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ රජයේ සහ මාක්ස්වාදීන් හවුල් වී කළ රජයේත් ඉඩම් ඇමති ධුරය දැරූ එතුමා ඔවුන්ගෙන් වෙනස් වුවාට පසුයි, සියළුම චෝදනා එල්ල කරන්නෙ. මේ රටේ බුඞ්මත් ජනතාව සිටින තුරු එතුමා මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයත් මානුෂික නිදහසත් ආරක්ෂා කිරීම සඳහා එඩිතර පියවරක් ගත් එකම පුද්ගලයා හැටියට සලකනවා ඇතැයි කියා මා මෙමු සභාව ඉදිරිපිට ආඩම්බරයෙන් ප්‍රකාශ කරනව. පසුගිය රජයට බාධා පැමිණුනේ එතුමාගේ ව්‍යාපාරවලින්ය කියා මේ අය කියනව. ඔය තුන් හවුලේ කපුවා වන ගරු ඉලංගරත්න මහත්මයාගේ අයවැය ලේඛන කතාවට අතිරේකව ඉදිරිපත් කරන ලද "ආර්ථික හා සමාජ ප්‍රගතිය" නමැති ධවල පත්‍රිකාවෙ කෘෂිකාර්මික අංශය යටතෙ මෙසේ සඳහන් වෙනව:

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

විසර්ජන කෙටුම්පත් පනත, 1965-66

—දෙවනවර කියවීම

"1956-57 දී බුසල් දශලක්ෂ 31.3 ක්ව පැවති වී නිෂ්පාදනය 1961-62 දී බුසල් දශලක්ෂ 48.1 දක්වා වැඩි විය. මෙය වූකලී පස්වසක් පමණ වූ මේ කාල සීමාව තුළ සියයට 70 ක පමණ වැඩිවීමකි. නිෂ්පාදනයේ වාර්ෂික වැඩිවීම පහත දැක්වේ:"

ඊළඟට එම වැඩිවීම විස්තර කර තිබෙනවා. අනතුරුව මෙසේ ද කියනව:

"ඉහත දැක්වෙන වී නිෂ්පාදනය වැඩිවීම සහ අක්කරයකට ලැබෙන සාමාන්‍ය අස්වනු ප්‍රමාණයේ වැඩිවීමද මේ කාලය තුළදී රජය විසින් ගන්නා ලද දැඩි උත්සාහයේ ප්‍රතිඵලයකි. එය මෙසේ ප්‍රහුඩින් පැහැදිලි කළ හැකි වේ:"

එතැන් සිට එය පැහැදිලි කර තිබෙනව. පසුගිය මැතිවරණයෙදිත් 1960 මාර්තු මැතිවරණයෙදිත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට යම් ආසන ගණනක් ලැබුණ නම් එය එසේ වුණේ ගරු සී. පී. ද සිල්වා මහතා විසින් කරන ලද සේවය අනුවයි. එතුමා විසින් පදිංචි කරන ලද ගොවි ජනපද වාසින් සිටින පළාත්වලින් විශෙෂ ආධාරයක් ලැබුණු බව මා කියන්නෙ සතුටිනුයි. නමුත් ගරු සී. පී. ද සිල්වා මැතිතුමා විසින් කරන ලද හැම වැඩක්ම තම පක්ෂය විසින් කළාය කියා ගනිමින් මැතිවරණ ව්‍යාපාරයෙදී තමන්ට ඡන්දය ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙ අය කල්පනා කළා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට සිටි එකම බාධකයා ගරු සී. පී. ද සිල්වා මහතා හැටියටයි, හඳුන්වා දුන්නෙ. අද දවසෙ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙ මන්ත්‍රීවරුන් අතුරින් පොළොන්නරුවෙ ගරු මන්ත්‍රීතුමා (ලීලාරත්න විජේසිංහ මයා.) පවා මෙහි පැමිණ සිටින්නෙ, ගරු සී. පී. ද සිල්වා මහතාට පිං සිද්ද වෙන්ටය කියා මා ආඩම්බරයෙන් කියනව. [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් මාත් පළමුවෙන් සිටියේ ලංකා සමසමාජ පක්ෂයේ බව ඔබතුමා දන්නවා ඇති. පොළොන්නරුවේ සිටින කාලයේදී අප දෙදෙනාම සිටියේ ලංකා සමසමාජ පක්ෂයේ කාරකසභිකයන් හැටියටයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1957 දෙසැම්බර් 27 දා ඇතිවූ මහ ජල ගැල්මේදී ගරු සී. පී. ද සිල්වා ඇමතිතුමා පොළොන්නරුවේ නොසිටින්ට අද පොළොන්නරුවේ මන්ත්‍රීතුමා (ලීලාරත්න විජේසිංහ මයා.) වැනි මහත්වරු මේ සභාව නියෝජනය කරන්නෙ නැහැ. එතුමා නොසිටින්ට ඔවුන් වතුරට ගසා ගෙන ගොස් මහ මුහුදේ කොහේ සිටිදෝයි සොයා ගන්ටවත් බැරිවන බව ආඩම්බරයෙන් මතක් කරනව. මා ඒ කාලයේ පොළොන්නරුවේ වෙළඳ ව්‍යාපාරිකයෙක් වශයෙන් සිටි නිසා තමුන්නාන්සේට කියන්ට කැමතියි, සති ගණනක් පැවති ඒ ධාරානිපාත වැස්ස නොසලකා ගරු ඉඩම් ඇමතිතුමා ජීප් රථයකින් මින්නේරිය වැවෙත්, පරාක්‍රම සමුද්‍රයෙත් වැව් කණ්ඩිය දිගේ එහාට මෙහාට ගමන් කරමින් කොයි වෙලේ වේල්ල කැඩේදෝයි කල්පනා කරමින් බලා සිට එක් තැනකින් වැව් කණ්ඩිය කැඩෙන්ට ඔන්න මෙන්න කියා තිබියදී, වෙනත් ස්ථානයකින් ඩයිනමයිට් හා ට්‍රැක්ටර් යොදා කඩා නොදැම්මා නම් ලීලාරත්න විජේසිංහ වැනි මහත්වරුන් අද මේ ගරු සභාව නියෝජනය කරන එකක් නැති බව කියන්ට කැමතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**

*(உப சபாநாயகர் அவர்கள்)*

(Mr. Deputy Speaker)

Please do not refer to hon. Members by name.

**විජේසිරි මයා.**

*(திரு. விஜேசிறி)*

(Mr. Wijesiri)

තමුන්නාන්සේ සමාවන්ට ඕනෑ. එතුමා මා සමග තරහ නොවන බව මා තමුන්නාන්සේට මතක් කරන්ට සතුටුයි. මා එසේ කියන්නෙ, අප දෙදෙනා ලංකා සම සමාජ පක්ෂයේ සාමාජිකයන්ව සිටි කාලයේ "වැඩ වර්ජන කරපල්ලා, වැඩ කරන්ට එපා" යයි කිව්ව අපේ නායකවරුන් අපට නියෝගයක් කළා, යුගෝස්ලාවියාවේ කාණු කපන්ට යන්ට කියා. මා එය ප්‍රතික්ෂේප කළ අවස්ථාවේදී මා වෙනුවට යුගෝස්ලාවියාවට ගොස් කාණු කපා පළපුරුද්දක් ලබාගෙන මෙරටට පැමිණියේ පොළොන්නරුවේ මන්ත්‍රීතුමායි. [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විරුද්ධවාදීන් කෙසේ කීවත් ගරු සී. පී. ද සිල්වා ඇමතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුවේ නිලතලවලට පයින් ගසා ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කර ගැනීමේ අදහසින් ගත්ත ඒ පියවර නිසයි, අප වැනි අයට අද මේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ මහජන නියෝජිතයින් වශයෙන් පෙනී සිටින්ට පුළුවන් වුණේ. මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයත්, මානුෂික නිදහසත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විජේසිරි මයා.]

ආරක්ෂා වී තිබෙන්නේ ගරු ඉඩම් ඇමතිතුමා ගත් ඒ එඩිතර පියවර නිසා බව මා මතක් කරන්ට සතුටුයි. මගේ කාලවේලාව අවසන් වීගෙන එන හෙයින් ගරු මුදල් ඇමතිතුමා විසින් ඉදිරිපත් කර තිබෙන මේ අය වැය ලේඛනයට පක්ෂව මගේ ඡන්දය පාවිච්චි කරන බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනව.

අ. භා. 7.34

**ලීලාරත්න විජේසිංහ මයා.** (පොළොන්නරුව)

(திரு. லீலாரத்ன விஜேசிங்க—பொலன்னறுவை)

(Mr. Leelaratne Wijesinghe—Polonnaruwa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මුදල් ඇමතිතුමා විසින් ඉදිරිපත් කර තිබෙන අයවැය ලේඛනය ගැන කථා කරන්ට පළමු මට කලින් කථා කළ මගේ හිත මිත්‍ර කුණ්ඩසාලේ ගරු මන්ත්‍රීතුමා (ආර්. පී. විජේසිරි මයා.) විසින් කෙලින් ම මා වෙත එල්ල කරන ලද චෝදනාවලට පිළිතුරු නුදුන නත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මේ රටේ ලොරිකාරයන් වැනි ගසා කන්නන් අල්ලගෙන, ඒ අය ආයුධයක් හැටියට පාවිච්චි කළායයි කරන ලද ප්‍රකාශයට පිළිතුරක් දෙන්ට අදහස් කරනව. පාර්ලිමේන්තු වරප්‍රසාදවලට මුවා වීමින් පිටත සිටින හක්ගල්ලේ මුදලාලි මහත්මයා වැනි අහිංසක කෙනෙකුට කැත විධියට මඩ ගැසීම ඇත්තෙන්ම මන්ත්‍රීවරයෙකුට වටිනවා යයි මා හිතන්නෙ නැහැ. කුණ්ඩසාලේ මන්ත්‍රීතුමා සභාවෙන් පිටවී යනව. ඇයි, යන්නෙ පොඩ්ඩක් නවතින්න. හක්ගල්ලේ මාටින් මුදලාලි මහත්මයා තම ජීවිතය පවා නොතකා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට වැඩ කළ වැදගත් සමාජ සේවකයෙක්. එතුමා කල්ලතෝනියෙක් හැටියට හංවඩු ගැසීමට කුණ්ඩසාලේ මන්ත්‍රීතුමාට පුළුවන් නම් කුණ්ඩසාලේ මන්ත්‍රීතුමාට කරන්ට බැරි කිසිම කැත වැඩක් නැතැයි කියන්ට පළුවන්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ලොරිකාරයන්ට උදව් කළායයි කියන තමුන්නාන්සේලාට පුළුවන්ද, හුඹස් බස් අරගෙන බස්කාරයන්ටත් උදව් කළා යයි කියන්ට. ඇත්ත වශයෙන්ම හුඹස් බස්කාරයන්ටත්, මේ රටේ මහජනතාවගේ දහඩිය මහන්සිය මංකොල්ලකාගත් තමුන්නාන්සේලා වගේ ලොරි හිමියන්ටත් කෙලින්ම පහර දී ධනවාදය මේ රටේ සෑහෙන පමණකින්වත් අඩපණ කළේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සමාජවාදී මා වන බව මා තමුන්නාන්සේට මතක් කරන්ට කැමතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගරු මුදල් ඇමති වන්නියේ නායක මැතිතුමා නමටම ඔබින වන්නියේ නායකයෙක්. මාත් වන්නි ප්‍රදේශයක් නියෝජනය කරන කෙනෙක්. එහෙත් අද වන්නිය වුණත් එක්තරා කාලයක ලංකාවේ සෞභාග්‍යමත් ප්‍රසිද්ධ අගනුවරක්ව පැවති පොළොන්නරු ප්‍රදේශය නියෝජනය කරන කෙනෙක් හැටියට වන්නිනායක මැතිතුමාගේ අයවැය ලේඛනය ගැන වචනයක් දෙකක් කථා කරන්ට අදහස් කරනව. වන්නිනායක මැතිතුමාගේ අයවැය ලේඛනයට ආණ්ඩු පක්ෂයේ බොහෝ දෙනෙක් ප්‍රශංසා කළා. ඇත්ත වශයෙන්ම මුදල් ඇමතිතුමා මුරුංගා ඇත්තෙ තියන්නද මා දන්නෙ නැහැ, ලංකාවේම මේතාක් ඉදිරිපත් නොකළ අන්දමේ අයවැය ලේඛනයක් ඉදිරිපත් කළාය කියා වර්ණනා කරනව. බොහොම ඉහළින්ම මුදල් ඇමතිතුමා වර්ණනා කරනව. එපමණක් නොවෙයි. අයවැය ලේඛනය ඉදිරිපත් කරන්නට සති දෙකකට තුනකට පමණ පෙර සිටම ධනපති පත්‍රකාරයින් දිගින් දිගටම මුදල් ඇමතිතුමාගේ උත්පත්තියේ සිටම එතුමාගේ ගුණ වර්ණනා කළා. හෙට අනිද්දා මේ රට කිරෙන් පැණියෙන් උතුරා වන විශ්මයජනක අයවැය ලේඛනයක් එතුමා ඉදිරිපත් කරාවිය කිව්ව. නමුත් වන්නියේ කෙනෙකු හැටියට මමත් කියන්නට සතුටුයි, මේ අයවැය ලේඛනය සම්බන්ධයෙන් වන්නියේ ජනතාව නම් සතුටුවී නැති බව.

අපේ කුණ්ඩසාලේ ගරු මන්ත්‍රීතුමා වැනි එක්සත් ජාතික පක්ෂයේ බොහෝ දෙනෙකු මැතිවරණයට පෙර නොයෙක් ප්‍රචාරයන් ගෙනගියා ගොවියාට අමුඩ ලේන්සුව නැහැ; බ්ලේඩ් එකක් නැහැ; බීඩියක් නැහැ; මේ අය රට නැති කළා; කුණු කරවල දෙනව ආදී වශයෙන් බොහොසෝ ප්‍රචාර ගෙන යමින් රට මුලා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරගෙන ගියා. නමුත් වන්නියේ මැති තුමකු ඉදිරිපත් කළ මේ අයවැය ලේඛන යෙනුත් අඩු වශයෙන් ඒ අමුඩයටවත් තැනක් ලැබී නැහැ. ඒ වාගේම බීඩියකට වත් තැනක් නැහැ. සිගරට් නිෂ්පාදනය කරන දුම්කොළ වවන හැම ගොවියකුගේම දුම්කොළ රාත්තලකට ආණ්ඩුව ලොකු තීරු බද්දක් අය කරනව. නමුත් ඒ අයට හොඳම දුම්කොළ රාත්තලකට ගෙවන්නෙ රුපියල් 3.75 යි. අඩු වශයෙන් දුම්කොළ රාත්තලකට රුපියලකවත් වාසියක් දුම්කොළ වවන්නාට මේ අයවැය ලේඛන යෙන් දී නැහැ. වන්නියේ හිරියාල පත්තුවේත් ඒ වාගේම මුදල් ඇමතිතුමා ගේම ආසනයේත් දුම්කොළ වවන ගොවීන් ඉන්නව. නමුත් ඒ ගොවීන්ට සැහෙන උදව්වක් මේ අයවැය ලේඛන යෙන් කර නොමැති බව මා කණගාටුවෙන් මතක් කරනව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද හැම වන්නිකරයකම ගොවීන් සූරාකන ගිනි පොලීකාරයින් ඉන්නව. වන්නියේ දුප්පත් ගොවි ජනතාව නිෂ්පාදනය කරන ද්‍රව්‍ය, බඩ ඉරිඟු, තල ටික, හොරෙන් සතෙකු මරා ලබා ගන්නා මස් සවල්පය තුට්ටුවට දෙකට කොල්ලකාගෙන මුදල් උපයා ගන්නා පිරිසක් ඉන්නව. කවුරු කෙසේ ප්‍රශංසා කළත් අන්න ඒ සූරාකන් නන්ට නම් මේ අයවැය ලේඛනයෙන් වාසි යක් සලසා දී තිබෙන බව මට පෙනී යනවා. දුප්පත් ජනතාවට අවාසියක් වෙන්නත් සූරා කන්නන්ට වාසියක් වෙන්නත් තමයි මේ අයවැය ලේඛනය පිළියෙළ කර තිබෙන්නෙ.

ඊළඟට මේ අයවැය ලේඛනයෙන් අපේ ගොවි ජනතාවගේ ශක්තිය කෙරෙහි කිසිම විශ්වාසයක් තබා නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රට පුරාණයේ සිටම කෘෂිකාර්මික රටක්. පුරාණයේ සිටම මේ රටේ ජනතාව රැකුණේ කෘෂිකර්මයෙන්. අපේ මුතුන් මිත්තන් තමයි පුරාණයේ මේ රටින් සහල් පිටරටට ඇරියෙ. ඔවුන් ගෙන් උරුමවූ අපේ ගොවි ජනතාවගේ කෘෂිකාර්මික දැනුම මොට්ට කරවන විධියේ යෝජනා මේ අයවැය ලේඛනයට ඇතුලත් වී තිබෙනව.

ගැමි ජනතාව ජීවත් වන ප්‍රදේශ වල ඉඩම් අක්කර සිය දහස් ගණනක් සුද්ද තර අයට, බෝරාකාරයින්ට, නැත්නම් කොළඹ කොම්පැනි කාරයින්ට බෙදා දී ඒ ප්‍රදේශවලත් ධනවාදය ව්‍යාප්ත කරවීමට මේ අයවැය ලේඛනයෙන් සූදානම් වෙනව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උඩරට වතුකරයේ තත්ත්වය නමුත්නාන්සේලා දන්නව. තේ වතු ඇති කළාට පසු උඩරට සිංහල ගැමි ජනතාව අද සම්පූර්ණයෙන්ම දාසභාවයට පත්වී තිබෙනව. අර ගරු තොන්ඩමන් මහතා වාගේ අයටත් සුද්දන්ටත් වතුවල කංගානිලාත් කංගානි ලගේ දරු මුනුපුරන්ටත් පුළුවන්වී තිබෙ නව උඩරට සිංහල ගැමියන් කෙරෙහි ලොකු බලයක් පාන්න. ඔවුන්ට දාසකම් කරන්නට සිංහල ගැමියන්ට සිද්ධවෙලා තිබෙනවා. ඒ අන්දමටයි වතුකරයේ ධන වාදය ව්‍යාප්තවීමෙන් සිංහල ගැමි ජනතාව දුකට පත්වී සිටින්නෙ. වතුකරයේ හතර පස් දෙනෙකු සිටින ඉන්දියානු කම්කරු පවුලකට අද රුපියල් 500 ක පමණ මාසික ආදායමක් ලැබෙනව. නමුත් එවැනිම සිංහල පවුලකට ලැබෙන්නේ මාසයකට රුපියල් 90 ක 95 ක පමණ ආදායමක්. වතුකරයේ කම්කරුවන්ගේ දරුවන් හොඳ විද්‍යාලවලට ගිහින් ඉගෙන ගන්නව. ඉගෙන ගෙන ඒ වතුවලම අධිකාරි වරුන්ගෙ මාර්ගයෙන් ලිපිකාරකම් ආදී රක්ෂා ලබා ගන්නව. සිංහල ගැමියන්ගේ දරුවන්ට සිද්ධවී තිබෙන්නෙ ඔවුන්ගේ වලත් සෝදන්නයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උඩරට ධනවාදය ව්‍යාප්ත කිරීමේ අනිෂ්ට විපාක ස්වල්පයකුයි මා මේ පෙන්වා දුන්නෙ. නමුත් වතුකරයේ සිටින ගැමි ජනතාවටත් වඩා නූගත් ගැමි ජනතා සිටින වන්නිය වැනි ප්‍රදේශවලටත් කොළඹ කොම්පැනිකාරයින් කඩා වැටුණාම අන්තිමට සිද්ධවෙන්නෙ කුමක්ද? වතුකරයේ මෙන් ඒ ප්‍රදේශවල ගැමියනුත් කොම්පැනිකාරයින්ගේ දාසභාවයට පත් වෙනව. අර උරුමයෙන් හිමිවී තිබෙන තමන්ගේ ශක්තිය යොදා වැඩ කිරීම නතර වෙනව. විශාල වතුයායවල කුලීකරුවන් ගේ තත්ත්වයටයි ඒ ගැමියන් වැටෙන් නෙ. ඒ අන්දමින් ධනවාදය ව්‍යාප්ත කරන්ටයි මේ අයවැය ලෙඛනයේ සූත්‍රයක් ඔබා තිබෙන්නෙ. වන්නිනායක මැති තුමා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විජේසිංහ මයා.]

මෙය කැල්ඩෝර් ක්‍රමය අනුව හැදුවද වෙන ක්‍රමයක් අනුව හැදුවද කියා මම දන්නෙ නෑ. එතුමා අපේ ගම්බද ජනතාව අතරත් ධනවාදය ව්‍යාප්ත කර අරක්කු කසිප්පු වැනි දෙයින් හෝ ඔවුන් මුලා කොට කොල්ලෙන් වල්ලෙන් ඔවුන්ගේ ඡන්දය කොල්ල කා ගන්නට ඉතාමත් තීක්ෂණ විධියට වැඩ පිළිවෙලක් ඇති කර ගෙන තිබෙනවා. මේ වැඩ පිළිවෙල ක්‍රියාත්මක කිරීමේදී කුණ්ඩසාලේ ගරු මන්ත්‍රීතුමාගේ හැඬි දැඩි මිනිසුනුත් ගම්බද අසරණ ජනතාව රැවටීමට යොදා ගන්නව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටට පැමිණි අධිරාජ්‍යවාදී සුද්දෝ අපේ රටේ තේ වතුවලින් හම්බ කරගෙන ඒ සල්ලි අරගෙන ගිහින් අප්‍රිකාවේ තේ වව නවා. අද එය අපේ තේවලට විශාල තර්ජනයක් වී තිබෙනවා. ඌරගෙ මාළු ඌරගෙ ඇඟේ තබා කපන්නාක් මෙන් අපේ රටේ වතුකරයේ සරුසාරකමින් උපදින ධනය සූරාගෙන ගොස් අප්‍රිකාවේ වගා කරන තේ සමග අපට කවදාහරි තරඟ කරන්නට සිදු වනවාට කිසිම සැක යක් නෑ.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)
අප්‍රිකාවට යැව්වේ කව්ද ?

විජේසිංහ මයා.
(திரு விஜேசிங்க)
(Mr. Wijesinghe)
ඔව්, මදි හරියත් අප්‍රිකාවට ගෙන යන්නට ඉඩ දෙන්නට වුවමනා නිසා තමයි, වීසා බදුත් අයින් කරදමා ගිනි පොළි කාර යින්ට ඕනෑතරම් සල්ලි ගෙනයන්නටත් ඉඩ දී තිබෙන්නෙ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බැංකු බද්දත් නැති කර දමා තිබෙනවා. බැංකු බද්දෙන් අන්න අර වගේ (ගරු මන්ත්‍රීවරයකු පෙන්වමින්) සල්ලිකාරයන්ට නම් වාසි වෙයි. නමුත් අපට නම්—අප වගේ ගම්බද ජනතාවට නම්—එයින් කිසිම වාසියක් සහනයක් ලැබෙන්නෙ නෑ. දූප්පත් අපි චෙක්පත්වලින් ගනු දෙනු කරන්නෙ නෑ. රුපියල් සියයකට ශත 10 යි කපා ගන්නෙ. එහෙම කපා ගෙනත් මසකට රුපියල් 80 ලක්ෂයක් පමණ බැංකු බද්දෙන් එකතු වෙනවා. දැන් ඒකත් නැතිකර දමා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් එක් විශෙෂ කරුණක් පෙන්වා දෙන්නට මම අදහස් කරනවා. කුණ්ඩසාලේ ගරු මන්ත්‍රීතුමා පොලොන්නරුවේ මාදුරා ඔය ව්‍යාපාරය බොහොම වර්ණනා කරමින් කථා කළා. එහි පොල් වගා කිරීමට ගිය උදවිය අද ඉතාමත් අසරණ කාලකන්නි තත්ත්වයකට පත් වී සිටිනවා. බොන්න වතුර ටිකක් පවා නැතිව දහස් ගණනක් අද අනාථ වී සිටිනවා. අර රුපියල් 80 ලක්ෂයේ මුදල ගත්තා නම්, අදූරදර්ශී ක්‍රියා කලාපයක් අනුගමනය කිරීම නිසා අසරණ තත්වයට පත් වී සිටින මේ මිනිසුන්ට යම්කිසි සහනයක් සලසන්නට තිබුණා. මේ ප්‍රදේශයෙහි තිබෙන හබරග්ගල වැව, පණ්ඩුකුලම් වැව ආදී වැව් ටික බැඳ දීමටවත් කටයුතු කළා නම් අනාථ වී සිටින ගොවි ජනතාවට එයින් විශාල සහනයක් ලැබෙනවා. ඒ වැව් ටික බැඳීමට ලක්ෂ 10 ක් වත් වියදම් වන්නෙ නෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ ජාතික ආණ්ඩුව දෙමළ ජනතාවටත් වෙනත් සුළු ජාතීන්ටත් බොහොම ඉහළින් සලකාගෙන යනවාය කියා, පෙඩරල් පක්ෂය රට පුරාම කියාගෙන යනවා. සුළු ජාතීන්ට සැලකීමේ ස්වරූපයක් 1956න් එහාදීත් එක්සත් ජාතික පක්ෂය තුළ තිබුණාය කියාත් ඔවුන් කියනවා. නමුත්, පෙඩරල් පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ භාෂාව වන දෙමළ භාෂාවට සාධාරණ තැනක්වත් ලැබුණේ 1956 න් එහාදීද නැත්නම් ඉන් මෙහාදීද කියා මම මේ අවස්ථාවේදී ප්‍රශ්න කරනවා. 1956 න් එහාදී මේ රටේ සිංහල වන අපටත් දෙමළ වන ඒ මන්ත්‍රීවරුන්ටත් කිසිම සාධාරණයක් ඉෂ්ට වුනේ නෑ. මේ රටේ සාමාන්‍ය ජනතාව සම්පූර්ණයෙන්ම යටපත් කර ගෙන සියයට හතක්වත් නොසිටි සුද්දොත් කළු සුද්දොත් ඉංග්‍රීසියෙන්මයි සියලුම කටයුතු කරගෙන ගියේ. සිංහල මිනිස්සුත් දෙමළ මිනිස්සුත් යටපත් කරගෙන අවුරුදු 9ක් තිස්සේ එක්සත් ජාතික පක්ෂය පාලනය ගෙන ගියේ ඉංග්‍රීසියෙන්ම පමණයි. 1956 දී බණ්ඩාරනායක මැතිතුමාගේ නායකත්වය යටතේ ඇති වුණු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සමාජවාදී රජයෙන් පසුවයි සිංහලය රාජ්‍ය භාෂාව බවට පත්වීමෙන් ඊට තැනක් ලැබුණේ. දෙමළ භාෂාවට සාධාරණ තැනක් වත් ලැබුණෙත් එයින් පසුව බව මම විශෙෂයෙන් මතක් කරන්නට ඕනෑ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

තමුන්නාන්සේලා පැය 24 නුත් කළා නේද?

**විජේසිංහ මයා.**
*(திரு. விஜேசிங்க)*
(Mr. Wijesinghe)

නමුත් එදා දෙමළ ජනතාවට ශ්‍රී අකුර පවා එපා වුණා. තමන්ගේ අයිතිවාසිකම් ලබා ගැනීමට ඕනෑතරම් ඉඩ කඩ තිබියදීත් දෙමළ ජනතාව එදා ඒ ක්‍රියාමාර්ගයට විරුද්ධ වී, ශ්‍රී අකුර සහිත බස් යාපනයට යවන්නට සූදානම් වන විට හර්තාල් දමා පාරවල් හරස් කරගෙන මහ කලබලයක් ඇති කළා. එදා අපේ ශ්‍රී අකුර පවා එපා වුණු උදවිය තමයි අද රට ජාතිය බේරා ගන්නට කිව්වු වී සිටින්නේ. මෙවැනි උදවියගෙන් අපේ රටට ජාතියට සෙතක් සැලසෙයිද කියා මම මේ අවස්ථාවේදී ප්‍රශ්න කරනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තම පළාත්වලට නොයෙකුත් විධියේ වැඩ කර ගන්නට තිබියදීත් ඒ ගැන නොසලකා ධන බලය පමණක් ඉස්මතු කරගෙන ධනවාදය රැකීමට පමණයි ඒ උදවිය කටයුතු කළේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කුඹුරු පණත මෙම පාර්ලිමේන්තුවට ඉදිරිපත් වුණු අවස්ථාවේදී ඊට විරුද්ධ වුණේ කවුද? එක්සත් ජාතික පක්ෂයත් පෙඩරල් පක්ෂයත් පමණයි එදා මේ පාර්ලිමේන්තුවේදී කුඹුරු පණතට විරුද්ධ වුණේ. ඉඩම්කාරයින් සමග එකතු වී දුප්පත් අද ගොවීන් සූරා කන්නට ඔවුන්ට වුවමනා නිසයි එදා ඔවුන් කුඹුරු පණතට විරුද්ධ වුණේ. එදා ඔවුන් කෙලින්ම මේ පණතට විරුද්ධ වුණා. දැන් එය බොරුයයි කියන්නට එපා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

බණ්ඩාරනායක මැතිණියත් විරුද්ධ වුණා.

**විජේසිංහ මයා.**
*(திரு. விஜேசிங்க)*
(Mr. Wijesinghe)

බණ්ඩාරනායක මැතිණිය විරුද්ධ වුණේ ගෙදරදී. මම කථා කරන්නේ මේ පාර්ලිමේන්තුවේදී විරුද්ධ වුණු අය ගැනයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පිට රටවලින් මෙහි එන සංචාරකයින්ට මෙහි දී කම්මුල් පහරවල් ගැහුවොත් ඔවුන් මෙහි පැමිණ මුදල් යොදා කටයුතු කරන්නේ කොහොමද කියා ගරු උප මුදල් ඇමතිතුමා එතුමාගේ කථාවේදී ප්‍රශ්න කළා. පසු ගිය ආණ්ඩුව කම්මුල් පහර ගැහුවේ සංචාරකයින්ට නොව මුදල් උපදවන්නට මෙහි එන ව්‍යාපාරිකයින්ටයි. මේ සම්බන්ධයෙන් මා එක් කරුණක් කියන්නට කැමතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එන එන පරංගියා බාරගත් නිසා තමයි අද මේ රටට මේ ව්‍යසනය ගහලා තිබෙන්නෙ. කවුරු වුණත් අම්මා කෙනකුගේ දරුවෙක්ය කියා අනුකම්පාවෙන්, එන එන පරංගියා බාර ගත් සිංහල උදවිය එදා එසේ නොකර කම්මුල් පහර දී පන්නා දැම්මා නම් අද මේ රටේ පෙඩරල් පක්ෂයකුත් නෑ, තමුන්නාන්සේලාට ඡන්ද ලබා ගන්නට වතුකරයේ ද්‍රවිඩ පිරිසක් ඉතුරු වන්නෙත් නෑ. ඒ නිසා අද ඔවුන්ගෙන් ලබා ගත් ආධාරවලට වන්දි වශයෙන් සුද්දන්ගෙ කොම්පැනි පසු පස ගිහිල්ලා ලක්ෂ ගණන් ගෙවන්න සිද්ධ වෙලා තියෙනව. වැඩි කාලයක් ඔය විධියට නම් වැඩ කටයුතු කරගෙන යන්න පුළුවන් වේය කියල මා නම් හිතන්නෙ නැහැ. ඔය විධියට දිගටම වැඩ කරගෙන යන අදහස ඉක්මනින් ඉවත් කර ගන්න වේවි. එහෙම නොකළොත් මගෙ නම් හිතේ කිසිම සැකයක් නැහැ, හෙට අනිද්දා වෙනවිට තමුන්නාන්සෙලාට ඔය ඉන්න තැන්වලින් ඉවත් වීමට සිදු වන බවට. මේ විධියට දිගින් දිගටම ධනවාදය ආරක්ෂා කරන්නත්, ධනවාදීන්ට ආධාර උපකාර කරන්නත් වැඩ කරගෙන ගියොත් ඔය තමුන්නාන්සෙලා දැන් ඉන්න පුටුවලින් අහකට වැටෙන තැනට කටයුතු සිද්ධ වෙන්න පුළුවනි.

මගෙ කථාව අවසන් කරන්න ඉස්සර වෙලා තවත් වැදගත් එක් කාරණයක් ගැන සඳහන් කළ යුතුව තිබෙනව. ගරු මුදල් ඇමතිතුමා එදා එතුමගෙ කථාව අවසන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විජේසිංහ මයා.]

කරන්න කලින් රජයේ සංස්ථාවල ඉන්න සේවකයින්ගෙ සහයෝගය වුවමනා කරන බව කියා සිටියා. මේ ආණ්ඩුව පවත්වාගෙන යාම සඳහා රාජ්‍ය සේවකයින්ගෙ සම්පූර්ණ සහයෝගය අපේක්ෂා කරන බව ඉතාම කරුණාවෙන් මතක් කරන බව අවසාන වශයෙන් ඒ කථාවෙන් කියා සිටියා. ඒ විධියේ ඉල්ලීම් ගැන අප දන්නව. රජයේ සේවකයින්ගෙ සහයෝගය හැම මුදල් ඇමතිවරයෙක්ම සිරිතක් වශයෙන් ඉල්ලනව. එතුමත් කළේ සමහර විට සිරිත් පරිදි හැම මුදල් ඇමතිවරයම කරන ඉල්ලීම විය හැකියි. නැවතත් පුරුදු ඉල්ලීම ඉදිරිපත් කිරීමයි ඉතින් එතුමත් කරන්න ඇත්තෙ. සිරිත් පරිදි හැම මුදල් ඇමතිවරයම කරන ඉල්ලීමෙත්, වර්තමාන මුදල් ඇමතිතුමා කළ ඉල්ලීමෙත් එක්තරා වෙනසක් මට පෙනෙන්න තියෙනව. වෙන මුදල් ඇමතිවරු නම් වැඩ කරන පංක්තියට සුළු වශයෙන් වුවත් යම් යම් සහනයක් දීලයි එවැනි ආයාචන මගින් වැඩ කරන පංක්තියේ සහයෝගය ඉල්ලා තිබෙන්නෙ. එහෙත් අපේ වර්තමාන මුදල් ඇමතිතුමා කෙලින්ම රාජ්‍ය සේවකයින්ගෙ සහයෝගය ඉල්ලා තිබෙනව. සහයෝගය ඉල්ලා සිටීමට ඇති සුදුසුකම පෙන්නුම් කළේ නැහැ. දුන් සහනයක් නැහැ. ඒ විධියට හිස රදයක් භාර ගන්න ඒ උදවිය ලෑස්ති නැති බව මතක් කරන්න සිදු වෙලා තියෙනව.

මේ රජය පසුගිය දා ඉදිරිපත් කළ රාජාසන කථාවෙනුත් මේ රටේ ඇතැම් කොටස්වලට අයිති සේවකයින්ට එක්තරා පොරොන්දුවක් දී තිබෙනව. මොකක්ද ඒ පොරොන්දුව? රාජ්‍ය සේවයේ නියුක්ත එක්තරා කොටසකට දේශපාලන නිදහස දෙනවය කියා පොරොන්දුවක් දුන් නමුත් ඒ ගැන සඳහන් කරන්නෙවත් නැහැ ඇත්. රාජාසන කථාවේ සඳහන් කරන ලද දේශපාලන අයිතිවාසිකම් ලබා දීම පිළිබඳ පොරොන්දුව මේ අවුරුද්දෙ සපිර කරන වග කියා ඊට පස්සෙ සහයෝගය ඉල්ලා සිටියා නම් ඒක වෙනම කාරණයක්. එවැන්නක් පවා මෙහි සඳහන් කළේ නැහැ. එක් අතකින් ගරු අධ්‍යාපන ඇමතිතුමා ගුරුවරුන් එහාට මෙහාට මාරු කරනව. නොයෙක් හේතු උඩ එතුමා ගුරුවරුන්ට හිරිහැර කරනව. තවත් පැත්තකින් ප්‍රවාහණ කටයුතු භාර ගරු ඇමතිතුමා බස් කොන්දොස්තර මහතුනුත්, ඩ්‍රයිවර් මහතුනුත් එහාට මෙහාට මාරු කරනව. වරායේ කම්කරුවන්ට තවත් පැත්තකින් හිරිහැර කරනව. කම්කරු නායකයින්ගෙන් පළිගැනීම නොනවත්වා කරගෙන යනව. ඒ අයට දැන් පාරේවත් බැහැල යන්න ඉඩ නොලැබෙන තැනට කටයුතු සිදු වෙලා තියෙනව. ඒ විධියෙ වැඩ කටයුතු දිගින් දිගටම කරගෙන යන අතර සහයෝගය ඉල්ලා සිටියට ලැබෙන්නෙ නැති බව කියන්න ඕනෑ.

රාජ්‍ය කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා නොබෝදා පනාගොඩට ගිහිල්ලා තුවක්කු එහෙමත් අතගාලා එතන ඉන්න යුද්ධ භටයින්ගෙන් සහයෝගය ඉල්ලු බව පුවත්පත් මගින් අපට දැන ගන්න ලැබී තිබෙනව. බලයට පැමිණි ආණ්ඩුවට විරුද්ධව කටයුතු කරන්නන්ගෙන් එය ආරක්ෂා කර ගන්න සහයෝගය දෙන ලෙස යුද්ධ භටයින්ගෙන් ඉල්ලා තිබෙනව, එතුමා. මා දැන් රාජ්‍ය කටයුතු භාර ගරු ඇමතිතුමාගෙන් අහන්න කැමතියි, එතුමා ඔය විධියට සහයෝගය ඉල්ලා සිටින්නෙ යම් පිරිසකගෙන්ද, ඒ පිරිසට හොඳට කාලා බීලා ඉන්න පුළුවන් විධියට වැටුප් ආදියවත් දී තිබෙනවද කියල. බණ්ඩාරනායක අගමැතිතුමන් ඉන්න කාලෙ නම් එතුමා යුද්ධ භටයින්ට ජීවත් වීමට තරම් වැටුප් ගෙවීමත්, සපිර තත්ත්වයක් දීමටත් ක්‍රියා කර තිබෙන බව අප දන්නව. මේ අයවැය ලේඛනයෙන් යුද්ධ හමුදාවටත්, පොලීසියටත්—ඒ දෙකොට්ඨාශයෙන්ම ආරක්ෂාව බලාපොරොත්තු වන මේ ආණ්ඩුව—මොනවද දීල තියෙන්නෙ? ඔය විධියට යුද්ධ භටයින්ගෙනුත්, පොලීසියෙනුත් ආරක්ෂාව ලබා ගන්න ගියොත් නම් මේ රට එකම ලේ විලක් වෙනවා මිස නිකම් කටින් කිව්වට නම් නියම ආරක්ෂාව ලබා ගන්න කවදාවත් බැහැ. [බාධා කිරීම්] අප වන්නියෙ ඉඳල ආ මිනිසුන් වුණත් ඔය විධියට තර්ජනය කිරීමෙන් නම් වැඩක් නැහැ. ඒවට අප බිය වන්නෙ නැහැ.

අපේ වර්තමාන ඉඩම් ඇමතිතුමා 1958 දී පමණ මී හරකුන් මැරීමට අවසර දුන්න. ඒ බව කවුරුත් දන්නවා. ඒ පාපය නිසා අද කුඹුරුවල වැඩ කර ගන්නවත් අපට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අපේ පළාත්වල මී හරක් නැහැ. ලොරි වලින් මී හරකුන් හොර රහසේ පටවන්න පටන් ගත්තට පස්සෙ දැන් කුඹුරු වැඩ වත් කරන්න විධියක් නැහැ. [බාධා කිරීම්] කුණ්ඩසාලෙ මන්ත්‍රීතුමාට තියෙන ලොරිවල මී හරකුන් ගෙන යන්න ඇති. ඒ කොයි හැටි වෙතත් දැන් අපේ පළාත් වල කුඹුරු වැඩටත් මී හරක් නැහැ. ඒ වුණාට මේ අයවැය ලේඛනයේ කුකුළන් ඇති කිරීම ගැන බොහොම ලොකුවට සඳ හන් වෙනව. ගවයන් ඇති කරන්නත් ඕනෑය කියනව. ගව පට්ටි දමන්න ඕනෑය කියනව. බොහොම තදින් කියන්නෙ කුකු ළන්, මසට හරකුන් ඇති කිරීම ගැනයි. මාක්ස්වාදීන්ගෙන් බෞද්ධාගම ආරක්‍ෂා කරන්න කටයුතු කරන්න ඕනෑය කිය කියා රට හැම තැන ප්‍රචාරය කරගෙන ගිය උදවියගෙන් සැදුණු මේ ආණ්ඩුව බෞද්ධා ගම රකින්න හදන්නෙ කොහොමද කියන එක දැන් කාටත් පැහැදිලියි. බෞද්ධයන් ගෙ පළමුවන ශික්ෂාපදය හැටියට තියෙන් නෙ "පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි" කියන එකයි. සතුන් මැරීමේ වරදින් මිදීමේ ශික්ෂාපදය ගැනයි එයින් කියැවෙන්නෙ. නමුත් මේ ජාතික ආණ්ඩුව කුකුළන් ඇති කරන්නෙත්, මසට හරක් ඇති කරන්නෙත් බෞද්ධාගම ආරක්‍ෂා කරන්නද ?

කැති, උදලු, අලවංගු වැනි දේවල මිළ අඩු කරනවය කියනව. ඒ දේවල මිළ අඩු වීමෙන් පමණක් ඇති වන සෙත මොකක්ද ? මම ඒක අහනව. තවමත් අර දහනායක ඇමතිතුමා ඉස්සර වගේ අමුඩය ගහගෙනද ඉන්නෙ. ඔය විදියට කෘෂිකර්මය දියුණු කරන්නට පුළුවන්ද කියල මා අහනව. ලෑන්ඩ් මාස්ටර් වැනි කුඩා යන්ත්‍ර තිබෙනවා. ඒවායේ මිළ සැහෙන තරමක් අඩු කර ගොවිජනතාවට දුන්නා නම් උදළු, අලවංගු මිළ අඩු කළාට වඩා වැඩි ප්‍රයෝජනයක් ලබන්න තිබුන. තමුන්නාන්සේලාට ඒවා පෙනෙන්නෙ නැහැ. [බාධාකිරීමක්] අපි කිව්වාට පසුව තමයි මතක් වෙන්නෙ.

මේ රටේ කසිප්පු බී මිනිසුන් අමාරුවේ වැටෙන නිසා හොඳ රා ටිකක් මැදගෙන බීමට පුළුවන් වන අන්දමට පසු ගිය අයවැය ලේඛනයෙන් ආචාර්ය එන්. එම්. පෙරේරා මහතා වැඩ පිළිවෙළක් යෙදුවා. එදා තමුන්නාන්සේලා ඊට "පෙරේරා රා" කියා විශාල උද්ඝෝෂණයක් ගෙන ගියා. අද මොකක්ද වෙලා තිබෙන්නේ ? අද තිබෙනවා, "දහ රා". "දහ රා" රට හැම තැනම ගලාගෙන යනවා. ඒවා "දහ රා" නොවෙයි ; "දහ ජරා". දැන් ගස් 5 ක් මැදගන්න අවසර දෙනවා. මීරා මදින්නලු දෙන්නේ ; නමුත් කිසිවෙක් මීරා මදින්නේ නැහැ. මහ රා මැද ඒවාට යීස්ට්, සීනි ආදිය දමා මහ ජරාවක් හදනවා. ඒ "දහ ජරා" බී මිනිස්සු ලෙඩ වෙනවා. අපි හොඳ රා දීමට යෝජනා කරන කොට තමුන්නාන්සේලා කිව්වා, අපි බුඩාගම නැති කරන්න හදනවාය කියා. නමුත් දැන් තමුන්නාන්සේලා ඒ වෙනුවට "දහ ජරා" දී මිනිසුන් ලෙඩ්ඩු කරන්න යනවා. මේ අතර තවත් කාරණ යක් මතක් වුණා. උතුරේ තල් ගස් මැදී මට ඕනෑ හැටියට ඉඩ දී තිබෙනවා. එදා තමුන්නාන්සේලා කෑගැහුවේ මාක්ස් වාදීන්ගෙන් බුඩාගම බේරා ගතයුතුය කියායි. නමුත් අද තමුන්නාන්සේලා ගෙන් බුඩාගම බේරාගැනීමට අපට සිඬ වී තිබෙනවා.

තමුන්නාන්සේලා කියනවා, අපි රට කෑවාය කියා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය රට කෑවාය කියනවා. අපි කෑවේ විදේශීය ධනපතියනුත්, බස් කොම්පැනි කාරයිනුත්, රක්‍ෂණ කොම්පැණිකාරයනුත්, බැංකු කාරයනුත් රට සූරා කන චෙට්ටියාර් වරුනුත් පමණයි. රට සූරා කෑ ඒ උදවියගේ නිදහස කෑ අතර අපි දුප්පත් ජනතාවගේ නිදහස ආරක්ෂා කළා. අනාගතයේදීත් ඒ දුප්පත් ජනතා වගේ නිදහස ආරක්ෂා කිරීම සඳහා අපි අපේ ජීවිතය නොතකා සටන් කරන බව ප්‍රකාශ කරන අතර, 1953 දී 9 දෙනෙක් මරා ධනපතියන්ගේ නිදහස ආරක්ෂා කිරීමට උත්සාහ ගත් මේ පක්ෂයට මෙවර ධනපති නිදහස ආරක්ෂා කළ හැක්කේ මාත් සමග දහසක් මැරීමෙන් පසුව බව අවධාරණයෙන්ම කියන්න කැමතියි.

අ. භා. 7.54

**එම්. සිවසිතම්පරම් මයා. (උඩුප්පිඩ්ඩි)**
*(திரு. எம். சிவசிதம்பரம்—உடுப்பிட்டி)*
(Mr. M. Sivasithamparam—Udupiddy)

Mr. Deputy Speaker, please permit me to speak a few words in support

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. සිවසිතම්පරම් මයා.]

of what the hon. Member for Walapane (Mr. T. B. M. Herath) described as the *vaday* Budget. I, Sir, in common with the hon. Member and very large sections of the peoples of this country, have a fondness for *vaday,* and, therefore, we are also fond of the Budget presented by the Hon. Minister of Finance. Certainly there is one matter that both the Members of the Government and the Opposition seem to have forgotten in the hurly-burly of this Debate, and that is, that the Hon. Minister of Finance has presented a surplus Budget on the Floor of this House.

You will remember, Mr. Deputy Speaker, when the hon. Member for Yatiyantota (Dr. N. M. Perera) was the Minister of Finance and presented his Budget in 1964-65, he, with a certain amount of justifiable pride, claimed that, on his own calculation of current expenditure and revenue and deducting the money that had been put into the sinking fund, he had presented a surplus Budget to this House. He was congratulated by fellow members of his party and also by the Members of the S.L.F.P. on having presented a surplus Budget—a surplus of a mere Rs. 14 million in that year.Can we be blamed if we are justifiably proud and happy that our Finance Minister from the Wanni, without any double doctorate, has been able to produce a surplus Budget of not Rs. 14 million but of a 104 million rupees ? It is useful to remind the hon. Members of this House of the claim that has been made of the excellent Budget the hon. Member for Yatiyantota had presented and to compare how our Finance Minister who, without any doctrinnaire and pre-conceived conceptions framed the Budget with the twin objective of bringing down the cost of living and of promoting capital formation with a consequential quickening of the economic development.

Mr. Deputy Speaker, during the Second World War Roosevelt, faced with the gigantic task of supplying the entire free world with American goods, made a trite saying. He told the industrialists in America, " Pull every lever in sight if it can do no harm ". This is exactly what our Hon. Minister of Finance has done in his Budget, faced with the ruinous economic situation which was facing the country at the time that he took over the reins of office.

One of the principal recommendations the Minister of Finance has made in his Budget speech is this short lease that he proposes to give to certain companies to cultivate subsidiary foodstuffs in this country. This proposal has been criticized by more than one hon. Member of this House, apparently, on the ground that this would be leaving it open to capitalists to enter into the field of cultivation of subsidiary foodstuffs and thereby shutting out the peasants. I do not think any Member who had read the Budget speech of the Minister can make that accusation. In fact, Sir, every colonization scheme that has been started will be continued and any land that is to be given to the companies will be after the entire needs of the peasantry of this country have been met. Therefore, to criticize this proposal of the Hon. Minister of Finance on that ground can only come from those who have not read the Budget speech.

Mr. Deputy Speaker, let us face this problem of subsidiary foodstuffs. Today, we are importing into this country nearly Rs. 184 million worth of subsidiary foodstuffs. To put it in another form of terminology, we are importing into this country practically the entire value of the outlay that we have made for the last few years on industries. You will remember, in our annual Budgets over the last few years the money that we had set apart for the industrial development of this country is something to the tune of Rs. 184 million. If we can produce in this country the necessary subsidiary foodstuffs, then the House will appreciate, Sir, how we can almost double the amount that we can lay by on the industrial development of this country.

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

It has been calculated by the Department of Agriculture that you will require roughly about 30,000 acres to be brought under subsdiary foodstuffs cultivation if this country can reach anything like near self-sufficiency in these foodstuffs. The average increase in the land under cultivation of subsidiary foodstuffs is 100 acres per year. You will thus see that if we go on at the rate we have been advancing in the matter of subsidiary foodstuffs cultivation we will take another 3,000 years before we can reach anything like self-sufficiency in subsidiary foodstuffs! It is for this reason, because we realize the enormity of the problem that is involved in the matter of the cultivation of subsidiary foodstuffs that the Hon. Minister of Finance has thought it necessary to invite companies which are prepared to invest capital and money in the cultivation of foodstuffs to do so.

We welcome the Hon. Minister's proposal for the simple reason that in the past people with capital who wanted to invest in agriculture were only interested in investing in coconut, tea and rubber. Now we find that people with capital and who are interested in agriculture are prepared to come forward and invest their money in the cultivation of subsidiary foodstuffs. What is wrong in that? If after satisfying the needs of the peasants, if after accelerating the alienation of land to the peasants, what is wrong if short-term leases are given to companies in order to increase the cultivation of subsidiary foodstuffs?

One curious feature of this year's Budget Debate has been the concentrated attack on the Hon. Minister of Land, Irrigation and power by practically every leader of the Opposition parties. One can understand their anger and their sense of bitterness at what the Hon. Minister of Land had done, because if there was one man responsible for the downfall of the Coalition and thereby prevented the quick march to totalitarianism in this country it is the Hon. Minister of Land, Irrigation and Power and nobody else. Therefore, one can understand their anger and one can understand their bitterness. But as the hon. Member for Kundasale (Mr. Wijesiri) showed, in past Budget speeches, the Minister of Finance has been speaking in very laudable terms of the work the Hon. Minister of Land. Irrigation and Power had done in the past.

As I said before, the Hon. Minister of Finance was faced with an economic situation that was almost ruinous and like Roosevelt he thought that he must pull every lever in sight as long as it could do no harm. I think the Hon. Minister of Finance has fashioned an instrument—after all the Budget is only an instrument. It all depends on how this instrument is to be wielded in the coming years whether the objectives of the Minister of Finance can be achieved or not. The Hon. Minister of Finance has undoubtedly fashioned an instrument which, if properly handled, can bring economic prosperity to our country.

The Budget has been described in various ways by various hon. Members of the Opposition; but I think we have based this Budget on the one philosophy which we have accepted, that is, a mixed economy, because we feel that for the preservation of democracy, for the preservation of Parliamentary democracy, as we have known it in this country for the last few years, it is absolutely essential that the private sector shall exist side by side with the public sector. Indeed, if any justification were needed for the continuance of the private sector one has only to see what happened in the C. W. E. to know what will happen if the entire productive machinery were in the hands of the public sector. The commission that is now looking into the activities of the C. W. E. has clearly shown how the public sector—like the C. W. E.—was utilized by those in power to make it possible for them to continue to be in power.

Mr. Deputy Speaker, you know how Hon. Ministers of the last Government, including the then Prime Minister, have written letters to the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. සිවසිතම්පරම් මයා.]

Chairman of the Co-operative Wholesale Establishment saying, " This man is a good supporter of mine, kindly give him a job. " We know what happened in the electorate of the present Hon. Prime Minister. We know how unemployment almost ceased to exist in that electorate, thanks to Mr. Deshapriya Senanayake. the Chairman of the C. W. E., who contested him at the subsequent election.

**නියෝජ්‍ය කථානායකතුමා**

*(பிரதிச் சபாநாயகர் அவர்கள்)*

(Mr. Deputy Speaker)

The hon. Member can continue his speech tomorrow.

එකල්හි වේලාව අ. භා. 8 වූයෙන් කටයුතු අත්සිටුවා විවාදය කල් තබන ලදී.

එතැන් සිට විවාදය 1965 අගෝස්තු මස 24 වන අඟහරුවාදා පවත්වනු ලැබේ.

அப்போது பி.ப. 8 மணியாகிவிடவே சபையின் நடவடிக்கைகள் இடைநிறுத்தப்பட்டு, விவாதம் ஒத்திவைக்கப்பெற்றது.

விவாதம் 1965 ஓகஸ்ட் 24 ஆம் திகதி செவ்வாய்க்கிழமை மீள ஆரம்பமாகும்.

*It being 8 P.M., Business was interrupted, and the Debate stood adjourned.*

*Debate to be resumed on Tuesday, 24th August 1965.*

## කල් තැබීම

## ஒத்திவைப்பு

## ADJOURNMENT

**මතු පළවන යෝජනාව සභාසම්මත විය :**

" මන්ත්‍රි මණ්ඩලය දැන් කල් තැබිය යුතුය ".—[ගරු ජේ. ආර්. ජයවර්ධන]

*தீர்மானிக்கப்பட்டது :*

*" சபை இப்பொழுது ஒத்திவைக்கப்பெறுமாக " [கௌரவ ஜே. ஆர். ஜயவர்தன].*

*Resolved :*

" That the House do now adjourn ".—[*Hon. J. R. Jayewardene.*]

**මන්ත්‍රි මණ්ඩලය ඊට අනුකූලව අ. භා. 8.1ට 1965 අගෝස්තු 20 වන දින සභා සම්මතිය අනුව, 1965 අගෝස්තු 24 වන අඟහරුවාදා පූ. භා. 10 වන තෙක් කල් ගියේ ය.**

*அதன்படி, சபை பி.ப. 8.1 மணிக்கு சபையினது ஓகஸ்ட் 20, 1965 ஆம் திகதிய தீர்மானத்திற்கிணங்க, 1965, ஓகஸ்ட் 24 செவ்வாய்க்கிழமை மு.ப. 10 மணி வரை ஒத்திவைக்கப்பெற்றது.*

*Adjourned accordingly at 8.1 P.M. until 10 A.M. on Tuesday, 24th August 1965, pursuant to the Resolution of the House of 20th August 1965.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි. මාස 6 කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කලින් එවිය යුතුය.

1965

சந்தா : பணம் கொடுத்த தேதியை யடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம் : தனிப்பிரதி சதம் 30, தபால்மூலம் 45 சதம், முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்.

1965

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months. Each part 30 cents, by post 45 cents, payable in advance to the Superintendent, Government Publications Bureau, P. O. Box, 500, Colombo 1.

1965

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org